
# බුදුබව පතන බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහනාහිමි

ඉත්තෑපාන ධම්මාලංකාර හිමි



# බුදුබව පතන
# බලන්ගොඩ
# ආනන්ද මෛත්‍රෙය
# මහානාහිමි

REFERENCE
15018
922

REFERENCE ONLY
Museum
Sabaragamuwa University of Sri Lanka
Belihuloya.

සම්පාදක
ඉත්තෑපාන ධම්මාලංකාර හිමි

# Budu Bava Patana
# Balangoda Ananda Maitreya
# Mahanahimi

Biography of Ven., Balangoda Ananda Maitreya )

**Pandit Ittepana Dhammalankara Thero**
B.A. Hons. (Kelaniya), M. Phill (Kelaniya)

*Chief Incumbent*
Maitri Vihara, Los Angeles, California, U.S.A.
and
Dharmavijayaloka ,Vihara, Rukmale, Pannipitiya
Sri Lanka.

# බුදුබව පතන

# බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය

# මහනාහිමි

සම්පාදක

ඉත්තෑපාන ධම්මාලංකාර හිමි

බී.ඒ. ගෞරව (කැලණිය) දර්ශනපති (කැලණිය)

R[illegible]LY

Sabaragamuwa [illegible] Sri Lanka

[illegible]

දෙවැනි මුද්‍රණය පෙබරවාරි 1994

© සියලුම හිමිකම් සම්පාදක සතුය

ISBN 955-95328-1-2

පිට කවරය
**චිත්‍ර හෙට්ටිගොඩ**

මුද්‍රණය
**ශ්‍රීදේවි ප්‍රින්ටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්**
**27, පැපිලියාන පාර, නැදිමාල, දෙහිවල. දුරකථන 716709**

# සම්පාදකගෙන්

සංවාද මගින් හෙළි කෙරෙන අග්ගමහා පණ්ඩිත අතිපූජ්‍ය බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහානායක මාහිමියන්ගේ මේ චරිත කතාවට දහනව වන ශතවර්ෂයේ අග භාගයත්, විසිවන සියවසේ ගෙවී ගිය දශක නවයත් ඇතුළත් වෙයි.

චරිත කතා ලිවීම පිළිබඳව නව මගක් අනුගමනය කරමින් මවිසින් 1990 දී ලියා පළ කරන ලද **පැවිදි පඩි මිණි පහන්** ග්‍රන්ථයට පාඨකයන් දැක්වූ ප්‍රතිචාරය ගැන මම සතුටු වෙමි. මෙය **පැවිදි පඩි මිණි පහන්** ග්‍රන්ථ මාලාවේ අංක 2 වන අතර, **පැවිදි පඩි මිණි පහන් අංක 3** ඉක්මනින් ප්‍රකාශයට පත් කිරීමට ද බලාපොරොත්තු වෙමි.

**පැවිදි පඩි මිණි පහන් අංක 1** ලියා පළ කිරීමේදී එයට අනිවාර්යයෙන්ම ඇතුළත් විය යුතු වූ කතාවකි අතිපූජ්‍ය ආනන්ද මෛත්‍රෙය මහනාහිමි චරිත කතාව. නමුත් එය ලියන වකවානුවේ උන්වහන්සේ ඇමරිකාවේ සහ යුරෝපයේ රටවල් ගණනාවක සාර්ථක ධර්මදූත සේවාවක යෙදී සිටීමෙන් ඒ අවස්ථාව මග හැරී ගියේය. එය එසේ වීම වඩාත් සුදුසු බව දැන් මට සිතේ. වෙනමම අපූර්ව චරිත කතාවක් මෙසේ ප්‍රකාශයට පත් වන්නේ ඒ නිසායි.

1991 මාර්තු 24 ද සිට දින විස්සක් මුළුල්ලේ දිනකට පැය පහකටත් වැඩි කාලයක් මහානායක මාහිමියන් වහන්සේ මුණ ගැසී සාකච්ඡා කිරීමට මට අවස්ථාව ලැබුණි. බත්තරමුල්ලේ ජයවඩනගම චිත්තවිවේකාශ්‍රමයේදී දින දහනමයක් ද තවත් දිනක් උදේ සිට හවස් වන තෙක්ම උන්වහන්සේ පැවිදි වූ,වාසයට වඩාත් ප්‍රිය කරන බළන්ගොඩ උඩුමුල්ල පන්සලේදී ද මුණ ගැසී සාකච්ඡා කිරීමට මට හැකි විය.

දින විස්සක් පමණ කාලයක් එක දිගට මගේ පැමිණීමත්,පැය ගණන් සාකච්ඡා කිරීමත්, විවිධ ප්‍රශ්න විචාරීමත්, කරදරයක් අමාරුවක් වෙහෙසක් සේ නොසලකා ශතවර්ෂයකට ආසන්න උන්වහන්සේගේ ජීවන ගමන් මග පිළිබඳ තොරතුරු එක දිගට ක්‍රමානුකූලව ප්‍රකාශ කිරීම පිළිබඳව උන්වහන්සේට මගේ කෘතඥතා පූර්වක ගෞරවය මුලින්ම පළ කිරීමට කැමැත්තෙමි.

ජීවමාන පැවිදි පඬිවරුන්ගේ රසවත් චරිත කතා සතිපතා එක දිගට පළ කිරීමට උපාලි පුවත් පත් සමාගම මුල සිටම දැක්වූ උනන්දුව මෙහිදී අගය කළ යුත්තකි. සිංහලකමත් බෞද්ධකමත් රැක ගැනීම සඳහා එම පුවත්පත් සමාගම ආරම්භ කරන ලද්දේ මෙයට වසර දහයකට පෙර අතුරුදහන් වූ ශ්‍රේෂ්ඨ සිංහල බෞද්ධ ජන නායකයකු වූ උපාලි විජයවර්ධන මැතිතුමා විසිනි. එතුමාගේ උදාර අරමුණු හොඳින් වටහාගෙන සිටි උපාලි පුවත්පත් සමාගමේ ප්‍රධාන කර්තෘ එඩ්මන්ඩ් රණසිංහ මහතාත්, නියෝජ්‍ය කර්තෘ දයා ප්‍රනාන්දු මහතාත්, විශේෂාංග කර්තෘ නිමල් කිත්සිරිශාන්ත මහතාත් මේ චරිත කතා දිවයින පත්‍රයේ බදාදා අතිරේකයෙහි පළකරවීමට ඉඩකඩ සැලසීම පිළිබඳව එම තුන්පළට මගේ ස්තුතිය මෙහිදී පළ කරමි.

මෙම ලිපි පෙළ ග්‍රන්ථයක් වශයෙන් සකස් කොට පළ කිරීමට මෙතෙක් ප්‍රමාදවීම ගැනත් මෙහිදී යමක් කිව යුතු වෙයි. මේ චරිත කතාවට ඇතුළත් ලිපි පෙළ සම්පූර්ණයෙන්ම ලියා දිවයින කාර්යාලයට භාර දීමෙන් පසුව 1991 ඔක්තෝම්බර් මාසයේදී මට ඇමරිකා එක්සත් ජනපදයට යාමට සිදු විය. වසරකටත් අධික කාලයක් ඇමරිකාවේ ගත කරන්නට සිදුවීම නිසා මේ ග්‍රන්ථය පළ කිරීම මෙතෙක් ප්‍රමාද විය. මා ඇමරිකාවේ සිටියදීත් පිටපත මුද්‍රණය සඳහා ඉක්මනින් භාර දෙන්න යැයි දෙහිවල ශ්‍රී දේවි ප්‍රින්ටර්ස් අධිපති මහේන්ද්‍ර සේනානායක මහතා කීප වරක්ම මට දන්වා සිටියද අධික වැඩ කටයුතු නිසා දිගින් දිගටම මෙසේ ප්‍රමාද කරන්නට සිදුවිය. එසේම හොඳ පිටපතක් ලැබුණොත් හොඳ පොතක් පිට කළ හැකිය යන ඒ මහතාගේ මුල් උපදේශයද මගේ හිතේ නිතර හොල්මන් කළ බව මෙහිදී නොකියාම බැරිය. කෙසේ වුවත් **පැවිදි පඬි මිණි පහන් අංක 2 හා අංක 3, 1992** වසරේදී ප්‍රකාශයට පත් කිරීමට මගේ හිතේ තිබුණු බලවත් ආශාව මේ විදේශ ධර්මදූත සේවාව නිසා මෙතෙක් ප්‍රමාද කරන්නට වූ බව නම් මෙහිදී විශේෂයෙන් සඳහන් කිරීමට සිදු වෙයි

මා ඇමරිකාවේ සිටින අතර මගේ විශේෂ ඉල්ලීම පරිදි මෙම ලිපිපෙළ ග්‍රන්ථයක් වශයෙන් පළ කිරීමට අවශ්‍ය මූලික කටයුතු බොහොමයක් සම්පූර්ණ කරන ලද්දේ මගේ කල්‍යාණ මිත්‍ර ශාස්ත්‍රපති කීර්ති නාරම්පනාව සහ ශාස්ත්‍රාචාර්ය අනුරුද්ධ

ජයසුන්දර මහතුන් විසිනි. එම දෙපළට මගේ හෘදයාංගම ස්තුතිය හිමි වෙයි. පිටපත් කිරීම් ආදී කටයුතුවලදී පන්නිපිටිය විද්‍යාලංකාර පිරිවෙනේ ආචාර්ය ශාස්ත්‍රාචාර්ය නාපටවෙල ධම්මානන්ද ස්ථවිරයන්ගෙන් සහ මගේ ප්‍රිය ශිෂ්‍ය මහරගම මධ්‍යමහා විද්‍යාලයෙහි ආචාර්ය පැලවත්තේ පුඤ්ඤරතන ආයුෂ්මතුන්ගෙන්ද ලැබුණු සහාය අපමණය. එම දෙපළටද මගේ ස්තුතිය හිමි වේ.

මෙම ග්‍රන්ථයේ මුල් පිටපත 1992 ඔක්තෝබරයේදී මා ඇමරිකාවට ගෙන්වා ගත් අතර එය නැවත සංස්කරණය කරන ලදී. එහිදී ඇමරිකාවේ ලොස්ඇන්ජලීස්හි සන්වැලි ප්‍රදේශයේ මෛත්‍රී විහාරයේ ධර්මදූත කටයුතුවල යෙදී සිටින ආචාර්ය ගරු පාතේගම ඤාණාරාම හාමුදුරුවන්ගෙන් සහ නිව්යෝර්ක් විශ්ව විද්‍යාලයෙහි ආචාර්ය උපාධිය සඳහා පර්යේෂණ කටයුතුවල යෙදී සිටින දිවයින පත්‍රයේ නියෝජ්‍ය කර්තෘ දයා ප්‍රනාන්දු මහතාගෙන්ද විටින් විට ලැබුණු සහාය සහ උපදෙස් වඩාත් හොඳ පිටපතක් සකස් කර ගැනීම සඳහා උපකාරී වූ බව කෘතඥතා පූර්වකව සඳහන් කරන අතර එම දෙපළට ද මගේ ස්තුතිය පිරිනමමි.

කෙතරම් කාර්යබහුල ජීවිතයක් ගත කළද මගේ ඉල්ලීම පරිදි මෙම ග්‍රන්ථයට අගනා ප්‍රස්තාවනාවක් සැපයූ බෙල්ලන්විල රජමහ විහාරාධිකාරී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ගරු බෙල්ලන්විල විමලරතන ස්ථවිරයන් වහන්සේටද මගේ විශේෂ ස්තුතිය හිමි වෙයි.

මෙම ලිපි පෙළ ආරම්භයේ සිටම පොතක් වශයෙන් මුද්‍රණය කිරීමට මා උනන්දු කළා වූද, මෙම ග්‍රන්ථය මනහර ලෙස ඉතා කෙටි කලක් තුළදී මුද්‍රණය කළා වූද, දෙහිවල ශ්‍රී දේවී මුද්‍රණාලයේ අධිපති මහේන්ද්‍ර සේනානායක මහතාටත්, එතුමාගේ පුත් තුසිත සේනානායක, උදිත සේනානායක සහ හරිත සේනානායක මහත්වරුන්ටත් කාර්ය මණ්ඩලයටත් මගේ ස්තුතිය පළ කරමි.

තවද පැවිදි පඩි මිණි පහන් අංක I ග්‍රන්ථයේ මෙන්ම මෙහිද පිටකවරය සිත්ගන්නා ලෙස ඇඳදුන් විනී හෙට්ටිගොඩ මහතාටද මගේ ස්තුතිය හිමි වේ.

REFERENCE
LIBRARY

මෙම විසිවන සියවසේ ශ්‍රී ලංකා පුත්‍රයකුගේ විශාලම පරිත්‍යාගය වශයෙන් සැලකිය හැකි ඇමරිකාවේ කැලිපෝර්නියාවේ ලොස්ඇන්ජලීස් නගරයේ සන්වැලි ප්‍රදේශයේ 'මෛත්‍රී විහාරස්ථානය' කරවා පූජා කරන ලද දොස්තර පී. එම්. සරත්චන්ද්‍ර මහතා විසින් මෙම චරිත කතාව ප්‍රකාශයට පත් කිරීමේ කාර්යයද ඉතා සතුටින් භාර ගැනීම පිළිබඳව මගේ විශේෂ ස්තුතිය එතුමන්ට හිමි වෙයි.

**ඉත්තෑපාන ධම්මාලංකාර ස්ථවිර**

## දෙවන මුද්‍රණයට.......සම්පාදකගෙන්

"බුදුබව පතන බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහනාහිමි" ග්‍රන්ථය දෙවන වරටත් මුද්‍රණය කරන්නට ලැබීම මට බලවත් සතුටට කරුණකි. තව අවුරුදු දෙකකින් ජීවන මගෙහි සියවෙනි වසරට පා තබන ශ්‍රේෂ්ඨ පැවිදි උතුමකුගේ චරිත කතාවක් මෙතරම් ඉක්මණට දෙවන වරටත් මුද්‍රණය කරන්නට ලැබීම තුළින් අපට පැහැදිලි වන්නේ ගුණ නුවණින් හෙබි උතුමන්ගේ චරිත කතා කියවීමෙන් ඒවායින් ආදර්ශ ගැනීමට ගිහි-පැවිදි දෙපක්ෂයේම එක්තරා කොටසක් හෝ තවමත් උනන්දුවෙන් සිටින බවයි.

මෙම දෙවන මුද්‍රණයේදී පළමු මුද්‍රණයේ තිබූ ඇතැම් මුද්‍රණ දෝෂ හා අතපසුවීම් කීපයක් සකස් කිරීමටද, මෙම ග්‍රන්ථය දොරට වැඩූ ද අති පූජ්‍ය බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් පැවත්වූ දේශනය පොතෙහි අවසානයට එකතු කිරීමට ද හැකි විය. ඒ හැරුණු විට මෙම දෙවන මුද්‍රණයෙහි හා මූලික කෘතියෙහි වෙනසක් නැති බව කිව යුතුය. මෙවරද මුද්‍රණ කටයුතු ඉතා මැනවින් කර දුන් දෙහිවල ශ්‍රීදේවි ප්‍රින්ටර්ස්හි අධිපති මහේන්ද්‍ර සේනානායක මහත්මා ඇතුළු කාර්ය මන්ඩලයටත්, මා දිවයිනෙන් බැහැරව සිටින මේ අවස්ථාවේදී දෙවන මුද්‍රණය පිළිබඳ සියලු කටයුතු සොයා බලා ඉටු කළ මහරගම මධ්‍යමහා විද්‍යාලයේ ආචාර්‍ය, මගේ දයාබර ශිෂ්‍ය පැලවත්තේ පුඤ්ඤරතන ආයුෂ්මතුන්ටත් මගේ කෘතඥතාවය හිමි වෙයි.

**- ඉත්තෑපාන ධම්මාලංකාර ස්ථවිර**

**1994.01.31**

# ප්‍රස්තාවනාව

බහුස්සුතං ධම්මධරං භජේථ
මිත්තං උළාරං පටිභානවන්තං

- සුත්තනිපාත, ඛග්ගවිසාණසුත්ත

රුක්මලේ ධර්මවිජයාලෝක විහාරයේත් ඇමරිකාවේ ලොස්ඇන්ජලීස්හි මෛත්‍රී විහාරයේත් අධිපති ශාස්ත්‍රපති පණ්ඩිත ඉත්තෑපාන ධම්මාලංකාර හිමියන් විසින් සම්පාදිත "බුදුබව පතන බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහනාහිමි" නම් කෘතිය කියවනවාත් සමගම මගේ සිහියට ආවේ ඉහත සඳහන් තථාගත භාෂිතයයි. එයම මගේ මේ ප්‍රස්තාවනාවෙහි සිරස්පාදය වශයෙන් යෙදීමට ද අදහස් කළෙමි.

සකලවිධ පුරුෂාර්ථ සාධනයක් සඳහාම ශක්තිය ඇතත් මිනිසා මිනිසුන් අතර සැරිසරද්දී මුහුණපාන අනෙකාකාර සංඝට්ටන හේතුවෙන් ගුණාත්මක, බුද්ධිමය දෙඅංශයෙන්ම අවප්‍රමාණ වෙයි. එය කිසිසේත් මනුෂ්‍යත්වය පිළිබඳ සාරාධිගමයක් නොවන අතර පරාජිත භාවයක් පමණකි. එනිසා සමාජගත පුද්ගලයා මනුෂ්‍යත්වය අපරාජිතව පවත්වා ගැනීම සඳහා බුද්ධිමත්වූත්, විචාරාත්මකවූත් ප්‍රයත්නයකින් නිරන්තර විය යුතු බව බුදුදහම පෙන්වා දී තිබේ. මේ සඳහා අනුගමනය කළ හැකි ශ්‍රෙෂ්ඨ පිළිවෙත් දෙකක් මා උපුටා දැක්වූ ඛග්ගවිසාණ භාෂිතයෙන් ප්‍රකට වෙයි. මිනිසා මිනිසුන් නිසා අසීරුවට, අනතුරට, අවපාතයට නොවැටී පුරුෂාර්ථ සාධනයෙහි තත්පර වන්නේ නම් ඔහු එක්කෝ බහුශ්‍රැත, ධර්මධර, ප්‍රතිභාපූර්ණ උළාර මිතුරන්ගේ ඇසුර ලැබිය යුතුය. නැත්නම් කඟවේණ අඟක් මෙන් එකචාරී විය යුතුය.

එකචාරී වීම සැම දෙනා විසින්ම නොකළ හැකි බැරෑරුම් කර්තව්‍යයක් හෙයින් අප විසින් අප ජීවත්වන සමාජය තුළ මිනිසුන් සේවනය, භජනය, පර්යුපාසනය සුපරීක්ෂාකාරීව කළ යුතුය.

...WA AFFILIATED UNIVERSITY ... LIBRARY
REFERENCE

කදවළලු මෙන් සමාජයේ සැරිසරන මායාකාරීන්ට ගොදුරු නොවී අඩුම තරමින් ආත්මහිතව, පරහිතකාමී පුද්ගලයන්ගේ ඇසුර ලැබීමට උත්සුක වීම මිනිස් මහිමය රැක ගැනීමකි. එම ඇසුරෙන් ලැබෙන අවවාදයත් ආදර්ශයත් බුද්ධිවර්ධනයට මෙන්ම චරිතවර්ධනයට හේතුකාරක වන හෙයිනි. සාධුකාරක චර්යාවෙහි නිරත පුරුෂශ්‍රේෂ්ඨයන් සමාජයට ආශීර්වාදයක් වන අතර හඳුනා ගැනීම වාසනාවකි. හඳුන්වාදීම මාහැඟි සමාජ සංග්‍රහයකි. ඉත්තෑපාන හාමුදුරුවන් ඉටු කොට ඇත්තේ ඒ උසස් සමාජ සංග්‍රහයයි.

මේ පොතෙන් විවරණය වන්නේ ආනන්ද මෛත්‍රෙය මහනාහිමියන්ගේ චරිතයයි. එය අසා, කියවා දන හැඳින ගැනීමට පාඨකලෝකයට අවස්ථාව සැලසී ඇති හෙයින් පුනරුච්චාරණයක යෙදීම අනවශ්‍යය. අර ගාථා දෙපදය මගේ සිහියට ආවේ එම චරිතකථාව පුරාම ලියැවී කියැවී ඇති කරුණු සමුදයයෙන් එම චරිතාපදානයෙහි අන්තර්හිත, ලෝකපූජිත, බහුශ්‍රැතතාව, ධර්ම ධාරිත්වය, උළාරමිත්‍රතාව සහ ප්‍රතිභානයම ධ්වනිත වන හෙයිනි.

තවත් පැත්තකින් බලතොත් මෙම අපදානය දහනව වන සියවසේ අගත් විසිවන සියවසේ අගත් එකට යා කොට ප්‍රත්‍යක්ෂයෙන් ලියූ අප රටේ ඉතිහාසය ද වෙයි. මෙදැතුර ගම - නගරය, පුද්ගලයා - සමාජය, ගිහියා - පැවිද්ද, පාසැල - පිරිවෙන, ගුරුවරයා - ශිෂ්‍යයා, අධ්‍යාපනය - ආගම, ජීවනය - චින්තනය ආදි විවිධාංශාගත අප්‍රකට, විචාරාත්මක, එමෙන්ම අද හෝ පුනරීක්ෂණය කොට බැලිය යුතු ඓතිහාසික කරුණු සමූහයක් නිරාවරණයව ඇත්තේය. මේ පිළිබඳව පොතේ අංක 3 "එද අවුරුදු නවයකින් ලැබූ අධ්‍යාපනය අද විස්සකින් වත් ලබන්න බැහැ" (26-36 පිටු), අංක 10 "ධර්මපාලතුමා සමඟ වාද කරලා දිනන්න අමාරුයි" (107-118 පිටු), අංක 12 "ඉංග්‍රීසි ආණ්ඩු කාලේවත් භික්ෂූන් වහන්සේලාට මෙහෙම කරදරයක් වුණේ නැහැ" (126-142 පිටු) යන ලිපි විශේෂයෙන් පාඨකයාගේ අවධානයට යොමු කරවනු කැමැත්තෙමි.

නිදහස ලබා ගැනීමේ පටන් අප වරදවා ගත් තැන් නිසා අපේ ජාතික, ආගමික, සංස්කෘතික පරිහානියට මහ පැදුණ අයුරු, වාර්ගික, ආගමික, පන්තිභේදවාදී අධ්‍යාපන ආයතන, විෂයමාලා

අනුකරණය කරමින් සාම්ප්‍රදායික, පෞද්ගලික අධ්‍යාපන ක්‍රමයෙන් මහ හැරීම වර්ගවාදී ආගම්වාදී අදහස් මෝරා රටේ සාමය, සමගිය, සංවරය බිඳී ගිය සැටිත් මෙහි සාකච්ඡාවී ඇති කරුණුවලින් මනාව පිළිබිඹු වන අතර, ඒවා කිසිදු ආදනගාහිත්වයකින් තොරව, උපේක්ෂාවෙහි පිහිටා, යථාර්ථය පෙන්වාදීමේ සැබෑ හිතකාමයෙන් විග්‍රහ කොට ඇත්තේය. මෙතෙක් කරුණු අනුව මෙම චරිතාපදානය, කාව්‍යයක්, ඉතිහාසයක්, බණ පොතක්, හිතෝපදේශයක් වශයෙන් හඳුන්වාලීමට මම කැමැත්තෙමි.

එවැන්නකට ඉඩ සැලසූ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේත්, එය සම්පාදනය කළ ඉත්තෑපාන ධම්මාලංකාර හිමියනුත්, ප්‍රකාශනයට සහාය වූ ඇමරිකාවේ ලොස්ඇන්ජලීස්හි පී. එම්. සරච්චන්ද්‍ර දෙස්තර මහතාත් අත්‍යවශ්‍ය සමාජසංග්‍රහයකින් ලත් මහාපිනක කොටස් කරුවෝ වෙති.

බෙල්ලන්විල විමලරතන ස්ථවිර

රජමහ විහාරය,
බෙල්ලන්විල

WA AFFILIATED UNIVERSITY
REFERENCE
- LIBRARY -

# පිළිගැන්වීම

මගේ ගුරුදේවෝත්තම ශ්‍රී සද්ධර්මවාගීශ්වර
ගරු තලවතුගොඩ ධම්මාලොකාභිධාන
සීතාදී සිව් කෝරළයේ
ප්‍රධාන සංඝනායක මාහිමිපාණන් වහන්සේට

# පටුන


1. මවු තුරුලේ උණුසුම මට ලැබුණේ සති දෙකයි 1

2. මා මහණ නොකළොත් කොහේ හරි පැනලා යනවා 16

3. එදා අවුරුදු නවයකින් ලැබූ අධ්‍යාපනය
අද විස්සකින්වත් ලබන්න බැහැ 26

4. සහසතු දේපල ක්‍රමය කොමියුනිස්ට්ද? 37

5. බුරුමයේ ෂට්ඨ මහාසංගායනාවට සහභාගිවන්ට
ලැබීම වාසනාවක් 50

6. චිත්ත බලය දියුණු කොට කළ වශී කර්ම 58

7. භාරතීය යෝගීන් සමග 70

8. පැරණි බණ පොතේ මාර කථාව මා පිළිගන්නවා 86

9. මගේ විදේශ ධර්මදූත සේවය 100

10. ධර්මපාලතුමා සමග වාද කරලා දිනන්න අමාරුයි 107

11. ක්‍රිෂ්ණමූර්ති සහ සායි බාබා සමග 119

12. ඉංග්‍රීසි ආණ්ඩු කාලෙවත් භික්ෂූන් වහන්සේලාට
මෙහෙම කරදරයක් වුණේ නැහැ 126


13. කතරගම දෙවියන් මගේ ඇස් දෙකෙන්ම දැක්කා 143

14. මා ලොවුතුරා බුදුබව පිණිස පාරමිතා පුරන කෙනෙක් 156

15. මෙම ග්‍රන්ථය ප්‍රථම මුද්‍රණයෙන් දොරට වැඩූ ද
අතිපූජ්‍ය ආනන්ද මෛත්‍රෙය මහනාහිමියන් විසින්
පැවත්වූ දේශනය. 171



...LUWA AFFILIATED UNIV...
REFERENCE
LIBRARY



අතිපූජ්‍ය බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහනාහිමියන්ගේ අත් අකුරු

# 1

# මවු තුරුලේ උණුසුම මට ලැබුණේ සති දෙකයි

මා මේ ලියන්ට සූදනම් වන්නේ තවත් අවුරුදු හතරක් ගෙවී ගිය විට ශතවර්ෂයක් (අවුරුදු 100) දීර්ඝවූ ජීවන ගමන් මග ගෙවා සම්පූර්ණ කරන අතිපූජ්‍ය බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ පිළිබඳවයි. මෙය තවත් අවුරුදු හතරකින් එනම් 1995 දී මට ලියන්ට ලැබුණේ නම් ඒ ගැන මම වඩාත් සතුටු වෙමි. නමුත් එය මට ස්ථිර නැත. එසේද වුවත් අතිපූජ්‍ය බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට නම් තමන් වහන්සේ තවත් අවුරුදු හතරක් නොව හතරේ හතරකටත් වැඩි ප්‍රමාණයක් ජීවත්වන බව නම් ස්ථිරය, පැහැදිලිය. තවත් අවුරුදු දහයකින් පහළොවකින් උන්වහන්සේ පිළිබඳ ජීවන තොරතුරු ටිකක් ලියන්නට කාට හෝ අවස්ථාව ඉතිරි කර තබමින් මම මෙය ආරම්භ කරමි.

මෙතෙක් ජීවන තොරතුරු අසා, දනගෙන ලියූ හුරු පුරුදු ක්‍රමය මෙහිදී හුහක් දුරට මට අමතක කරන්ට සිදුවිය. ආරම්භයේ සිට බොහෝ වේලා ගතවන තෙක් ඇසිය යුතු තරම් ප්‍රශ්නයක් මගේ සිතට ආවේම නැත. උන්වහන්සේ ඒ ජයවඩනගම චිත්ත විවේකාශ්‍රමයේ හාන්සි පුටුවක වැඩ ඉඳිමින් ශතවර්ෂයකට ඉතාම ආසන්නවූ ඒ දීර්ඝ ජීවන ගමනේ රසවත් තොරතුරු කියන්ට පටන් ගත්හ. ඉඳ හිට සුළු ප්‍රශ්නයක් නැගීම පමණි මා කළේ.

"මෙතෙක් මගේ සම්පූර්ණ ජීවන තොරතුරු එක දිගටම කාටවත් කියා නැහැ. දන් මම මගේ ජීවන ගමන පිළිබඳ තොරතුරු සම්පූර්ණයෙන්ම කියන්නම්. ඔක්කෝම ලියන්න. ඒකෙනුත් ඉතින් කාට හරි වැඩක් වෙයිනේ."

"එහෙමයි, මහානායක හාමුදුරුවනේ, ඉඩ කඩ ඇති විදියට මා එන්නම්; හමුවෙන්නම්. සියල්ලම වදරන්න"යැයි මම ආදරයෙන් හා ගෞරවයෙන් කීවෙමි.

"මා උපන්නේ 1896 අගෝස්තු මාසයේ 24 වෙනිද. සිංහල ක්‍රමයට 23 වෙනිද විය හැකියි. බළන්ගොඩ ආසන්නයේ පුංචි ගමක් තියෙනවා, කිරිදිගල කියලා. බැලුවාම ඒක ගමකුත් නොවෙයි. ගෙවල් මණ්ඩියක් විතරයි. ඒ ගමේ ඉඳලා මහ පාරට යන්න පාරක් තිබුණෙත් නැහැ. ඇලවේලි දිගේ නියරවල් දිගේ තමයි ඒ කාලේ ගියේ. ඉංග්‍රීසීන්ට විරුද්ධව නොයෙක් විදියේ සටන් කළ අයත් හැංගිලා හිටියේ මේ ගමට ඇවිදිල්ලා. ඒකට හේතුව මේ ගමට යන්න එන්න පහසුකම් නැති කමයි. කොටින්ම පාරවල් නැති කමයි. දැන්නම් මේ හරිය හුඟක් දියුණුයි. පාර අද්දරත් ගෙවල් හදාගෙන විශාල පිරිසක් පදිංචිවෙලා ඉන්නවා."

"මගේ පියාට වැඩිමල් සහෝදරයෙක් හිටියා. එයා තමයි ඩිංගිරිහාමි. දිනෙස්හාමි කියලත් කියනවා. කලක් මහණවෙලා සිට සිවුරු හළ කෙනෙක්. හොඳට ගොවිතැන් බත් කටයුතු කරගෙන තමයි ඒ අය ජීවත් වුණේ. මගේ පියාගේ මව මාතර කෙනෙක්. පියාගේ පියා හතර කෝරළේ කෙනෙක්. මගේ පියාගේ නම මද්දුමහාමි. පසුකාලයේ පියා මෙතියස් අප්පුහාමි නමින් ප්‍රසිද්ධවී සිටියා. මගේ මවගේ නම හීන්මැණිකේ. මා මෙලොවට බිහි කරලා මගේ අම්මා සති දෙකකින් මිය පරලොව ගියා. අම්මා බෙන්තර ආරච්චිගේ පරපුරෙන් පැවත එන කෙනෙක්. ඇය සැදැහැවත් භක්තිමත් උපාසිකාවක්."

"අපේ ගේ ළඟම තිබුණා බෝමළුවක්. අම්මා හැමදාම උදේ සවස බෝධීන් වහන්සේට වඩින්න ඔය බෝමළුවට යනවාලු. ගිහිල්ලා බෝධීන් වහන්සේ වටා හොඳින් අතුපතුගාලා මල් පහන් පූජා කරලා ප්‍රාර්ථනාවකුත් කරනවලු. ඒ ප්‍රාර්ථනාව තමයි, 'මට මහණ කරන්න පුතකු ලැබෙන්න ඕන' කියන එක."

"ඒ කාලයේ මහනුවර පලීපාන වලව්වෙන් මහණ වෙච්ච කෙනෙක් හිටියා. ඒ හාමුදුරුවන් ඉතාම සිල්වත් ගුණවත් ධුතාංගධාරී කෙනෙක්. ඒ හාමුදුරුවන් හැමදාම වගේ අපේ ගෙදරට පිණ්ඩපාතේ වඩිනවා. මගේ අම්මා ඒ හාමුදුරුවන්ට ආරාධනා කරනවා, ගේ ඇතුළට වඩින්න කියලා. වැඩියාම ආසනයක වඩා හිඳුවලා, වැඳලා, පිණ්ඩපාතෙ පිළිගන්වනවා. පිණ්ඩපාතේ පිළිගන්වලා එතනදීත් ප්‍රාර්ථනාවක් කරනවා, 'මට මහණ කරන්න

පුතකු ලැබෙන්න ඕනෑ' කියලා. ඒ වනවිට මගේ අම්මට අවුරුදු විස්සක් විතර ඇතිලු.

"මගේ පියා හරිම සැඩපරුෂ කෙනෙක්. කිසිම කෙනෙකුට කීකරු කරන්න බැරි මහා දරුණු කෙනෙක්. නමුත් අපේ අම්මට නම් හරිම කීකරුයිලු. ඒ කාලයේ පොලීසියේ මහත්තුරුත් අපේ තාත්තට බයයි. දවසක් පොලීසියේ මහත්තුරු කීප දෙනකුට ටවුමෙදි ගහලා ඒ අයගේ තිලතොප්පි පවා, ගලවගෙන පුච්චලා දැම්මලු. එහෙම කරලා ගෙදර ආවලු. ඒ කරපු වැඩේට ලොකු නඩුවකුත් තිබුණලු. නඩුවට ගියාම තාත්තා කරපු දේ ගැන නඩුකාරයා ස්තුති කරලා තියෙනවා. නමුත් පොලිස් නිලධාරීන්ගේ හිස්වැසුම් ගිනි තැබීම රාජද්‍රෝහී ක්‍රියාවක් නිසා ඒකට දඬුවම් වශයෙන් රුපියල් පහක් දඩ ගහලා තියෙනවා. පුදුම විදියේ ශරීර ශක්තියක් තමයි තාත්තට තිබුණේ. දහයක් දොළහක් ආවත් ඔක්කොටම ගහලා පන්නනවා. නමුත් මගේ අම්මා මීට හාත්පසින්ම වෙනස් කෙනෙක්. ඇය හරිම කාරුණික අහිංසක තැනැත්තියක්."

"අපේ ලොකුඅම්මටත් දරුවන් හිටියේ නැහැ. ලොකු අම්මා කියන්නේ ලොකු තාත්තගේ භාර්‍යාව, නෑ කමට අම්මගේ අක්කා. එයාටත් ළමයි නැති නිසා හැමදම වගේ මගේ අම්මා හම්බවෙන්න ඇවිත් කියනවා, 'ළමයෝ උඹට දරුවකු ලැබුණොත් මට දීපන්' කියලා, මේ අක්ක නගෝ දෙන්නා හරිම ස්නේහවන්තයි. කොහොම නමුත් බේරෙන්න බැරිම තැන මගේ අම්මා පොරොන්දු වෙලා තියෙනවා, දරුවකු ලැබුණොත් දෙනවා කියලා. එතෙන්දි ලොකුඅම්මා කියලා තියෙනවා, 'දරුවා උපන් හැටියේම බාර දෙන්න ඕනෑ කියලා'. ඒ වෙලාවේ මගේ අම්මා කියලා තියෙනවා, 'පිරිමි දරුවෙක් ලැබුණොත් මහණ කරන්න පොරොන්දු වෙනවානම් විතරක් බාර දෙනවා' කියලා. 'ගෑනු ළමයෙකු ලැබුණොත් කැමැත්තක් කරන්න' කියලත් කිව්වලු."

"අම්මට මාව ලැබෙන්න කලින්නුත් සිහිනෙන් පවා පෙන්නුම් කරලා තියෙනවා, මාව ඉපදිලා වැඩි දවසක් අම්මා ජීවත් වෙන්නේ නැහැ කියලා. ඒ බව අම්මා අනික් අයටත් කියලා තියෙනවා. මා උපදින වෙලාවේ ලොකුඅම්මා තමයි සාත්තුවටත් එක්ක අම්ම

ළඟ ඉඳලා තියෙන්නේ. මා ඉපදිලා ටික වෙලාවකින් අම්ම මාව ලොකුඅම්ම අතට දුන්නලු 'මෙන්න මා වෙච්ච පොරොන්දුව ඉටු කරනවා' කියලා. කොහොම නමුත් මට මවු තුරුළේ ඉන්න ලැබිලා තියෙන්නේ දින දහතරක් විතරයි. අම්මා ලොකුඅම්මට කිව්වලු 'අක්කේ මත් ඉක්මනින් මැරේවි, මේ ළමයා උඹට අයිතියි.' කියලා. 'හැබැයි පෝරොන්දු හැටියට නොවරදවාම මේ ළමයා මහණ කරන්නත් ඕනෑ' කියලා කිව්වලු. මේ විදියට කියලා සති දෙකකට පස්සේ අම්මා මැරුණලු."

"මගේ තාත්තා අම්මා මැරුණ නිසා ඒ පළාතේ ඉන්නෙ නැතිව වෙන පළාතකට ගියාලු..තාත්තා නිවිතිගල ගිහිල්ලා එහෙ පදිංචි උණාලු. ඇත්තෙන්ම මා හැදුණේ ලොකුඅම්මා ළඟ. නමුත් අවුරුදු කීපයක් ගතවෙන කල්ම මේ මගේ අම්මා කියලමයි ලොකුඅම්මා ගැන මට හිතුණේ. අම්මා නෙවෙයි කියන හැඟීමක් ඇති වුණේම නැහැ. ලොකුඅම්මා ඒ තරමට පරෙස්සමෙන් තමයි ක්‍රියා කළේ. වයස අවුරුදු හතර වනවිට තමයි මට යන්තම් වැටහුණේ මේ මගේ අම්මා නොවෙයි කියලා. මා ලොකුඅම්මා ළඟ ඉතාම සැපෙන් වැඩුණා. මා ඉපදිලා මාස දහයක් විතර වෙනකොට සිදුවෙච්ච සමහර දේවල් මට මතකයි. එයින් කීපයක් මම කියන්නම්."

"මගේ මුත්තණුවන්ගේ මරණය මට හොඳට මතකයි. එයාගේ මරණයෙන් මාස හතකට විතර පස්සේ අපේ ගෙදරට සැතපුම් කාලකට විතර එහා ගෙදරක විශාල බලියක් තිබුණා. විශාල රූප රාශියක් හදල තිබුණු බවත් මට මතකයි. මාවත් වඩාගෙන ලොකුඅම්මා මේ බලිය බලන්න ගිය හැටි මට මතකයි. මාවත් කර තියාගෙන පඩි පෙළවල් නැග ගෙන, මහා කඳු නැග ගෙන ගිය ගමනකුත් මට මතක තියෙනවා. පසුව මා තේරුම් ගත්තා ඒ ගියේ සිරිපාදේ කියලා. ගෙදර සෙල්ලමෙන් හැදුණු හැටිත් මට මතකයි. විටින් විට මාව බලන්න පියාත් ඇවිත් ගියා. ලොකුඅම්මා මාව හැදුවේ ඇහැක් වගේ ආරක්ෂා කර ගෙන."

"අපේ ගෙදරට යන එන එක මාමා කෙනෙක් හිටියා. එයා හොඳ වයලින් වාදකයෙක්. අනික් මාමා හොඳ තබ්ලා වාදකයෙක්. මේ නිසා මාත් හැදුණේ හරිම විනෝදෙන්, සන්තෝසෙන්. මගේ

අම්මා මාව මේ ලෝකයට බිහි කරලා සුමාන දෙකකින් විතර මැරුණ නිසා මට කිරි බීමත් බරපතළ ප්‍රශ්නයක් වුණා. ඔය අතර පහළ ගෙදර නැන්දටත් මා උපන්දට පසුවද දුවක ලැබුණා. ඒ නැන්ද එයාගෙ දුව එක පැත්තකත්, අනික් පැත්තේ මාවත් තියාගෙන තන දෙකෙන් අප දෙන්නට කිරි දුන්නලු. ඒ නැනා මට වඩා බාල එක දවසකටයි. ඇගේ නම රත්මැණිකේ. ඒ ගොල්ලෝ හුඟාක් දේපොළ තියෙන පොහොසත් අය. ඒ නැනගේ මැණියන් මට මගේ මැණියන් තරමටම ආදරෙන් තමයි කටයුතු කළේ. මා එංගලන්තයේ සිටියදී මීට අවුරුදු දෙකකට කලින් ඒ රත්මැණිකෙ මිය ගිය බව දැන ගන්න ලැබුණා."

"ඇයට අවුරුදු අනූහතරක් වෙන්න ඇති. අප දෙන්නගේම කේන්දර දෙක හුඟාක් දුරටම සමානයි කියලත් ඒ දවස්වල හැමෝම කිව්වා. කලකට පෙර ඉන්දියාවේ නාඩි වාක්‍යය අහන්න ගිය මට ඉස්සෙල්ලාම කිව්වේ රත්මැණිකේගේ නමයි. මා ඒ වෙලාවේ කිව්වා, ඒ ළඟම මගේ නමත් ඇති කියලා. ඒ වගේම ඒ ළඟම තිබුණා. මගේත් ඇගේත් අල්ලේ රේඛාවල පුදුම සමාන කමක් තිබුණා. ඇය තමයි බළන්ගොඩ පිරිවෙනේ විහාර මන්දිරයේ බුද්ධ ප්‍රතිමාව සෑදෙව්වේ. ඒ පරපුරේ අය අදත් මට හරියට සලකනවා. හැබැයි අපේ මේ පරම්පරාවල පරණ අයගෙන් අද ඉන්නේ මා විතරයි. අනික් අය වයස අවුරුදු පනහට අඩු අයයි වැඩිපුර ඉන්නේ."

"මට වයස අවුරුදු හයේදී තමයි නැකතට අකුරු කියෙව්වේ. මට අකුරු කියෙව්වේ හීන්හාමි කියන එක්කෙනා. එයා ඒ කාලයේ ඒ පළාතේ හිටිය හොඳම නක්ෂත්‍ර කාරයා. ඒ වෙනකොටත් එයා හරිම වයස් ගත කෙනෙක්. මට අකුරු කියවන නැකත හැදුවෙත් එයාමයි. මගේ උපන් වෙලාව අනුව කේන්දරය හැදුවේ පණ්ඩිතසේකර කියන එක්කෙනා. එයත් හරිම දක්ෂ නක්ෂත්‍ර කාරයෙක්. එද කේන්දර හදලා පුස්කොළවල ලියලත් තියෙනවා. මේ උපන් වෙලාවේ හැටියට මේ කේන්දරය අයිති එක්කෙනා ගිහි ජීවිතයේ හිටියොත් නීතිඥයකු හරි නඩුකාරයකු හරි වෙනවා කියලත්, බරපතළ පැවිදි යෝගයකුත් තියෙන නිසා පැවිදි වුණොත් කීර්තිමත් පැවිද්දෙකු වෙනවා කියලත් ලියලා තිබුණා. ඒ විතරක් නොවෙයි රටට ලෝකයට සේවයක් කරන පුද්ගලයකු වෙනවා

කියලත් ලියලා තිබුණා. අදත් බලන්න පුළුවන් අන්න කේන්දරේ පුස්කොළේ ලියපු එක තියෙනවා.''

''ඉතින් මටත් රත්මැණිකෙටත් කිරි දුන්න රත්මැණිකෙගේ මැණියන්ගෙ කිරි අවසන් වී ගෙන ගියා. වාසනාවකට වගේ ඒ නැන්දගේ සහෝදරියකටත් දරුවකු ලැබුණා. එයාවත් මෙහාට ගෙන්නා ගත්තා. ඊ ළඟට මට කිරි දුන්නේ එයාගෙන් තමයි. ඉතින් ඒ කාලයේ තිබුණේ මව්කිරි විතරයිනේ. පිටිකිරි නැහැනේ. යන්තම් මට ඇවිදින්න පුළුවන් වෙනකොට ළඟ ගෙදරක එළදෙනකට පැටියකු ලැබුණා. ඒ එළදෙනගේ කිරි දොවා ගත්ත ගමන්ම කිසිම රත් කිරීමක් නැතිව මට බොන්න දුන්නා. කිරි දොවා ගත්ත හැටියේම රස්නේ පිටින්මයි මට බොන්න දුන්නේ.''

''වයස අවුරුදු හය වනවිට ළඟම තියෙන කතෝලික පාසලට මා යැව්වා. බළන්ගොඩ කිරිදිගල පල්ලියට අයත් ඒ කතෝලික පාසල පාලනය කළේ 'වොලින්' කියන පූජකතුමා. එතුමා හරි හොඳ කෙනෙක්. හරිම කරුණාවන්ත කෙනෙක්. එතුමා එක්කෝ බෙල්ජියන්, නැතිනම් ප්‍රංශ. ඒ ස්කෝලේ ගිහි ගුරුවරුන් දෙන්නෙක් හිටියා. මා මේ පාසලට යැව්වේ ගේ ළඟම තියෙන නිසයි.''

''මාස කීපයකට පස්සේ මා බළන්ගොඩ රජයේ කුමාර විද්‍යාලයට යැව්වා. ගෙදර ඉඳලා කුමාර විද්‍යාලයට යන එක දුර ගමනක්. ඒ නිසා මගේ පියාගේ තුඹගොඩ තියෙන වෙළඳ සැලේ මා නතර කළා. එහි ඉඳීම නම් මට හරිම පාළුවක් වුණා. ඒ පරිසරය මට එච්චර ප්‍රිය එකක් වුණේ නැහැ. මා පුරුදු වෙලා හිටියේ ළමයි කට්ටියත් එක්ක වතුවල, කුඹුරුවල, පිට්ටනිවල සෙල්ලම් කරමින් කාලය ගත කරන්නයි. ඉතාම නිසංසල පරිසරයකටයි මා හුරුවෙලා හිටියේ. කුරුල්ලන්ගේ මිහිරි නාදය අසමින්, දත් බෝච්චියා කමින්, සෙල්ලම් කරමින් සිටිය ඒ නිසංසල පරිසරය නැතිවීම මට මහත්ම වේදනාවක් උණා. වෙළඳ සැලේ නතරවී සිටීම ඇත්ත වශයෙන් මට හිරගෙදරක ඉඳීමක් කියලයි හිතුණේ. වෙළඳ සැලේ ඉඳලා පාසලට හැතැප්මක් විතර දුරයි.''

''ටික දවසක් මේ විදියට පාසල් ගියා. කුමාර විද්‍යාලයට යටි පැත්තේ ඒ ළඟම මගේ පියාට අයිති තවත් වෙළඳ සැලක් තිබුණා. ඒක තිබුණේ මගේ ආතා කෙනෙකුගෙයි මාමා කෙනෙකුගෙයි

පාලනය යටතේ. ඒ ආතා හේරත් මුදියන්සේලාගේ බණ්ඩප්පුහාමි. එයා කඩුපිටි මාදම්පේ කෙනෙක්. ඒ වගේම එයා කලක් පැවිදිවෙලා ඉඳලා සිවුරු හළ කෙනෙක්. එයාගේ බාරෙට මා පත් කරලා ඒ වෙළඳ සැලේ මා නතර කළා. එතන ඉඳලා පාසලට යන්නත් පහසුයි. කුඩා කල ඉඳලාම මා චණ්ඩයි, පරුෂයි, බොහොම දඟකාරයි. එවගේම හිතුවක්කාරයි. මට අද හිතෙනවා ඒකට හේතුව මා ඕනෑවට වඩා හුරතල් කළ නිසා ද කියලා."

**"මහානායක හාමුදුරුවන්ගේ තාත්තාත් හුඟාක් චණ්ඩයි, පරුෂයි කිව්වනේ, ඉතින් ටිකක් හරි පුතාටත් එන්න ඕනෑ නේද?"**

මහානායක හාමුදුරුවෝ මුහුණ පුරා විහිදී ගිය සිනාවකින් "ඔව් එහෙමත් වෙන්න පුළුවන්" යැයි කීහ.

"මා මේ වෙළඳ සැලේ නතර වුණාට පස්සේ ආතගේ ආශ්‍රය නිසා ක්‍රම ක්‍රමයෙන් වෙනස්වුණා. මා නතරවෙලා හිටිය ඒ වෙළෙඳ සැලේ මැද ලොකු ශාලාවක් තිබුණා. ආතා හැමදම රාත්‍රියට ඔය ශාලාව මැද විශාල ගිනි කබලකුත් තියාගෙන ගිනි තපිනවා. මාත් ඉතින් එතනට ළංවෙලා ගිනි තපිනවා. ඔය ගිනි තපින අතර ආතා මට නොයෙක් නොයෙක් කතන්දර කියා දෙනවා. ආතා ඒ වෙලාවට මට අවවාද කරනවා. දවසක් මට කිව්වා 'සතුන් මරන්න එපා, බොරු කියන්න එපා, කාටවත් හිංසා පීඩා කරන්න එපා' කියලා. ආතා එහෙම කියනකොට මා ඇහුව්වා, 'හොඳයි ආතේ, ඒවා නොකර ඉන්න කොට මොකද වෙන්නේ?' කියලා. ආතා එකවරටම කිව්වා 'ඒවා නොකර හිටියොත් දිව්‍ය ලෝකයට යනවා' කියලා. එතකොට මා ඇහුව්වා, 'කවද්ද දිව්‍ය ලෝකයට යන්නේ?' කියලා, 'ලොකු වුණාම තමයි දිව්‍ය ලෝකෙට යන්නේ' කියලා ආතා කිව්වා, මා හිතුවා ඒ වෙලාවේ ලොකු වුණාම දිව්‍ය ලෝකෙට යනවා කියන්නේ 'ලොකු වුණාම උඩට යනවයි' කියලා. මා හිතුවේ දිව්‍ය ලෝකේ තියෙන්නේ උඩයි කියලා. ඊ ළඟට මා ආතාගෙන් ඇහුවා, දිව්‍ය ලෝකේ රතිඤ්ඤ, වීනපටස් එහෙමත් තියෙනවද කියලා? ආතා කිව්වා, 'දිව්‍ය ලෝකේ හොඳ හොඳ සෙල්ලම් තියෙනවා, මෙහේ තියෙන රතිඤ්ඤවලට, වීනපටස්වලට වඩා හොඳ ඒවා දිව්‍ය ලෝකේ තියෙනවා කියලා. හැමදම රාත්‍රියට ගිනි තපින වෙලාවට මා අහන ප්‍රශ්නවලට ආතා ඔය විදියට

උත්තර දෙනවා. මාත් ඒවා හොඳට අහගෙන ඉන්නවා. ආතා මේ කියන ඒවා අහගෙන ඉන්න කොට මා හුඟක්ම වෙනස් වුණා කියලයි මට හිතෙන්නේ.''

''මා ඔය නතරවෙලා හිටිය වෙළඳසැලේ ඉඳලා හැතැක්ම අරික්කාලක් විතර එහායින් තියෙනවා, රාමඤ්ඤ නිකායේ පන්සලක්. ආතයි, තවත් අයයි ඔය පන්සලට සිල් ගන්න යනවා. ඒ යනකොට මාවත් අඬගහගෙනයි යන්නේ. මාත් තවත් ළමයින් ටික දෙනෙකුත් අඬගහගෙන ආතත් සමග පන්සලට යාම සිරිතක් කර ගත්තා. ඒ ගියාම අපට ආතා තමයි ගාථා කියලා දෙන්නේ. හැමදාම නිදන්න ගියාමත් ආතා පිරිත් හෙමත් කියනවා. මටත් ටික ටික ඒවා කියලා දුන්නා. හැමදාම නිදගන්න ඉස්සරවෙලා ආතා සතිපට්ඨාන සූත්‍රය කටපාඩමින් කියාගෙන යනවා. මාත් ඉතින් ඕක හැමදාම අහගෙන ඉන්නවා. ඔහොම අහගෙන ඉන්න කොට මටත් තැන් තැන්වලින් එක එක කෑලි කටපාඩම් හිටියා.

''මේ වෙනකොට වෙච්ච ඉතාම වැදගත් සිද්ධියක් මට මතකයි. ඒක තමයි ලංකාවට ඉස්සෙල්ලාම කාර් එකක් ගෙනාපු සිද්ධිය. එංගලන්තයෙන් ඒක එවලා තිබුණේ, එකල ලංකාවේ හිටිය බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයාටයි. මට මතක හැටියට ඒ ආණ්ඩුකාරයාගේ නම 'සර් හැන්ස් බ්ලේක්'. මේ ඉබේ දුවන කරත්තයෙන් කොළඹ ඉඳලා බදුල්ල දක්වා යනවා කියලා පත්තරවලත් පළවෙලා තිබුණා. ඒ කාලයේ සතිපතා පත්තර කීපයක් තිබුණා. සඳරැස, රිවිකිරණ, ලක්රිවිකිරණ, ඥානාර්ථ ප්‍රදීපය විශේෂයෙන් සඳහන් කරන්න පුළුවන්. ඔය ඔක්කෝම පත්තරවල මේ කාරණය පළ කරලා තිබුණා. ඔය කාලයේ දිනපතා පත්තර එකක්වත් නැහැ. කොළඹ ඉඳල බදුල්ල දක්වා මේ ඉබේ දුවන කරත්තය, බොහොම හෙමින් තමයි ගමන් කළේ. ප්‍රසිද්ධ නගරවලට ස්ථානවලට ඒ ඒ දිනවල පැමිණෙන බව ටැලිග්‍රෑම් මගින් කලින් දන්වා එවා තිබුණා. පැල්මඩුල්ලටත් බළන්ගොඩටත් ඒ විදියට දන්වලා තිබුණා. බළන්ගොඩට එන බව කලින් දන්වා එවා තිබුණ නිසා හැතැක්ම දහය දොළහ තරම් ඈත ගම්බද ප්‍රදේශවලින් පවා සිය ගණන් පිරිස පැමිණිලා, පෙරහැරක් බලන්න තරම් ආශාවෙන් තමයි මේ ඉබේ දුවන කරත්තය බලන්න පාර දෙපැත්තේ රැස්වෙලා සිටියේ.''

"මට මතක හැටියට ඔය 1903 - 1904 විතර ඇති. අපේ ස්කෝලේ ලොකු මහත්තයත් උදේම ළමයින් රැස්කරලා කිව්වා, 'උතුමාණන් වහන්සේ අද එනවා ඉබේ දුවන කරත්තෙන්, පාර දෙපැත්තට වෙලා බලා ගෙන ඉන්න' කියලා. අපිත් ඉතින් උදේ ඉඳලම පාරට වෙලා බලාගෙන හිටියා. උදේ නවයට දහයට විතර උතුමාණන් වහන්සේ මහ ලොකු හතරැස් කරත්තයක් වගේ එකකින් පාර දෙපැත්තේ ඉන්න අයට අත වනමින් ගියා. හරියට ඒක ලොරියක් වගෙයි. දෙපැත්තේ තිරත් එල්ලලා තිබුණා. ඉස්සරහ ලොකු ලාම්පු දෙකක් තිබුණා. ඒ ලාම්පු එක්කෝ ගෑස් ලාම්පු, නැතිනම් භූමිතෙල් ලාම්පු වෙන්න ඕනෑ."

"ඊට පස්සේ කලක් යනකල් කාර් එකක් දැක්කේම නැහැ. හැබැයි ඒ කාලයේ ලොකු අශ්ව කරත්ත තිබුණා. ඒ එක කරත්තයක විස්සක් විතර යන්න පුළුවන්. ඒවා බළන්ගොඩ ඉඳලා හැන්දෑවේ හයට පිටත් වුණාම උදේ හය වනවිට කොළඹට යනවා. ඒ වගේම ඒ අශ්ව කරත්ත නතර කරන්න ස්ථාලත් තිබුණා. පැල්මඩුල්ලේදී, රත්නපුරයේදී, අවිස්සාවේල්ලෙදී, හංවැල්ලෙදී අශ්වයන් මාරු කරනවා. තවත් ඒ වගේම එකක් තිබුණ, ගොන් කෝච්චිය කියලා. ලොකු ගොන් දෙන්නකු බැඳගෙන තමයි ඒවා දැක්කුවේ. විටින් විට ඒ ඒ තැන්වලදී ගොනුන් මාරු කරනවා. මේ ගොන් කරත්තේ දහයකට විතර නැගලා යන්න පුළුවන්. හැබැයි මේවා යන්නේ බොහොම හිමින්."

"උතුමාණන් වහන්සේගේ ඉබේ දුවන කරත්තය දැක්කාම, අපි පොඩි ළමයි ඒ වගේ කරත්ත හදන්න පටන් ගත්තා. රෝදවලට තුල් ඉවරවෙච්ච තුල් රෝද ගත්තා. ඒ කාලයේ ගල්කූරු පෙට්ටි තිබුණා. ගල්කූරු ඉවරවෙච්ච පෙට්ටිත් අර ගත්තා. ඒ පෙට්ටිවලට අර තුල් රෝද හතරක් හයි කරලා අර වගේ කරත්ත හැදුවා. ඒ වුණාට ඒවා ඉබේ දුවන්නේ නැහැනේ. ආතගෙන් ඇහුව්වා 'කොහොමද ආතේ මේවා ඉබේ දුවන්නේ' කියලා. ආතා කිව්වා 'රැවලක් හයි කරන්න' කියලා. කඩදසි රැවලකුත් හයි කරලා හුළං හමන පැත්තට තිබ්බාම වේගයෙන් ඉබේ දුවන්න පටන් ගත්තා. රාත්‍රි නවය දහය වෙනකම්ම ඕව තමයි බොහෝ දවස්වල කළේ. සරුංගල් හැදීමත් හරි ආශාවෙන් කළා."

"ඔය අතර ත්‍රීරවුන්ඩ් ක්‍රීඩාවත් තිබුණා. ඒක ටැනිස් බෝලයෙන් කරන ක්‍රීඩාවක්. අපි ක්‍රිකට් ගහන්නත් ගියා. ඔය කාලෙත් සුදු මහත්වරු හරියට ක්‍රිකට් ගහනවා. අප පොඩි එවුන් වශයෙන් ඒ ක්‍රීඩාවත් කළා. පුට් බෝල් ගැහීමත් තිබුණා. මේවාට ළමයිනුත් පුරුදු වුණා. මේ කොච්චර ක්‍රීඩා තිබුණත් අපේ හොඳ විනෝදම වැඩේ තමයි සරුංගල් යැවීම. ඔය කාලයේ ළමයින් අතර පුදුම විදියේ සම්බන්ධ කමක් තිබුණා. සිංහල, දෙමළ, මුස්ලිම්, ලංසි කියන හැම ජාතියකටම අයිති ළමයි ඔක්කෝම එකට මිත්‍ර කමින් හිටියා. මේ විදියට එකට සිටීම නිසා ජාතිභේද හැඟීමක් ඇතිවුණේ නැහැ. ඒ වගේම කුලභේද හැඟීමක් ද ඇතිවුණේ නැහැ. හැබැයි ගෙවල්වල වැඩිහිටියන් අතර නම් කුලභේදයත් තිබුණා. ජාතිභේදයත් තිබුණා. නමුත් කඩේ, ටවුමේ, ස්කෝලේ ඒ මොකවත් තිබුණේ නැහැ. මාත් එක්ක ඉගෙන ගත්ත මුස්ලිම් ළමයෙකු හිටියා 'අබ්දුල් මජීද්' කියලා. අපි එයාට කියන්නේ 'අජුරු මජුරු' කියලා. මගේ හොඳම යාළුවා එයා තමයි. ළඟදී එයා මැරුණා."

**"හැම ජාතිකයන්ම එකට මිත්‍රව ජීවත් වීම නිසා ජාතිභේද කියන එක නැතිවෙලා යනවා නේද? ඒ විතරක් නෙවෙයි, කුලභේදයත්, ආගම් භේදයත් නැතිවෙලා යනවා නේද?"**

"ඇත්තෙන්ම ඔව්, ලොකු අය අතර මොන තරම් වෙනස්කම් තිබුණත් කුඩා කාලයේ ඉඳලාම යාළුකම් ඇතිවුණාම ලොකු වෙන කොටත් ඒ තත්වය එහෙමම තියෙනවා. පාසල් ජීවිතයේ තමයි ඔය යාළු මිත්‍රකම් ඇති වෙන්නේ. ඒ නිසා ජාති වශයෙන් වෙන වෙනම ස්කෝල හොඳ නැහැ. ආගම් වශයෙන් වෙන වෙනම ස්කෝල හොඳ නැහැ. එහෙම තියෙනකොට නිකම්ම බෙදිලා යනවා. කුඩා කාලයේ ඇතිවන මිත්‍රකම් ලේසියෙන් කඩන්න බැහැ. ඔය වෙනකොට මගේ වයස අවුරුදු නවයයි."

" මේ අතර සිද්දවෙච්ච විශේෂ සිද්ධියක් මම කියන්නම්. ඔය කාලයේ මහාබෝධි සමාගමේ ලේකම් වශයෙන් සිටියේ වලිසිංහ හරිශ්චන්ද්‍ර මහත්මයා. එයා බ්‍රහ්මචාරී කෙනෙක්. මගේ බාප්පා කෙනෙක් හිටියා, එයාගෙ නම ඇම්. ඒ. පුංචි මහත්මයා. එයත් මහාබෝධි සමාගමේ සාමාජිකයෙක්. එයා ධර්මපාලතුමාගේ වැඩ කටයුතුවලටත් හරියට උදව් දුන්නා. මේ අතර වලිසිංහ හරිශ්චන්ද්‍ර

බ්‍රහ්මචාරීතුමා බළන්ගොඩට ගෙන්නුවා. බළන්ගොඩ නොතාරිස් කන්තෝරුවේ තමයි නවාතැන් දුන්නේ. දැන් තැපැල් කන්තෝරුව තියෙන්නේ එතනයි. ඒ ගොඩනැගිල්ලත් අපේ බාප්පට අයිති එකක්. වලිසිංහ හරිශ්චන්ද්‍ර මහත්මයා දවස් දෙකක් ඒ ස්ථානයේ නතරවෙලා හිටියා. ඒ දවස් දෙකේ හවස්වරුවේ ස්කෝල ළමයින්ටත් දේශන පැවැත්තුවා. ඒ කාලයේ සිනමාව වෙනුවට තිබුණේ 'මැජික් ලැන්ටර්න්' පින්තූර. ඉස්සර වෙලා ඒවා අපට පෙන්නුවා. ඊට පසුව තමයි දේශන පැවැත්තුවේ. ඒ වගේම එතුමා ළමයින්ට හොඳ අවවාදත් දුන්නා."

"ලංකාවට පළමුවෙන්ම ගෙනා ග්‍රැමොෆෝන් යන්ත්‍රයත් මේ දේශන පැවැත්වීමේදී එතුමා යොදා ගත්තා. ඒක අපට අමුතුම දෙයක් වුණා. අනගාරික ධර්මපාලතුමා ඇමෙරිකාවේ ධර්ම ප්‍රචාරක කටයුතු වලට ගිය අවස්ථාවේ උන්නැහේට තෑගි ලැබුණු එකක් ඒක. දේශන පවත්වනවිට පාවිච්චියට ගන්න කියලා ඒක වලිසිංහ හරිශ්චන්ද්‍ර මහත්මයාට දීල තිබුණා. ඒකට හයි කරලා තිබුණේ බම්බුවක්. තැටි නෙවෙයි ඒකට දන්නේ. කතාවත් ඒ බම්බුවට ගන්න පුළුවන්. ඒ වෙලාවේම ඒවා ප්‍රචාරය කරන්නත් පුළුවන්. ඒකෙන් කවි ගාථා ශ්ලෝක කියවමින් තමයි එතුමා කතා පැවැත්තුවේ. ඒ කතා අපේ සිත්වලට තදින්ම කා වැදුණා. ඒ වගේම එතුමා කෙරෙහි පුදුම ආදරයක් ගෞරවයක් අප තුළ ඇතිවුණා. එතුමා කාරුණිකයි. තවුසකු වගෙයි. හැමදෙනාම එතුමාට ආදරය කළා. ධර්මපාලතුමා වගේ එතුමා සැර නැහැ. බෞද්ධ සංස්කෘතිය රැකගන්න, සිරිත් විරිත් රැක ගන්න, ජාතිය රැක ගන්න, මේ ආදී කරුණු තමයි එතුමා දේශනවලදී වැඩිපුර ප්‍රකාශ කළේ. කාටවත් විරුද්ධ වෙන්න කිසිවක් එතුමා කියන්නේ නැහැ. කවුරුවත් එතුමා සමඟ විරුද්ධ වුණෙත් නැහැ."

"එතුමා මෙහාට පැමිණි දෙවන දිනයේ උදේ මා ආතගෙන් ඇහුව්වා, 'කවුද ආතේ ඒ මහත්තයා?' කියලා. ආතා කිව්වා, 'එයා බුද්ධාගම දියුණු කරන්න වැඩ කරන කෙනෙක්' කියලා. ඒ වෙලාවේ මා කිව්වා, ලොකු වුණාම මටත් ඒ මහත්තයා වගේ වෙන්න ඕනෑ කියලා. බ්‍රහ්මචාරී කියන එක මට තේරුණේ නැහැ. පසුවද උදේ ආතා මා එක්කරන් ගියා හරිශ්චන්ද්‍ර මහත්තයා ළඟට. ගිහිල්ලා වලිසිංහ හරිශ්චන්ද්‍ර මහත්තයාට කිව්වා, මේ ළමයාටත් බ්‍රහ්මචාරී

ACCESSION NO 15018
CLASSIFICATION NO 922

කෙනකු වෙන්න ඕනැයි කියනවා, කියලා. එතුමා එකවරටම කිව්වා, 'හොඳයි මම බාර ගන්නම්' කියලා. අපේ තාත්තටත් මේ කාරණය කිව්වා. තාත්තා ඒ වෙලාවේ කිව්වා, 'මෙයා පුංචි ළමයෙක් නේ, ලොකු වුණාම මෙයා එවන්නම්' කියලා. එතැන් සිට හැමදම මා කිව්වා 'මාත් බ්‍රහ්මචාරී කෙනෙක් වෙන්න ඕනැ' කියලා."

"ඔය අතර තවත් වැදගත් සිද්ධියක් වුණා. අපේ වෙළඳ පොළ තිබුණේ තුන්මං හන්දියක් ඉදිරිපිට. ඔය කාලයේ මාසයකට සැරයක් වගේ මහවලතැන්නේ පන්සලට හාමුදුරු නමක් වඩිනවා. ආතා මේ හාමුදුරුවන් කඩේට වඩමවාගෙන ඇවිදිල්ලා වැඳලා ගිලන්පස එහෙමත් පිළිගන්වලා, ටික වෙලාවක් කතා කර කර ඉන්නවා. මේ හාමුදුරුවන් වැඩියාම මා ලවාත් ඒ හාමුදුරුවන්ට වන්දවනවා. බළන්ගොඩට සැතපුම් දෙකක් විතර එහායින් පිහිටි බෙලිගල ගල්ගුහා පන්සලේ තමයි මේ හාමුදුරුවන් වැඩ සිටියේ."

"මේ හාමුදුරුවන් තමයි එද පළාතේ වැඩ සිටිය උගත්ම හාමුදුරුවෝ. උන්වහන්සේගේ නම දෙණිහේනේ සීලානන්ද. මේ හාමුදුරුවෝ විදුරුපොළ රතනජෝති මහානායක හාමුදුරුවන්ගෙන් සිංහල, පාලි, සංස්කෘත හොඳට ඉගෙන ගෙන හිටියේ. සීලානන්ද හාමුදුරුවන්ගේ ගුරුවරයා තමයි දමහනේ ධම්මානන්ද හාමුදුරුවෝ. සීලානන්ද හාමුදුරුවන් මේ මාසයකට වරක් එන්නේ තමන්ගේ ගුරුහාමුදුරුවන් බලන්නයි. මහවලතැන්නේ චන්ද්‍රශේඛර මුදලින්ද්‍රාරාමයේ තමයි ඒ හාමුදුරුවන් වැඩ සිටියේ."

"මහවලතැන්නේ චන්ද්‍රශේඛර මුදලින්ද්‍රාරාමයේ සියලු කටයුතු සංවිධානය කළේ ඇස්. ඩී. මහවලතැන්නේ රටේ මහත්මයා විසින්. එයා තමයි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ මවගේ පියා. ඉතින් සීලානන්ද හාමුදුරුවෝ මේ රටේ මහත්තයත් ගෙන්වා ගන්නවා සාකච්ඡාවලට. රටේ මහත්තයත් සෑහෙන උගත් කෙනෙක්. මේ හාමුදුරුවන් වඩින්නේ පයින්මයි. මේ හාමුදුරුවෝ උගත් කෙනෙක් වගේම හොඳ සිල්වත් හාමුදුරු නමක්. ඒ විතරක් නෙවෙයි උන්වහන්සේ හරිම ශාන්ත දාන්තයි. මටත් මේ හාමුදුරුවන් නිතර නිතර දකින්න ලැබුණා. නොයෙක් විට මා බ්‍රහ්මචාරී වෙන්න ඕනැ කියමින් තමයි හිටියේ. ඒ අතර දවසක් ආතා කිව්වා, 'බුද්ධාගම දියුණු කරන්න ඕනැ නම් මහණ වීමයි වඩා හොඳ'

කියලා. ආතත් මහණවෙලා හිටපු කෙනෙක්. එදා ඉඳලා මහණ වෙන්න ම ඕනෑය කියන අදහස මගේ සිතේ තදින්ම හට ගත්තා.''

''ඔය අතර මා සෙල්ලමෙන් සතුටින් වැඩුණා. ඉගෙන ගැනීමත් හොඳට කළා. මට ඉක්මනින්ම පාඩම් හිටිනවා. ඉගෙනීමට මා දක්ෂයි. හැමදම පන්තියේ පළවෙනියා වුණේ මායි. ඔය වෙනකොට මගේ වයස අවුරුදු 12ක් විතර ඇති. කඩෙන් පාඩු නිසා අපේ පියා ඒ කඩේ වැහුවා. ආතා මේ කාලයේදී කලුරිය කළා. මේ අතර මගේ පියා හිටියේ බළන්ගොඩ තුඹගොඩ කියන ස්ථානයේ. මේ වෙළඳසැලේ ඉඳලා එතනට හැතැක්මක් විතර ඇති. මා ඒ කඩේට නතර වෙන්න ගියා. එතන නතරවෙලා පාසල් යන්න පටන් ගත්තා. දවල් එකට විතර ස්කෝලේ ඇරිලා වෙළඳහලට එනවා. කෑම කාලා සවස එකහමාරට විතර ඉංග්‍රීසි ස්කෝලෙට යනවා. එතන සවස පහට විතර වෙනකල් ඉංග්‍රීසි ඉගෙන ගන්නවා. ඊට පස්සේ ආයිත් කඩේට එනවා.''

''**සරසවි, සඳරැස** පත්තර අපේ කඩේට ගේනවා. ඒවා මා හොඳින් කියවනවා. ඔය වෙන කොට මා ස්කෝලේ හත්වෙනි පන්තියේ තමයි හිටියේ. කතෝලික ළමයකුත් මගේ පන්තියේම ඉගෙන ගත්තා. එයා කලින් ඉගෙන ගත්ත ස්කෝලේ ඉහළ පන්ති නැති නිසයි මා ඉගෙන ගන්න ස්කෝලෙට ආවේ. මෙයා කතෝලික වුණත් මගේ හොඳම යාළුවා. විටින් විට එයා මට කතෝලික පොත් පත් ගෙනත් දුන්නා. දවසක් මට ගෙනත් දුන්නා **බෞද්ධ ලබ්ධි විනිශ්චය** කියන පොත. ඒක බුද්ධාගමේ එන කරුණු විවේචනය කරමින් ලියපු පොතක්. ඒක පළ කරලා තිබුණේ කතෝලික සභාවෙන්. බෞද්ධයන් විශ්වාස කරන පොළොවේ පිහිටීම, මහාමේරු පර්වතය, ආදි කරුණු ඒ පොතේ විවේචනය කරලා තිබුණා. පාසලේදී භූගෝල විෂය මා විශේෂ ආශාවකින් තමයි ඉගෙන ගත්තේ. බෞද්ධයන් අතර තිබුණ මහාමේරු පර්වතාදිය ගැන විශ්වාස මට ඇල්លුවේ නැහැ. ඒ නිසා මා පන්සල්වලට ගිහිල්ලා හාමුදුරුවරුන්ගෙනුත් මේ ගැන ඇහුවා. ඒ අයටත් ඒවාට හොඳ උත්තර දෙන්න බැරිවුණා.''

''ඔය අතර අපේ පියා තමන්ටම අයිති ඉඩමක වෙනම පන්සලක් හැදුවා. ඒක හැදුවේ උඩුමුල්ල කියන හරියේ. ඒ හරියට බුලත්ගම කියලත් කියනවා. ඒ පන්සලට වඩමවා ගත්තේ අර

කලින් කිව්ව සීලානන්ද කියන හාමුදුරුවන්. මා කාලයක සිට දකලා පුරුදු හාමුදුරුවෝ තමයි ඒ. වෙළඳසැලේ ඉඳලා ගෙදරට ගියාම මා පන්සලටත් යනවා. ගිහිල්ලා අර ප්‍රශ්න ගැන කතා කර කර ඉන්නත් මා පුරුදු වුණා. හැබැයි මා පන්සලේ ඉන්න ලොකු හාමුදුරුවන්ගෙන් මොකවත් අහන්නේ නැහැ. එහෙම අහන්නේ නැත්තේ ලොකු හාමුදුරුවන්ට තියෙන බය නිසයි. පන්සලේ වැඩ සිටිය අනික් හාමුදුරුවරුන්ගෙන් තමයි මා නොයෙක් ප්‍රශ්න අහන්නේ. ඒ හාමුදුරුවරුන් මගේ ප්‍රශ්න අහගෙන ඉඳලා කිව්වේ ඕවා ක්‍රිස්තියානි ප්‍රශ්න කියලා. ඒ විතරක් නෙවෙයි ඕවා බොරු කියලත් කිව්වා.''

"මගේ ප්‍රශ්නවලට පිළිතුරු නොලැබෙන නිසා මගේ හිතේ සැක ඇතිවුණා. **බෞද්ධ ලබ්ධි විනිශ්චයේ** එන බුද්ධාගමට විරුද්ධ ප්‍රශ්නවලට පිළිතුරු ලැබෙන්නේ නැහැ. මේ නිසා මගේ හිතේ යම් යම් සැක වැඩි දියුණු වෙන්න පටන් ගත්තා. ඉතින් ඒ වෙනකොට ගැඹුරු බණ මා දන්නෙත් නැහැ. හැබැයි ඔය වෙනකොට ජාතක පොත ඔක්කෝම කියවලා අවසන් කරලයි මා සිටියේ. ඒ වගේම සද්ධර්මාලංකාරයත් හුහක් දුරටම කියවා අවසන් කරලා තිබුණා. සද්ධර්මරත්නාවලියත් කියවමින් තමයි හිටියේ. ඒවා කියවන විට යම් යම් අදහස් මගේ සිතේ ඇතිවෙලා තිබුණා. ඒ දවස්වල ඉඩ කඩ තියෙන හැම වෙලාවකම ඔය පොත් තමයි මා කියෙව්වේ. භූගෝල විද්‍යාව ගැන මගේ දැනුම වැඩි වූ නිසා, සක්වළ ගැන සිංහල බණපොත්වල තියෙන විස්තරය මට නොපිළිගැනුණ නිසා මගේ ආගම භක්තිය ටිකක් අඩු වෙන්ටත් පටන් ගත්තා.''

"ඔය අතර සඳරැස පත්‍රයත් **ඥානාර්ථ ප්‍රදීපය** කියන පත්‍රයත් අතර ආගම්වාදයක් පටන් ගත්තා. ඒ වාදය හැඳින්වූයේ හෙනගුලි වාදය කියලා. අපේ වෙළඳ සැලට සරසවි සඳරැස පත්‍රය ගන්නවා. අල්ලපු කඩේට ඥානාර්ථ ප්‍රදීපය පත්‍රය ගන්නවා. මේ වාදය අවුරුද්දක් විතර කරගෙන ගියා. මේ ඔක්කෝම මා කියෙව්වා. අවසානයේදී බෞද්ධ පක්ෂය මේ වාදයෙන් දිනුවා. ඒ වාදය කියවීමෙන් සක්වළ විස්තරය ගැන මට තිබුණ සැකය දුරුවුණා. වාදය අවසන් වූ ටික දිනකින්ම වාදයේ පළවූ ලිපි ඇතුළත් කරලා පොතකුත් පිට කළා. ඒ අවස්ථාවේදී මට මෙන්න මේ වගේ අදහසක් ඇති වුණා.''

"මා මෙච්චර දවසක් මේ ක්‍රිස්තියානි විවේචකයන්ගේ බොරුවලට මුළා වෙලා හිටියා. තවත් අය මා වගේම රැවටිලා ඉන්නවා ඇති. කවද හරි මේ බොරු ප්‍රචාරවලටත්, මේ අයටත් පහර ගහන්න ඕනෑ කියන අදහසක් මට ඇති වුණා. ඒ විතරක් නෙවෙයි, **හෙනගුලි වාදය** කියවීමෙන් මගේ හිතේ තිබුණ සියලුම සැක නැතිවී ගියා. කතෝලිකයන් ඉදිරිපත් කරලා තිබුණ ඔක්කෝම ප්‍රශ්නවලට මේ **හෙනගුලි වාදයේදී** හොඳට පිළිතුරු ලැබුණා. හොඳට බණ ඉගෙන ගෙන මේ අයට තව තවත් පහර දෙන්න ඕනෑ කියන හැඟීමක් මට ඇති වුණා. මේ අදහස මගේ හිතට තදින්ම කා වැදුණා."

"පාසල් ඉගෙනීම මා අවසන් කළේ වයස දහතුනේදී. ඊට පසුව ශිෂ්‍ය ගුරුවරයකු වශයෙන් ගුරු විභාගයට පුහුණු වුණා. ඒ කාලයේ පස්වෙනි පන්තියට **සුභාෂිතය** ඉගැන්නුවා. හයවෙනි පන්තියට **ලෝකෝපකාරය** ඉගැන්නුවා. හත්වෙනි පන්තියට **ගුත්තිලයේ** කොටසක් ඉගැන්නුවා. මට ගුරු විභාගය සඳහා **ගුත්තිලයත්, සිදත් සඟරාවත්,** ඉගෙන ගන්න සිදු වුණා. ඒ විදියට අවුරුදු දෙකක් ශිෂ්‍ය ගුරුවරයකු වශයෙන් කටයුතු කළා. සවස ඉංග්‍රීසි ස්කෝලයටත් නොවරදවාම ගියා. ඔය අතර මට ශිෂ්‍යත්ව දෙකක් ලැබුණා. කොළඹ කොලීජියකට එකක්. අනෙක රත්නපුරේ කොලීජියකට යන්නයි. නමුත් මා ඒවා අත් හැරියා. මහණ වෙන්න තියෙන ආශාව නිසයි ඒ. මා මේ දවස්වල පෙරුම්පුරමින් හිටියේ කවද කොයි වෙලාවේ මහණ වෙනවද? කියලා."

# 2 මා මහණ නොකළොත් කොහේ හරි පැනලා යනවා

"මට අවුරුදු දොළහ වනවිට මගේ පියා මියගියා. ඉන්පසුව මගේ සම්පූර්ණ භාරකාරයා වුණේ මගේ ලොකු තාත්තා. මේ වනවිට තිබුණ ක්‍රිස්තියානි බලවේග නිසා පැවිදිවීමේ ආශාව තවත් වැඩි වුණා. මා ලොකු තාත්තාගෙන් සහ ලොකු අම්මාගෙන් ඒ සඳහා අවසර ඉල්ලුවා. නමුත් ඒ අය මට මහණ වෙන්න අවසර දුන්නේම නැහැ. හැබැයි ලොකු අම්මාටත් ඔය වන විට බාල දරුවන් හිටියා. මගේ අම්මා එක්ක ඇති කරගත් ගිවිසුමත් මා ලොකු අම්මට සිහිපත් කළා. මට මහණ වෙන්න ඕනෑම කියලා, ඈ ලවාත් ලොකු තාත්තාට කියෙව්වා. නමුත් ඒක කොහොමවත්ම කරන්න බැහැ කියලා ඒ දෙන්නම කිව්වා. අන්තිමට ලොකු තාත්තා කිව්වා 'මගේ ළමයට බුදලය අයිති කර දෙන්න හිතාගෙන මේ ළමයා මහණ කළා කියලා' රටෙන් චෝදනාවකුත් එයාට ලැබෙයි කියලා. 'උඹ වෙනුවට මල්ලී මහණ කරනවා' කියලත්, කිව්වා. ඇත්තෙන්ම තමන්ගේ දරුවන්ටත් වඩා ඒ අය මට ආදරය කළා. සමහරවිට නංගිලාට මල්ලිලාට විටින් විට වැරදිවලට ගහනවා. නමුත් කවදාවත් මට නම් ගැහුවේ නැහැ."

"කොහොම වුණත් මහණ වෙන්න මට අවසර නොලැබෙනවිට මා වඩාත් දරුණු වුණා. හිතුවක්කාර වුණා. ඔය අතර අපේ වෙළඳ සැලේ වෙළඳම සඳහා පැමිණි ඉලන්දාරි කීප දෙනෙකුත් හිටියා. ඒ අය වැඩි දෙනෙක් කතෝලික අය. රෑට බත් කාලා ඉවර වුණාම මේ අය නිදා ගන්නේ කුස්සියේ. කුස්සිය හොඳට ඉඩ කඩ තිබුණ එකක්. ඒ අය නිදාගන්න ගියාම මා ඒ අයත් එක්ක ආගම් වාදේ පටන් ගන්නවා. මේ වෙලාවට ඒ අය බුදුහාමුදුරුවන්ටත් දොස් කියනවා. එහෙම කියනකොට මට හොඳටම කේන්ති එනවා. මා ගිහිල්ලා කේන්තියෙන් ඒ අයගේ කම්මුලට ගහනවා. හැමදාම වගේ මා ඒ අයත් එක්ක කෝලාහල කර ගන්නවා."

"මේ කඩේ බාරව සිටියේ මගේ මාමා කෙනෙක්. අර මිනිස්සු මාමට පැමිණිලි කරනවා, මා ඒ අයට ගහනවා කියලා. ඒ වෙලාවට මාම ඒ අයට කියනවා 'ඔයා මාවත් ගණන් ගන්නේ නැහැ, මටනම් එයාට මොකවත් කියන්න බැහැ;මට එයා කීකරු නැහැ, අයියා ආවාම එයාට ඕවා කියන්න' කියලා. ලොකු තාත්තා එනවා කඩේට උදේ හතට විතර. ආව හැටියේම මට විරුද්ධව තමයි පැමිණිලි ලැබෙන්නේ. ඉස්සරවෙලාම ලොකු තාත්තා මට කතා කරනවා. 'මෙහෙ වරෙන් පුංචි මහත්තයා, මොකද? මේ මිනිස්සුන්ට ගහන්නේ. ස්කෝලේ යන කාලේ ඇයි මේ ආරාවුල් ඇති කර ගන්නේ? මෙහෙ ඉන්න එපා, පලයන් ගෙදර' මේක තමයි මට දෙන ලොකුම දඬුවම."

"ස්කෝලේ ඉඳලා කඩේට හැතැක්ම එකහමාරක් විතර තියෙනවා. එතන ඉඳලා ගෙදරටත් හැතැක්ම එකහමාරක් විතර තියෙනවා. ඉතින් ගෙදර ඉඳලා ඉස්කෝලේ යන්න ගියාම හුඟාක් දුරක් පයින් යන්න ඕනෑ. දැන් ඉතින් මා ගෙදර ඉඳලයි ස්කෝලේ යන්නේ. හැන්දෑවට බොහෝ දවස්වල මා පන්සලටත් යනවා. ලොකු හාමුදුරුවන් ඉස්තෝප්පුවේ වැඩ ඉන්නවා වටේට පොත් ටිකකුත් තියාගෙන. මා ඇතුළට ගොහින් පන්සලේ ඉන්න අනික් හාමුදුරුවරුන් සමඟ කතා බහ කරනවා. සමහර වෙලාවට අප අතර රණ්ඩු සරුවල් පවා ඇති වෙනවා. මට වඩා ලොකු ඇත්තෝ ඒ අය. නමුත් මා ඒ ඇත්තන් අල්ලලා බිත්තියේ හප්පලා පැනලා ගෙදර එනවා. ඒ එන්නේ පන්සලේ පිළිකන්න පැත්තෙන්. හැන්දෑවේ ලොකු තාත්තා පන්සලට ආවාම ඒ හාමුදුරුවරුන් මේවා කියනවා. පන්සලට ගිහින් ආව හැටියේම ලොකු තාත්තා මා දිහා රවලා බලනවා. හැබැයි කවදාවත් මට ගහන්නේ නැහැ. ඔය වෙලාවට තාත්තා කියනවා. 'උඹ පලයන් කඩේට, උඹට මෙහෙ ඉන්න බැහැ කියලා'. ඉතින් මා කඩේට යනවා. එතන ඉන්නකොට ආගම්වාදෙ හදාගෙන එතන ඉන්න අයට ගහලා ආයිත් ගෙදරට එනවා."

"මට ඉක්මනින් කේන්ති එනවා. ඒ නිසයි මා එහෙම කරන්නේ. සමහරවිට කඩේ අයට ගහනවා. පන්සලේදී සමහර හාමුදුරුවරුන් තල්ලු කරගෙන ගිහිල්ලා බිත්තියේ හප්පනවා. ඇත්තෙන්ම; හොඳට මගේ ඇඟේ හයිය තිබුණා. හැබැයි මා පන්සලට ගිහිල්ලා කරන මේ දේවල් මොකවත් ලොකු

හාමුදුරුවෝ දන්නේ නැහැ. අනික් හාමුදුරුවරුන් මේවා ලොකු හාමුදුරුවන්ට කියන්නෙත් නැහැ.”

“මේ විදියට මට ටික දවසක් කඩේ ඉන්න වෙනවා. ටික දවසක් ගෙදර ඉන්න වෙනවා. දවසක් මා ඕනැකමින්ම ප්‍රමාදවෙලා රෑ හතට විතර ගෙදර ආවා. පාඨශාලාවට ගිය තංගිත් එක්කයි මා ආවේ. කිසිම එළියකුත් නැතුව කැලෑ පාර දිගේම මහ කළුවරේ තමයි අප දෙන්නා ආවේ. ගෙදර ලොකු අම්මයි ලොකු තාත්තයි හරියට බය වෙලයි හිටියේ. ගෙයක් දොරක් නැති මහ කැලෑ පාරේ, රෑ වෙනකම්ම අප දෙන්නා ගෙදර නාව නිසා හොයන්න යන්න ලෑස්තිවෙලයි ලොකු තාත්තා හිටියේ. මා ගෙදරට ගොඩවෙනකොට ලොකු තාත්තා මා දිහා තදින් රවාගෙන බලා හිටියා. ගේ ඇතුළට ගියාම ලොකු අම්මා ඇවිදින් හෙමින් මට කිව්වා.

‘ඔන්න තාත්තා හොඳටම කේන්තිවෙලයි ඉන්නේ අද, අදනම් හොඳට ගුටි වදීවි’

ලොකු තාත්තා ටිකක් හයියෙන් මට කතා කළා. ‘පුංචි මහත්තයා මෙහෙ වරෙන්, මොකද අද පරක්කු වුණේ?’

මා මොකවත් කතා නොකර හිටියා.

‘උඹ ඉංග්‍රීසි ස්කෝලේ ගියාද?’ මා එකවරටම උත්තර දුන්නා, ‘නැහැ.’

‘ඇයි නොගියේ?’ ‘මට යන්න බැහැ.’

‘එහෙමනම් සිංහල ස්කෝලේ යන්නෙත් නැද්ද?’ ‘නැහැ.’

‘එහෙමනම් උඹ ඔය කඩේ බලාගෙන හිටපන්.’ ‘මට බැහැ.’

‘එහෙමනම්, අපේ මේ තේ වතුවල කුඹුරුවල වතු පිටිවල වැඩ බලාගෙන හිටපන්.

ඔක්කෝටම මා බැහැ කිව්වා.

දැන් ඉතින් ලොකු තාත්තාට හොඳටම කේන්ති ඇවිත්.

‘එහෙමනම් උඹට මොකක්ද පුළුවන්’ කියලා අන්තිමට ඇහුවා

මා එකවරටම ටිකක් හයියෙන් කිව්වා, ‘මට මහණ වෙන්න ඕනෑ’ කියලා.

ලොකු තාත්තා ඒ වෙලාවේ කේන්තියෙන් වගේ කිව්වා, ‘මිනිහෝ උඹටත් පුළුවන්ද මහණකම් කරන්න? හැමතැනම

කලබල කර ගන්නවා. ආරවුල් ඇති කර ගන්නවා. එක එක්කෙනාට ගහකනවා.'

මා ඒ වෙලාවේ කිව්වා, 'මට කඩේ ඉන්නත් බැහැ, ගෙදර ඉන්නත් බැහැ, මට මහණ වෙන්නම ඕනෑ' කියලා.

'මාව මගේ අම්මා ලොකු අම්මාට බාර දුන්නේ මහණ කරනවා කියන පොරොන්දුව පිටම නේද?' කියලා මා ඇහුවා.

ලොකු තාත්තා ඒ වෙලාවේ කිව්වා, 'නැහැ උඹ මහණ කරන්නේම නැහැ' කියලා.

අන්තිමට මා කිව්වා, 'එහෙනම් මා කොහේ හරි පැනලා ගිහිල්ලා කොතනහරි මහණ වෙනවා' කියලා. අන්තිමට ලොකු තාත්තා කතාව නතර කළා.

'හා හොඳයි ..... පස්සේ බැරියැයි ඒවා ගැන කතා කරන්න. දූන් ගිහිල්ලා බත් කාපන්' කියලා කිව්වා.

"ඒ එක්කම ලොකු තාත්තා මට කිව්වා 'අම්මට මෙහාට එන්න කියපන්' කියලා. මා ගොහින් ලොකු අම්මාට දන්නුවා. ලොකු අම්මත් ඒ වෙලාවේ ගෙයි ඉස්සරහ පැත්තේ ලොකු තාත්තා ඉන්න තැනට ගියා. මායි නංගියි දූන් මැද සාලේ කෑම කන්න වාඩිවෙලයි හිටියේ. එළියේ ටිකක් කළුවරයි. මා කෑම කන එක නතර කරලා හෙමින් හෙමින් ගිහිල්ලා ලොකුතාත්තයි ලොකුඅම්මයි කතා කරන්නේ මොනවාද කියලා හැංගිලා හොරෙන් අහගෙන හිටියා."

ලොකුතාත්තා ලොකුඅම්මාට කියනවා මට ඇහුණා..... 'මේකා කොහොමවත් බේරන්න බැහැනේ, කිසිම කීකරු කමක් නැහැනේ, මේකා පැනලා යන්නත් පුළුවන්. එහෙම ගියොත් අපට මහ කරදරයක් තමයි වෙන්නේ.'

මේ තත්වය යටතේ මොකද කරන්නේ කියලා ලොකුතාත්තා ලොකුඅම්මාගෙන් ඇහුවා. ඒ වෙලාවේ ලොකුඅම්මා කියනවා මට ඇහුණා, 'ඔයා මහණවෙලා ඉන්නේ නැහැ. ඒ නිසා මහණ කරවා දමු. පන්සලේ වැඩි දවසක් ඉන්නේ නැහැ. ආපසු ගෙදර එවි' කියලා ලොකුඅම්මා වැඩි ගණනකට නැතුව කිව්වා. 'පන්සලත් ගෙදර ළඟමනේ, ඒ නිසා පන්සලට බාරදෙමු කියලා' දෙන්නම ඒ වෙලාවේ තීරණය කළා.

ලොකු අම්මා එතනින් ගේ ඇතුළට ගියා. ලොකුතාත්තත් ඇවිත් කෑම කෑවා. කෑම කන ගමන් ලොකුතාත්තා මට කිව්වා, 'උඹ හෙට උදේම බාරදෙනවා පන්සලට මහණ කරන්න' කියලා. 'හෙට උදේ පන්සලට ගෙනියන්න විශේෂ කැවිලි ටිකක් හදන්න' කියලත් ලොකු තාත්තා ලොකුඅම්මට කිව්වා.

ඒ කාලයේ අපේ ගෙවල පැණි හකුරු හරියට තියෙනවා. සීනි පාවිච්චියක් තිබුණේම නැහැ. මා වැඩිය බත් කෑවේ, විශේෂයෙන්ම දවාලට බත් කෑවේ ම පැණි එක්ක බව මට මතකයි.

ලොකුඅම්මා රාත්‍රියේම පිටි කොටලා බැදලා හොඳට අලුවා හැදුවා. ලොකු බත්දේසියක් පිරෙන්න තරමටම හැදුවා. මේ වැඩ කටයුතු ඉවර වෙනකොට රාත්‍රී එකට විතර ඇති. ඉතින් එද මා හරිම සතුටින් තමයි නිදි ගත්තේ. පසුවද උදේ පාන්දරින්ම නැගිටලා ලොකු තාත්තා අලුවා බත්දේසිය සුදුරෙද්දකින් හොඳට වස්වලා ගෙදර වැඩ කරන කොළුවා ලවා ගෙන්වාගෙන පන්සලට ගියා. හයියෙන් කතා කළොත් ඇහෙනතෙක් මානේ තමයි පන්සල තිබුණේ. සැතපුම් අරික්කාලක්වත් නැති තරම්. එද ලොකුහාමුදුරුවෝ කොළඹ යන්න සූදනම්වෙලා, නැකැත් වෙලාවට එළියට බැහැලා විහාර මළුවෙයි හිටියේ. ඉතින් ලොකුතාත්තා විහාර මළුවට ම ගිහිල්ලා අලුවා බත්දේසියත් පිළිගන්වලා වැඳලා මා ලවාත් බුලත් අතකුත් දෙවලා ලොකුහාමුදුරුවන්ට වැන්දෙව්වා.

ඒ වෙලාවේ ලොකු හාමුදුරුවන් එකවරටම ඇහුව්වා 'මොකද මුදලාලි මහත්තයෝ, මේ උදේ පාන්දරින්ම කියලා. 'හාමුදුරුවනේ, මෙයා මහණ වෙන්න ඕනෑ කියනවා. අපි එපා කිව්වට බාර ගන්නේ නැහැ. මෙයාව පන්සලට බාරදීලා යන්නයි ආවේ' කියලා ලොකුතාත්තා කිව්වා.

'කේන්දරේ එහෙමත් තියෙනවාද?' කියලා ලොකුහාමුදුරුවන් ඇහුවා. ඒ වෙලාවේ ලොකුතාත්තා වට පිට බැලුවා. මගේ සාක්කුවේ කේන්දරයත් තියාගෙනයි මා හිටියේ. ඒක මා දුන්නා. ඔය වෙනකොට මා කේන්දර ගැන නැකැත් ගැන ටිකක් දැනගෙන හිටියා.

අපේ ගෙදරට කිට්ටු ගෙදරක හිටියා කේන්දර බලන්න පුළුවන් කෙනෙක්. මා එයාගෙන් තමයි කේන්දර බලන්න ඉගෙන

ගත්තේ. එයා තමයි රත්වත්තේ වලව්වේ අයගෙත් කේන්දර බලන්නේ. ඒ විතරක් නෙවෙයි වලව්වේ ඕනෑ එපාකම්වලට නැකැත් හදන්නෙත් එයා. එයාගෙ නම "ගිරහා" කියලයි මට මතක තියෙන්නේ. මිනිහා හොඳ කේන්දර කාරයා. හොඳ නැකැත් කාරයා. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය උපන් දවස වෙලාව අනුව කේන්දරය හදලා මෙයා කියපු කතාවක් මට මතකයි. 'මේ අප්පෝ නම් කවදාහරි ලංකාවේ රජවෙනවා රජවෙනවාමයි.' එහෙම කිව්වේ මැතිනියගේ උපන් වෙලාව බලලයි. රත්වත්තේ උන්නැහැ ඒ කියන්නේ සිරිමාවෝ මැතිනියගේ පියා මේක අහගෙන ඉඳලා හිනාවෙලා කිව්වලු, 'මිනිහෝ බොරු කියන්න එපා, මේ ඉංග්‍රීසි ආණ්ඩු කාලයේ කොහොමද අපේ කෙනකු රජ වෙන්නේ කියලා' ඒ වෙලාවේ නැකැත් කාරයා කිව්වාලු, රජවෙන්නේ නැතිනම් ඒ හා සමාන තත්වයකටවත් පත් වෙනවා කියලා. කොහොම වුණත් මගේ මහණවීම තීන්දු වුණා. ලොකුහාමුදුරුවන් ඒ වෙලාවේ කිව්වා මුදලාලි මේ ඇවිදිල්ලා තියෙන්නේ හොඳ නැකැත් වෙලාවකින් කියලා. 'මේ මා සුදනම් වෙන්නේ කොළඹ යන්නයි. ඒ යන්නේ මගේ ගුරුවරුන් බලල එන්නයි.' රත්මලානේ වැඩ හිටිය වලාණේ. ධම්මානන්ද නායක හාමුදුරුවොයි, ලක්මිණිපහන් කතෘ වන ධර්මරත්න පඬිතුමයි බලල එන්නයි ලොකුහාමුදුරුවන් මේ වඩින්න සුදනම් වෙලා හිටියේ. මගේ කේන්දරය අරගෙන ලොකු හාමුදුරුවන් තිකම් උඩින් පල්ලෙන් බැලුවා. බලලා කිව්වා එකපාරටම මෙයා ඉංග්‍රීසි භාෂාවේත් හොඳ දක්ෂයෙකු වෙනවා කියලා. භාෂා කීපයක් හොඳට ඉගෙනගෙන දක්ෂයෙකු වෙනවා වගේම මහණකමත් මෙයාට හොඳට හරි යනවා කියලා කිව්වා. ඉන් පස්සේ ලොකු තාත්තා කඩේට ගියා. ලොකුහාමුදුරුවන් කොළඹ යන්න පිටත්වුණා.

මා ඉතින් පන්සලට ගිහිල්ලා අනික් හාමුදුරුවරුන්ටත් කිව්වා මාව මහණ කරන්න පන්සලට බාර දුන්නා කියලා. එතකොට ඒ හාමුදුරුවරුන් මට කිව්වා 'මේ මහණ වුණාට කමක් නැහැ, කලබල කරන්න ආරාවුල් කරන්න සුදනම් වෙන්න එපා' කියලා. 'එහෙම වුණොත් අපි ගහනවා' කියලත් කිව්වා. දින හත අටකට පස්සේ ලොකුහාමුදුරුවන් පන්සලට වැඩියා. හැබැයි මා එක දවසක්වත් පන්සලේ නතර වුණේ නැහැ. පන්සලට ගිහිල්ලා සාමණේර බණදහම් පොත කියවාගෙන ගෙදර ගිහිල්ලා පාඩම්

කරනවා. පන්සලට ඇවිදිල්ලා පාඩම් දීලා ගෙදර යනවා. ගෙදර ළඟම නිසා දිගටම කළේ මේ විදියටයි. මාස කීපයකට පස්සේ මාව මහණ කරන්න නැකතක් හැදුවා. ඒ නැකත යෙදී තිබුණ දවසට කලින් දවසේ ලොකුහාමුදුරුවන්ට ඉතා හිතවත් කැපකරු දයිකාවක වූ මහවලතැන්නේ මහ කුමාරිහාමි රටේ මහතාගේ මැණියන් කලුරිය කළා. එසේම ලොකුහාමුදුරුවන්ගේ ශිෂ්‍ය භික්ෂු නමකුත් අපවත් වුණා. පන්සලේ විහාර මන්දිරයේ නෙත් තැබීමේ පින්කම යොදගෙන තිබුණ දවසටමයි මගේ මහණ පින්කමත් යොදගෙන තිබුණේ. ඉතින් ඔක්කෝම මේ නිසා කල්ගියා. මාස කීපයකට පස්සේ තවත් දවසක් යොදගත්තා මගේ මහණ පින්කමට. ඉතින් එදට කලින් දවසේ ලොකුහාමුදුරුවන්ගේ සංස්කෘතාචාර්ය වලානේ ධම්මානන්ද නාහිමියන් අපවත් වුණා. ඒ නිසා මගේ මහණ පින්කම දෙවැනි වරටත් කල් ගියා. ලොකුතාත්තයි ලොකුඅම්මයි ගෙදර ඉඳගෙන මට කියන්න පටන් ගත්තා 'දූන් ඉතින් දෙවරක්ම බාධා ඇතිවුණා, ඒ නිසා කැමති තීරණයක් ගන්න' කියලා.

"ඔය වෙනකොට මගේ මහණ පින්කමට අවශ්‍ය කරන සිවුරු පිරිකර සූදනම් කරලයි තිබුණේ. මා එකවරටම කිව්වා මට මහණ වෙන්නම ඕනෑ කියලා. නංගිත් මට කිව්වා, 'අයියේ, තාත්තා කියන දේ අහන්න' කියලා. මා කිව්වා මගේ මහණ පින්කම වළක්වන්නේ මාරයා. මාරයා විරුද්ධයි හොඳ වැඩ වලට. දූන් ලොකුතාත්තාටත් ලොකුඅම්මාටත් මාරයා වැහිලා. නංගියේ උඹටත් මාරයා වැහීගෙන එනවා කියලා. මා ස්ථිර වශයෙන්ම මහණ වෙනවාමයි කියලා තදින්ම කියා සිටියා. බළන්ගොඩ පරණ පාරේ "වංශපාල" කියලා මගේ හොඳම මිත්‍රයකු හිටියා. එයත් මහණවෙන්න හිටිය කෙනෙක්. එයත් දූන් කළුතරට ගොහින්. ඒ නිසා මා සිටියේ ඉතාමත් සිත් අමාරුවෙන්."

"කොහොම නමුත් තුන්වැනිපාර නැකත හරිගියා. විහාරයේ නේත්‍ර පින්කමයි, මගෙ මහණ පින්කමයි ළඟ ළඟ දිනවලට යොදගෙන තිබුණා. මහණවීමේ දිනය තමයි 1911 මාර්තු මස 02 වෙනිද. හැබැයි මා මේ වෙනකම්ම එක දවසක්වත් පන්සලේ නතරවෙලා හිටියේ නැහැ. සාමණේර බණදහම් පොත, පාලි වරනැගිල්ල, රූපමාලාව, බාලාවතාරය වැනි පොත් ඔය වෙනකොට මා පාඩම් කරලා ඉවරයි. මහණ වෙන්න

ඉස්සරවෙලා පාසලේදී සිංහල ව්‍යාකරණ හොඳට ඉගෙන ගෙන හිටියේ. ඒ නිසා හුඟාක් දේවල් මට පහසු වුණා."

"මා මහණ කිරීමේ නැකත යෙදී තිබුණේ උදේ කාලයේ. ගෙදර හිටිය නංගියි මායි කෑම කන්නෙත් එක පිඟානේ. නිද ගන්නෙත් එකට. මහණ පින්කම දවසේ පාන්දරින්ම ගෙදර අය අවදි වුණා. මාත් අවදි වුණා. නමුත් නංගිව අවදි කළේ නැහැ. එයා මා යනකොට අඬන්න පුළුවන් නිසයි එයාව අවදි කළේ නැත්තේ. ඉතින් එදා උදේ මහණ වෙන්න යන්න පිටත් වෙනකොට ලොකු තාත්තගෙන් මට ලැබුණ අවවාදය තමයි;

"මහණ වුණාට පස්සේ උඹට බැහැ කියලා හිතුණොත් ගෙදර වරෙන්, එතන කෝලාහල කරගන්න එපා. කොහේවත් පැනලා යන්නත් එපා.' ඕක තමයි මට ලැබුණ එකම අවවාදය. ලොකුතාත්තා මෙහෙම කියනකොට මා කිව්වා 'මන් සිවුරු අරින්නෙත් නැහැ, ගෙදර එන්නෙත් නැහැ' කියලා."

"මා මහණ වෙන දවසට කලින්ද හොඳ සිද්ධියක් වුණා. එදා ලොකුතාත්තා උදෙන්ම මට කිව්වා, උඹ ගිහිල්ලා ළඟම නෑදෑයන්ට කියලා වරෙන් උඹ හෙට මහණ වෙනවා කියලා, මා මුළු දවසේම ඇවිදලා ඔක්කෝම නෑදෑයන්ට යාළුවන්ට කිව්වා, 'මා හෙට උදේ මහණ වෙනවා' කියලා. ආපහු ඇවිදිල්ලා මා ලොකුතාත්තාට කිව්වා ඔන්න ඔක්කෝටම කිව්වා කියලා. මා කඩේට එනකොට ලොකුතාත්තා එක්ක ගනු දෙනු කරන මැදගම පුංචි මහත්තයා කියන කෙනෙකු කඩේට ඇවිදිල්ලා ලොකුතාත්තා සමග කතා කර කර හිටියා. ලොකුතාත්තා මට කිව්වා 'මෙන්න මෙයාටත් උඹ මහණ වෙන එක කියාපන්' කියලා. එතකොට මන් පුංචි මහත්තයාට කිව්වා 'මා හෙට මහණ වෙනවා' කියලා. ඒ වෙලාවේ පුංචි මහත්තයා ලොකුතාත්තාට කිව්වා 'මුදලාලි මේ වැඩේ නම් කරන්න එපා, මුදලාලිට හිතවත් කමටයි මන් මේ කියන්නේ. මෙයා මහණකමේ ඉන්නේ නැහැ. පන්සලේ හාමුදුරුවන්ටත් ගහලා, විහාරෙටත් ගිනි තියලා මෙයා ආපස්ස බලන්නේ. මෙයා එහෙම නොකොළොත් මුදලාලි මෙන්න මගේ කණෙන් කෑල්ලක් කපාගන්න මා ඉඩදෙනවා, මා කියන්නේ මුදලාලි මෙයා මහණ කළත් අවුරුද්දක්වත් ඉන්නේ නැහැ' කියලත් පුංචිමහත්තයා කිව්වා."

SABARAGAMUWA AFFILIATED UNIVERSITY
REFERENCE
LIBRARY

"ලොකුතාත්තා ඒ වෙලාවේදී කිව්වා, 'ඔව් ඉතින් බැරිනම් ගෙදර එන්නේ නැතුවයෑ.' ඔය කියපු පුංචි මහත්තයා මාත් එක්ක හරි විරුද්ධයි. දවසක් පොඩි ප්‍රශ්නයකට පන්සලේදී මා එයාට කම්මුල් පාරවල් දෙකක් ගැහැව්වා. ඔය තරහ දිගටම එයාගේ හිතේ තිබුණා. මා ටිකක් එහාට ගිහිල්ලා, තාත්තාට නොපෙනෙන තැනක ඉඳලා, පුංචි මහත්තයාට දත් විලිස්සලා' ඔච්චමක් කරලා ඇඟිල්ලක් දික් කරලා තර්ජනයකුත් කරලා ගෙදර ගියා."

"ඉතින් මගේ මහණ පින්කම බොහොම ජයට තිබුණා. මගේ මහණ වීම සිදුවුණේ 1911 මාර්තු 2 වනදා උදේ 7 ටයි. සෙනගත් හරියට ආවා. ඒ දිගටම පින්කම් උත්සව පැවති දවස්. හාමුදුරුවරුන් හුඟාක් ඇවිත් ඉන්න නිසා රෑට ගිලන්පසට හැමදම වතුර උණු කරනවා. මගේ වයසේම ධම්මරතන කියලා තවත් සාමණේර නමක් හිටියා. ඒ සාමණේර නමත් එක්ක මාත් දන්ගෙට වෙලා ගිලන්පසට වතුර උණු කරන අතර ඒ පොඩිහාමුදුරුවෝ මගෙන් ඇහුව්වා, 'ඔයා කෝලාහල කාරයෙක් කියලා කවුරුත් කියනවා, මොකද ඒ? මා ඒ වෙලාවේදි කිව්වා "මට ඉක්මනින් කේන්ති එනවා" කියලා. 'තරහ නොගන්න හැටියට මා ළඟ දිවුරන්න' කියලා ඒ පොඩිහාමුදුරුවන් මට කිව්වා. ඉතින් මා ඒ ධම්මරතන පොඩිහාමුදුරුවනුත් එක්ක ඒ දන්ගෙයි ළිප ළඟදී ආයිත් එහෙම කේන්ති ගන්නේ නැහැ කියලා දිවුරලා පොරොන්දු වුණා. මා ටිකක් කල්පනා කළා. මගේ හොඳ කියන කෙනෙක් ඇත්තේම නැහැ නේද? මා තද අධිෂ්ඨානයක් ඇති කර ගත්තා. ආයිත් මා කේන්ති ගන්නේම නැහැ කියලා. හැමදම දන්ගෙයි ළිප ළඟට වතුර උණු කරන්න ගියාම අර පොඩිහාමුදුරුවන් මේක මට මතක් කරනවා."

"වත් පිළිවෙත් කිරීම ගැනත් ඒ පොඩිහාමුදුරුවන් මට කියලා දුන්නා. මාත් දන් උදෙන්ම මල් කඩනවා. වත් පිළිවෙත් කරනවා. ඒ වගේම පාඩම් කරනවා. අපේ ලොකුතාත්තා ඉඳහිට ඇවිදිල්ලා ලොකුහාමුදුරුවන්ගෙන් අහනවා 'අපේ පොඩිහාමුදුරුවෝ කොහොමද හොඳද? කියලා. ලොකුහාමුදුරුවන් ඒ වෙලාවට කියනවා 'බොහොම හොඳයි පොඩිනම, හරිම හොඳයි පොඩිනම' කියලා. මෙහෙම කියනකොට මා ඒවා රහසින් අහගෙන ඉන්නවා.

මා ඒ වෙලාවේදී හිතුවා 'හොඳ නෑ කියලා කියවාගන්න එක නරකයි. හොඳයි කියලා කියවා ගන්න එක කොච්චර හොඳද?' කියලා."

"අපේ ලොකුහාමුදුරුවෝ තාපස කෙනෙකු වගෙයි. තවුස් ගුණවලින් පිරුණු උතුමෙක්. කවදාවත් මොකකටවත් තරහ ගන්නේ නැහැ. හැමවිටම සතුටින් හා සාමයෙන් ඉන්න කෙනෙක්. අන්න ඒ තත්වය මටත් ඇති කරගන්න මා හිතා ගත්තා. උත්සාහ ගත්තා."

# 3

# එද අවුරුදු නවයකින් ලැබූ අධ්‍යාපනය අද විස්සකින්වත් ලබන්න බැහැ

**"නායක හාමුදුරුවන් ඉගෙනගත් පිළිවෙළ කොහොමද?"**

"මුලදී අපේ ලොකුහාමුදුරුවන් මට පාලි ඉගැන්වීමේදී නාමපදමාලාව පාඩම් කෙරෙව්වා. විස්තර අර්ථ කියෙව්වේ නැහැ. පදවලට විතරක් අර්ථ කියෙව්වා. ඒ එක්කම ඒවා තෝරලා දුන්නා. මගෙ හිතට වැඩි බරක් පැටෙව්වේ නැහැ. ඒ කාලයේ තිබුණා රූපමාලාව කියලා පොතක්. අද පාලිභාෂාවතරණය වෙනුවටයි ඒක තිබුණේ. දෙවනුව ඒ රූපමාලාව කියෙව්වා. ඒකෙන් වාක්‍යයත් හැදෙව්වා. රූපමාලාවට අර්ථත් කියෙව්වා. ඔය අතර හාමුදුරුවන් පොඩි පද කීපයක් කියාදී වාක්‍යත් හැදෙව්වා. තරමක් පාලිභාෂාව කටට හුරුවුණාට පස්සේ ධම්මපදට්ඨකථාව කියවන්න පටන්ගත්තා. හැබැයි ඒකෙන් කියවන්නේ ටිකයි. පේළි කීපයක් කියවලා ඒකේ විභක්ත්‍යන්ත පද, ආඛ්‍යාත පද එහෙමත් තෝරලා දෙනවා. තෝරලා දෙමින් ටිකින් ටික ඒවා කටට හුරු කළා. ඒ කාලේ වැඩිය පොත් තිබුණෙත් නැහැ. ඔහොම ගිහිල්ලා ඒවා කටට හුරුවුණාම ධම්මපදට්ඨකථාවේ පිටක් හමාරක් කියවන්න පටන් ගත්තා. ධම්මපදට්ඨ කථාවේ ප්‍රථම වර්ගය කියවලා ඉවර වෙනකොට පාලිභාෂාව හොඳට කටට හුරු වුණා."

"ඊළඟට බාලාවතාරයේ සූත්‍රවල අර්ථ බොහොම කොටින් උගන්වාගෙන ගියා. එහෙම උගන්වන ගමන් ඒවා තෝරලත් දුන්නා. ස්කෝලෙදි මා සිංහල ව්‍යාකරණ ඉගෙන ගෙන තිබුණ නිසා උගන්වන දේ මට ලේසියෙන් වැටහුණා. බාලාවතාරය පළමුවර එහෙම උගන්වාගෙන ගිහිල්ලා, දෙවනවර තමයි සවිස්තරව උගන්වන්න පටන් ගත්තේ. තුන්වන වරට බාලාවතාරයේ නිදර්ශන පදවල පදසිද්ධි

සූත්‍ර දක්වමින් ලියන්නට සිදුකළා, බාලාවතාර ලියන සන්නයේ ක්‍රමය අනුව එක දවසක් බාලාවතාරය ලියවනවා. අනිත් දවසේ ධාතුමංජුසාව කටපාඩම් දී අර්ථ කියවනවා. ඔය අතර හැම ධාතුවකින්ම හැදිය හැකි පද සාදවනවා. ආඛ්‍යාත පද, කෘදන්ත පද සාදවමින් ඒවායින් කුඩා වාක්‍යත් හදවනවා. ඔහොම මුළු ධාතුමංජුසාවම ඉවර කළා.''

"ඒ අතර දවසක් ඇර දවසක් මට වෙනත් පාලි පොතකුත් ඉගැන්නුවා. පාලි මිළින්ද ප්‍රශ්නයේ පිටු අසූවක් ඒ දවස්වල මුද්‍රණය කරලා තිබුණා. ඒක උගන්වන ගමන් විශේෂ පදයක් හමුවුණාම ඒකෙ ධාතුව මොකක්ද? ප්‍රත්‍යය මොකක්ද? කියලත් අහනවා. සමහරවිට සූත්‍රයත් අහනවා. ඔය විදියට මිළින්ද ප්‍රශ්නයේ පිටු අසූවම ඉවරවෙනකල් පදවල ව්‍යාකරණ විස්තරත් අහ අහා ඉගැන්නුවා. ඒක ඉවර වනවිට පාලිභාෂාව ගැන ලොකු බැයගත්ත දැනීමක් ඇති වුණා.''

"ඊට පස්සේ තමයි, හාමුදුරුවන් පටන්ගත්තේ අංගුත්තරනිකාය උගන්වන්න. ඒකත් මුලදී වැඩිය ඉගැන්නුවේ නැහැ. ඒක උගන්වන විටත් පදවල පද සිද්ධිය, ධාතුව, ප්‍රත්‍යය, අහ අහා තමයි ඉගැන්නුවේ. ඒ අතර වාක්‍ය සම්බන්ධයත් අහනවා. අංගුත්තර තික නිපාතය අවසන් කළ පසු ගාථා හදන්න පුරුදු වෙන්න කියලා තෙලකටාහ ගාථා පොත ෂඩ්විධ වර්ණනාව ඇතුව ඉගැන්නුවා. ඒකේ හැම ගාථාවක්ම හය විධියකට වර්ණනා කරන්න ඕනෑ. ඒකේ පද හැදිච්ච හැටිත් කියන්න ඕනෑ. හැබැයි එක දවසකට ඉගැන්නුවේ එක ගාථාවයි. ඒක ඉගෙන ගෙන ඉවර වෙන කොට මට ගාථා හදන්න හොඳට හුරු වුණා. වයස දහඅට වනවිට හොඳට ගාථා රචනාව පුළුවන් වුණා. හැමදම ගාථාවක් හදලා හාමුදුරුවන්ට පෙන්වනවා. ඒ අතර වුත්තෝදය සංක්ෂෙපයෙන් කියා දුන්නා. වෘත්ත හදනහැටි, ප්‍රස්තාර කරන හැටි, නෂ්ට උද්දිෂ්ටාදි ඔක්කෝම කියා දුන්නා. ඊළගට හාමුදුරුවන් කිව්වා ඔය පැත්තට වැඩිය හිත නොයොද බණ පොතට හිත යොදවන්න කියලා. ඔය අතර රූපසිද්ධියත් කියෙව්වා.''

"ඊළඟට පාලි විනය පොත් කියවන්න පටන් ගත්තා. මුලින්ම මහාවග්ගය කියෙව්වා. සාමණේර කාලයේදීම මා මහාවග්ගයත් චුල්ලවග්ගයත් කියවලා අවසන් කළා. ඒ වෙනකොට පාලි ව්‍යාකරණ පොත් හුඟක් කියවලා අවසන්. සිදත් සඟරාව

ස්කෝලෙදී ඉගෙනගෙන තිබුණා. හාමුදුරුවන් මට කිව්වා, එහෙමනම් සිදත් සඟරාවට පාලියෙන් අර්ථ කියන්න කියලා. පාලි පරිවර්තනය පුරුදු වෙන්නත් එක්කයි ඒක කරන්න කිව්වේ. එතකොටත් මට පාලි හොඳට පුළුවන්. ඒ නිසාම මා සිදත් සඟරාවට පාලියෙන් අර්ථ කියන්න පටන් ගත්තා. මුලු සිදත් සඟරාවටම අර්ථ කිව්වා පාලියෙන්. ඒක ඉවර වනවිට මට පාලි නීති රීති හා පරිවර්තන ඔක්කෝම හොඳට හුරු වුණා."

"ඊට පස්සේ සතියකට දෙවරක් විතර සවිස්තරව අභිධර්මාර්ථ සංග්‍රහය ඉගැන්නුවා. සාමණේර කාලයේදී මේවා ඔක්කෝම ඉවර කළා. උපසම්පදව ලැබුවායින් පස්සේ පාරාජිකා, පාචිත්තිය, පරිවාර කියන අනෙක් විනය පොත් තුන අටුවාව සහිතව සම්පූර්ණයෙන් ගුරුවරයා ළඟදී ඉගෙන ගත්තා. සුබෝධාලංකාරය ගැනත් වැඩි මහන්සියක් වෙන්න එපා කියලා ඒ ගැනත් සාමාන්‍ය දැනුමක් ලබා දුන්නා. තවදුරටත් දීඝනිකායේ වර්ගයක්, මජ්ඣිමනිකායේ වර්ගයක් කියවමින් විස්තර කරලත් දුන්නා. ඒවා කියවන විටත් ධාතු ප්‍රත්‍යය පෙන්වන්න ඕනෑ. අටුවාව අනුව විස්තර කරන්නත් ඕනෑ. ඔය විදියට ඒවා කරගෙන ගියා. ඔය කාලය ඇතුළතම දවල් ගුරු හාමුදුරුවන් ළඟ පාඩම් දීලා රාත්‍රියේ සංයුත් සඟියේ මුලපටන් ටික ටික අටුවාවත් ළඟ තියාගෙන කියෙව්වා. මට වයස විස්ස වෙන්න ඉස්සර වෙලා සංයුත් සඟියත් ඉවර කළා. සැක සහිත තැන් පමණක් හාමුදුරුවන්ගෙන් අහගත්තා. ඒ කාලයේ භාවිතා කළේ පුස්කොළ පොතයි. ඒ කාලයේ මුද්‍රිත පොත් අඩුයි. මජ්ඣිමනිකායත් ටිකෙන් ටික කියවමින් අමාරු තැන්, ගැටළුතැන් හාමුදුරුවන්ගෙන් අහගත්තා. දීඝනිකායත් ඒ ආකාරයෙන්ම තනිව දිගට කියවමින් අමාරු තැන් අහගනිමින් ඉගෙන ගත්තා. වයස විස්ස වෙනකොට ඔය ඔක්කෝම පොත් කියවලා අවසන් කළා. වෙන එකක් තබා, සාරත්ථදීපනී විනය ටීකාවත් බොහෝ දුරට මා කට පාඩම් කළා. මොකද? රාත්‍රියට මුල ඉඳන් අවසානය දක්වා පෙළයි අටුවාවයි මා කියවනවා. ඒක නිසා ඒක කටපාඩම් වුණා. වයස විසි හතර වෙනවිට හත්ථවනගල්ල විහාරවංසය, දාඨාවංසය ආදියත් කියවා අවසන් කළා. දවසක් ඇර දවසක් හෝ දවස් දෙකක් ඇර දවසක් ගංගාරෝහණ වර්ණනාව, ප්‍රාතිහාර්‍ය ශතකය, මුවදෙව්දාවත වැනි

පොත් සිංහල දැනුම වැඩිකර ගැනීම සඳහා කියවන්ට සිද්ධ වුණා. අන්තිමට තමයි මට හාමුදුරුවන් දුන්නේ අශ්වඝොෂ බුද්ධචරිතය කියවන්න. සංස්කෘතවලට මුලින්ම කියවන්න දුන්න පොත ඒකයි ඊ ළඟට මා තවත් සංස්කෘත පොත් කීපයක්ම කියෙව්වා. විශේෂ උත්සාහයක් මා දැරුවේ නැහැ සංස්කෘත ඉගෙන ගන්න. හාමුදුරුවන් මට කිව්වා ඔය සංස්කෘත පොත් ටිකක් කියවන්න. එතකොට ඕක හරියයි කියලා."

"වයස විසි හතර වෙනකොට හාමුදුරුවන් කිව්වා, 'දැන් ඔව ඉගෙන ගත්තා ඇති, දැන් තනියම ඕන හැටියට තවදුරට ඉගෙනීම දියුණු කරගන්ඩ පුළුවන් කියලා. දැන් ඉතින් ඉංග්‍රීසි දැනුම දියුණු කර ගත්තොත් හොඳයි කියලත් කිව්වා. ඒ සඳහා මා ආනන්ද කොලීජියට යැවීමටත් උනන්දු වූයේ උන්වහන්සේයි. මට මුලදී ඉංග්‍රීසි ගැන වැඩි උනන්දුවක් තිබුණේ නැහැ. කොටින්ම වයස විසිහතර වනතෙක්ම මා වැඩියෙන් උනන්දු වුණේ ව්‍යාකරණ පොත්, ත්‍රිපිටක පොත් කියවන්නයි. ඒ වන විටත් ත්‍රිපිටක පොත් බොහොමයක් කියවා අවසන් කරලයි හිටියේ. පාලි ව්‍යාකරණ පොත් වලින් කච්චායනයට තියෙන පරිවාර ග්‍රන්ථ ඔක්කොම වගේ මා තනිව කියෙව්වා. කච්චායන භේදය, කච්චායන සාරය, රූපභේදප්පකාසනිය, කාරිකාව, ශබ්ද බින්දුව, බාලාවතාර ගන්ධි සාරය, කාරක පුෂ්ප මංජරිය, ආදි මහ ගොඩාක් පරිවාර පොත් ඒ කාලයේ තිබුණා."

"ගොඩාක් පොත් කියවිය යුතුව තිබුණු නිසා මේ අවුරුදු නවයේම මා රෑ නිදි ගත්තේ පැය දෙකහමාරක් පමණයි. ඒ කාලය තුළ පිළිවෙළින් පෙළ පොතුත්, දාඨාවංසාදි පාලි කාව්‍යත් අමාවතුර, මුවදෙව්දාවත ආදි සිංහල සාහිත්‍ය ග්‍රන්ථත් කියෙව්වා. මේ අන්දමේ අධ්‍යාපනයක් තමයි මා ලැබුවේ. මේ නිසා පාලි භාෂාව ගැන ලොකු පලපුරුද්දක් මට ඇති වුණා. සිංහල භාෂාව තරමටම මට පාලි භාෂාවෙනුත් කතා කිරීමට හැකියාව ලැබුණා. ඒ කාලයේ හැම හැන්දෑවකම හාමුදුරුවන් අපට කතා කරලා 'අපි පාලියෙන් කතා කරමු' කියලා, කතාව පටන් ගන්නවා. හාමුදුරුවන් සමග අප පාලියෙන් වාද කරනවා. එතනදී අපට වරදින පාලි වාක්‍යය මෙන්න මෙතනයි වරද කියලා හොඳට පෙන්නලා දෙනවා. අතික පත්තරය ආවාම ඒක ගේන්න කියා එහි ලියවිල්ලක් කියවන්න කියලා

අපට නියම කරනවා, ඒකේ තියෙන වැරදි හොයන්න. ව්‍යාකරණ වැරදි මොනවාද කියලා අපෙන් අහනවා. ඉතින් අපට වැරැද්දක් හොයා ගන්න බැරිවුණොත් මෙන්න මෙතන වැරදියි කියලා පෙන්වා දෙනවා. කවුරුන් හෝ හදපු පාලි, සංස්කෘත හෝ සිංහල ස්තුති පත්‍රයක් හරි ශෝක ප්‍රකාශයක් හරි ලැබුණාම ඒකේ තියෙන වැරදි හොයන්න කියලා අපට නියම කරනවා. අපට හොයා ගන්න බැරිවුණොත් මෙන්න මෙතන වැරද්ද කියලා හාමුදුරුවන්ම පෙන්නලා දෙනවා."

"ඔය විදියටයි අප ඉගෙන ගත්තේ. අප ලබා ගත් මේ දැනුම නිසාම පාලි සංස්කෘත හෝ සිංහල පිළිබඳව කුමන හෝ වරදක් දුටු හැටියේම මට පේනවා මෙන්න මෙතනයි වරද කියලා. වයස විසි හතර වනවිට හාමුදුරුවන් ළඟ පුරා අවුරුදු නවයක් ඉගෙනීම සඳහා ගත කරලා තිබුණා. අපට නිවාඩු ලැබුණේ සිංහල අවුරුදු දවස, වෙසක් පෝය දවස, සහ පොසොන් පෝය දවස වගේ දවස් කීපයක් පමණයි. අනික් මුළුකාලයම හැමදාම පොත් පාඩම් දෙන්න වුණා. කටපාඩම් කරපු ඒවා රාත්‍රියේ හාමුදුරුවන්ට ඇහෙන්න කිය යුතුයි. ඉතින් හැමදාම රෑ පැය දෙකක් පමණ කටපාඩම් කියනවා. කොළඹ එනවිට මා විනය පොත් දෙකහමාරක් කටපාඩම් කරලා තිබුණා. මහවග චූළුවග දෙකම කටපාඩම්. පාරාජිකා පොතේ බාගයක් කටපාඩම්. පාචිත්තිය පාලි පොතෙන් කොටසක් කටපාඩම්. පාලිතිසණ්ඨුව කටපාඩම්. සාරත්ථදීපනී ටීකාවත් බොහෝ දුරට කටපාඩම්. ධාතුමංජුසාව ආදිය මුලින්ම කටපාඩම් කරලා තිබුණා. බණ පොතුත් හුඟාක්ම කටපාඩම් මේ නිසාම තිබිච්ච ලොකුම ප්‍රයෝජනය පාලි ලියන කොට කියන කොට පෙළේ තියෙන පාලි රීතිය බොහෝ සෙයින්ම මතක් වීමයි. කියවෙන්නෙත් ඒවා, ලියවෙන්නෙත් ඒවා."

"එද අවුරුදු නවයකින් අප ලැබූ අධ්‍යාපනය අද ක්‍රමය අනුව අවුරුදු විස්සකින්වත් ලබන්න බැහැ. ඔන්න ඔහොමයි පැරණි ඉගෙනීමේ ක්‍රමය. ඉතින් ඔය පැරණි භික්ෂු අධ්‍යාපන ක්‍රමය නැවත ඇති කළොත් සිංහල පාලි සංස්කෘත හොඳට දන්නා උගතුන් ඇතිවෙනවා කියා මා හිතනවා."

"අපේ හාමුදුරුවන් ඈත දුර බැහැර ධර්මදේශනාවකට එහෙම වඩින විට මගේ පාඩම්වලට බාධාවක් වෙනවයි කියලා මාත් එක්කර ගෙනමයි ඒවාට වැඩියේ. ගිහිල්ලා විවේක ඇති පරිදි

ඒ තැන්වලදීත් මගෙන් පාඩම් ගන්නවා. මේ විදියට මගේ ගුරුහාමුදුරුවන් බලවත් උනන්දුවෙන් මට ඉගැන්නුවා. ඒ කාලයේ දැන් වගේ ගමනාගමන පහසුකම් නැහැ. කාරුත් නැහැ. බසුත් නැහැ. සැතපුම් දහය දොළහ බණවලට වඩින්නේ පයින්මයි. රාත්‍රියේ බණට වැඩලා පසුවද දවාලත් පහුවෙලා තමයි ආපසු පන්සලට වඩින්නේ. හොඳ සිද්ධියක් මට මතකයි. දවසක් බළන්ගොඩ ඉඳලා සැතපුම් හයක් විතර එහා මද්දේගම කියන ගමේ පන්සලේ බණකට ලොකුහාමුදුරුවන්ට වඩින්න සිදු වුණා. ඒ වෙලාවේ ලොකුහාමුදුරුවන් මට කිව්වා 'පුංචිනම මට ආපසු එන්න වෙන්නේ අනිද්ද. ඒ නිසා පුංචිනමත් පාඩම් කරන පොත් දෙකක් තුනක් අරගෙන මාත් එක්ක යන්න ලෑස්ති වෙන්න ඕනෑ' කියලා. තවත් කැප කරුවෙකුත් එක්කයි හාමුදුරුවන් පිටත් වුණේ. මාත් ඉතින් පිටුපස්සෙන් පිටත් වුණා. හාමුදුරුවන් කිසිම කතාවක් නැතුවයි ඉදිරියට වඩින්නේ. බිම බලාගෙන නිශ්ශබ්දව ඉදිරියට වඩිනවා. ටිකක් දුර ගොහින් හාමුදුරුවන් මට කතා කරලා මගෙන් ඇහුව්වා, 'පුංචිනම මේ එන ගමන් මොනවා ගැන කල්පනා කරමින්ද ආවේ කියලා' මා කිව්වා මේ පැත්ත මා කලින් නාව පැත්තක් නිසා වට පිට ගස් කොළන් කඳු මිටියාවත් බලමින් තමයි ආවෙ කියලා. වෙන මොකවත් ගැන මා කල්පනා කළේ නැහැ කියලත් කිව්වා. එතනදී හාමුදුරුවන් කිව්වා 'පුංචිනම එහෙම එපා, ඔය පාඩම් කළ පොත්වල පාඩම් සිහි කර කර එන්න කියලා. නැත්නම් ඕවා අමතක වේවි නේද?' කියලත් කිව්වා. 'පුංචිනම මාත් මේ යන්නේ කුඩා කාලයේ පාඩම් කළ දේවල් සිහි කරමින් තමයි' කියලත් කිව්වා."

"එද ඒ පන්සලට ගියාට පස්සේ හාමුදුරුවන් මට මෙන්න මෙහෙම අවවාදයක් කළා. 'දැන් ඉතින් මේ පන්සලේ කෙනකු වගේ මෙහෙත් වත් පිළිවෙත් කරන්න ඕනෑ. විහාර මළු අතුපතුගෑම් ආදියත් කරන්න ඕනෑ. ඊට පස්සේ පාඩම් දීමට පාඩම් පිළියෙළ කර ගන්නත් ඕනෑ' මේ විදියට තමයි මගේ ඉගෙනීම කරගෙන ගියේ. එක දවසක්වත් පාඩම් දීම, ගැනීම වැරදිලා ගියේ නැහැ. සමහර දවස්වල අපේ හාමුදුරුවන් අභිධර්මාර්ථ සංග්‍රහය කටපාඩමින් කියාගෙන යනවා. අපට අහගෙන ඉන්නයි එහෙම කියාගෙන යන්නේ. රාත්‍රියේ නින්ද යනතුරුම සමහර දවස්වල කියනවා. සමහර දවස්වල සාරස්වත ව්‍යාකරණය කටපාඩමින්

කියනවා. ඔය විදියට උන්වහන්සේ පාඩම් කරපු දේවල් කටපාඩමින් කියන සිරිත තිබුණා. විනය විනිශ්චය ගාථා දෙදහකටත් වඩා උන්වහන්සේට කටපාඩම් තිබුණා. සමහර දවස්වල විවේකයෙන් වැඩ ඉන්න කොට ඒවත් කටපාඩමින් කියවනවා. මේ නිසා මගේ ඉගෙනීම් කටයුතුවලදී ලොකුහාමුදුරුවන් මට ලොකුම ආදර්ශය වුණා. මතක තබාගැනීමේ හා පොතපතටම සිත් යොමු කිරීමේ පුරුද්ද මට ඇතිවුණේ උන්වහන්සේ නිසයි. සිරුර අලංකාර කිරීම, හා ඉන්න තැන සැරසීම, බඩුමුට්ටු රැස්කිරීම වැනි දේට උන්වහන්සේගේ කිසිම ඕනෑකමක් තිබුණේ නැහැ. මටත් ඒ ක්‍රමය උන්වහන්සේගෙන් පුරුදු වුණා.”

“මා වයස විස්සේදී එනම් 1916 ජූලි 14 වෙනිද බළන්ගොඩ ඕලුගහ උදකුක්ඛෙප සීමාමාලකයේදී උපසම්පදාව ලැබුවා. මගේ උපාධ්‍යායන් වහන්සේ තමයි මගේ ගුරුහාමුදුරුවන්. වහන්සේගේ ආචාර්යයන් වහන්සේ වන දමහන ධම්මානන්ද මහානායක හාමුදුරුවෝ. උන්වහන්සේ වැඩ සිටියේ මහවලතැන්නේ අදිකාරම් මැතිතුමා විසින් කරවන ලද මහවලතැන්නේ චන්ද්‍රශේඛර මුදලින්දරාමයේ. ඒ පන්සල තිබුණේ වලව්වට අල්ලපු වත්තේ. මගේ ආචාර්යයන් වහන්සේගේත් සියලු අවශ්‍යතා සපුරාලන ප්‍රධාන දායකයා වශයෙන් ක්‍රියා කළේ ඇස්. ඩී. මහවලතැන්නේ රටේ මැතිතුමායි. එතුමාගේ ඇවෑමෙන් අපේ සංඝයාගේ මහා දායකකම දැරුවේ එතුමාගේ බෑනණුවන් වූ බාන්ස් රත්වත්තේ රටේ මැතිතුමායි. ඒ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ පියා. මට වයස විස්සේදී තරම මහවලතැන්නේ රටේ මැතිතුමා මගේ ප්‍රාචාර්යයන් වහන්සේ සමග සාකච්ඡා කොට මා මාළිගාකන්දේ විද්‍යෝදය පිරිවෙනට යැවීමට අදහසක් ඉදිරිපත් කළා. එතුමා කියා සිටියේ මේ අපේ පන්සලේ දෙන අධ්‍යාපනය හොඳයි, නමුත් නවීන ක්‍රමයට තවත් බාහිර ඉගෙනීමක් ලබා ගැනීමට මාළිගාකන්දට ගියොත් හොඳ බවයි. මේ අදහසට මගේ ප්‍රාචාර්යයන් වහන්සේ එකඟ වුණා. මේ අවස්ථාවේදී මහවලතැන්නේ රටේ මැතිතුමා, බාන්ස් රත්වත්තේ මැතිතුමාට කතා කරලා කිව්වා, ගොහින් මුදලාලි මුණගැහිලා පොඩිහාමුදුරුවන් මාළිගාකන්දේ පිරිවෙනට යැවීමට සාකච්ඡා කළ බව දන්වන්න කියලා. ඒ විතරක් නෙවෙයි ඒ ගැන මුදලාලිගේ අදහස අහන්න කියලත් කිව්වා. බාන්ස්

රත්වත්තේ මැතිතුමා වෙළඳ සැලට ආවා, අපේ ලොකුතාත්තා මුණගැහෙන්න. ඇවිදින් මේ කාරණය දැනුම් දුන්නා."

"ඒ වෙලාවේ ලොකුතාත්තා කිව්වේ මගේ දරුවා මා බාර දුන්නේ ලොකුහාමුදුරුවන්ටයි. උන්වහන්සේගේ අවසර නැතුව මට මොකවත් කියන්න බැහැ. එදා සවස ලොකුතාත්තා ලොකුහාමුදුරුවන් මුණ ගැහෙන්න පන්සලට ආවා. ඇවිදිල්ලා රටේ මහත්තයාගේ අදහස ලොකු හාමුදුරුවන්ට කිව්වා. ඒ වෙලාවේදී ලොකු හාමුදුරුවන් මට කතා කරලා කිව්වා, 'පුංචිනම, ඔය නම මාළිගාකන්දේ විද්‍යෝදය පිරිවෙනට යවන්න යෝජනාවක් ඉදිරිපත් වෙලා තියෙනවා. කැමතිනම් ඒක මට පිළියෙළ කරන්න පුළුවන්'. එතකොට මා ලොකු හාමුදුරුවන්ට කිව්වා, 'හාමුදුරුවන් ළඟ මා මෙච්චර කල් පොත් කිව්වා, තවත් පොත් කියන්න තියෙනවා. කවද හරි මට දැන් පොත් කියෙව්වා ඇති කියලා හාමුදුරුවන් වදාරන තුරු මා මේ විදියටම ඉගෙන ගන්න කැමතියි. දැන්ම මට පිට යන්න බැහැ'. ඉතින් ඔය විදියට බුද්ධ ධර්මය පිළිබඳ පරිපූර්ණ උගතකු වූ මගේ ආචාර්යයන් වහන්සේගේ ඇසුරේ අවුරුදු නවයක් තරම් කාලයක් බුද්ධ ධර්මයත් අනෙකුත් ශබ්ද ශාස්ත්‍රත් ඉගෙන ගත්තා."

"බුද්ධ ධර්මය ගැන වගේම ඉංග්‍රීසි භාෂාව ගැනත් මා උනන්දු කළේ මගේ ලොකු හාමුදුරුවන්. මහවලතැන්නේ රටේ මහත්තයා හමුවෙන්න අප ඉඳහිට යනවා. එතුමා හොඳ ඉංග්‍රීසි උගතෙක්. විදේශීය රටවල පළකරන පොත්පත්, ප්‍රකාශන, සහරා එතුමා කෙළින්ම ගෙන්වා ගන්නවා. සමහර විදේශීය බෞද්ධ සමාගම්වලින් පළකරන ප්‍රකාශනවලට එතුමා දායකයකු වී සිටියා. එතුමාගේ පුස්තකාලයේ ඉංග්‍රීසි පොත්පත් පිරී තිබුණා. ඒ පොත්පත් දැක්කම ඒවා කියවන්න ඇත්නම් කොච්චර හොඳද කියලා මට ලොකු ආශාවක් ඇතිවුණා. එක දවසක් එතුමා මට කිව්වා, 'පාලි සංස්කෘත විතරක් ඉගෙන ගත්තට මදි, ඉංග්‍රීසිත් හොඳට ඉගෙන ගන්න ඕනෑ' කියලා. 'ඉංග්‍රීසි හොඳට ඉගෙන ගත්තොත් ලෝකයේ නොයෙක් රටවල ධර්මප්‍රචාරය කරන්න පුළුවන්' කියලා, එතුමාත් ඉංග්‍රීසි ඉගෙනීම පිළිබඳව මා ධෛර්යමත් කළා. ජාතකට්ඨකථාවේ රීස් ඩේවිඩ්ස් ඉංග්‍රීසි පරිවර්තනය එතුමා ළඟ තිබුණා. ඒක මට කියවන්න කියලා එව්වා."

GAMUWA AFFILIATED UNIVERSITY
REFERENCE
LIBRARY

"මේ අතර විදේශීය උගතුන් හා විවිධ සමාගම් එක්ක ඇතිකරගත් සම්බන්ධකම් තුළිනුත් මගේ සමයාන්තර දැනුම මෙන්ම ඉංග්‍රීසි භාෂා ඥානයද වැඩි දියුණු වුණා. මගේ ආචාර්යවරයාණන් වහන්සේගේ මෙහෙයවීමෙන් මද්‍රාසියේ තියෝසොපිකල් පොත් හලෙන් පොත්පත් මා ගෙන්වා ගත්තා. ධම්මපදට්ඨ කථාවේ සැමුවෙල් බිල්ගේ ඉංග්‍රීසි පරිවර්තනයත් ඒ සමාගමෙන් ගෙන්වා ගෙනයි මා කියෙව්වේ. එහෙත් එවූ පුස්තකාල නාමාවලියේ ඉංග්‍රීසි පරිවර්තනය සහිත භගවත්ගීතාව ගැන සඳහන්වී තිබුණා. භගවත්, යන නම නිසා මා සිතුවේ ඒක බෞද්ධ පොතක් කියලා. ඒ නිසා ඒකත් ගෙන්වා ගත්තා. ඒක හින්දු ආගමේ පොතක්. එයට ඇනී බැසන්ට් මැතිනිය සැකසූ ඉංග්‍රීසි පරිවර්තනයත් එක්ක ඒකත් කියෙව්වා. මගේ සංස්කෘත දැනීම දියුණු කර ගැනීමටත් ඒක හුඟාක් උපකාරී වුණා. එයට පස්සේ එහෙත් පරිවර්තන සහිත උපනිෂද් පොත්ද කිහිපයක් ගෙන්වා ගෙන කියෙව්වා."

"මේ අතර කාලයේ එංගලන්තයේ බ්‍රිතාන්‍ය අයර්ලන්ත මහා බෞද්ධ සමිතියේ (Buddhist Society of Great Britain and Ireland) ලේකම් ෆ්‍රැන්ක් ඊ. බෝල්ස් (Frank E. Balls) සමග ලියුම් කියුම් ගනුදෙනු කිරීමට පටන් ගත්තා. ඒ සමිතිය පිළිබඳ තොරතුරු මා දැනගත්තේ කල්කටාවේ පළවෙන මහාබෝධි සමාගමේ සඟරාව මගින්. ඒ සඟරාව නිතර කියවන්න මා පුරුදු වී සිටියා. මේ කාලයේම කල්කටාවේ සිටිය අනගාරික ධර්මපාලතුමා සමගත් මා ලියුම් ගනුදෙනු කරන්න පටන් ගත්තා. බ්‍රිතාන්‍ය බෞද්ධ සමිතියේ යථෝක්ත ලේකම් මහතා ඒ සමිතියෙන් පළවූ බුඩිස්ට් රිවීව් නැමැති සඟරාවේ මුල පටන් සියලුම කලාප මට පරිත්‍යාග වශයෙන් එවා තිබුණා. ඒ සඟරාව මගින් රීස් ඩේවිඩ්ස් මැතිනියගේ ලිපිනයත් මා දැනගත්තා. දැනගෙන ඇය සමගත් ලියුම් ගනුදෙනු කරන්න පටන් ගත්තා. මට හොඳට මතකයි මා ඇයට යැවූ පළමුවන ලිපියේම මැක්ස්මුලර් ආදි පඬිවරුන් විසින් ඉංග්‍රීසියෙන් පළකරන ලද ධම්මපදයේ මුල්ම ගාථාව 'මනො පුබ්බඞ්ගමාධම්මා' පරිවර්තනය කර තිබෙන්නේ වැරදි ලෙස බව ඇයට ලියා යැව්ව හැටි. එතැන් පටන් ඇය සමගත් ලියුම් කියුම් ගනුදෙනු කිරීම වැඩි වුණා. ඇය මට එවන ලියුම්වල මගේ ඉංග්‍රීසි භාෂා දැනුම දියුණු කර ගැනීම සඳහා අසවල් අසවල් පොත් කියවන්න කියලත් මට උපදෙස් දී තිබුණා."

"මේ අතර එතුමිය විසින් ඉංග්‍රීසියට පරිවර්තනය කරනලද සංයුත් සඟියේ සගාථක වග්ගයේ පිටපතක් ද මට පරිත්‍යාගයක් වශයෙන් එවා තිබුණා. එය හොඳට භාවිතා කරන්න කියාත් ඒ අනුව ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම දියුණු කරගන්න කියාත් මට දන්වා එවා තිබුණා. මාත් සංයුත් සඟියේ සගාථක වග්ගය (පාලි) කටපාඩම් කළා. ඇගේ ඉංග්‍රීසි පරිවර්තනයත් කටපාඩම් කළා. අකාරාදියක උදව්වෙන් ඒවායේ අර්ථත් ලියාගෙන පාලිය සමග සංසන්දනය කරමින් ඒ අනුව ඉංග්‍රීසි දැනුම දියුණු කර ගත්තා."

"මා අභිධර්මාර්ථ සංග්‍රහය ඉගෙන ගන්න කාලයේ එංගලන්තයේ පාලි පොත් සමාගමෙන් පළකර තිබුණු කොම්පෙන්ඩියම් ඔෆ් බුඩිස්ට් පිලොසපි (A compendiam of Buddhist philosophy) නම් අභිධර්මාර්ථ සංග්‍රහයේ ඉංග්‍රීසි පරිවර්තනය ද කියෙව්වා. බොහෝ දුරට ඒකත් කටපාඩම් කරගත්තා. ස්වල්ප කාලයකට පසුව කථාවත්ථු ප්‍රකරණය ඉංග්‍රීසියට නගා තිබුණු බව පාලි පොත් සමාගමේ පොත් ලැයිස්තුවෙන් මා දැනගත්තා. ඒකත් මා ගෙන්වා ගත්තා. ඒ කාලයේ කථාවත්ථු ප්‍රකරණය සිංහල අකුරෙන් මුද්‍රණය වී තිබුණේ නැහැ. අප ආචාර්යයින් වහන්සේ විසින් බුරුම රටින් ගෙන්වා ගෙන තිබුණු බුරුම අකුරු කථාවත්ථු ප්‍රකරණය ඉල්ලාගෙන ඒක ඉංග්‍රීසි පරිවර්තනයත් සමග සංසන්දනය කරමින් මා කියෙව්වා."

"මහාබෝධි සමාගමේ සඟරාවේ පළ වූ අනගාරික ධර්මපාලතුමාගේ සමහර ලියවිලි මා සම්පූර්ණයෙන්ම කටපාඩම් කරගත්තා. සමහර දවස්වල විහාර මිදුලේ කටපාඩම් කරන ගමන් ළඟම තියෙන ගහක් දිහා බලාගෙන ඉංග්‍රීසි කතාවක් පවත්වන ආකාරයෙන් කටපාඩම් කරගත් ලියවිලි කියාගෙන යනවා. මේ තරම් උත්සාහ ගත්තේ ඉංග්‍රීසියෙන් දේශන පැවැත්වීමට හුරුපුරුද්දක් ඇතිකර ගැනීමටයි. ඒ අහලකවත් ඉංග්‍රීසි දන්න කෙනෙක් නැති නිසා ස්වෝත්සාහයෙන් මේ සියල්ල කරගන්ට මට සිදු වුණා."

"නොයෙක් අවස්ථාවල මගේ ආචාර්යයින් වහන්සේ මා කියවන ඉංග්‍රීසි පොත් උන්වහන්සේ ඉදිරියේ කියවා සිංහලට නගන්න කියලා මට නියම කරනවා. මේ අන්දමින් උන්වහන්සේ මගේ ඉංග්‍රීසි දැනුම දියුණු කරගන්ට බොහොම අනුබල දුන්නා.

ACCESSION NO 15018
CLASSIFICATION NO 922

උන්වහන්සේට ඉංග්‍රීසි දැනුමක් තිබුණේ නැහැ. එහෙම වුණත් ඉංග්‍රීසි දැනුම දියුණු කරගැනීමේ ඇති ප්‍රයෝජනය නිතර නිතර මට පැහැදිලි කර දුන්නා. 'කවරදක හෝ පිටරටවල බුද්ධ ධර්මය ප්‍රචාරය කිරීමේ ක්‍රියා මාර්ගයකට සහයෝගය දෙන්න අවස්ථාවක් උදවෙන්න පුළුවන්. ඒ නිසා ඉංග්‍රීසි දැනගෙන තියෙන එක හොඳයි' කියමින් නිතර නිතර මා උනන්දු කළා."

"රැට පැය දෙක හමාරයි මා නිදගත්තේ. ඉතිරි මුළු කාලය ගත කළේ ඉගෙනීමටයි, පොත් කියවීමටයි. එසේ නොකළානම් එච්චර පොත් රාශියක් නව අවුරුද්දක් තුළ කොහොම කියවන්නද?"

4

# සහසතු දේපල ක්‍රමය කොමියුනිස්ට්ද?

"දැන් මේ වනවිට මගේ වයස අවුරුදු විසි හතරයි. ඔය අතර මට සඳරැස් පත්‍රයේ පළවී තිබුණ විශේෂ දැන්වීමක් දකින්නට ලැබුණා. කොළඹ ආනන්ද විද්‍යාලයේ භික්ෂූන් වහන්සේලා සඳහා විශේෂ ඉංග්‍රීසි පන්තියක් ආරම්භ කොට ඇති බව එහි පළවී තිබුණා. මේ දැන්වීම කියවලා අපේ හාමුදුරුවන් මට කිව්වා, 'පුංචිනම මේ පන්තියට බැඳුණොත් හොඳයි, දැන් බණ දහම් ඉගෙන ගත්තා ඇති, කොළඹ යන්න සූදානම් වෙන්න, පුංචිනමගේ ලොකු පියාටත් කොළඹ යන බව දන්වන්න.' කියල මට කිව්වා. පියාට මා දැනුම් දුන්නා. ඒ අනුව මගේ ආචාර්යයින් වහන්සේටත් මටත් තවත් කැපකරුවෙකුටත් ගමන් වියදම් සඳහා මුදල් මගේ ලොකුතාත්තා එවා තිබුණා. මට මතක ඇති හැටියට ඔය 1919 අවුරුද්දේ මුල. කොළඹ ආනන්ද විද්‍යාලයේ භික්ෂූන් වහන්සේලාගේ පන්තියට ඇතුළත් කරගැනීමේ විභාගය පැවතුණා. මේ සඳහා අප කොළඹට ආවේ දුම්රියෙන්. ඒ කාලේ බස් නැහැ. මා එම විභාගයට පෙනී සිටියා."

"මේ පරීක්ෂණයේ පාලකයන් වශයෙන් සිටියේ ගුණසේකර මහතා සහ බී. ඇස්. පෙරේරා මහතායි. ඒ දෙපළ ආනන්දයේ ගුරුවරු. දෙන්නම පුහුණු ගුරුවරු. ඒ මහත්වරු මගේ උත්තර පත්‍ර බලා අවසන්වෙලා විභාගශාලාවේ එළියේ පුටුවක වැඩ සිටිය අපේ හාමුදුරුවන් ළඟට ඇවිත් කිව්වා, 'නායක හාමුදුරුවනේ, මේ පොඩි හාමුදුරුවන්ට මේ පන්තිය මදි. පොඩි හාමුදුරුවන්ගේ ඉංග්‍රීසි භාෂා දැනුම හුඟාක් දියුණු වෙලා තියෙනවා. කුලරත්න මහත්මයත් සමග කතා කරලා මැට්‍රිකියුලේෂන් පන්තියට හරි සීනියර් පන්තියට හරි පොඩි හාමුදුරුවන් ඇතුළත් කරනවා'. ඒ වෙලාවෙදී ලොකු හාමුදුරුවන් කිව්වා, 'මට ඕවා ගැන තේරුමක් නැහැ. පුංචි උන්නාන්සේගේ කැමැත්තක් කරන්න' කියලා.

ඒ වෙලාවේදී මා කිව්වා, මට ඉංග්‍රීසි භාෂාව හුහක් තේරුණත් කතා කරන ඉංග්‍රීසි ගැන හුරු පුරුද්දක් නැහැ. ඒ නිසා කතා බහ හුරු පුරුදු වෙන්නත් එක්ක පහළ පන්තියක ඉඳන් යන එක හොඳයි කියලා.''

''පන්ති දෙකයි තිබුණේ. මා ඉහළ පන්තියට දැම්මා. ඒ පන්තියේ හිටියේ පොල්වත්තේ බුද්ධදත්ත, කිරුළපනේ විමල, කරපුටුගල ධම්මාලෝක, දොඩන්දූවේ කල්‍යාණවංශ, ගිංතොට භාරද්වාජ, ගාල්ලේ පඤ්ඤානන්ද යනාදි හාමුදුරුවරුන්. ඉතින් මා ඒ පන්තියේ ඉගෙනීම කළා. මට ඒ පන්තියේ වැඩිය ඉගෙන ගන්න දෙයක් තිබුණෙත් නැහැ. උගන්වන විට ඉංග්‍රීසියෙන් කතා කරන නිසා ඒ අනුව ඉංග්‍රීසි කතාව පුරුදු වුණා.''

''මේ ඉංග්‍රීසි පන්තියේ දැ වුරුද්දක් විතර ඉගෙන ගත්තායින් පස්සේ මට මතකයි ආනන්ද කොලීජියේ පාලි ඉගැන්වීම ආරම්භ වෙච්ච හැටි. ඒ සඳහා පොල්වත්තේ බුද්ධදත්ත, කිරුළපනේ විමල ආදි කීපනමකුත් ටික කලකට පසු මාත් පත්කර ගත්තා. ඊට ටික කලකට පස්සේ ආනන්ද කොලීජියේ සංස්කෘත ඉගැන්වීමත් ආරම්භ කරන්න කුලරත්න මහත්මයා අදහස් කළා. උන්නැහේ මේ ගැන අනික් හාමුදුරුවරුන් සමග සාකච්ඡා කළාම ඒ ඇත්තන් කිව්වලු, 'මේ ළමයින්ට සාරස්වත ආදිය ඉගැන්වීම කළ නොහැකි වැඩක්' කියලා. පස්සේ දවසක් කුලරත්න මහත්මයා මට එන්න කියලා ආනන්දයේ ළමයින්ට සංස්කෘත ඉගැන්වීම ගැන සාකච්ඡා කළා. ඒ වෙලාවේදී මා කිව්වා, ඒක ලේසි වැඩක් කියලා. ඊට පස්සේ උන්නැහේ ආනන්ද කොලීජියේ සංස්කෘත පන්ති ආරම්භ කීරීම මට පැවැරුවා.''

''මේ අතර මා ඉන්දියාවේ ස්කෝලවල සංස්කෘත ඉගැන්වීමට සකස් කර තිබුණු ගෝලේ නම් ආචාර්යවරයාගේ සංස්කෘත ඉංග්‍රීසි පාඩම් පොත් පෙළ ඉන්දියාවෙන් ගෙන්වා ගත්තා. ඒවායින් තමයි මා සංස්කෘත ඉගැන්වීම ආරම්භ කළේ. ඒක හොඳට සාර්ථක වුණා. ටික කලකට පස්සේ පොල්වත්තේ බුද්ධදත්ත, කිරුළපනේ විමල, ආදි තෙරවරුන් තම තමන්ගේ පන්සල්වල කටයුතු නිසා ආනන්ද කොලීජියෙන් අස්වෙලා ගියා. සියලුම ඉහළ පන්තිවල පාලි සංස්කෘත හා ධර්මය ඉගැන්වීමේ බර මා කරපිට වැටුණා. මට උදව් පිණිස කැමති භික්ෂු දෙනමක් ගෙන්වා ගන්නා ලෙස

කුලරත්න මහතා මට උපදෙස් දුන්නා. ඒ විතරක් නෙවෙයි ආනන්ද කොලීජිය ඇතුළේම ශිෂ්‍ය නිවාසයේ කාමර දෙකක් මගේ පදිංචියට වෙන් කර දුන්නා.''

''මගේ උදව්වට පසු කාලයේ මැදගම විහාරාධිපතිව වැඩ සිටි අපවත්වී වදාළ පිටදෙණියේ රතනපාල නායක ස්ථවිරයන් වහන්සේත්, කනම්පැල්ලේ විහාරාධිපතිව වැඩ විසූ පේමානන්ද නායක ස්ථවිරයන් වහන්සේත් සහාය ගුරුවරුන් වශයෙන් පත් කර ගත්තා. ඒ නම් මට හරියට මතකත් නැහැ. අවුරුදු කීපයක් ඒ තෙරවරුන් ආනන්ද කොලීජියෙහි ඉගැන්වීමෙහි යෙදුණා. අන්තිමට ඒ තෙරවරුන් අස්වෙලා තම තමන්ගේ ගම්වලට පිටත් වෙලා ගියා. අන්තිම කාලයේ ටිබැට් ජාතික මහින්ද භික්ෂුව හමුවී කතා කරලා මගේ සහායට පත් කර ගත්තා. මා ආනන්දයේ ඉගැන්වීමෙහි යෙදුණු මුල් කාලයේම කුලරත්න මහත්මයා තවත් පාසලක් ආරම්භ කළා. ඒක ආනන්දයේ ප්‍රාථමික පාසල ලෙස පවත්වා ගෙන යන්නයි එතුමා අදහස් කළේ. එහි ප්‍රධානියා හැටියට ආනන්දයෙන් යැව්වේ මෙත්තානන්ද මහත්මයා. ඒ අලුත් පාසල තමයි නාලන්ද විද්‍යාලය. ඒ නම දුන්නෙත් මායි. කුලරත්න මහත්මයාගේ ඉල්ලීම පරිදි නවසිය විසිතුනේ ජනවාරි පළමුවෙනිදා නාලන්දවේ ආචාර්ය මණ්ඩලයට මා ඇතුළත් වුණා. ඒ විදුහලේ ආදර්ශ පාඨය වන 'අපදන සෝභිනී පඤ්ඤා, (ප්‍රඥාවෙන් චරිතය හැඩ ගැසේ) යන්න දුන්නේත් මායි.''

''ටික කලක් ඔය විදියට නාලන්දයේ ඉගැන්වීම කරගෙන ගියා. ඔය වකවානුවේ තමයි, මලලසේකර මහත්මයා එංගලන්තයේ ඉඳලා ආචාර්ය උපාධිය එහෙම සමත් වෙලා ලංකාවට ආවේ. එතුමාට විදුහලේ සිංහල පාලි අංශය බාර දුන්නා. කුලරත්න මහත්මයා නැවත වරක් මට ආනන්දයට එන ලෙස බල කළා. ඉතින් මගේ අඩුව පුරවන්න හීනටියන ධම්මාලෝක තෙරුන් නාලන්දවට පත් කරවලා මා ආයෙමත් සැරයක් ආනන්දයට ආවා.''

**''ආනන්ද විද්‍යාලයේ ගත කළ ජීවිතය කරදර සහිත වුණේ නැද්ද?''**

''මට කිසිම කරදරයක් වුණේ නැහැ. මට එහිදී ආශ්‍රයට ලැබුණේ ඉතාම ශිෂ්ට උගත් හොඳ ගති ඇති ආචාර්යවරුන් සහ ශිෂ්‍යයන්. කුලරත්න මහත්මයා තමයි ප්‍රධානියා. ඔහු ඉතාමත්

අවංක ජාති භේද කුල භේද කිසිවක් නොසලකන යුක්තිගරුක බුදු දහමට ඉතා ලැදි දුර්ලභ ගණයේ පුද්ගලයකු බව මට හොඳට වැටහුණා. එවැනි කෙනෙකුගේ පාලනය යටතේ පවතින ආනන්ද විද්‍යාලය ඇතුළේ ගත කළ මගේ ජීවිතය භාග්‍ය සම්පන්න එකක්. එහි කාල සටහනේ මා උගන්වන පන්තිවල කාලවේලා නියමය මට ඕනෑ විදියට සකස් කරගත් පසුවයි අනික් ගුරුවරුන්ගේ කාල සටහන් සකස් කළේ. ඒ අනුව දහවල් එකෙන් පසුව මට සම්පූර්ණයෙන්ම නිවාඩු තිබුණා. ඒ මා පුරුදු කරන භාවනා සඳහායි.''

''උදේ පහට අවදි වෙලා හය දක්වාත්, දහවල් දහයේ සිට දහයයි තිහ වනතුරුත්, හැන්දෑවේ පහේ සිට හය දක්වාත්, රාත්‍රී දහයේ සිට එකොළහ දක්වාත් මා එක්තරා භාවනා ක්‍රමයක් නොකඩවා දිගටම පුරුදු කළා. එහි ප්‍රතිඵල මට ප්‍රත්‍යක්ෂ වුණා. ඒ ආනාපානසති භාවනාවයි. මේ අතර ශිෂ්‍යයන් අතරින් උසස් ලෙස පිළිවෙත් පුරන බොහෝ දෙනෙකුගෙන් යුක්ත බෝධිසත්ව සමාගම නමින් සමාගමක් ආනන්ද විද්‍යාලයේ පිහිටෙව්වා. විද්‍යාලයේ විහාරයක් නොතිබුණු නිසා චිත්‍රශිල්පී සාර්ලිස් උන්නැහැ ලවා, ප්‍රසිද්ධ ගන්ධාර පිළිමයේ සැලැස්ම අනුව බුදු පිළිමයක් සාදවා එය ඕල්කට් ශාලාවේ උඩ තට්ටුවේ තැන්පත් කරවා, එයට ගැළපෙන ලෙස බිත්ති සායම් කරවා ආනන්ද විද්‍යාලයේ මුල්ම ප්‍රතිමා මන්දිරය ආරම්භ කළා. මෙහිදී කුලරත්න මහත්මයා මහත් උනන්දුවෙන් මට සහායව ක්‍රියා කළබව සඳහන් කරන්ට ඕනෑ. බෝඩිමේ සියලුම ශිෂ්‍යයන් හා ගුරුවරුන්ද එතැන් සිට උදේත් හැන්දෑවෙත් මේ අලුත් විහාර මන්දිරයට ඇවිදිල්ලා වන්දනාමාන පුද පූජා පැවැත්තුවා. වැඩි දෙනෙකු එහිදී මෛත්‍රී භාවනාව ආදි කිසියම් භාවනාවකුත් පුරුදු කළා. මෙසේ ආනන්ද විද්‍යාලයේ බෝඩිමේ ගත කළ ජීවිතය එහි ගුරු ශිෂ්‍ය පිරිසටත් මටත් ප්‍රීතිදායක භාග්‍ය සම්පන්න කාලයක් වුණා.''

**''ආනන්දයේ නායක හාමුදුරුවන්ගෙන් ඉගෙන ගත්ත ශිෂ්‍යයන් අතර විශේෂයෙන් සඳහන් කළ හැකි අය මතකද?''**

''අවුරුදු 12ක් පමණ කාලයක් මා ආනන්දයේ ඉගැන්වීම් කටයුතුවල නිරත වුණා. ඔය කාලය තුළ මහත් ශිෂ්‍ය පිරිසක් මගෙන් ඉගෙනීම ලැබුවා. පසු කාලයේ උසස් තනතුරුවලට පත්වූ

බොහෝ දෙනෙකුන් ඔය අතර හිටියා. සමහර අය දන් ජීවතුන් අතරත් නැහැ. ඇන්. ඇම්. පෙරේරා, අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල, රොබට් ගුණවර්ධන, ජී. බී. සේනානායක වැනි ශිෂ්‍යයන් මට මතකයි. ඊරියගොල්ල ආනන්දයේ ඉඳලා නාලන්දය ආරම්භ කරන කොට ඒකට ඇතුළත් වුණ ශිෂ්‍යයෙක්. එයා හරිම මුරන්ඩුයි. ඒ වුනාට ඉගෙන ගන්න දක්ෂයි. ඉක්මනින් කේන්ති එන කෙළින් කතා කරන පුද්ගලයෙක්. පස්සේ කාලෙක මෙත්තානන්ද මහත්තයා සමග බහින්බස්වෙලා නාලන්දයෙන් අස්වෙලා ගියා. රොබට් ගුණවර්ධනත් විදුහල්පති එක්ක තරහ වෙලා අස්වෙලා ගියා. ඇන්. ඇම්. ඒ දෙන්නාටම වඩා වෙනස්. හරිම තැන්පත්. සන්සුන්. එයා දිගටම ආනන්දයේ ඉගෙන ගත්තා. පස්සේ වැඩිදුර ඉගෙනීම සඳහා එංගලන්තෙට ගියා."

"ආනන්දයේ උගන්වන ගමන් මා වැඩි දූරටත් ඉංග්‍රීසි හා ලතින් භාෂාව ඉගෙන ගත්තා. ආර්. එස්. එස්. ගුණවර්ධන මහත්මයා තමයි මගේ ලතින් ගුරුවරයා. කුලරත්න මහත්මයා මට ආනන්දයේදී සෑම පහසුකමක්ම සලසා දුන්නා. ඒ අතර මා උපාධියකට කල්කටා විශ්ව විද්‍යාලයට යවන්න කියලත් කුලරත්න මහත්තයා උනන්දු වුණා. මට ඕනැ වුණේ උපාධි ලබා ගන්න නෙවෙයි. ඉගෙන ගන්නයි. ඉතින් පිටරටක නොගියාට ඒක මට ලංකාවේ ඉඳලා කරන්න පුළුවන් නිසා මට එහි යන්නට ඕනැ කළේ නැහැ. හැබැයි මේ කාලයේ මගේ අදහසක් තිබුණා තව කලකට පසු ඉන්දියාවට ගිහින් ධර්මපාලතුමා සමග එකතු වෙලා ධර්ම ප්‍රචාරක වැඩ කරන්න. එතුමාත් මා ඉන්දියාවට ගෙන්වා ගන්න කැමැත්තෙන් හිටියා."

"මේ කාලයේ අප 'ලංකා ධර්ම දූත සභාව' නමින් සංවිධානයක් ආරම්භ කළා. ඒකේ සභාපති වුණේ මායි. ලේකම් වූයේ හීනටියන ධම්මාලෝක ස්ථවිරතුමායි. ධර්මදේශන පැවැත්වීමත් දේශකයන් පුහුණු කිරීමත් ආදි කටයුතු රාශියක් එයින් ඉටු කළා. කොළඹ මුඩුක්කුවල පවා ධර්ම ප්‍රචාරක කටයුතුවල අප නිරත වුණා. කොළඹ තරුණ බෞද්ධ සමිතියේ ආරාධනාවක් අනුව මා ලියූ මුල්ම කෘතිය 'බුද්ධ චරිතය', ඔය දවස්වල ප්‍රකාශයට පත් කරන්න මට පුළුවන් වුණා. 1926 දීයි එය පළ කළේ. ඔය කාලයේ වෙනත් පුවත් පත් සඟරාවලට ලිපි ලිවීමද කරගෙන ගියා."

"නායක හාමුදුරුවන් 1922 හෝ 1923 පමණ දී ක්‍රිස්තියානි ලබ්ධික්යන් සමග වාදයකට පැටලුණා නේද?"

"ඔව්, මා සඳරැසේ ලියූ ලිපියකට හෙළා දකලා කතෝලික පක්ෂයෙන් ලියන්නට පටන් ගත්තා. එතැනදී මාත් සඳරැසෙත් ලියන්නට පටන් ගත්තා. එයට පස්සේ බුද්ධ රශ්මි නමින් පත්‍රයකිනුත් ක්‍රිස්තියානි ආගම විවේචනය කළා."

"ඒක හොඳ ප්‍රවෘත්තියක්. දවසක් මට ධර්මපාලතුමා කීවා, 'තමුන්නාන්සේ විසින් දන් තව වැඩක් කළ යුතුව තිබෙනවා. ඒ තියෝසොපියට (පරමවිඥනාර්ථ වාදයට) පහර දෙන එකයි කියලා. ඒ වැඩේත් කරන්ට ඕනෑ. මා පළමුකොටම තියෝසොපිකල් සමාගමේ සාමාජිකයකු වුණා. බොරැල්ලේ පාර අද්දර 'ප්රෙස්ටන්' (Mrs. Preston) නම් මහලු ඉංග්‍රීසි නෝනා කෙනෙකුගේ ගෙදරයි තිබුණේ ඉන්දියන් තියෝසොපිකල් සමාගමේ ලංකා ශාඛාවේ කායාීලය. ඈ 'බ්ලවැට්ස්කි' මැතිනියගේ ශිෂ්‍යාවක්. දඩි ඉංග්ලිසි මානය ඇති චතුර කථිකාවක්. ලංකා ශාඛාවේ සභාපති ඈයි. ලේකම්ව සිටියේ ලවුරන්ස් (Mrs. Louranz) නම් ඕලන්ද ජාතික උගත් නෝනා කෙනෙක්. මා එතනට ගොස් එහි සාමාජික වෙන්නට ඕනෑ කීවා. 'භික්ෂූන්ගෙන් අප මුදල් අය කරන්නේ නැහැ' කියලා මා ගරු සාමාජිකයකු හැටියට ඇතුළත් කර ගත්තා. එහි තියෝසොපි ධර්මය පිළිබඳ පොත් බොහොම තිබුණා. සෑම ඉරිදම මා එහි යනවා. ඒ පොත් ලබා ගන්නවා, කියවනවා. එයින් සිදු වුණේ තියෝසොපිවාදයට විරුද්ධවීම නොව එහිත් හොඳ දෑ බොහෝ ඇති බව පිළිගන්නට වීමයි. එහි දක්වන 'මහත්මා කුථුමි, මහත්මා මෝරිය,' ආදීන් ගැන ධර්මපාලතුමාත් මා සමග කියා තිබුණා. 'මහත්මා කුථුමි' ගැන එතුමා මහත් විශ්වාසයක් ඇතුව හිටියා. එතුමා විරුද්ධ වුණේ ඇනී බැසන්ට් මැතිනිය තියෝසොපිවාදයට වේදාන්තය ඈඳගත්ත එකටයි. වර්තමාන තියෝසොපිවාදයේ උගන්වන 'ආත්ම' කථාවට මා විරුද්ධයි. එහෙත් එහි දක්වෙන 'මහත්මා කුථුමි', ආදි සිද්ධාචායාීයන් ඇතිබව මා පිළිගන්නවා."

"මේ කාලයේ මා සූත්‍රපිටකය සම්පූර්ණයෙන්ම කියවලා තිබුණා. එයිනුත්, තියෝසොපි පොත් කියවීමෙනුත් මා තුළ ලොකු වෙනසක් ඇති වුණා. එතෙක් ක්‍රිස්තියානි ආගම කෙරෙහි මා තුළ

තිබුණු විරෝධය දුරු වුණා. අන්‍ය ආගම්වලට නින්ද කිරීම නුසුදුසු බව වැටහුණා. කොයි ආගමටත් සැලකිලිමත් බව මා තුළ ඇති වුණා. එයට පසු මා කිසිම ශාස්තෘවරයකුට, කිසිම ආගමකට නින්ද කළේ නැහැ. මේ රටට ආගම්වාද අවශ්‍ය කාලයක් තිබුණා. ඒ අන්‍ය අය බුද්ධාගමට දොස් නගන කාලයේ. දැන් ඒවා අවශ්‍ය නැහැ. බෞද්ධ වූ අප විසින් කළ යුත්තේ අන් ඒවාට දොස් නැගීම නොවේ. ඒවා කොච්චර දුරට බුදු දහමට ළං‌ව ඇද්දැයි විමසා බැලීමයි. එහෙම නැත්නම් බෞද්ධ ගිහි පැවිදි අය තමන්ගේ ප්‍රතිපත්තියෙන් යහපත් පැවැත්මෙන් අන්‍ය ලබ්ධික අයට ආදර්ශ වීමයි. මොන ආගමක් අනුව ගියත් මනුෂ්‍ය සහෝදරත්වය අමතක කළයුතු නැහැ. බුදුරජාණන් වහන්සේ මෛත්‍රිය වඩන්නට වදාළේ අන්‍ය ආගමිකයන් අත හැරලා නොවෙයි. ඒ හැමදෙනාටමත් එක්කයි. ඔය ආගම් පිළිබඳ මගේ පැවැත්මයි."

"ලංකාවේ කොමියුනිස්ට්වාදය ආරම්භ වෙච්ච මුල් කාලයේ මේක මොකක්ද කියලා මා බොහෝ දෙනාගෙන් ඇහුවා. ඒ දිනවල මා නිතර නිතර පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙනටත් ගියා. නාරාවිල ධම්මරතන ස්ථවිරයන් ආදි ඇත්තන් හමුවෙලා මේ ගැන කතා කළා. මොකක්ද මේ කොමියුනිස්ට් වාදය කියන්නේ? කියලා මා ඒ ඇත්තන්ගෙනුත් ඇහුවා. ඒ ඇත්තන් කිව්වා 'ලැබෙන ආදායම සමසේ බෙදීයාමයි' කොමියුනිස්ට්වාදය කියලා. මාක්ස්වාදය කියන්නේ ඒකයි කිව්වා, ඒ විතරක් නෙවෙයි ඒ ඇත්තන් ඒක හොඳට වර්ණනා කළා. මා ඒ වෙලාවේ හිතුවා සංඝයාට ලැබෙන දේත් සංඝයා අතර පොදුවේ බෙදන්න කියලා විනය නීතියක් තියෙනවා. එහෙම නම් ගිහියාටත් මේ ක්‍රමය හොඳයි කියලා. ඔය අතර අදිකාරම් මහත්තයත් මා ඉදිරියේ මේ ගැන වර්ණනා කළා."

"කොමියුනිස්ට් දර්ශනය උච්ඡේදවාදයක් කියලා මා හිතාගෙන හිටියේ නැහැ. ඔය අතර සිංහලජාතිය පත්‍රයේත් සෝවියට් පාලන ක්‍රමය වර්ණනා කරමින් ලිපි පළ කරලා තිබුණා. ඒ නිසා මා කල්පනා කළා මේකට විරුද්ධ වෙන්න හේතුවක් නැහැ කියලා. මේක බුද්ධාගමටත් විරුද්ධ දෙයක් නොවෙයි කියලත් මා හිතුවා. සමාජවාදය පිළිබඳව නැත්නම් මාක්ස්වාදය පිළිබඳව මගේ අදහස් ලියා එව්වොත් හොඳයි කියලා මගේ සහරාවේ, කතෘ මට දන්වා එවා තිබුණා. ඉතින් මා ලිපි දෙක තුනක් ඒකට ලිව්වා. බෞද්ධයන්

මේකට බයවෙන්න හේතුවක් නැහැ කියලත් ලිව්වා. සංඝයාගේ දේපොළ පාලනය පිළිබඳව, සංඝයාට අධිකව ලැබෙන දේ පිළිබඳව අනුගමනය කළයුතු ක්‍රමය බුදුහාමුදුරුවන් වදාරලා තියෙනවා. ඉතින් ගිහි ජනතාවගේ ආදායම පිළිබඳවත් ඒ ක්‍රමය හොඳයි. ඒකෙන් බුද්ධාගමට හානියක් නැහැ. බෞද්ධයන් මේකට බියවෙන්න එපා කියලත් පැහැදිලිව ලිව්වා. ලියුම් කීපයක් එක දිගටම ලිව්වා.''

''මගේ සහරාව මාක්ස්වාදී පක්ෂයකින් පළ කරපු එකක්. ටික දවසකින් මා මේ ගැන තව දුරටත් සොයන කොට මට වැටහුණා මා කළේ දුරදිග නොබලා අපරීක්ෂාකාරී වැඩක් කියලා. මේ කොමියුනිස්ට් දර්ශනය නැවත ඉපදීම, බුද්ධාගමේ උගන්වන කර්ම විපාක නීතිය, සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරන එකක් බව පස්සෙයි මට වැටහුණේ. ශාස්තෘවරයකුට ගෞරව නමස්කාර කිරීම පුද්ගලාභිවාදනයක් හැටියට ඔවුන් හෙළා දකිනවා. ප්‍රතික්ෂේප කරනවා. බුදුහාමුදුරුවන්ට කරන වන්දන මානන ආදිය පුද්ගලාභිවාදනයක් හැටියටයි ඔවුන් කියන්නේ. ඉතින් මේ විදියේ දර්ශනයක් තමයි කොමියුනිස්ට් දර්ශනය.''

''මේ අතර බුද්ධාගමේ එන සමහර කාරණා හෙළා දකිමින් 'අලි බොරුව' කියලා පොතක් ඒ අය පළ කරලා තිබුණා. ඒ පොතේ සැරියුත් මුගලන් මහ රහතුන් වහන්සේලාට, සුද්ධෝදන රජ්ජුරුවන්ට එහෙමත් නිග්‍රහ කරලා තිබුණා. මේවා ගැන හොයලා බලන කොට මට තේරුණා මා දුරදිග නොබලා එක පැත්තක් විතරක් බලා අර ලිපි පළ කරවපු එක වැරදියි කියලා. මගේ සහරාවේ, මා පළ කළ ලිපි අවලංගු කිරීමට, ආරූඪ නමකින් ස්වදේශ මිත්‍රයා පත්‍රයට ලියන්න පටන් ගත්තා. ඒවා ලිපි පෙළක් වශයෙන් පළ වුණා. ඒවායේ භාෂා විලාසයත් අමුතු විදියකටයි මා යෙදුවේ. මේ රහස දැනගෙන සිටියේ කළුකොඳයාවේ නායක හාමුදුරුවන් විතරයි. ඒ හාමුදුරුවන් මේ ලියුම්කරු සොයමින් සිටියා. මා හමුවී කතා කළාම මා කිව්වා ඔය මායි ලියන්නේ කියලා. මේක කාටවත් දැන ගන්න බැරි වුණා. ඉතින් මේ ලිපි පළ කරගෙනයන කාලේ පියදාස සිරිසේන මහතා මාක්ස්වාදයට විරුද්ධව 'සිංහ හඬ' කියලා පත්තරයක් පටන් ගත්තා. මටයි වල්පොළ රාහුල තෙරුන්ටයි, උඩකැන්දවල සරණංකර ස්ථවිරයන්ටයි තුන්දෙනාටම ඒ පත්‍රයේ බැණලා තිබුණා. මට මතකයි ඒකේ තිබුණ කවියක්. කවිය ආරම්භ කොට තිබුණේ මෙහෙමයි.''

'උඩකැන්දවලයා - ගලේ රාහුලයා - ආනන්ද බලයා,

"අතික් පේළිය මට මතක නැහැ. ඔන්න ඔහොම අපට බැණලා දිගටම ඒ පත්‍රයේ ලිපි පළ කළා. වැඩිපුරම බැණලා තිබුණේ මටයි. ඒ පත්තරේ ලියුම් පෙළ පියදස සිරිසේන මහත්තයයි තවත් ඇත්තනුයි ලිව්වේ. මා ඉතින් උත්තර ලියන්න ගියේ නැහැ. ඒ අය දන්නේ නැහැ, කොමියුනිස්ට්වාදයට විරුද්ධව ලිපි පෙළක් මා වෙන පත්තරයකින් ලියන බව. මා එහෙම ලියද්දිත් මගේ අර මුල් ලියුම බලාගෙන ඒ ගොල්ලෝ මට බැන්නා. මා කළ මෝඩකමට තිහඩව ඉඳගෙන බැණුම් ඇහිය යුතුයි කියලා මට හිතුණා."

"ඉතින් ඔහොම තියෙන අතර සිංහල බෞද්ධයා පත්‍රයේ දේවාදේව වාදයක් පටන් ගත්තා. අදේව පක්ෂයට ඩේවිඩ් කරුණාරත්න මහත්මයා තමයි ලිපි ලිව්වේ. ඔහු ලිව්වේ 'සුරගුරු', නමින්. කතරගම දෙවියන්ට එහෙම බොහෝම තින්ද අපහාස වන විදියට ලිපි ලිව්වා. කතරගම දෙවියන් ඉන්දියාවෙන් ආව දෙමළෙක් කියලත් ලියලා තිබුණා. පසුව ඔහු දවස පත්‍රයේ කර්තෘ වෙලත් හිටියා. දෙවියන් ඇතිබව පෙන්වීමට භික්ෂූන් වහන්සේලා කීප නමක් බොහොම හොඳට උත්තර ලිව්වා. නමුත් උන්වහන්සේලා ඉදිරිපත් කරන ශක්තිමත් තර්කවල සමහර කොටස් කපලා කොටලා ඉතුරු කොටස් විතරයි එයා පළ කළේ. එවන ලිපි හරියට පළ කළේ නැහැ. ඔය විදියට කරගෙන ගිහිල්ලා වාදය අවසන් කළා."

"දෙපක්ෂයේම ලියුම් පිළිබඳව මධ්‍යස්ථ විවේචනයක් කරන්න කියලා මට පැවරුවා. මා ඒ සඳහා ලියාපු ලිපිය කරුණාරත්න මහත්තයට වාසිවන විදියට එයාට අවශ්‍ය කොටස් කපලා පත්තරේ පළ කළා. හරියට කරුණාරත්නගේ මත පිළිගත් කෙනෙකු හැටියට මාවත් පෙනෙන විදියටයි ඒ ලිපිය සකස් කර තිබුණේ. මා එයාගෙ මත පිළිගෙන තිබුණේ නැහැ. නමුත් එයා වැරදි විදියට මගේ ලිපියේ වැදගත් කොටස් කපා දලා බොහොම පොඩ්ඩක් තමයි පළ කළේ. ඔය දවස්වල මා ඉන්දියාවට ගොහින් හිටියේ. ලිපිය ලියා දීලයි මා ඉන්දියාවට ගියේ. ඉන්දියාවේ ඉඳලා ආවට පස්සේ මා ඇහුවා මගේ ලිපිය ගැන. මගේ හිතට හරි අමාරු වුණා, මා ගැන වැරදි හැඟීමක් රටේ ඇතිවෙන්නට සැලැස්වීම ගැන. ඔය අතර පියදස සිරිසේන මහත්තයලා ඒ අයගේ පත්තරෙන් මට බණිනවා. අර සිංහ හඬ, කියන පත්තරෙන්."

"මා දවසක් මරදානේ ඉඳලා පයින්ම යනවා පිටකොටුවට. පාර අද්දරමයි පියදාස සිරිසේන උන්නැහේගේ කන්තෝරුව තිබුණේ. පාර දකුණු පැත්තෙයි ඒක තිබුණේ. උන්නැහැ මාව දුටුවා. දැකලා 'හාමුදුරුවෝ මෙහාට වඩින්න' කියලා කිව්වා, මා ගියා. ගියාම කිව්වා, 'හාමුදුරුවෝ මෙහාට වඩින්නෙත් නැහැනේ'. එතකොට මා කිව්වා, 'මා කොහොමද එන්නේ? මහත්තයලා මට කිසි විචාරයක් නැතිව බණිනවානේ' කියලා, පස්සේ උන්නැහැ කිව්වා, 'ඇයි හාමුදුරුවනේ හාමුදුරුවන් දුර දිග නොබලා ලියුම් පළ කළේ'. ඒකනේ බොහෝ දෙනකු ඒවාට විරුද්ධව ලියන්න කියලා මට කිව්වේ. හාමුදුරුවන් වගේ වැදගත් කෙනකු මෙහෙම දෙයක් කිව්වාම ලිව්වාම බොහෝදෙනා ඒක අනුගමනය කරනවා, රැවටෙනවා. ඉතින් ඒක නිසා මේක විවේචනය කළ යුතුමයි කියලා බොහෝ දෙනකු මට කිව්වා. ඒකයි මා ඔබ වහන්සේට විරුද්ධව ලියන්න පටන් ගත්තේ' කියා කීවා."

"මා ඒ වෙලාවේ කිව්වා 'මහත්මයා මගේ ලියුමට විරුද්ධව ලියන්න ඉස්සරවෙලා ඇයි ටිකක් මා ගැන සොයා බැලුවේ නැත්තේ? මා ලියපු ඒ ලිපිය විවේචනය කරමින් මා ස්වදේශ මිත්‍රයා පත්‍රයේ ලියුම් පෙළක් ලියනවා වෙන නමකින්. ඇයි ඒ ගැන සෙව්වේ නැත්තේ? අන්න බලන්න ඒ පත්තරේ අරගෙන. පස්සේ උන්නැහැ කිව්වා, 'හාමුදුරුවනේ මා දන්නේ නැහැනේ ඕකෙ වගක්. මා ඇහුවා ඕක ලියන්න ඉස්සරවෙලා මගෙන් අහන්න තිබුණා නේද කියලා'. නිකම් බොරුවට බැන්නා මට පත්තරවලින් නොසෑහෙන විදියට. පස්සේ පියදාස සිරිසේන මහත්තයා කිව්වා, 'නැහැ හාමුදුරුවනේ මා ලියන්නේ නැහැ මීට පස්සේ, මට හාමුදුරුවන් හම්බවෙන්න ඕන කරලයි තිබුණේ. මා ඇහුවා ඇයි කියලා. 'හාමුදුරුවනේ, සිංහල බෞද්ධයා පත්‍රයේ සුරගුරු නමින් දෙවිවරු කියලා පිරිසක් නෑ කියමින් ලියුම් පෙළක් පළ කළා නේද? දැන් ඒ වාදය ඒ ගොල්ලම නවත්වලා. ඒක නවත්තවපු හැටි හරි නෑ. දැන් මෙහාට එවලා තියෙනවා. ඒ වාදය අලුත් කරන්න කියලා. ඒකට හාමුදුරුවන් ඉදිරිපත් වෙන්න' කියලා මට කිව්වා. මා කිව්වා, 'වාදයකට මා ඉදිරිපත් වෙන්නේ නැහැ. ඒ වුනාට ත්‍රිපිටක ධර්මයෙහි පෙළ අටුවා ආදියෙහි දෙවියන් පිළිබඳව යමක් කියා ඇත්නම් ඒ ටික ක්‍රමානුකූලව මා සකස් කරලා එවන්නම්' කියලා. එතකොට පියදාස සිරිසේන මහත්මයා කිව්වා, 'අන්න ඒ ඇති අපට' කියලා."

"ඉතින් පෙළේ එන්නෙ මෙහෙමයි, අටුවාවේ මෙහෙමයි කියලා ඔක්කෝම එකතු කරලා මා ලිව්වා ලියුම් පෙළක් දේව සංකල්පය ගැන. එක දිගටම පළ කළා. ඉතින් උන්නැහැ මට බැණීමත් අත් හැරලා බොහෝම ප්‍රශංසා කරන්න පටන් ගත්තා. මේ හාමුදුරුවන් තුළ කලින් එහෙම හැඟීමක් තිබුණත් දැන් ඒ හාමුදුරුවන් එවැනි හැඟීම් ඇති කෙනෙක් නොවෙයි කියලා සිංහල ජාතිය පත්‍රයේ මට ප්‍රශංසා මුඛයෙන් ලියුම් පළ කළා. ඒ මගේ ලිපි පෙළ පළවුණායින් පස්සේ ආයිත් වාදය ආරම්භ වුණා. දෙවියන් ඇතැයි කියන පක්ෂයේ අදහස් අන්තිමට ජයග්‍රහණය කළා. ඔප්පු වුණා. ඉතින් ඕක නිසා කරුණාරත්න මහත්මයා මාත් එක්ක අමනාප වුණා. ඔහොම ටික දවසක් ගත වුණා".

"මෙතැනදී ඉතාම වැදගත් සිද්ධියක් මම කියන්නම්. ටික කලකට පස්සේ මා කතරගම ගියා. හැන්දෑවේ ගිහිල්ලා කිරි වෙහෙර වැඳලා මා එනවා දේවාලය ළඟට. දේවාලෙට ඇතුල් වෙන ගේට්ටුව ළඟට එනකොට කොළඹ ඉඳලා ආව ඉලන්දරි කට්ටියක් දකින්නට ලැබුණා. මා ඇහුවා මහත්තයලා මොකද මෙතන කියලා. හාමුදුරුවනේ මේ කරුණාරත්න මහත්තයා එනකල් අපි මෙතන ඉන්නවා කියලා ඒ අය කිව්වා. කවුද ඒ මහත්තයා කියලා මා ඇහුවා. අර පත්‍රයේ කතෘ වෙලා ඉන්න එක්කෙනා කියලා ඒ අය උත්තර දුන්නා. කෝ එයා කියලා මා ඊළඟට ඇහුවා. අන්න එයා පූජා වට්ටියක් අරගෙන දේවාලේ අස්සට ගියා කියලා ඒ අය කිව්වා. 'එයා මේ කතරගම දෙවියෙක් නෑ කියලා ඉන්දියාවෙන් ආව දෙමළෙක් කියලා බැණ බැණ හිටියා නේද?' කියලක් මා ඒ අයගෙන් ඇහුවා. එතනදී ඒ අය කිව්වා 'ඔහොම තමයි හාමුදුරුවනේ, කියනකොට එකක් කරන කොට වෙන එකක්."

"මේක මෙයාගෙන් අහන්නම හිතාගෙන මාත් එතන ටික වෙලාවක් නැවතිලා හිටියා, එයා එනකල්. නමුත් මේ මිනිහා එන්නෙම නැහැ. මිනිහා කොතන හරි හැංගිලා. පැයකට වැඩිය කාලයක් මා එතන හිටියා. අන්තිමට මා හිතුවා, මෙවැන්නකු හින්ද මා මොකටද මගේ කාලය නැතිකර ගන්නේ, ඕන එකක් කමක් නැහැ කියලා මා එතනින් යන්න ගියා. ඉතින් අපේ මිනිස්සු, ප්‍රසිද්ධ ග්‍රන්ථ කතෘවරුන් පවා මා තේරුම් ගත්තේ, කියන්නේ එකක්,

කරන්නේ ඊට විරුද්ධ එකක් කියලා. නමුත් කතරගම දෙවියන්ට බැණපු අයගේ ජීවිතය බොහෝ විට අභාග්‍ය සම්පන්න එකක් වුණා. කතරගම දෙවියන්ට බණින එක හොඳ නැහැ. කතරගම දෙවියන් ජීවමානව ඉන්න මහා බලසම්පන්න දේවතාවෙක්. මගේ ඇහින්ම කතරගම දෙවියන් මා දැක තිබුණා. ඒ කතාව මම පසුව කියන්නම්."

"ආනන්ද කොලීජියේ ඉගැන්වීමේ යෙදී සිටි කාලයේදී සෑම දෙසැම්බර් නිවාඩුවකටම මද්‍රාසියේ තිබුණු තියෝසොපිකල් සමාගමේ වාර්ෂික උත්සවයට මා යනවා. ගිහිල්ලා මාසයක් විතර එහි නැවතී ඉන්නවා. 1926 දී කේරලයේ කැලිකට් නුවර රාජ්‍ය මන්ත්‍රීවරයකු ශ්‍රී. ක්‍රිෂ්ණන් මහතාගේ ඉල්ලීම අනුව මා පළමුවන ධර්මදූත ගමන පිටත් වුණා. මාසයක් විතර එහි නොයෙක් තැන්වල ධර්මදේශනා පැවැත්තුවා. ඒ ගමනේ ප්‍රතිඵලයක් වශයෙන් බුදුදහම ගැඹුරින් අධ්‍යනය කළ ශ්‍රී ක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා 1929 දී මගේ ආචාර්‍යත්වයෙන් ටික දිනකට පැවිදි වුණා. මේ ගමනේදී මද්‍රාසියේ තියෝසොපිකල් සමාගමටත් ගියා. ක්‍රිෂ්ණමූර්ති තුමාගේ මුල්ම ප්‍රසිද්ධ දේශනය පැවැත්වීමට මේ දිනවල කටයුතු පිළියෙළ වෙමින් තිබුණා. නමුත් ඒ කතාව අහන්න ඉන්න අපට කල් මදි වුණා. ඉක්මනට එන්න තිබුණ නිසා ලංකාවට ආවා. මා සමග මේ ගමනට ආනන්ද විද්‍යාලයේ ගුරුවරයකුවූ ඇම්. ඊ. ප්‍රනාන්දු මහතාත් සහභාගි වුණා."

**"මහානායක හාමුදුරුවන් ආනන්ද විද්‍යාලයේ ඉගැන්වීමේ කටයුතුවලින් ඉවත් වුණේ ඇයි?"**

"මා කලින් කිව්වා ඔය වකවානුව වනවිට ඉන්දියාවට ගොහින් ධර්මපාලතුමා සමග එකතුවෙලා ධර්ම ප්‍රචාරක කටයුතුවල නිරත වෙන්න මගේ අදහසක් තිබුණු බව. ධර්මපාලතුමාත් ඒකට කැමැත්තෙන් හිටියේ. බළන්ගොඩ ගියාම බාන්ස් රත්වත්තේ රටේ මැතිතුමා මට මුණ ගැහෙනවා. ඉතින් ඉන්දියාවට යාම පිළිබඳ මගේ අදහස එතුමාට මා කිව්වා. එතුමා මගේ හොඳ හිතවතෙක්. එතුමා කියා සිටියා බළන්ගොඩ පැත්තේ උගත් භික්ෂූන් වහන්සේලා හිඟ බැවින් ඒ පළාතේ පිරිවෙනක් ආරම්භ කිරීම වඩා සුදුසු බව. 'මම අවශ්‍ය දේවල් ඔක්කෝම කරන්නම්. ඔබ වහන්සේට

තියෙන්නේ ඔය උගත්කමින් අපේ පළාතට සේවයක් කරන එකයි. අපේ පළාතේ උගත් අය අඩු නිසා හොඳ උගත් පරපුරක් බිහි කරන්න ඔබ වහන්සේට පුළුවනි. ඊට පස්සේ පිටරට වැඩියට කමක් නැහැ' කියලා, එතුමා ඔය ඉල්ලීම කළා."

"ඉතින් ඔය වකවානුව වනවිට මගේ ගුරුහාමුදුරුවොත් අපවත් වෙලා. ඒ නිසා පිටරට යන අදහස කල් දමා මා බළන්ගොඩට ගොස් පිරිවෙන පටන් ගත්තා. ආනන්ද විද්‍යාලයෙන්, ඒ පුණ්‍ය භූමියෙන් ඉවත්ව යෑමේදී ප්‍රිය විප්‍රයෝග දුක මට තදින් දැනුණා. එහෙත් උපන් ගම් ප්‍රදේශයට සේවයක් කරන්න යන ගමනක් බැවින් සිත සනසා ගන්න හැකි වුණා."

SABARAGAMUWA AFFILIATED UNIVERSITY
REFERENCE
LIBRARY

# 5

# බුරුමයේ ඡට්ඨ මහා සංගායනාවට සහභාගිවන්ට ලැබීම වාසනාවක්

"1935 දී ආනන්දයෙන් ඉවත්ව බළන්ගොඩ තුඹගොඩ සාංඝික ශ්‍රී සුධර්මාරාමයේදී ශ්‍රී ධර්මානන්ද නමින් නව පිරිවෙනක් මා ආරම්භ කළා. එහි එය ආරම්භ කළේ වෙන තැනක් හද ගන්නා තුරුයි. ටික කලකට පසුව එය මීරිස්වත්තට ගෙන ගියා. මගේ ප්‍රාචාර්යයන් වහන්සේගේ නමිනුයි එය ආරම්භ කළේ. පිරිවෙනට බොහෝ ශිෂ්‍යයන් එන්න පටන් ගත්තා. රජයේ අනුමත නොවූ නවක පිරිවෙනක් නිසා රත්වත්තේ දිසාව මැතිතුමා, සිරිල් එල්ලාවල නීතිඥ තුමා, හරමානිස් මුදලාලි මහත්මා මගේ කිට්ටු ඥාතිවරියක වූ රත්මැණිකේ උපාසිකාව, කිට්ටු ඥාතිවරයකු වූ මීරිස්වත්තේ කනකරත්න මහත්මා ආදි ගිහි පින්වතුන්ගේ ද, බළන්ගොඩ පන්සලේ අධිපති ගහල්පිටියේ සුමංගල මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ද, මහවලතැන්නේ විහාරාධිපතිව වැඩවිසූ බිබිලේ සුමංගල නාහිමියන්ගේ ද ගල්ලැල්ලේ පන්සලේ අධිපතිව වැඩ සිටි මහවලතැන්නේ පේමානන්ද හාමුදුරුවන්ගේ ද ආධාර උපකාර නිසා පිරිවෙන ලේසියෙන් පවත්වා ගෙන යන්න පුළුවන් වුණා. රජයේ ආධාරයක් නොමැතිව පැවැත්වූ බැවින් මට නිදහස්ව නිවහල්ව දිගටම හොඳින් පිරිවෙන පවත්වා ගෙන යාමට හැකි වුණා. අන්තිමේදී බොහෝදෙනාගේ ඉල්ලීම පිට රජයේ අනුමත පිරිවෙනක් බවට පත් කළා. මේ පිරිවෙන පැවැත්වීමේදී උප ප්‍රධානාචාර්යවූ ගැටඅරළුවේ ධම්මරතන තෙරුන්ගේ පූර්ණ සහයෝගය ද ලැබුණා."

"විද්‍යෝදය විශ්වවිද්‍යාලයට මා සම්බන්ධ වන තෙක් පිරිවෙනේ කටයුතුවල නිරත වුණා. පසු කාලෙක පිරිවෙනේ කටයුතු කිරීමේදී මට සහයෝගය දුන්න වැලිගෙපොළ මෛත්‍රීමූර්ති නැමැති මගේ

ශිෂ්‍ය නම එකදහස් නවසිය පනස් පහ  වර්ෂයේදී අපවත් වුණා. පිරිවෙනට මහා ලොකු පාඩුවක් එයින් සිදු වුණා. නමුත් අතික් ගුරුවරුන්ගේ සහයෝගය ඇතිව මා පිරිවෙන පවත්වා ගෙනගියා. ආරම්භයේදී මගේ ද ශිෂ්‍යයකුව සිටි කළල්ඇල්ලේ ආනන්දසාගර (කේයස්) කලක් පිරිවෙනේ ගුරුවරයකුව සිටියා. එය මිරිස්වත්තට ගෙන ගියායින් පසු සිටි ආචාර්යවරු අතර ගැටඅරළුවේ ධම්මරතන, උඩුවහවර ජිනානන්ද, දෙණගම නාගර්ජුන යන තෙරුන් වහන්සේලා විශේෂයි. මා විදේශයට යන්නට පෙරාතුවම ඒ හුහ දෙනකු පිරිවෙනෙන් අස්වෙලා තම තමන්ගේ ආරාමවල කටයුතුවලට ගියා. ආනන්දසාගර උපසම්පදවෙන් මගේත් ශිෂ්‍යයෙක්. පස්සේ උපැවිදි වුණා. සාගර පලන්සූරිය නමින් දේශපාලනයට සම්බන්ධ වුණා.''

**"1955 දී බුරුම රටේ පැවැත් වූ හයවෙනි ධර්ම සංගායනාව පිළිබඳව නායක හාමුදුරුවන්ගෙන් විස්තර දැනගන්න මා කැමතියි.''**

"බුරුමයෙන් ලැබුණු ආරාධනාවක් අනුව එහි පැවැත්වූ ඡට්ඨ මහා සංගායනාවට සහභාගි වන්නට ලැබීම මගේ ජීවිතයේ ඉතා වැදගත් අවස්ථාවක් කොට සලකනවා. ත්‍රිපිටක ශෝධක මණ්ඩලයේ කටයුතු සඳහා වඩින්න කියලයි බුරුමයෙන් ආරාධනාව ලැබුණේ. පරවාහැර වජිරඥාන හාමුදුරුවොත්, වැලිවිටියේ ශ්‍රී සෝරත නායක ස්ථවිරතුමාත්, මිරිස්සේ ගුණසිරි ස්ථවිරයන් වහන්සේත් මාත් යන හතර නම තමයි ඒ ගමනට සහභාගි වූයේ. අප හතර නම කොළඹින් පිටත් වෙලා කල්කටාවට ගිහිල්ලා එතන ඉඳන් ගුවන් නැවින් රැන්ගුන් නුවරට ගියා. එහිදී අප නතර වුණේ ශාසනයේතා කියන භාවනා මධ්‍යස්ථානයේ. සංගායනාව සඳහා සැදූ ගොඩනැගිලි වැඩ අවසන් නොවී තිබුණ නිසයි එතන නතර වෙන්නට සිද්ධ වුණේ.''

"ත්‍රිපිටකය කොටස් තුන්සීයකට බෙදලා මණ්ඩල තුන්සීයකට පවරලා තිබුණා. එක මණ්ඩලයකට පස්නම බැගින් සිටියා. සියල්ලෝම උගත් බුරුම භික්ෂූන් වහන්සේලා. උන්වහන්සේලා ශුද්ධ කරලා එවන පිටපත් අවසාන කොමිටියෙන් තවත් සකස් කරලා මුද්‍රණයට යවනවා. ඒ අවසාන ශෝධක මණ්ඩලයට ලංකාවෙන් පත්වෙලා හිටියේ පොල්වත්තේ බුද්ධදත්ත මහානායක

ස්වාමීන්ද්‍රයන් වහන්සේයි. මාස කීපයක්ම ඒ කොමිටියේ වැඩ කළ නිසා උන්වහන්සේ ලංකාවට ඊමට සූදානම් වුණා. මේ නිසා ලංකාව වෙනුවෙන් ඒ අවසාන ශෝධක මණ්ඩලයට මා පත්කර ගත්තා.''

''මාස දහයක් විතර මා ඒ මණ්ඩලයේ වැඩ කළා. ඒ අවසාන ශෝධක මණ්ඩලයේ විසුද්ධාභිවංශ ස්ථවිරයන් වහන්සේත්, මහාසි සියාඩෝ ස්ථවිරයන් වහන්සේත්, තවත් දෙනමකුත් මාත් කටයුතු කළා. මේ කොමිටියේදී අප ඔක්කෝම සාකච්ඡා කළේ පාලි භාෂාවෙන්. මෙහිදී ලංකාවේත් සියමේත් පාලි පිටපත්වලට ශෝධක මණ්ඩලය වැඩි සැලකිල්ලක් දැක්වූ බව පෙනුණා.''



**1955** දී බුරුම රටේ පැවැත්වූ ෂට්ඨ මහා සංගායනාවට සහභාගි වූ ලාංකික හා විදේශීය හිමිවරුන් පිරිසක්. වමේ සිට දෙවැන්නා මහනාහිමියන් වහන්සේයි.

''බොහෝ පෙර ලංකාවෙන් බුරුමයට උපසම්පදාව ගෙන යද්දී ඡප්පද (ඡප්පට) තෙරුන් ප්‍රධාන සංඝයා ලංකාවේ පුස්කොළ පොත්වලින් පිටපත් කරගෙන ගිය පෙළ අටුවා ටීකා ආදියෙහි යම් යම් වැරදි සිදුවී ඇති බව අපට මෙහිදී පෙනුණා. බුරුමයේ මින්ඩුන්මින් රජුගේ කාලයේදී ත්‍රිපිටක සංගායනාවක් කරලා ඒවා කිරිගරුඬ ගල්වල කෙටෙව්වා. ඒවා අදත් හොඳින් ආරක්ෂා වෙලා තියෙනවා. මේ ශෝධනයට ගත්තේ ඒ පිටපත් බව පෙනුණා. ලංකාවෙන් පිටපත් කරගෙන යද්දී සිදු වූ වැරදි එසේම තියෙන බවත් අපට පෙනුණා. ඒ නිසා අපේ මේ අවසාන ශෝධනයේදී

ඒ වැරදි පවා ඉවත් කරලා බොහෝ සෙයින් ලංකාවේත් සියමේත් තියෙන ත්‍රිපිටක හා සසඳලා තමයි මුද්‍රණයට යැව්වේ."

"මුද්‍රණයෙන් පසුව ඒ පිටපත් සංගායනාවට සහභාගිවන සියලුම තෙරුන් වහන්සේලා අතට පත් කරනවා. අර ශිලාලේඛනගත ත්‍රිපිටකයට අයත් ක්‍රමයට වඩා වෙනස් තැන් දකින්නට ලැබුණාම බුරුම මහතෙරවරුන් හැමවිටම ඒකට විරුද්ධත්වය ප්‍රකාශ කළා. එහෙම අවස්ථාවලදී ඒ ගැන බුරුම ජනාධිපතිතුමාටත්, අගමැතිතුමාටත්, ශාසන අමාත්‍යයාටත් දැනුම් දෙනවා. ඒ අනුව අප දෙපක්ෂයම විටින් විට ජනාධිපති මන්දිරයට හෝ අගමැති මන්දිරයට කැඳවූ බව මට මතකයි. මෙහිදී සමහරවිට අපගේ ඇතැම් ශෝධන පිළිබඳව බුරුම නායක තෙරවරුන් සමග වාද විවාද පවා කරන්නට සිදු වුණා. ඒ වාද විවාද කරන්නට සිදු වුණේ ඒ ඇත්තන් කතා කරන බුරුම භාෂාවෙන්. අපේ පාඨ ශෝධනයේ ප්‍රමුඛ වූවෝ මහාසි සියාඩෝ තෙරණුවෝයි."

"එක් වතාවක පාරාජිකාපාලියේ වේරඤ්ජා කාණ්ඩයේ එන 'පත්ථ පත්ථ පුලකං' (පත පත බැගින් යවසාල්) යන්න ගැන දිගටම විවාදය ගියා. කලින් මුද්‍රිත බුරුම පොත්වලත්, අර ශිලාලේඛන ගත කළ පාරාජිකා කාණ්ඩයේත් තිබුණේ 'පත්ථ පත්ථ මූලකං' කියලා. ඒක නිවැරදියි කියලා බුරුම තෙරවරුන් තර්ක කළා. මූලකං කියන එක හරි බවත් ඒ ඇත්තන් තදින්ම කියා සිටියා. මේක නිගමනය කරන්න බැරිම තැනට ආවා. මේ ගැන සාකච්ඡාවට ඌනු මහත්තයාගේ මැදුරට අප කැඳෙව්වා. එතනදී අගමැති ඌනු මහතා මගේ අදහස විමසුවා. මා එතනදී ඇහුවා මට බුරුම භාෂාව කතා කරන්න බැරි නිසා මේකට මා පාලියෙන් උත්තර දෙන්නද කියලා. ඌනු අගමැතිතුමා කිව්වා අපේ ශබ්ද උච්චාරණය වෙනස් නිසා සමහර විට මා කියන දේ ඒ අයට තේරුම් ගන්න බැරි වෙයි, ඒ අය කියන දේ මට තේරුම් ගන්න බැරි වෙයි, ඒ නිසා මා ඉංග්‍රීසියෙන් අදහස් ඉදිරිපත් කිරීම වඩා සුදුසුයි කියලා. 'ඔබ වහන්සේ ඉංග්‍රීසියෙන් කියන්න, මම බුරුම බසට පරිවර්තනය කරන්නම්' කියලත් එතුමා කිව්වා."

"මා ඒ වෙලාවේදී මගේ අදහස කිව්වා. සංස්කෘත ශබ්දකෝෂවලින් මා කරුණු පෙන්නුවා. 'බුදු දහමට සකු පොත් අවශ්‍ය නෑ' කියලා ඒ තෙරවරුන් කීවා. මා කීවා, පාලි භාෂාව

දඹදිව පැවති එකක්. ඒ ශුද්ධ මාගධීයයි. ඒකේ සහෝදර භාෂා තමයි අර්ධ මාගධී සංස්කෘත සහ ප්‍රාකෘත. ඒ කොයි භාෂාවේත් මූලක යන්න හඳුන්වන්නේ විෂ මුල් වර්ගයක් කියලා. ධාන්‍ය වර්ගයකට මූලක කියලා නමක් නැහැ. හලායුධ කෝෂාදි පැරණි සංස්කෘත ශබ්ද කෝෂවල පුලාක යන්න අශ්වයන්ට කන්න දෙන ධාන්‍ය වර්ගයක් කියලා තේරුම් කරලා තියෙනවා. පාරාජිකාපාලියේ පුලක කියලා ආවේ ඒ පුලාක කියන එකමයි කියලා මා කිව්වා. ඒ නිසා මෙහි ශුද්ධ පාඨය 'පත්ථ පත්ථ පුලකං' විය යුතුයි කියලා මා අදහස් ඉදිරිපත් කළා. එතනදි බුරුම භික්ෂූන් බොහොම තදින් කියා සිටියා 'බුද්ධ ධර්මය ශුද්ධ කිරීමට බමුණන්ගේ පොත්වල පිහිට පතන එක වැරදියි' කියලා."

"බුදුරදුන් වදාළ ඛන්ධ, ධාතු, ආයතනාදිය පිළිබඳව සංස්කෘත ශබ්ද කෝෂවල දෙන අර්ථ හෝ ඒවායේ පිහිට නොපැතිය යුතුයි. නමුත් රටේ තොටේ ධාන්‍ය ආදි දෑයට වැහැරවූ නම් බුදුරජාණන් වහන්සේ නොහඳපු ඒවා බවත්, ඒවා ඒ කාලයේ ව්‍යවහාර කළ නම් බවත් මා අවධාරණයෙන් කියා සිටියා. ඒ රටේ පැවතුණ මාගධියට සම්බන්ධ භාෂාවල ඒවායේ ශබ්ද කෝෂවල පිහිට එබඳු දේ ගැන ලබා ගත යුතුම බවත් මා තදින්ම කීවා. මේ අනුව බුරුම මහ තෙරවරුන් ඉදිරිපත් කරන කරුණු පිළිගත නොහැකි බවත් මා නැවත නැවත කියා සිටියා. එහිදී මගේ අදහස් හරි බව බුරුම ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් ශාසන අමාත්‍යයාත් පිළි ගත්තා. 'පත්ථ පත්ථ පුලකං, කියලා අපේ මණ්ඩලය ශුද්ධකොට යෙදූ ඒ පාඨය එසේම තිබිය යුතුය කියල අන්තිමට තීන්දු වුණා. ඒ වෙලාවේ ඒ බුරුම තෙරවරුන් නිහඬ වුණා. එද විවාදය එයින් අවසන් වුණා."

"මේ අවසාන ශෝධක මණ්ඩලයේ සාකච්ඡාවලදී සමහරවිට ඒ බුරුම තෙරවරුන් මහා ශබ්දනීතියේ මෙසේ තියෙනවා කියලා, තමන්ගේ මතය තහවුරු කිරීමට ශබ්දනීතියේ යෙදුම් බොහෝ විට ඉදිරිපත් කළා. එබඳු අවස්ථාවලදී මා කීවා ශබ්දනීති ව්‍යාකරණය කළ ඒ මහා තෙරුන්ට මහා පඬිවරයකු හැටියට අප ගරු කරන බව. එහෙත් උන්වහන්සේ ඇතැම් තැන්වල වැරදි කර ඇති බව මා ඔප්පු කළා. මේ සාකච්ඡාවලදී බුරුමයේ සෑදූ ශබ්දනීති ව්‍යාකරණයට දොස් කීම ගැන ඒ ඇත්තන්ගේ සිතට ටිකක් මදි

වුණා. මා කීවා ඡන්දයෙන් අගතියට නොගොස් අප බුද්ධ වචනය පරීක්ෂා කළ යුතුයි කියා. අපේ රටේ පඬිවරයා වූ පලියට හෝ ගුරුවරයාවූ පලියට හෝ වරද වසන් කිරීම නුසුදුසු බවත්, වරදක් කළොත් එය වරදක් වශයෙන් පෙන්වා දීමට අපට ධෛර්‍යය තිබිය යුතු බවත් මා පැවසුවා. අප ලබාගෙන තිබෙන අවබෝධය ගැන අපේ විමංසනය තිබිය යුතු බවද මා පැහැදිලි කර දුන්නා. නිශ්චිත තීරණයක් නැති එක්කෙනා ඒ මේ අතට වැනෙනවා. ඒ නිසා මෙතනදී නිදහසේ කරුණු කියන්න, හිතන්න අප පුරුදු විය යුතු බවත් කියමින් ශබ්දනීතියේ එක් තැනක වරදක් මා පෙන්වා දුන්නා.''

"නට ධාතුව විස්තර කිරීමේදී 'නටතීති නටො, නටොයෙව නාටො, නාටස්ස පුත්තො නාටපුත්තො, නිගණ්ඨොනාට පුත්තො' කියා ඒ ශබ්දනීති ව්‍යාකරණයේ තියෙනවා. මේ බුරුම පොත්වල තියෙන 'නිගණ්ඨොනාටපුත්තෝ' යන්න එහෙම පිටින්ම වැරදි එකක් බව මා පෙන්වා දුන්නා. එහි ශුද්ධ පාඨය නම් 'නිගණ්ඨෝනාතපුත්තෝ' යනු මහාවීර හෙවත් වර්ධමාන නමින් සිටි නිගණ්ඨනාතපුත්‍රයායි. ඤාත නැමැති ලිච්ඡවීන්ගේ ක්‍ෂත්‍රිය ගෝත්‍රයට අයත් රාජ කුමාරයෙක් ඔහු. ඒ ඤාත ගෝත්‍රයේ ක්‍ෂත්‍රියකුගේ පුත්‍රයා නිසා ඤාතපුත්ත කියා ව්‍යවහාර වුණා. එය පාලි පොත්වල නාතපුත්ත නමින් ඇවිත් තියෙනවා. එතුමා නටන්නකුගේ පුතෙක් නොවෙයි. එහෙත් ශබ්දනීති කාරයා එතුමා නටන්නකුගේ පුතකු වශයෙනුයි තෝරලා තියෙන්නේ. මහා ශබ්දනීති ව්‍යාකරණය කොයිතරම් වැදගත් කොයිතරම් හොඳ එකක් වුවත් ඒ වගේ වැරදි තැන් තැන්වලට ඇතුළත්වී තියෙනවා. ඒ නිසා ඒකේ තිබුණ පලියට අප අන්ධානුකරණයෙන් ඒවා පිළිගන්ට හොඳ නැහැ. එයට වඩා පැරණි වූ කච්චායන, මොග්ගල්ලායන, ව්‍යාකරණ සහ ඒවාට පරිවාර වශයෙන් ලියූ රූපසිද්ධි, මොග්ගල්ලායන පඤ්චිකා ආදි ව්‍යාකරණත් සංසන්දනය කොට බලා තීන්දුවකට පත්විය යුතුයි කියා මා කිව්වා. මගේ කීමට ඒ ඇත්තන් එකඟ වුණා. ඉතින් පොත් ශුද්ධියේදී අප අතර මේ වගේ සාකච්ඡා දිගටම තිබුණා. මේ හැම අවස්ථාවකදීම ඒ මණ්ඩලයේ ඇත්තන් මා කෙරෙහි මහත් ප්‍රසාදයකින් තමයි ක්‍රියා කළේ. මට පසුව දැනගන්නට ලැබුණා අගමැතිතුමාත්, ජනාධිපතිතුමාත්, ශාසන අමාත්‍යයාත් ඇතුළු අවසන් ශෝධක මණ්ඩලයේ අය මට අග්ගමහා පණ්ඩිත උපාධිය දීමට තීන්දු කළා කියලා.''



REFERENCE

"සංගායනාවේ පළමුවන වාරය ළංවුණා. එයට ඉන්දියාව ලංකාව ආදි රටවලින්, ඒ ඒ රටවල විශේෂ පුද්ගලයන් විසින් එවා තිබුණ නිවේදන වැඩි හරියක් තිබුණේ ඉංග්‍රීසි භාෂාවෙන්. ඒ සියල්ලම පාලියට නගලා බුරුම අකුරින් ලිවීමේ කාර්යය මට පැවරුණා. ඒ වැඩෙහි මාස කීපයක් මා යෙදුණා. සංගායනා සභාවට ඉදිරිපත් කළේ ඒ ලියවිලි."

"ප්‍රථම සංගායනා අවස්ථාවේදී ලංකාවේ මහ තෙරවරුන් වෙනුවෙන් දේශනය විද්‍යෝදය පරිවේණාධිපතිව වැඩසිටි බද්දේගම පියරතන නාහිමියන් විසින් කළා. ඒ කතාව කළේ පාලි භාෂාවෙන්. අනතුරුව විද්‍යාලංකාර පරිවේණාධිපතිව වැඩ සිටිය කිරිවත්තුඩුවේ ප්‍රඥාසාර නාහිමියන්ගේ දේශනයයි තිබුණේ. ඒකත් පාලි භාෂාවෙන් කළා. ඔය මට මතක තියෙන හැටියටයි. පසුවද රාමඤ්ඤ නිකාය වෙනුවෙන් කතාවක් පාලි භාෂාවෙන් කළා. කවුද කියා මට මතක නැහැ. පාලියෙන් හා ඉංග්‍රීසියෙන් කතා දෙකක් කිරීම මට පැවරුණා. ඊට පසුවයි සංගායනාවේ කටයුතු ආරම්භ වුණේ. දවස් කීපයකින් මුල්වාරයේ සංගායනාවේ කටයුතු අවසන් වුණා. ඒ ඒ රටවලින් ආ අය ආපසු පිටත්වෙලා ගියා. ලංකාවෙන් ආව ඇත්තනුත් ආපසු ගියා."

"ඊළඟ අවුරුද්දේ දෙවන සංගායනා වාරය ආරම්භ කරන බව දන්වා එවා තිබුණා. ඒ අතරතුරදීම අග්ගමහාපණ්ඩිත උපාධිය මට සම්මත කොට ඇති බවත් දන්වා එවා තිබුණා. මගේ භ්‍රාතෘවරයාවුත් ප්‍රධාන ශිෂ්‍යයාවුත් වැලිගෙපොළ මෛත්‍රීමූර්ති භික්ෂු නමගේ මරණය සිදුවූ ඒ අවුරුද්දේ මා ගතකළේ බලවත් චිත්ත පීඩාවෙන් යුතු ජීවිතයක්. එබැවින් මා බුරුම ගමන ප්‍රතික්ෂේප කළා. කෙසේ වුවත් මාස කීපයකට පසු ඒ අග්ගමහාපණ්ඩිත උපාධිය මට පිරිනමා අක්තපත්‍රයත් එවා තිබුණා."

"මේ අතර තුන්වන වාරයේ සංගායනාවට මට සම්බන්ධ වීමට අවස්ථාව ලැබුණා. ස්වල්ප කලක් බුරුම සංගායනාවේ සභාපතිව සිටි රට්ඨගුරු මහතෙරුන් (සංඝරාජ) අපවත්වී මාස කීපයක් ගතවූ ඒ අවස්ථාවෙහි උන්වහන්සේගේ ශරීරය පිළිබඳ ආදහන උත්සවයට මට යන්නට සිදු වුණා, ලංකාව වෙනුවෙන්. ලංකාවේ භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් මට කතාවක් කරන්ටත් එහිදී අවස්ථාව ලැබුණා. ලංකාව වෙනුවෙන් මේ කතාව කරන්ට කියලා, සෝරත නාහිමියන් ප්‍රධාන ත්‍රිපිටක ශෝධක මණ්ඩලය

මගේ නම සම්මත කොට යවා තිබුණා. ඉන්පසුව මා ලංකාවට එන්ට සැරසෙන විට සංගායනා මණ්ඩලයේ ලේකම් විසුද්ධාභිවංශ මහ තෙරුන්ගෙන් මට පණිවුඩයක් ලැබුණා, සංගායනාවේ සභාපති ධූරයට මා පත්කර ගත්තා කියලා. තව ටික කලක් මෙහි වැඩ කරන හැටියටත් මට දන්වා එවා තිබුණා.''



බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහනාහිමියන් බුරුමයේ ඡට්ඨ මහා සංගායනා සභාවේ මුලසුනේ වැඩ සිටි අයුරු.

"සති කීපයක් මා සංගායනාවේ සභාපති වශයෙන් ක්‍රියා කළා. මේ මුල් ආසනයේ සභාපති වශයෙන් ඉඳගන්න අවස්ථාවේදී මට එක් කරුණක් මතක් වුණා. එයට අවුරුදු හයකට කලින් මා මදුරාසියෙහි රායපෙටා ස්ට්‍රීට් රෝඩ් නම් විදීයෙහි කෞමාර නාඩි මධ්‍යස්ථානයේදී ලබාගත් නාඩි වාක්‍යවල සඳහන් කාරණයක් ඒ. එහි සඳහන්ව තිබුණේ මොහුට මෙපමණ වයස වනවිට පිටරටකදී සභාවන්ගේත් සභාවේ, ප්‍රධාන ආසනය උසුලන්නට වෙනවා ඇත යන්නයි. දෙමළ වාක්‍යය ඔහු ඉංග්‍රීසියට නගා තිබුණේ සභාවන්ගේත් සභාව කියලයි. එද ඒ නාඩි වාක්‍යයේ සඳහන්වෙලා තිබුණේ මේ සංගායනා සභාව ගැන බව මේ මොහොතේදී මට මතක් වුණා. නාඩි වාක්‍යයේ සත්‍යතාව මට ප්‍රත්‍යක්ෂ වුණ එක් අවස්ථාවක් තමයි මේක. සති කීපයකින් පසු මා ලංකාවට ආවා.''

# 6 චිත්ත බලය දියුණු කොට කළ වශී කර්ම

"විද්‍යෝදය විද්‍යාලංකාර පිරිවෙන් විශ්වවිද්‍යාල බවට පත් කළේ 1959 අවුරුද්දේයි. පළමුවෙන්ම විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ උපකුලපති පදවියට පත්වූ වැලිවිටියේ ශ්‍රී සෝරත නාහිමියන් මට කතා කළා, මහායාන බෞද්ධ අධ්‍යයන අංශයේ මහාචාර්ය පදවියට. ඉතින් මා පිරිවෙනේ කාර්ය භාරය පණ්ඩිත ධර්මමූර්ති නැමති ශිෂ්‍ය නමට පවරලා කොළඹ ආවා. විද්‍යෝදය විශ්වවිද්‍යාලය ආරම්භයේ පටන් අවුරුදු කීපයක් මහායාන බෞද්ධ අධ්‍යයන අංශයේ මහාචාර්ය පදවියත්, ඉන්පසු මුළු බුද්ධ ධර්ම අධ්‍යයනාංශයේ විනෙතෘ පදවියත් මා ඉසුළුවා. මුළුකාලය වර්ෂ දහයයි."

"සෝරත නාහිමියන්ගේ අපවත්වීම මට ලොකු පාඩුවක් වුණා. උන් වහන්සේ ගැන මගේ පිළිගැනීම නම්, හික්කඩුවේ ශ්‍රී සුමංගල, රත්මලානේ ශ්‍රී ධර්මාරාම, මහගොඩ ඤාණේශ්වර වැනි මෑත යුගයේ සිටි ශ්‍රේෂ්ඨ පඬිවරුන්ගේ ගණයට වැටෙන බවයි. අසහාය පාණ්ඩිත්‍යයක් උන්වහන්සේ සතු වුණා. ඇතැම් කරුණුවලදී මට වැටහුණා තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමියන්ගෙන් පසු පහළවූ විශිෂ්ට ගණයේ පඬිවරයෙක්ය කියා. ව්‍යාකරණ නීති, පද සාධන සම්බන්ධ සාකච්ඡාවලදී මට එවැනි හැඟීමක් තමයි ඇති වුණේ."

"රජය මගින් ත්‍රිපිටක පරිවර්තන මණ්ඩලය සඳහා මුලින් පත්කර ගත්තේ සෝරත මාහිමියන් පරවාහැර වජිරඤාන නාහිමියන්, සහ මාත් තවත් දෙතුන් නමකුත් පමණයි. ඒ මණ්ඩලය මගින් තමයි ඒ ඒ පොත් භාරදීමට උගත් තෙරවරුන් තෝරා ගත්තේ. මේ ත්‍රිපිටක පාලිය ශුද්ධ කිරීමේදී, පරිවර්තනයේදී නිවැරදි තේරුම් ලබා ගැනීමේදී, ඒ සඳහා කරන ලද සාකච්ඡාවලදී සෝරත නාහිමියන්ගේ ගැඹුරු විනිවිද ගිය ඤානය හොඳින් ප්‍රකට වුණා. උන්වහන්සේ පිළිබඳ මගේ පැහැදීම එයින් තව තවත් වැඩි දියුණු වුණා."

"විද්‍යෝදය විශ්වවිද්‍යාලයෙහි ඉගෙන ගත් සෑම භික්ෂුවකටම අනිවාර්යයෙන්ම බුද්ධ ධර්මය උගත යුතුව තිබුණා. මා ටික කලකින් එයින් අස්වීමට හිතාගෙන හිටියත්, සමහර විශ්ව විද්‍යාලයීය ආචාර්යවරුන් මේ භික්ෂූන්ට බුද්ධ ධර්මය ගැන වැරදි අදහස් දෙන බව මට දැනුණ නිසා ඒ වැරදි හැඟීම්වලින් මේ භික්ෂූන් බේරා ගත යුතුයි කියන හැඟීම උඩ තව කලක් මෙහි ඉගැන්විය යුතුයි කියා මට හිතුණා. මෙයට හේතු වූයේ විද්‍යෝදයේ ඉගැන්වීම ආරම්භ කළ සති කීපයකින්ම මට දැන ගන්න ලැබුණ එක් කාරණයක්. වෙනයම් කිසි විෂයක් ඉගෙන ගන්නා පන්තියකදී ඒ භික්ෂූන්ට ඒ කථිකාචාර්යවරයා පටිච්ච සමුප්පාදය බුදුරදුන්ගේ දෙසුමක් නොව සාංඛ්‍ය දර්ශනය අනුව භික්ෂූන් විසින් පසුව සකස් කරගත් එකක්ය කියල උගන්වලා තිබුණා. පන්තියේදී ඒ භික්ෂූන් මට මේ කාරණය කිව්වා. එතනදී ඒ කාරණය මා පැහැදිලි කොට දී ඒක යල් පැනපු වැරදි මතයක් බවත්, පටිච්චසමුප්පාදයත් සාංඛ්‍ය දර්ශනයත් අතර කිසිම සම්බන්ධයක් නැති බවත් පැහැදිලි කරලා දුන්නා. ඒ වෙලාවේදී හිතුණා, තව තවත් මේ වැනි වැරදි මත මේ භික්ෂූන්ට පිළිගැන්වීමට ඉඩ ඇති බවත්, මේ රටේ බුද්ධ ධර්මය පිළිබඳව දැනට භික්ෂූන් තුළ පවත්නා රුචිය වැඩි දියුණු කළ යුතු බවත්. මා අවුරුදු දහයක් විතර කාලයක් විද්‍යෝදයේ රැඳුණේ ඔය කාරණය නිසයි."

"මේ අතර කාලයේදී සෝරත නාහිමියන්ගේ අකල් මරණය විද්‍යෝදය විශ්වවිද්‍යාලයට මහත් පාඩුවක් වුණා. උන්වහන්සේගෙන් පසු ස්වල්ප කාලයක් පලන්නොරුවේ නායක ස්ථවිරයන් වහන්සේ උපකුලපති ධුරය දැරුවා. ඔය කාලය තුළදී මට විද්‍යෝදය විශ්වවිද්‍යාලයෙන් සාහිත්‍ය ශූරී උපාධියත්, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයෙන් සාහිත්‍ය චක්‍රවර්ති උපාධියත් පිරිනැමුවා. මේ උපාධි කෙරෙහි මගේ ඇල්මක් නැතත් ඒවා නොපිළිගැනීම ඒ ආයතනවලට කැරෙන අගෞරවයක් වශයෙන් සලකන්නට ඉඩ තියෙන නිසා මා ඒවා පිළිගත්තා. ඒත් මා ඒවා එකක්වත් පාවිච්චි කරන්නේ නැහැ. මා කොච්චර අකමැති වුවත් සමහරුන් මගේ නමට මුලින් සමහරවිට මේවා යොදන බව නම් පේනවා. අග්ගමහා පණ්ඩිත උපාධියවත් මා පාවිච්චි කරන්නේ නැහැ."

"ඊළඟට පරවාහැර වජිරඤාන නාහිමියන් විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ උපකුලපති වශයෙන් ටික කලක් වැඩ කළා. ඉන් පසු මට

ඒ තනතුර ලැබුණා. මා හිතා ගත්තා මට පොත් පත් බලන්න හොඳ විවේකයක් මේ තනතුර නිසා ලබාගත හැකිය කියා. එහෙත් උදේ කාර්යාලයේ ඉඳ ගත්තම ඒ ඒ අංශ පිළිබඳව එන ලියුම් කියුම් කියවා බලා, අත්සන් කිරීමට හැන්දෑ වනතුරුත් කාලය ගත කරන්න සිදු වුණා. එක දවසක්වත් පොතක් පතක් බලන්න කිසි ඉඩරයක් ලැබුණේ නැහැ. උදේ හිට හැන්දෑ වනතුරුම ලියුම් කියවා පරීක්ෂා කරන්න, අත්සන් කරන්න, වුණ මට හැන්දෑ වෙනකොට හරිම වෙහෙසක් දැනුණා. මේ නිසා මට උපකුලපතිකම තිත්ත වුණා."

"මෙහෙම තියෙද්දී මගේ හිතට එකඟ නැති කටයුත්තකට මගේ අත්සන දිය යුතුව තිබුණා. ඒක මගඅරින්න බැරිම තැන මා කළේ උපකුලපති පදවියෙන් අස්වීමයි. වෙනින් කෙනෙක් පත් කර ගන්න කියලා මා කිව්වා. පත් කර ගන්නේ කවුද? කියලා මලලසේකර මහත්තයා මගෙන් ඇහුවා. ඒ වනවිට ප්‍රංශයේ සෝබෝන් විශ්වවිද්‍යාලයේ සිටි ආචාර්ය වල්පොළ රාහුල හිමියන් පත් කර ගන්නය කියලා මා උපදෙස් දුන්නා. මා තමයි ඒ නම දුන්නේ. මහාචාර්ය මලලසේකර මහත්තයා මට කිව්වා තව අවුරුදු දෙකක්වත් වැඩ කරන්න කියලා. මා කිව්වා, සුමාන දෙකක්වත් බැහැ කියලා. අන්තිමට ඩඩ්ලි සේනානායක මහතා ලවා වල්පොළ රාහුල හිමියන්ට වඩින්න කියලා ආරාධනා කරවලා පනිවිඩ කීපයක් යැව්වා. ඒ පාර තමයි උන්වහන්සේ ආවේ. මා වැඩ බාරදීලා අස් වුණා. විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ උපකුලපති පදවියෙන් ඉල්ලා අස්වූ පසු මට ලොකු නිදහසක් ලැබුණා. මා දැන් කාටවත් බැඳීමක් නැහැ. පිටරටවල ධර්ම ප්‍රචාරක කටයුතුවලට යෑමට නිදහස ලැබුණේ ඉන් පසුවයි. බළන්ගොඩ මා ඉන්න අතර කල්කටාවෙන් නෙළුවේ ජිනරතන ස්ථවිරයන් වහන්සේ ආරාධනාවක් එවා තිබුණා, බුද්ධගයාවේ වස් වසන්න වඩින්න කියලා. මා බුද්ධගයාවේ වසට ගියා. වස අවසානයේදී බරණැස සාරානාත්හි මහාබෝධි සමාගමෙන් පාලනය වන ඉසිපතනාරාම විහාරයෙහි අධිපති ධුරයත් මට පැවරුවා."

"මෙහි මා ගත කරන කාලයේදී පුදුම දෙයක් මට දැන ගන්න ලැබුණා. දවසක් අවුරුදු තිස්පහක් තරම් වයසැති ඇමෙරිකන් මහතකු මා හමුවෙන්න ආවා. ඉසිපතනයේ ආගන්තුක නිවාසයේ කාමරයක් ටික දවසකට ඔහු ඉල්ලුවා. මා එක කාමරයක් ඔහුට

දුන්නා. දවසක් මට හිතුණා මොහු හමුවී ඩැඩ්පුර තොරතුරු ටිකක් දැන ගන්න ඕනෑ කියලා. මොහු ටිකක් සංස්කෘත හා හින්දි භාෂාවන් දන්න කෙනෙක්. මන් ඔහුගෙන් ඇහුවා මෙතනට ආවේ කොහේ ඉඳලද? කියලා. ඔහු කීවා තමා ආවේ හිමාලය ජනපදයේ 'බද්රිනාත්' ප්‍රදේශයේ ඉඳලා කියලා. මා ඊළඟට ඇහුවා එහේ මක් කරනවාද? කියලා. එහේ ගල්ගුහාවක නැවතිලා යෝග භාවනා කරනවා කියලා ඔහු කිව්වා. කවුද ඔබට උපදෙස් දෙන යෝගී ආචාර්යවරයා කියලා මා ඇහුවා. ඔහු නමක් කිව්වා, මට මතක ඇති හැටියට නම් පව්හාරිබාබා."

"ඔහු ඒ යෝගී ආචාර්යවරයාගේ ඡායාරූපයක් මට පෙන්නුවා. මේ ඇත්තාගේ එක රැවුල් ගහක්වත් පැසී නැති තරුණයකු කියලයි මට ඒ ඡායාරූපය බැලීමේදී හැඟුණේ. මා ඒ ඡායාරූපය බලලා කිව්වා, 'මෙයා වැඩි වයස් කාරයෙක් නෙවෙයි, තරුණවිය ඉක්මවූවෙක් නෙවෙයි' කියලා. එතනදී ඒ ඇමෙරිකන් මහතා මට කිව්වා නැහැ මෙයාට වයස අවුරුදු දෙදහත් පැනලා කියලා. මා කිව්වා මට නම් ඕක විශ්වාස කරන්න බැහැ කියලා. ඔබ විශ්වාස කළත් නොකළත් මා විශ්වාස කරනවා මේක ඇත්තක් කියලා ඔහු කිව්වා. එපමණක් නෙවෙයි මේ ඇත්තා ත්‍රිකාලදර්ශී කෙනෙක් කියලත් ඒ ඇමෙරිකන් මහතා කිව්වා. එතනදී මා ඇහුවා, තවත් ඒ වගේ අය එහේ ඉන්නවාද? කියලා. ඔහු කීවා අවුරුදු සීය, දෙසීය, තුන්සීය, හාරසීය, පන්සීය වයස් ගත කරපු යෝගීන් තව සෑහෙන ප්‍රමාණයක් එහෙ ඉන්නවා කියලා."

"ඒ සමඟම ඔහු කිව්වා 'අවුරුදු ගණනාවකට ඉස්සර බරණැසට කිට්ටු දුම්රිය පොළකදී දුම්රිය ගාඩ් කෙනකු මෙයා මුදල් නොගෙවා දුම්රියෙන් යෑමට විරුද්ධව දුම්රියෙන් එළියට ඇද දමා තියෙනවා. පසුව මේ තැනැත්තා දුම්රිය පොළේ වේදිකාවේ ඉඳගෙන ඒ දුම්රිය දිහා බලාගෙන හිටියලු'. එද තිබුණ ඉංග්‍රීසි නීතිය අනුවත් හින්දු තවුසන්ට මුදල් නැතිව නොමිලේ වාහනවල යන්ට අවසර තිබුණා. ඉංග්‍රීසි ගාඩ් කෙනකු මොකක් නිසා හෝ මෙයාව දුම්රියෙන් දොට්ට දලා තියෙනවා. අනික් ඔක්කෝම මිනිසුන් දුම්රියට නැග්ගාට පස්සේ දුම්රිය පිටත් කරවන්න අවශ්‍ය සංඥා දුන්නා. එහෙත් දුම්රිය යන්නේ නැහැ. දුම්රිය පදවාගෙන යන අය හුඟාක් උත්සාහ දැරුවා. නමුත් දුම්රිය යන්නෙම නැහැ.

ඔක්කෝම පරීක්ෂා කරලා බැලුවා. කිසිම දෝෂයක් තිබුණෙත් නැහැ. කොහොමවත් දුම්රියට පිටත් වෙන්න බැරි වුණා. එතන හිටිය කිසියම් උගත් මහතකු අර දුම්රිය ගාඩ්ට කතා කරලා රහසින් කිව්වා මේ වේදිකාවේ ඉන්න යෝගියා මහා බල සම්පන්න කෙනකු විය යුතුයි. ඒ නිසා මහත්මයා එයා ළඟට ගිහින් සමාව ඉල්ලා රේල්ලුවට නගින්න ආරාධනා කරන්න කියලා. අර ගාඩ් මහත්මයා ගිහිල්ලා සමාවෙන්න කියලා රේල්ලුවට නගින්න ඒ යෝගියාට ආයාචනා කළා. යෝගියා රේල්ලුවට නැග්ග හැටියේම ඒක පිටත් වුණා. මේ ප්‍රවෘත්තිය එකල සිංහල බෞද්ධයා පත්‍රයේත් පළ කරලා තිබුණා. ඉන්දියන් පත්‍රවලත් ඒ ප්‍රවෘත්තිය පළ කරලා තිබුණු හැටි මා දුටුවා. ඉතින් අර ඇමරිකන් මහත්මයා කිව්වා අන්න ඒ යෝගියා තමයි මේ කියලා. ඊට පසුව මාත් මේ ගැන හුඟක් කල්පනා කළා."

"සෘද්ධිබල වැඩූ කෙනෙකුට ආයුෂ කල්පයක් තරම් කාලයක් ජීවත් වෙන්න පුළුවන් කියලා බුදුරජාණන් වහන්සේත් වදාරලා තියෙනවා. උත්පත්තිය ලබා දීපු කර්මය අවුරුදු තුන් හාරදහක් ජීවත් කරවන්න තරම් බලවත් නම්, මේ කාලයේ සාමාන්‍ය මනුෂ්‍යයකුගේ ආයුෂය අවුරුදු එකසිය විස්සක් වුණත් යෝග භාවනා බලයෙන් හෝ ඖෂධ බලයෙන් හෝ මන්ත්‍ර බලයෙන් හෝ ඊට වැඩි කාලයක් ජීවත් විය හැකියි. ඒ නිසා ඇමෙරිකන් මහත්මයා කියන කතාවේ සත්‍යයක් ඇතැයි කියා මට හිතුණා. ඒ වගේම පුදුම සෘද්ධිබල ඇති යෝගීන් එහි ඉන්න බවත් ඒ අය අනුනට ඒවා නොපෙන්වා තව තවත් ඒවා දියුණු කිරීමේ යෙදී සිටින බවත් ඔහු මට කීවා. ඇමෙරිකන් මහතාගේ කියමනට මා විරුද්ධ වුණේ නැහැ. හින්දු යෝගීන් පිළිබඳ මාත් තරමක දැනුමක් අත්දැකීමක් ලබාගෙන තිබුණා."

**"බොහෝදෙනා අතර තියෙන විශ්වාසයක් තමයි මහානායක හාමුදුරුවන් නොයෙක් බලවේග උපදවාගෙන වැඩ ඉන්නවා කියලා. ඒ ගැන විශේෂ යමක් කියන්න තියෙනවාද?"**

"බොහෝදෙනා හිතන අන්දමේ බලවේගයක් මා තුළ නැහැ. මා සාමණේර කාලේ ඉඳලම ආනාපාන සතිය පුරුදු කළා. ඒ කාලේ ඔය චිත්ත ශක්තිය නැංවීම පිළිබඳ ඉංග්‍රීසි පොතක් මගේ මිත්‍රයකු මට ගෙනත් දුන්නා."

"මහණ වෙන්න ඉස්සරවෙලා මා අටවෙනි පන්තියට තරම් ඉංග්‍රීසි ඉගෙන ගෙන තිබුණා. ඒ පොතේ ඔය චිත්ත බලය වඩන ක්‍රමය ගැන තරමක විස්තරයක් තිබුණා. මට මේකේ ඇත්තක් තියෙනවද කියලා බලන්න ලොකුවට ඕනෑකම තිබුණා. ඒ කාලයේ මීගමුවේ හිටිය මහත්මයෙක් මට නම හරියට මතක නැහැ. (නීතිඥ එච්. පී. ද සිල්වා වෙන්න ඇති) වශී කරණ ගැන සිංහලයෙන් පොඩි පොතක් පළ කරලා තිබුණා. ඒකේ කියා තිබුණු උපදෙස් අනුව මා 'හිප්නටිසම්' ටිකක් පුරුදු කළා. නමුත් හරි ගියේ නැහැ. මේ අතර මා ආනන්ද කොලීජියේ ඉන්න ගමන් ඉංග්‍රීසියෙන් පළවෙළා තියෙන චිත්ත බලය වැඩීම පිළිබඳ පොත් පත් ටිකක් සොයා ගත්තා. ඉන්දියාවේ තින්නවේලියේ මුද්‍රණය කරපු චිත්ත බලය වැඩීමේ පාඩම් මාලාව ඇතුළත් පොත් කාණ්ඩ මට ලැබිලා තිබුණා. මා ටිකක් ඒවා පුරුදු කළා. ඒ අනුව තරමක් දුරට චිත්ත ශක්තියක් ලැබුණත් ඒක මගේ හිතට එච්චර ඇල්ලුවේ නැහැ. මේ අතර ඇමෙරිකාවේ පළවෙච්ච 'ලාමෝට්ටේසාජ්' නැමැති වශීකරණ විද්‍යාඥයා ලියපු බොහොම අගේ ඇති පොතක් මට ලැබුණා. ඒක මට ගෙනත් දුන්නේ මා ඇසුරු කරන මගේ මිත්‍රයෙක්. හිප්නටිසම් බලයෙන් ලෙඩ සුව කිරීම ආදිය පවා ඒකේ බොහොම හොඳට විස්තර කරලා තිබුණා. ඒ අනුවත් ඒක ටිකක් පුරුදු කළා. එහෙත් මගේ හිතට ඒකත් ඇල්ලුවේ නැහැ."

"මේ අතර Verner නම් කෙනෙකු පළ කළ Way to success නම් පොතක් මට ලැබුණා. එහි උපදෙස් අනුව වශීකරණ විද්‍යාව පුරුදු කළා. ඉන්පසු එංගලන්තේ පළකරපු පොතක පිට කවරයේ දැන්වීමක සඳහන් වෙලා තිබුණා, 'හඤ්ඤුහර' කියන කෙනකු පළ කරපු 'ප්‍රැක්ටිකල් හිප්නටිසම්' කියන පොතක් ගැන. ඒකත් ගෙන්වා ගෙන ඒ අනුවත් පුරුදු කළා. ඒකේ හින්දු 'ප්‍රාණයාම යෝගය' පදනම් කරගෙන වශීකරණ දියුණු කරන හැටි උගන්වලා තිබුණා. මගේ චිත්ත බලය හුඟක් දුරට දියුණුවන බව මට පෙනුණා. ඒකේ පිට කවරයේ තිබුණා ඒ කතෘ විසින්ම ලියූ 'ප්‍රැක්ටිකල් යෝග' කියන පොතක් ගැන. පස්සේ ඒකත් ගෙන්වා ගෙන ඒකේ උගන්වන ක්‍රමයටත් යෝග පුරුදු කළා. දිගටම ප්‍රාණයාම යෝගය කරන්ට පටන් ගත්තා. යෝග භාවනා පැත්තට මගේ හිත තදින් ඇදී ගියා. ඒ අතරම පුරුදු ආනාපාන සතියත් වැඩුවා. ඒ මගින් චිත්තබලය දියුණු වුණා. මෛත්‍රී භාවනාව පදනම් කරගෙන චිත්ත බලය

වැඩීමයි එහි උගන්වා තිබුණේ. මට එහි ඉගැන්වූ ක්‍රමයෙන් මහත් ප්‍රතිඵල ලැබුණා."

"ක්‍රීඩාවලට ගිහිල්ලා තුවාලවෙච්ච ආනන්ද කොලීජියේ සමහර ළමයි සික්වෝඩ් එකේ ඉන්නවා. ඒ අය සමහරවිට මට කරදර කරනවා තමන්ගේ ශරීරවල තුවාලවල කැක්කුම ඉවසන්න බැහැ, සනීප කරදෙන්න කියලා. ඉතින් මා ගිහිල්ලා චිත්ත බලය පාවිච්චි කරලා බොහොම ඉක්මනට ඔවුන් වශීකරලා තුවාල සනීප වනතුරුම එතන කැක්කුම ඇති නොවන්නට සලස්සනවා. ඒක බොහෝම සාර්ථක වුණා. සභාවක කතා කිරීමට පවා ලැජ්ජා සමහර ළමයිනුත් විදුහලේ හිටියා. මා ඒ ළමයින් වශීකරලා අර ලැජ්ජාව දුරු කරවලා එඩිතර බව ඔවුන් තුළ ඇති කළා. සමහර දරදඬු හිතුවක්කාර ළමයි මගේ චිත්ත බලයට හසු නොවී මග අරින්නත් වෑයම් කළා. ඒ අය මා වෙන ක්‍රමයක් පාවිච්චි කරලා දැඩි වශී නිද්‍රාවට පත් කළා. ඒ සඳහා මට ශක්තිය ලැබුණේ යෝග පුරුදු කිරීමෙන්. පයින් එන්න පුළුවන් තරම් දුරක සිටින කෙනකු මා සිටින තැනට කැමති වෙලාවක ගෙන්වා ගැනීමේ බලය මා තුළ ඇති වුණා. අත්හදා බැලීම් වශයෙන් ඔය විදියට නොයෙක් දේ මා කළා."

"මගේ ශරීරයට ඇතිවෙච්ච අසනීප, විශේෂයෙන් උණ රෝග පවා බෙහෙත් නොකර චිත්ත බලයෙන් ම මා සනීප කර ගත්තා. පාඩම් හිටින්නේ නැතිව හිත වික්ෂිප්තව හිටිය ළමයින් වශීකරණ විද්‍යාවෙන් නිද්‍රාවට පත් කරලා හොඳට පාඩම් හිටින අය බවට පත් කළා. එබඳු කෙනෙක් අද උසස් දොස්තර කෙනෙකුව ඉන්නවා. ඒ දවස්වල දුබලකම් ඇති නොයෙක් දෙනා මා ළඟට අරන් එනවා. මා ඒ අය හොඳ තත්වයට පත් කරනවා. චිත්ත බලයෙන් තවත් නොයෙක් දේ මා කළා. ඒවා එහෙම කළේ සත්තද කියා බලන්නයි. හරි ගියා. පස්සේ මා චිත්ත බලය එබඳු වැඩවලට පාවිච්චි නොකර මගේ ආරක්ෂාවටම යොදා ගත්තා. මා කාටවත් ඒක ඇහෙව්වේ නෑ. සමහර ධර්මදේශනාවලට ගිය අවස්ථාවල මුළු පිරිස දිහාම බලලා එක පාරටම ඒ අය වසඟ කළා. ඊට පසුව මගේ අවසරයක් නැතිව ඒ ගොල්ලන්ට ධර්මදේශනය අවසන් වෙනතෙක්ම නැගිටින්න බැහැ. මා නැගිටින්න අවසර දුන්නාමයි ඒ ඇත්තන්ට නැගිටින්න පුළුවන් වෙන්නේ."

"ඒ කාලයේ මොරටුවේ පාදිලි කෙනෙක් බුද්ධාගමට විරුද්ධව විටින් විට කතා පවත්වනවා. මා මොරටුමුල්ලේ තාපසාරාමෙට ගිහිල්ලා ඒවාට උත්තර වශයෙන් කතා පැවැත්තුවා. ඉස්සරහ පල්ලියේ පාදිලිතුමා බුද්ධාගමට විරුද්ධව කතා පවත්වනවා. දවසක් ඇර දවසක් වගේ මාත් ගිහිල්ලා ඒවාට උත්තර දීම් වශයෙන් කතා පවත්වනවා. ඔය නිසා සමහර ක්‍රිස්තියානි කාරයන් මා සමග හරියට විරුද්ධ වුණා. මා ඒකට බය වුණේ නැහැ. ඔවුන් මට පිහියෙන් අනිනවා, වෙඩි තියනවා කියලත් ලියලා එව්වා. මා කොහෙත්ම බය වුණේ නැහැ. එහෙම දැන්වූ අවස්ථාවල තනිවම පයින්මයි මා එහාට ගියේ. මා දකින කොට ඔක්කෝම වසඟ වෙනවා. මට කොයි වෙලාවකවත් බයක් ඇතිවුණේ නැහැ."

"දවසක් මා මොරටුවේ දේශනාවකට ගිහිල්ලා උදේ රේල්ලුවෙන් ආපසු කොළඹ ආවා. මා ආව රේල් පෙට්ටියේම ආවා මොරටුවේ තරුණයන් දෙන්නකුත්. ඒ අය කොළඹ කොටුවේ රස්සාවල් කරන අය කියලා මට පසුව දැන ගන්න ලැබුණා. ඒ අය කතෝලිකයන් බවත් මට තේරුණා. මා වාඩිවෙලා හිටිය ආසනය ඉදිරිපිට ආසනයේ ඒ අය වාඩිවෙලා, මා දිහාවට කකුල් දික් කරගෙන කිසිම ගරු සරුවක් නැතිව අසතුටු මුහුණක් පෙන්වමින් සිටියා. තවත් කීප දෙනෙක් ඒ ආසනයේ වාඩිවෙලා හිටියා. හොඳ වැඩක් කරන්නම් කියලා හිතලා, මා අර එක්කෙනකු දිහා බැලුවා. බලා තදින් හිතින් අධිෂ්ඨාන කළා මොහු නින්දට වැටෙන්න ඕනෑ කියලා. ටික වේලාවකින් ඔහු නින්දට වැටුණා. අනික් එක්කෙනාවත් වශී කරන්න හිතාගෙන මා එයා දිහා බලනකොට එයා අහක බලා ගත්තා. මිනිහා මට බය වුණා. කොහොමවත් එයා මට මූණ දුන්නේ නැහැ. කොහොම හරි මුහුණේ එක ස්ථානයක් අල්ලා ගත්තාමයි වශී කරන්න ලේසි. අර මිනිහා මගඇරියා. නමුත් අනෙකා නින්දට වැටුණා."

"වටේට වාඩිවෙලා හිටිය අය මේක බලාගෙන ඉඳලා නිහඬ වුණා. මා මන්තර ගුරුකමක් කරනවා කියලා ඒ අය හිතන්න ඇති. ඉතින් ටික ටික කොටුවට කිට්ටු වුණා. මා කල්පනා කළා අනේ මේ මනුෂ්‍යයාට වෙලාවට කන්තෝරුවට යන්න බැරි වුණොත් මෙයාට දඬුවම් ලැබෙන්නත් පුළුවනි. එහෙම වෙන්න දෙන එක හරි නෑ කියලා කොල්ලුපිටිය හරියේදී මා බොහොම උත්සාහ කළා,

එයාව පුබුදු වන්න. ඒ සියල්ල කළේ හිතින්මයි. කාටවත් අහවන්නේ නැතිව තවත් උත්සාහ කරන කොට කොටුව කිට්ටුවදී එයා පිබිදුණා. පිබිදිලා කොටුව ස්ටේසමේදී බැස්සා. නමුත් බැස්සට මොකද, අර නිදිමත නිසා මිනිහා බිම වාඩිවෙලා නැගිටින්න බැරිව හිටියා. පස්සේ ටික වෙලාවකින් නැගිටලා, ටිකක් නතර වෙලා ඉඳලා, අනික් එක්කෙනත් එක්ක ගිය බව මට පෙනුණා.''

''මා යන්නේ මරදානටයි. තව දෙතුන් දෙනෙක් ඒ රේල් පෙට්ටියේ ඉතුරුවෙලා හිටියා. ඒ අය මගෙන් ඇහුවා හාමුදුරුවෝ මන්තර ගුරුකමක් කළා නේද කියලා? මා කිව්වා මා දන්න මන්තරයක් නැහැ කියලා. නැත්තේ මොකද හාමුදුරුවන් මොකක් හරි කළා නේද කියලා නැවතත් ඇහුවා. මා ඒවාට උත්තර දෙන්න ගියේ නැහැ. මරදානට රේල්ලුව ආව ගමන් ඉක්මනට බැහැලා ආවා.''

''ඉතින් ඔය ප්‍රවෘත්තිය පස්සේ පත්තරවලත් පළවී තිබුණා. මා ඒවාට උත්තර දෙන්න ගියෙත් නැහැ. ඔය වගේ දේවල් මා කළා. කිසිවෙකුටත් ඒ මගින් අනතුරක් නම් කළේ නැහැ. මගේ චිත්ත බලය මා පාවිච්චි කළේ සමහරුන්ගේ අසනීප සුව කිරීමට, පාඩම් නොහිටින අය තුළ පාඩම් කිරීමේ ස්මරණ ශක්තිය දියුණු කිරීමට වැනි හොඳ දේවලටයි. ෆ්‍රෙනලොජි කියන ක්‍රමයට අනුව ස්මරණ ශක්තියට ප්‍රධානවන මධ්‍යස්ථානයක් හිසේ තියෙනවා. වශී කරලා ඒ තැන් ඇල්ලීමෙන් ස්මරණ ශක්තිය දියුණු කරන්න පුළුවන්. වශීකරණයේදී ඒවා නරක වැඩවලට පාවිච්චි කළොත් ඒ ශක්තිය නැතිවී යනවා.''

''සමහරවිට සමහර තැන්වලදී විනෝදය පිණිසත් මා සමහරුන් වශී කළා. මට මතක නෑ හරියට, වාද්දුවේ වෙන්ට ඇති, එක්තරා පන්සලක බණකට ගිය වෙලාවේ අවුරුදු විස්සක් විතර තරුණ භික්ෂුවක් වශී කළා. වශී කරලා කිව්වා, මා බණ කියලා එන තුරුත් ඔතන ඔහොම ඉන්න කියලා. මා බණ කියලා එන තුරුත් එතනම හිටගෙන හිටියා. ඒවා කළේ විනෝදෙට. ඊට පසුව නිද්‍රාවෙන් ඔහු අස් කළා. ඉතින් මේ අත්හද බැලීම්වලින් බොහොම දේවල් මා ඉගෙන ගත්තා.''

"මරදනේ එක්තරා ආවාසයකට මා ගිය වෙලාවක මට කිව්වා කෙනෙකු වශී කරලා පෙන්වන්න කියලා. මා එතන හිටිය සාමණේර නමක් වශී කළා. වශී කරලා ඇස් දෙක ඇරෙව්වා. එයා ඇස්දෙක ඇරියේත් නිද්‍රාවෙන්. දැන් එයා මට වසඟයි. මා කිව්වා දැන් ඔබ ඉදිරිපිට ලොකු බිත්තියක් තියෙනවා. ඒක හින්ද ඔබට එතනින් එහාට යන්න බැහැ කියලා. බිත්තියක් ඇත්ත වශයෙන් එතන නැහැ. එතන තියෙන්නේ හිස් ශාලාවක්. මා කිව්වා ඉස්සරහට යන්න කියලා. එයා යනවා, ගිහිල්ලා ආපස්සට පනිනවා. බිත්තියේ හැපෙන්නා වගේ එයාට දැනෙනවා. නැති බිත්තියකයි එයා හැපෙන්න යන්නේ. මා හිතින් මනෝමය බිත්තියක් ඇති කළා. මනෝමය බිත්තිය කියන්නේ එයාට බිත්තියක් පෙනෙන්ට සැලැස්වීමයි. එතන හැපෙන්න බිත්තියක් නැහැ. එයා එතනට ගියාම හැපෙනවා. බිත්තියක් කියලා එයාට දැනෙනවා. ඒනිසා ආපස්සට පනිනවා. යන්ඩ බෑ කියනවා. සමහරවිට ගිනි ගොඩක් නැති තැනක මා ගින්නක් කියලා කිව්වාම ටික වෙලාවකින් ඒක එයා විශ්වාස කරනවා. එතන්ට යන කොට පිච්චෙනවා වගේ එයාට දැනෙනවා. පිච්චෙනවා කියලා කෑ ගහනවා."

"සමහරවිට ආනන්ද කොලීජියේදීත් මා ඒවා කළා. වශීකරණයෙන් නිද්‍රාවට දලා ඇහැ අරවලා මෙතන හොඳ ගහක්, අපි නාමු කිව්වාම එයා අමුඩෙ ගහගෙන බිම එහාට මෙහාට පීනනවා. සමහර අවස්ථාවල ඇතැම් ළමයකු නිද්‍රාවට පත් කරලා ඔබ දැන් කුකුළෙක් කියලා කීපවරක් කීවාම එයාට ඇහෙන්නේ එයා කුකුළෙකු කියලා. ඊට පස්සේ එයා අත්තටු ගහනවා. කුකුළෙක් වගේ කෑ ගහනවා. ආනන්ද කොලීජියේ ඒ දිනවල හිටිය එක ළමයෙක් හරිම ලැජ්ජයි. බයයි. එයාට අත් ළමුන් නම් කළේ 'ගර්ලි' කියලා. පස්සේ පන්ති බාර ගුරුවරයා මට කිව්වා, හාමුදුරුවනේ මේ ළමයාගේ අනවශ්‍ය ලැජ්ජාව බය නැති කරලා දෙන්න කියලා. හොඳයි පන්තියට ඇවිදිල්ලා ළමයි ඉදිරිපිටම මෙයා වශී කරන්නම් කියලා පන්තිභාර ගුරුතුමාට ඒ වෙලාවේදී මා කිව්වා."

"මා ගිහිල්ලා ඒ ළමයා පන්තියේදීම වශී කරලා කිව්වා, 'ඔබ දැන් බොහොම දක්ෂ නෘත්‍ය කාරයෙක්. හොඳට වයලීනය වාදනය කරන්නත් පුළුවන්. වයලීනය වාදනය කරන්න' කියලා අතට ලී කෑලි දෙකක් දුන්නා. එයා මේ ලී කෑලි දෙක වයලීනය වාගේ

වාදනය කළා. මා කිව්වා, සින්දුවක් කියන්න කියලා. මට මතකයි, රාම සීතා කතාවේ එන (නෘත්‍යයේ එන) "සීතා කෝකිලනාද මධුරසර" ආදි සින්දුව එයා කිව්වා. ඒක අර ලක්ෂ්මන කුමරයා සීතාව කැලේ ගිහින් තවත්වලා තින්ද යනතුරු කියාපු සින්දුව. එයා ඒක පංචිකාවත්තේ ටවර්හෝල් එකේදී අහලා තිබුණා. ඒ සින්දුවත් හරිම ලස්සණට කියමින් අර ලී කැලි දෙක එකට ගැටෙව්වා. හරියටම වයලීනය වාදනය කරනවා වගේ. එහෙම කරලා ඉවර වුණාම මා කිව්වා, 'උඹ දන් නාට්‍ය කාරයෙක්. ඒ නිසා නැටුමක් නටන්න කියල' එයා දකල තිබුණු නැටුමක් ඉතාම ලස්සණට නැටුවා. අනික් වෙලාවට හරිම ලැජ්ජයි. කතා කරන්නෙත් නැහැ. ඉතින් නටන අතරතුරදීම මා එයා ටිකින් ටික පිබිදෙව්වා. පුබුදුවමිනුත් කිව්වා, උඹ හොඳටම පිබිදෙව්වට පස්සෙත් නැටීම නතර කරන්න බැහැ, උඹ දිගටම නටනවා කියලා. එයා හොඳටම පිබිදෙව්වා. එහෙත් ඔහු දිගටම නටනවා. නැටුම නතර කළේම නැහැ. මා නවත්වන්න අණ දෙන තුරු නැටුවා. ඔය විදියට කළාම එයාගේ ලැජ්ජාව නැති වුණා. ඊට පස්සේ එයා ඉතාම හොඳ එඩිතර ළමයකු වුණා."

"ඔන්න ඔහොම දේවල් මා කළා. ඊට පස්සේ සත්‍යදයි බැලීමට හිත්දු යෝගත් පුරුදු කිරීමෙන් යම් යම් ප්‍රතිඵල ලබා ගත්තා. ඊළහට මා බෞද්ධ යෝග භාවනාවත් ඔස්සේ හිත දුවවලා ආනාපානසති පැත්ත යළි දියුණු කළා. මේවා කිරීමෙන් ලොකු චිත්ත බලයක් මා ලබාගෙන තිබුණා. ඒ අනුව යම් යම් දේ කළා. මටත් අනුන්ටත් යහපත පිණිසයි ඒ හැම දෙයක්ම කළේ. බළන්ගොඩ ගිහින් පිරිවෙන පටන්ගත් කාලේ යෝග භාවනාව (ධ්‍යාන භාවනාව) තව දුරටත් වැඩි දියුණු කළා. එය ද ඉතා රහසිගතවයි කළේ. එහි කිසිම කෙනකු දන ගත්තේ නැහැ, මා එවැන්නක් කරන බව."

"අද ඒ තත්වය නැද්ද මහානායක හාමුදුරුවනේ?"

"බොහෝම කලකින් ඒවා පුරුදු කළේ නැහැ. මොකද ඕවා හරියටම කට්ටඩිකම් කිරීම වගෙයි. යකුන් බැඳ ගත්ත මිනිහා හැමදම යකාට තටුවක් තියන්න ඕනෑ. ඒ වගේම මේ වැඩේටත් හැමදම උදේ ටිකක් හිතන්න ඕනෑ. කෙනෙකු වශී කිරීමට එයාගේ කැමැත්ත අරන් කරන එක වෙනම දෙයක්. මා කෙනකු වශී කරන්නේ එයාගේ කැමත්ත අරගෙන නොවෙයි. එයාගේ හිතට

විරුද්ධව. එයා කොච්චර වශී නොවී ඉන්න උත්සාහ කළත් මට පුළුවන් එයා වශී කරන්න. ඒ විදියටයි මා ඒක පුරුදු කළේ. ඒක යෝග ක්‍රමයක්. මට අදත් හිතුවොත්, පැය කීපයක් මහන්සි ගත්තොත් ඒ ශක්තිය ආයිත් මතු කර ගන්න පුළුවන්. මා දැන් ඒ ඔස්සේ නොවෙයි යන්නේ. දැන් කලක ඉඳලා මා අධ්‍යාත්මික දියුණුව පිළිබඳ විපස්සනා භාවනාව පුරුදු කරනවා. ඒ පැත්තට හැරුණට පස්සේ අරව එපා වුණා. ඒවා නිකම් විහිළු කියලා හිතුණා. බොහොම ඉස්සර ධ්‍යාන භාවනාව ටිකක් දුර දියුණු කළා පසුව ඒක විපස්සනාව පැත්තට හැරෙව්වා. දැන් ප්‍රධාන වශයෙන් මා කරන්නේ විපස්සනා භාවනාවයි. ධ්‍යාන භාවනාවත් ස්වල්ප වශයෙන් කරනවා. ඒක තරමක් දුරට දියුණුවෙලා තියෙනවා. එහෙත් මේවාට මට ඉඩ ලැබෙන්නේ නැහැ. කොච්චර තනිව විවේකීව මේවා කරන්න හැදුවත් අවකාශයක් ලැබෙන්නේ නැහැ. මෙතන ඉන්න කොට උදේ ඉඳන් හැන්දෑ වෙනකල් මිනිසුන් එනවා එක එක දේවලට. බළන්ගොඩ ගියාම නම් ටිකක් අඩුයි. ඒත් කොළඹින් පවා එහාට හොයා ගෙන එනවා. මට නම් මේක මහ අලි කරදරයක්. බොහෝ දෙනකු එන්නේ ඇමතිවරයකුට ලියුමක් ගන්න. එක්කෝ ජනාධිපතිතුමාට මා ලවා මොකක් හරි කියවන්න. නැත්නම් ඒ වර්ගයේ වෙන වැඩකට.”

# 7 භාරතීය යෝගීන් සමග

"මා ආනන්ද කොලීජියේ ඉන්න කාලයේ ඉඳලම භාවනා ක්‍රම දියුණු කරමින් තමයි හිටියේ. විවේක වෙලාවල එක්තරා යෝග භාවනා ක්‍රමයක් මා පුරුදු කළා. බළන්ගොඩ පිරිවෙනට පැමිණීමෙන් පසුවත් යෝග භාවනාවල යෙදුණා. ඒක සමාධි භාවනාවක්. ටික කලකදී ඒ භාවනාව තුළින් මට පරචිත්ත විජානනය (පරසිත් දන්නා නුවණ) ලැබුණා. ඒත් මා ඒක ලබාගන්න ඕනකම් කළේ නැහැ. ඉබේම ඒක ආවා."

"කවදාවත් ඊට පෙර නුදුටු කෙනකු දුටුවත් මා දන්නවා ඔහුගේ නම, ඔහු ආ කාරණය, ඔහුගේ ගම. එහෙම දැනීමේ ශක්තියක් මට ඇති වුණා. පිරිවෙනේ ශිෂ්‍යයකු දුටු හැටියේම මට දැනෙනවා මොහු දැන් හිතන්නේ මෙහෙමයි කියලා. එහෙම දැනගෙන ඒවා අහලා ඔහුට අවවාද කරනවා. ඔය වගේ අවස්ථාවල සමහර ශිෂ්‍යයන් සැක කළා, වෙනින් කවුරුහරි කෙනකු ඒ අය ගැන මට කේලම් කියනවා කියලා. ඒ නිසා පිරිවෙනේ සිසුන් අතර අසමගිකම් පවා ඇති වුණා. කවුරුවත් කියල නොවෙයි, දුටු හැටියේම මට පෙනෙනවා. මා අපේ පිරිවෙනේ ශිෂ්‍යයන්ට දුම්බීම තහනම් කරලා තිබුණා. ඒ වගේම දවාලට නිදන්නත් අවසර තිබුණේ නැහැ. දවල් දැනෙන් පස්සේ ශිෂ්‍යයන් මොකද කරන්නේ කියලා බලන්න මගේ හිත ඒ ඒ තැන්වලට යවනවා. ඒ ඒ තැන්වල දුම් බොන අය මට පේන්න පටන් ගන්නවා. නිදන අයත් මට පෙනෙනවා. ඉක්මනින් ගිහිල්ලා අල්ලා ගන්නවා. ඒ වෙලාවේම ඒ අයට අවවාද කරනවා."

"මා උදේ පහයි තිහට නැගිටලා ටිකක් භාවනා කරනවා. සවස පහයි තිහටත් භාවනා කරනවා. රෑ දහයයි තිහටත් භාවනා කරනවා. මේක නොකඩවා කරගෙන යනකොට තමයි මට ඔය ශක්තිය ලැබෙන්න පටන් ගත්තේ. එහෙත් මා භාවනා කරන බව කාටවත් ඇහෙව්වේ නැහැ. එච්චර රහසේ තමයි මා ඒවා කළේ.

එහෙම තියෙන අතර අපේ පිරිවෙනට ශිෂ්‍යයන් තුන්දෙනකු එවන ලොකු හාමුදුරු නමක් ඒ පන්සලේ සති දෙකක පින්කමක් තියෙනවා කියලා මටත් ඒකට එන්නම කියලා ඇවිත් ආරාධනා කළා. ඒ ගල්ලෑල්ලේ පන්සලේ. ඒ කාලයේ ඒ විදියේ පින්කම්වලට මා යන්නේ නැහැ. මා යන්නේ නැත්තේ මගේ මේ භාවනාවට පාඩු වන නිසයි. ඉතින් ඒ වෙලාවේ ඒ ලොකුහාමුදුරුවන් කිව්වා, 'අපේ ගෝලයන් කීප නමක් පිරිවෙනට එවනවා. එහෙම වුණත් අපේ පින්කමටවත් ඔබ වහන්සේට වඩින්න බැහැ, මේ පින්කමට නම් කොහොම හරි වඩින්න ඕනෑ' කියලා බල කරලා කිව්වා. ඒ වෙලාවේදී මා කිව්වා 'හොඳයි මම එන්නම්. මට විවේකයෙන් ඉන්න තැනක් පිළියෙළ කරලා දෙන්න' කියලා. එහෙම කිව්වේ භාවනාව නොකඩවා කරගෙන යන්න ඕනෑ නිසයි. මගේ භාවනාවේ ළපටි අවස්ථාවයි තවම. හා හොඳයි කියලා ඒ හාමුදුරුවන් පොරොන්දු වුණා."

"මා ගියා ගල්ලෑල්ලේ පන්සලේ පින්කමට. ඉතින් ගියාම මට ඉන්න හදලා තිබුණ කාමරය මොකක්ද? ඒ හාමුදුරුවන්ගෙම කාමරය. ඒකේ මොන විවේකයක්ද? ඒක හරියට කඩ පොළක් වගෙයි. ඒ කාමරයේ මොනම විවේකයක්වත් නැහැ. පෙරහැරේ ආම්පන්නත් ඒකෙ. ධාතු කරඬුව තියෙන්නෙත් ඒකෙ. පන්සලේ පවත්වන සල්පිලේ සල්ලි තියෙන්නෙත් ඒකෙ. ඒකට හැමෝම යනවා, එනවා, එක එක දේවල් ඉල්ලා ගන්න. මා රහසේ කරන භාවනාවට ඒකෙ ඉඩක් නැහැ. මා කිව්වා, 'මට මේකේ ඉන්න බැහැ කියලා, වෙන තැනක් පිළියෙළ කරලා දෙන්න' කියලත් කිව්වා. ඒ පාර පිරිතට ආව සංඝයාට වැඩ ඉන්න දුන්න ශාලාවේ බිත්තියක් අද්දර මට ඇඳක් පිළියෙළ කරලා දුන්නා. ඒකේ ඉඳගෙනවත් නියමිත වෙලාවට භාවනා කරන්න පුළුවන්ද කියලා උත්සාහ ගත්තා. එතන ඒකට ඉඩක් ලැබුණේ නැහැ. එතන හිටිය තෙරවරු කවුරුත් වාගේ මට වඩා වැඩි මහලුයි. මා ඒ පිරිසේ ළාබාලයා. මා අර තනියම පැත්තකට වෙලා ඉන්න කොට අර ලොකුහාමුදුරුවරුත් 'මොකද උන්නාන්සේ බුම්මාගෙන ඔතනට වෙලා ඉන්නේ? මෙහාට එනවකෝ ටිකක් කතා කරන්න' කියමින් කෑ ගහනවා."

"ඉතින් මට විවේකීව නියමිත වෙලාවට භාවනා කරන්න එක දවසක්වත් එතන බැරි වුණා. ඒ පාර මා සීමා ගෙයිවත් විවේක ඇද්ද කියලා බලන්න ඒකට ගියා. එතන බෙර කාරයොයි හොරණෑ

කාරයෝයි පිරිලා. බණ මඩුවෙ නිතරම සෙනග පිරිලා. අන්තිමට විහාරෙට ගියා. එතනත් අපහසුයි. නිතරම සෙනග යනවා එනවා. මුළු පන්සල් ඉඩමේම කොහේවත් තැනක් නැහැ භාවනා කරන්න. ඉතින් දවස් කීපයකට පස්සේ ඒ පන්සලේ ලොකුහාමුදුරුවන් දකින කොටත්, ඒ පිරිතට ආ සංඝයා දකින කොටත් මට කෝප්පයක් ඇති වෙන්න පටන් ගත්තා. මේ ඇත්තෝ තමයි ශාසනයේ හතුරෝ කියලා මට හිතුණා. ඉතින් මට ඇතිවුණ තව හැඟීමක් තමයි, අද බුදුරජාණන් වහන්සේ වැඩ ඉන්නවා නම් 'මේ පන්සල්වලින් එහාට තවත් අභිනිෂ්ක්‍රමණයක් කළ යුතු'යි කියලා වදාරනවා ඇති කියලා. එහෙම තත්වයකට පන්සල් වැටිලා තියෙනවා කියන එක හිතනකොට බලවත් කලකිරීමක් සංවේගයක් ඇති වුණා. ඒක පස්සේ කෝපයටත් හැරුණා. එහෙමයි ඒ දවස් ටික මා ගත කළේ."

"සුමාන දෙක ඉවර වුණාම බළන්ගොඩ පිරිවෙනට ගියා. ගිහින් පුරුදු පරිදි භාවනාව පටන් ගත්තා. නමුත් කලින් වගේ මගේ හිතේ සමාධිය වැඩෙන්නේ නැහැ. හිත එකඟ වේගෙන එනකොට ගල්ලෑල්ලේ පන්සලේ උත්සවය පේනවා. එතකොට හිතට ටිකක් කේන්තියකුත් එනවා. භාවනාව වඩන්න පටන් ගත්තාම වරින් වර ඒක මතක් වෙනවා. මේ නිසා ටික කලක් මා භාවනාව නතර කළා. පිරිවෙනේ වැඩ කරගෙන ගියා. කුඩා කල මගේ තිබුණ රෞද්‍ර ගතිය, ඉක්මනින් කිපෙන ගතිය නැවත ඇති වුණා."

"ඉතින් මාත් අනික් භික්ෂුවක් වගේ පිරිවෙනේ කටයුතු කරගෙන ඔහොම ඉන්න කොට මට දැන ගන්න ලැබුණා, ඉන්දියාවෙන් ආ කෙනකුගෙන් මදුරාසි දිස්ත්‍රික්කයේ තිරුවනමලේ ගම්මානයේ යෝගාශ්‍රමයක ඉන්න රමණමහර්ෂි නැමැති ධ්‍යානලාභී බලසම්පන්න යෝගියකු ගැන. ඒ යෝගියාගේ චිත්ත බලය අවට පැතිරීම නිසා ඔහු ඉදිරියේ භාවනා කරන ඕනෑම අයෙකුගේ සිත ඉක්මනින්ම සමාධි ගතවෙන බව මට අහන්න ලැබුණා. ඒ අනුව ඔහු හමුවෙන්න ඉන්දියාවට යන්න ඕනෑ කියලා මා හිතා ගත්තා. පිරිවෙනේ කටයුතු උප ප්‍රධාන තෙරුන්ට පවරලා නිවාඩු අරගෙන ඉන්දියාවට යන්න මා තීරණය කර ගත්තා."

"මහාබෝධි සමාගමේ වලිසිංහ දේවප්‍රිය මහත්මයා ඒ කාලයේ හිටියේ ලංකාවේ. මට ඉන්දියාවට යන්න ඕනෑ කියලා උන්නැහේට මා කිව්වාම, ඔබ වහන්සේ බරණැසට වඩින්න,

මා අවශ්‍ය වියදම් දෙනවා කියලා කිව්වා. ඉතින් මා දුම්රියෙන් තමයි පිටත් වුණේ. එහෙම ගිහින් එග්මෝර් කියන ස්ටේෂමෙන් බැහැලා, ළඟම තියෙන මහාබෝධි මධ්‍යස්ථානයට ගියා. දවස් දෙකක් විතර එහි ඉඳලා, අඩියාර් ගම්මානයේ තියෝසොපිකල් සමාගමේ මූලස්ථානයට ගියා. මා එහි යන කොට එහි පොත් ගුලේ සිංහල පාලි පොත් සකස් කරමින් ඩොක්ටර් අදිකාරම් හිටියා. මා ඔහුට මගේ අදහස කිව්වා. 'එහෙම නම් අපි දෙන්නම යමු' කියලා, උන්නැහේත් මා සමග එකතු වුණා."

"අප දුම්රියෙන් ගිහිල්ලා ඊට පසුව බස් එකෙනුත් ගිහිල්ලා ටික දුරක් පයින්ම ගිහින් තිරුවනමලේ යෝගාශ්‍රමයට පැමුණුණා. දවල් දහයට විතරයි අප එතනට ගියේ. එතනට යන සියලු දෙනාටම නොමිලයේ පිරිසිදුව ආහාර ලැබෙනවා. අපටත් ඒ ආහාර ලැබුණා. අපට ඉන්න කාමරයකුත් ලැබුණා. අප දෙන්නා සවස යෝගීවරයා ඉන්න ශාලාවට ගියා. ඒ රමණ මහර්ෂි තුමා මිටි ඇඳක හාන්සි වෙලා සමාධියට සමවැදිලා ඇහැ ඇරගෙන හිටියා. ඇහැ ඇරගෙන හිටියත් ඔහුට කිසිවකු, හෝ කිසිවක් පේන්නේ නැහැ. හිත වෙනින් අරමුණක බැඳිලා. ඇස්පිල්ලත් නොහෙළා සවස පහ විතර වෙනකල් එහෙම තිසසලව හාන්සිවෙලා හිටියේ. ඒ වෙලාවේ ඇමෙරිකන් මහතකු ඇවිත් බිම දිගාවෙලා යෝගියාට වැඳගෙන ඉන්නවා අප දුටුවා. ඔහු ඉදිරිපිට බිත්තිය අද්දර පැදුරක මා ඉඳ ගත්තා. ඉඳගෙන මට පුරුදු භාවනා ක්‍රමයකට සිත යොමු කළා. භාවනාව වඩන්න පටන් ගත්තා. ඉක්මනින්ම සිත එකඟ වුණා. කලින් එමින් තිබුණ කේන්තිය ආවේ නැහැ."

"එහේ හිටිය දවස් පහේම මා වැඩි වශයෙන් ගත කළේ එතන ඉඳගෙන භාවනා කිරීමටයි. අදිකාරම් මහත්මයත් හිටියා. උන්නැහේත් භාවනා කළා. දවස් පහකට පසුව අප ආපසු ආවා. අදිකාරම් මහතා අඩියාර් එකට ආවා. මා කල්කටාවට ආවා. එතනදීත් භාවනා කළා. දැන් ඔය වෙනකොට භාවනාව හරියාගෙන එනවා. ඔය අතර වෙසක් පෝය ළංවුණා. මහාබෝධි සමාගමෙන් පළකරන සහරාවේ වෙසක් කලාපයක් ගහන්න ඔය අතර ලෑස්ති වෙමින් හිටියේ. නෙළුවේ ජිනරතන ස්ථවිරයන් වහන්සේ ඒ වෙසක් කලාපයේ පළකිරීම සඳහා බුද්ධ චිත්‍රයක් ඇඳ දෙන්න කියලා මට

කිව්වා. මා ඒකත් ඇඳ දුන්නා. කල්කටාවේ ධර්මරාජ විහාරයේ චිත්‍ර ඔය වෙනකොට ටිකක් නරක්වෙලා තිබුණේ. මට කිව්වා ඒ චිත්‍ර ටිකත් ඇඳ දෙන්න කියලා. මා පොරොන්දු වුණා 'පසුව ආ වෙලාවක ඒක කර දෙන්නම්' කියලා. ඊළඟට මා බරණැස බලා පිටත් වුණා."

"බරණැසට විත් සාරානාත් විහාරයේ මා නතර වුණා. එතනදී හැමදම වගේ උදේට වළඳලා මා ප්‍රතිමා මන්දිරයට යනවා. එහි බුදු පිළිමයේ පිටුපස ලොකු ඉඩක් තිබුණා. එතන ඉඳගෙන මා සමාධි භාවනාව වැඩුවා. උදේ හතට විතර ඉඳ ගත්තම දවල් දනය වළඳන තෙක් හැමදම භාවනා කළා. දවල් දනෙන් පස්සේ ආයෙත් එකට විතර ඇවිත් හවස හය වනතෙක්ම භාවනාවෙහි යෙදුණා. මෙහෙම දවස් ගාණක් භාවනාව පුරුදු කරගෙන එනකොට හදිසියෙන් පපුවේ කැක්කුමක් හැදුණා. මට මගේ ඇඟ එහාට මෙහාට හරවන්න බැරිව ගියා. කොයි පැත්තකටවත් ඇඟ ඇල කරන්න බැරිව ගියා. කොහොමවත් නිදගන්න බැරිව ගියා. අන්තිමට වාඩිවෙලාම නිදගත්තා. යන්තම් ඇඟ ඇල වෙනකොට කැක්කුම හැදිලා ඇහැරෙනවා. ඒ තරම්ම තද වේදනාවක් තමයි හට ගත්තේ."

"දවස් හතරක් ගත වුණා. හැමදම හැන්දෑවට බුදුන් වඳින්න එනවා එහාට බජෝරියා කියන හොඳ ධනවත් හින්දු භක්තිකයෙක්. එයා සුප්‍රසිද්ධ බිර්ලාගේ ඥාතියෙක්. එයා මාව ඇඳිනගෙන මට ආරාධනා කළා එයාගෙ ගෙදරට පිණ්ඩපාතේ එන්න කියලා. මා එහාට පිණ්ඩපාතේ ගියා දහයයි තිහට විතර. ඔය දවස්වල තමයි කලින් කිව්ව අමාරුව මට හැදුණේ. මා උන්නැහේට කිව්වා, 'මගේ පපුවේ කැක්කුමක් හැදිලා තියෙනවා, නිද ගන්නත් අපහසුයි' කියලා. ඒක හැදුණේ කොහොමද කියලා උන්නැහැ මගෙන් ඇහුව්වා. මා කිව්වා මා ගත කරන ජීවිතය ගැන. 'ආ..... එහෙමනම් යෝග අභ්‍යාස පමණට වඩා කිරීමෙන් තමයි ඔය අමාරුව හැදිලා තියෙන්නේ. ඕකට දොස්තරවරුන් පස්සේ යන්න එපා. හිමාලය දිස්ත්‍රික්කයේ කංබල නම් ගමේ බල සම්පන්න යෝගියෙක් ඉන්නවා. එයා හමුවුණාම යෝග අභ්‍යාස මගින්ම ඕක සුව කරවා ගන්න පුළුවන්. ඉක්මනින් එයා හමුවෙන්න' කියලා එතනට යන පාරත් මට ලියලා දුන්නා."

"එදම හැන්දෑවේ මා රේල්ලුවට නැග්ගා. රෑ දෙකක් දුම්රියේම ගත කළා. තුන්වෙනිදා දිල්ලියෙන් බැස්සා. දිල්ලියේ බිර්ලා හදවාපු බුද්ධ විහාරයට ගියා. එතන දවස් තුනක් නැවතිලා හිටියා. දුම්රියේදීත් පන්සලේදීත් මගේ භාවනාව මා අත්හැරියේ නැහැ. මොකක් වුණත් කමක් නැහැ කියලා හිතාගෙන නිදගත්තේ රෑට වාඩිවෙලා ඉඳගෙනමයි. යන්තම් ඇඟ ඇලවෙනකොට ඇහැරෙනවා. අර රිදුම තදින් එනවා. ඉතින් ඔහොම දින කීපයක් ගත කරලා හරිද්වාරයට යන යානයකින් මා ඒ දක්වා ගියා. එතනින් බැහැලා වෙනත් බස් එකකට නැගලා කංඛලයට ගියා. ඒ වෙනකොට රාත්‍රි හතට විතර ඇති. බස් එකේ කොන්දොස්තරගෙන් මා ඇහුව්වා, ස්වාමි නාරායනානන්ද ඉන්න තැන කොහේද කියලා. ඒ වෙලාවෙ ඔහු කිව්වා, 'මාත් ඒ කිට්ටුවටයි යන්නේ, මම එතනටම ගිහින් ඇරලන්නම්' කියලා. වැඩි දුරක් නැහැ, බස්තිරාම් පාඨශාලාව මට පෙන්නලා කොන්දොස්තර ආපසු ගියා."

"තරප්පුව නැගලා මා ගියා උඩ තට්ටුවට. ස්වාමි නාරායනානන්ද හාන්සි පුටුවක ඉඳගෙන උන්නා. මා දුටු හැටියේම මට කතා කරලා ඉඳගන්න කියලා, දොඩම් යුෂ ටිකක් බොන්න ලෑස්ති කරලා දුන්නා. මා ආ කාරණය කියන්න මට අවස්ථාව ලැබුණේ නැහැ. ඊට ඉස්සරවෙලා එතුමා කතා කළා. දැන් දවස් ගණනක්ම නිදා ගත්තේ නැහැ නේද? අද හරියට නිදා ගන්න. ඔන්න මා මගේ ඇඳ ළඟම ඇඳක් ලෑස්ති කරලා තියෙනවා. ඉතින්; එතන ටැලිෆෝන් එකකුත් නැහැ. එතුමා මගේ තත්වය කොහොමද දැන ගත්තේ කියලා මට පුදුම හිතුණා. ඉන් පසුව මා එතුමාට කිව්වා, මට දවස් ගණනක ඉඳලා නිදා ගන්න බැරිව ඉන්න බව. මගේ පපුව තදින්ම රිදෙනවා කියලත් මා කිව්වා. එතුමාගේ කාමරයේ එක පැත්තක මට ඉන්න කියපු ඇඳ තිබුණේ. මට ඇඳේ ඉඳ ගන්න කියලා එතුමා කිව්වා. කියලා, එතුමාගේ අත්දෙක ඔසවලා ආශිර්වාද කරන්නාක් මෙන් මගේ හිසේ සිට අත්දෙක පහතට යැව්වා. ඒක හිප්නාටිසම් නොවෙයි. යෝග ක්‍රමයක්. 'අදට කැක්කුම නැවැත්තුවා, දැන් ඉතින් හොඳට නිදගන්න' කියලා මට කිව්වා. දවස් ගණනකට පසුව එදා තමයි හොඳට නිදා ගත්තේ."

"පසුවදා උදේ මට ඇහැරුණා. ඒ පාඨශාලාව ඉස්සරහින් තමයි ගංගාතම් ගඟ ගලා බසින්නේ. මා එතනට ගිහිල්ලා මුහුණ හෝදගෙන ආවා. ඒ යෝගියාගේ හිතවත් දයකයන් තමයි අවට

හැම තැනම ඉන්නේ. උදේට එළකිරි භාජනයක් එතුමාට ගෙනත් පිළිගන්වනවා. එතුමා තනියමයි මෙතන ඉන්නේ. එතුමා ළඟ තියෙනවා යකඩ ලිපක්. ඒකේ කිරි උණු කරලා ලොකු කිරි කෝප්ප දෙකක් හදනවා. සීනි දන්නේ නැහැ. කිරි අළුවා කෑල්ලක් කාලා අර කිරි කෝප්පේ බොනවා. මටත් කිරි අළුවා කෑල්ලක් එක්ක ලොකු කිරි කෝප්පයක් දෙනවා. උදේ ආහාරය එච්චරයි. එදා උදේ කිරි බීලා ටික වෙලාවක් ඉඳලා එතුමා මට කිව්වා, 'මේ යෝග භාවනා කරන කොට මිනිසුන්ට පේන්න කරන්න හොඳ නැහැ. මේවා රහසේ කළ යුතුයි' කියලා. 'ප්‍රසිද්ධියේ මේවා කිරීම තමාගේ විශේෂ ගුණ අනුන්ට පෙන්වීමක් වෙනවා. අතික් වෙලාවට අප සාමාන්‍ය පැවිද්දන් වගේ ඉන්න ඕනෑ. අප මේවා කරන බව මිනිසුන්ට පෙන්නලා ඔවුන්ගෙන් සත්කාර ලබන එක හොඳ නැහැ. සාමාන්‍යයෙන් කොයි පැවිද්දන් කෙරෙහිත් ඇති පොදු ගුණ පමණයි අප පෙනෙන්ට ඉඩ හැරිය යුත්තේ' කියලා. එහෙම කියලා 'මිනිසුන්ට නොපෙනෙන තැනකට අපි යමු' කියලා ඒ පිටුපස ඇති අඹ උයනේ හුඟක් දුරට ගියා."

"උයනේ මැද හරියේ කාටවත් නොපෙනෙන තැනක සමතලා ගල් තලාවක නැවතිලා, එතුමා පද්මාසනයෙන් ඉඳගත්තා. මටත් එතුමා ඉදිරියේ ළඟින්ම පද්මාසනයෙන් ඉඳගන්න කිව්වා. මාත් එසේ කළා. එතුමා ප්‍රාණයාම අභ්‍යාසයක් කළා. මටත් ඒ අනුව ඒකම කරන්න කීවා. මිනිට්ටු පහක් විතර ඒක කළා. ඊට පස්සේ කිව්වා, දැන් බලන්න ඇඟ නමන්න පුළුවන්ද කියලා? මා ඉස්සරහට හා දෙපැත්තට ඇඟ නැමුවා. පුදුමයි දැන් කැක්කුම නැහැ. පපුවේ කැක්කුම එයින්ම නැති වුණා. ඊට පස්සේ නැගිටලා අප දෙන්නම අර පාඨශාලාවේ උඩ තට්ටුවට ගියා. එතුමා මට කිව්වා, 'ඔය සමාධි යෝග භාවනා පුරුදු කරන විට හොඳ පළපුරුදු ගුරුවරයකු ළඟ ඉන්න තැනකටම වෙලා පුරුදු කරන්න ඕනෑ. නැත්නම් පුළු වැරදීමකින් මහත් වේදනා කරදර ඇතිවෙන්න පුළුවන්' කියලා. ඉතින් මට එසේ උපදෙස් ගන්න සමාධිලාභී ගුරුවරයෙක් ළඟ නැහැ කියලා, මා කිව්වා. 'මෙහේ නැවතිලා ඉන්නවා නම් මගේ ශක්ති ප්‍රමාණයෙන් උපදෙස් දෙන්නම්' කියලා එතුමා කිව්වා. 'මා මෙහි ඉඳීම ඔබට බරක් කරදරයක් නොවේ නම් ඉන්න කැමතියි' කියලා මා කිව්වා. 'මට කිසිම බරක් නැහැ, මෙහේ නතර වෙන්න' කියලා, එතුමා කිව්වා. ඉතින් මා එහේ නතර වුණා."

"මාස එක හමාරක් විතර එහේ නතර වෙලා ඉඳගෙන එතුමාගේ උපදෙස් පරිදි අපේ පොත් පත්වලත් තියෙන කරුණු අනුව සමාධිය වැඩුවා. ඒ යෝගීතුමාගේ ජීවිතය මහ පුදුම එකක්. එතුමා ගත කරන්නේ හුදකලා ජීවිතයක්. ඒ අවට හැමදෙනාම එතුමාගේ හිතවත් දයකවරු. ඒත් කිසිම කෙනෙකුට එතුමා හමුවෙන්න අවසරයක් නැහැ, හැන්දෑවේ පහෙන් මෙහා. සවස පැයක් පමණ වෙලාවක් තියෙනවා ගිහි දයක වරුන්ට ඇවිදිල්ලා ධර්ම සාකච්ඡාවල යෙදෙන්න, අවශ්‍ය යමක් තිබේ නම් විමසන්න. ඒ වෙලාවට ඉස්සෙල්ලවත් පස්සෙවත් එතුමා හමුවෙන්න කවුරුවත් එන්නේ නැහැ. අවශ්‍ය ආහාරපාන උපකරණ සියල්ල ඒ වෙලාව තුළ ගෙනත් පිළිගන්වනවා. එතුමා තනියෙන් ඒවා පිළියෙළ කර ගන්නවා. මා එහි සිටිය කාලය තුළදී එතුමා ගත කළ ජීවිතය මට මහත් ආදර්ශයක් වුණා."

"උදේ ආහාරයට කිරි වැළඳීමෙන් පසුව යෝග අභ්‍යාස පුරුදු කරනවා. ඒකට කියන්නේ 'ප්‍රාණායාම' කියලා. ප්‍රාණාපාන කියලත් කියනවා. මේ අපේ ආනාපානසතියට සමානයි. ඒක දේශයකින් සමථ ආනාපානයට කිට්ටුයි. එතුමා මට උපදෙස් දෙමින් මා සමගම ප්‍රාණායාමය පුරුදු කළා. එයට පසුව එතුමාගේ පොත් ගුලේ තියෙන වටිනාම හින්දු බෞද්ධ පොත් මට කියවන්න දීලා එතුමා යනවා. ඉදිරි පිට මිදුලේ තියෙනවා යන්තම් බද්ධ පර්යංකයෙන් ඉඳගන්න පුළුවන් ලැලිවලින් හදපු පුංචි කුඩුවක් වැනි එකක්. ඒකෙ නිදගන්න ඉඩ නැහැ. එතුමා ඒකට වැදී දෙර වහගෙන සමාධි භාවනාවෙන් කාලය ගෙවනවා. දවල් දහය විතර වෙනකල් පැය හතරක් පමණ එහි රැඳී සිටිනවා. ඒ අතර මා පොත් ගුලේ පොත් කියවනවා."

"දවල් දහය වෙනකොට එතුමා අර කුටියෙන් ආපසු ඇවිත් ලිප දල්වලා ආටා පිටිවලින් රොටී හදනවා. ඒවා කන්න හොද්දකුත් හදනවා. මේ අතර ළඟම තියෙන ගංගා නදියට ගොස් මා නාගෙන එනවා. මා පාත්තරේ අරන් ගිහින් තිබුණා. මගේ පාත්‍රයට එතුමා හැදූ ආහාර බෙදනවා. එතුමා තමාගේ ලොකු පිත්තල තැටියට රොටීත් බෙද ගන්නවා. අර හොද්දත් වක්කර ගන්නවා. ඊට පසුව වළඳනවා."

"දවස් හතරක් පහක් විතර මෙහෙම ගතවෙන කොට දවසක් කෑම කන වෙලාවේ මට හිතුණා, හැමදම මේ රොටී කන නිසා බත් ටිකක් කන්න ලැබුණොත් හොඳයි කියලා. පහුවද උදේ එතුමා මට පමණක් බත් උයලා මගේ පාත්තරයට බෙදුවා. එතුමා විතරක් රොටී හද ගත්තා. දවස් පහක් විතර ගත වුණා. එක දවසක් මට හිතුණා, බොහොම දවසකින් පැණි රහක් කෑවේ නෑ කියලා. පහුවද එතුමා මට පැණි පුඩිමක් හද පිළිගැන්නුවා. තවත් දවසක් කුරහන් තලප කෑමට කැමැත්තක් ඇති වුණා. පහුවද කුරහන් හැදිගාලා එතුමා මට ඒවා පිළිගැන්නුවා. එද එතුමා අත් ඔසවලා කිව්වා, 'මේ රටේ ඇති දෙයක් ගැනනම් ඔබ වහන්සේ ආශා කරන්න, හැබැයි මේ රටේ නැති දෙයක් ගැනනම් හිතන්න ආශා කරන්න එපා' කියලා. එතුමා පරචිත්ත විජානනය ඉතාම උසස් ලෙස දියුණු කරගෙනයි හිටියේ."

"ඒ කාලය තුළදී එතුමා හින්දු යෝග භාවනා ක්‍රමය සම්පූර්ණයෙන්ම (ප්‍රාණායාම - ප්‍රාණාපාන ක්‍රමය) මට ඉගැන්නුවා. ඊළඟට අසනීප වුණාම යෝග ව්‍යායාම මගින් ඒවා සනීප කර ගන්නා ක්‍රමයත් කියා දුන්නා. ඍද්ධිවිධ ඥානය ලැබීමට කුණ්ඩලිනී යෝග ශක්තිය වර්ධනය කිරීමට අවශ්‍ය සියලුම මාර්ග මට කියා දුන්නා. 'මෙතනින් එහාට ගුරුවරයකු ඕනෑ නැහැ, පුරුදු කරගෙන යන්න' කියලා මට කිව්වා. මා ඇහුවා, 'මට මේ ආත්මයේදීම ධ්‍යානයක් ලබන්න පුළුවන්ද?' කියලා. එතනදී එතුමා කිව්වා, 'එක එක වැඩ බාර ගන්නේ නැතුව, එන ආරාධනාවලටත් කන් නොදී විවේකයෙන් කල් ගත කළොත් ඔබ වහන්සේට භාවනාව සමෘද්ධ වෙනවා' කියලා. 'ඔබ වහන්සේගේ භාවනාවේ අගය සාමාන්‍ය මිනිසුන් දන්නේ නැහැ, ඒ අය බලා ඉන්නේ ඔබ වහන්සේගෙන් ප්‍රයෝජන ගන්නයි. ඒ නිසා ඒවා ගැන නොසිතා ඔබ වහන්සේගේ ආධ්‍යාත්මික දියුණුවට කටයුතු කරන්න' කියලා මට කිව්වා."

"මාස එකහමාරකට පමණ පසුව එතුමා මට කිව්වා, 'සැතපුම් සීයකට පමණ ඈතින් තියෙනවා ඍෂිකේශි ප්‍රදේශයේ ආශ්‍රම, ඒවා බලන්ට යන්න පුළුවන්, එහේ යෝගීන් බොහෝම ඉන්නවා' කියලා. එතනට යන ගමන් මාර්ගයත් මට කියලා දුන්නා. ඉතින් මා එහාට යන්න ස්වාමී නාරායනානන්දතුමා ගෙන් සමු ගත්තා."

"මා බස් එකෙන් සැතපුම් සීයක් පමණ ගෙවා කාලිකමල කියන ස්ථානයට ගියා. 'කාලිකමල' කියන කෝටිපතියකු හිටියා. එයාගේ මුළු දේපලම යොදවලා විශාල අරමුදලක් හදලා, රජයේ බැංකුවේ තැන්පත් කරලා, ඒකෙන් ලැබෙන පොලියෙන් දිනපතාම යෝගීන් දෙසීයකට ආහාර පාන දෙන්නට එයා පිළියෙළ කරලා තිබුණා. ඒ සඳහා සෘෂිකේශි කන්ද පාමුල තට්ටු දෙකේ විශාල ගොඩනැගිල්ලකුත් හදලා තිබුණා. ඒක ඉදිරියේ මිදුලේ දෙපැත්තේ පැදුරු එලලා කන්දෙන් බහින යෝගීන්ට ඉඳ ගන්න උදේම ආසන පිළියෙළ කරනවා. මා එහාට යනකොට දවල් එකොළහට විතර ඇති. එතකොටම වගේ කන්දෙන් යෝගීන් දෙසීයක් විතර පහළට බැහැලා ඇවිත් අර පැදුරුවල ඉඳ ගත්තා. ඔක්කෝම යෝගීන්ගේ කමණ්ඩලා වලට (ලොකු ලබු ගෙඩියක් හාරලා හදගෙන තියෙන පාත්‍රයකට වඩා ලොකු භාජනයක්) බත් රොටී ව්‍යඤ්ජන ඔක්කෝම එහි සේවකයන් පිළිගන්වනවා. ඒ අයගේ අතේ තියෙන අතික් භාජනයට කිරි වක්කරනවා. සමහරුන් එතනදීම ඒවා වළඳනවා. සමහරුන් ඒවා අරගෙන කන්දට නගිනවා. මා මේ ඔක්කෝම බලාගෙන හිටියා."

"මට අර ගොඩනැගිල්ලේ කාමරයක් නවාතැන් පිණිස ලැබුණා. මට එතනටම බොජුන් ගෙනත් දුන්නා. එතන ලේකම් කෙනකු හිටියා. එයා ලංකාවේ භික්ෂූන් දැක පුරුදු කෙනෙක්. දවල් කෑමෙන් පසු තුන විතර වෙනකල් මා විවේකයෙන් උන්නා. ඊට පස්සේ ඒ ගොඩනැගිල්ලේ ප්‍රධානියාට කතා කරලා 'සෘෂිකේශයට මට යන්න ඕනෑ, නමුත් යන්න පාර දන්නේ නැහැ, මඟ පෙන්වන්න කෙනකු මට හොයලා දෙන්න පුළුවන්ද?' කියලා, මා ඇහුවා. ඒ මහත්මයා කිව්වා, 'ඉංග්‍රීසි දන්න අය නම් මේ කැලෑ ප්‍රදේශයේ නැහැ, ඔබ සංස්කෘත දන්නවා නම් සංස්කෘත දන්න ඉලන්දාරි මෙහෙ ඉන්නවා කියලා. මා කිව්වා, මට සංස්කෘත පුළුවන්, එහෙම කෙනකු හොයලා දෙන්න කියලා. ඉතින් සංස්කෘත දන්න අවුරුදු දහනවයක් විස්සක් විතර වෙන බමුණු තරුණයකු මට හොයලා දුන්නා. ඔහු මට මඟ පෙන්නුවා. එයත් එක්ක හැතැප්මක් එකහමාරක් විතර කන්ද නැග්ගා. ඒක හිමාලයේ පැත්තක්. කන්ද නැගලා ස්වාමි ශිවානන්දයන් ඉන්න ආශ්‍රමයට ගියා."

"ස්වාමි ශිවානන්ද යටතේ යෝගීන් හාරසීයක් විතර ගෝල පිරිස වශයෙන් ඉන්නවා. ඔහු කලින් හොඳ ඉංග්‍රීසි වෛද්‍යවරයෙක්. දැන් යෝගියකු වෙලා. ඔහු ඉන්න ස්ථානයට කියන්නේ ආනන්ද

කුටීර් කියලා. 'ස්වාමි ශිවානන්ද එන්න තව පැයක් විතර යාවි එතකල් ඉන්න' කියලා, එතන භාරකාරයා මට කිව්වා. ඉතින් මට මග පෙන්වපු ඉලන්දරියාට මා සංග්‍රහයක් කරන්න ලෑස්ති වුණාම එයා මට කිව්වා, 'අප එහෙම සන්‍යාසීන්ගෙන්, පැවිද්දන්ගෙන් කිසිවක් ගන්නේ නැහැ කියලා.' ඒ විතරක් නෙවෙයි ඒ තරුණයා කිව්වා, 'මා කළේ මගේ යුතුකමක්'ය කියලා. එහෙම කියලා යන්න ගියා."

"දැන් වෙලාව පහමාරට විතර ඇති. මා ටිකක් ඇවිදින්න ගියා. ගංගානම් ගඟ මත්තෙන් කම්බි පාලමක් තියෙනවා. මා ඒ කම්බි පාලමෙනුත් එගොඩ වුණා. ඒ හරියේ බොහෝම තාපසවරුන් ඉන්නවා. ආශ්‍රමත් තියෙනවා. ඒ කොටසට කියන්නේ ස්වර්ගාශ්‍රමය කියලා. මා එයින් එකකට ගියා. ඒවා දයකයන් විසින් හදපු හොඳ ගොඩනැගිලි. සෙමර වලිගත්, කස්තුරිත් හරියට ඒවා ඇතුළේ තියෙනවා. එහි හිටිය තවුසා මගෙන් ඇහුවා ඒවා ඕනෑ ද කියලා. මා ප්‍රතික්ෂේප කළා. ඒවා ටිබැට්කාරයන් ඒ අයට ගෙනත් දෙන බඩු. ටිකක් එහායින් පෙනුණා චෛත්‍යයක් වගේ එකක්. මා ඔහුගෙන් ඇහුවා ඒක මොකක්ද කියලා. ඒක 'රාමකුණ්ඩ' කියලා ඔහු කිව්වා. (රාමකුමාරයා තපස් රැක්ක තැන) එතනටත් එහා තවත් චෛත්‍යයක් වගේ එකක් දැකලා ඒක මොකක්ද කියලත් ඇහුවා. ඒක 'ලක්ෂමන් ජූලා' (ලක්ෂමණ කුමාරයා තපස් රැක්ක තැන) කියලා කිව්වා. තවත් එහාට යන්න මට ආශාව තිබුණත් 'යන්න එපා' කියලා ඒ අය කිව්වා. ඒ හරියේ ව්‍යාඝ්‍රයන් ඉන්න බව කිව්වා. මා ආපසු ආනන්ද කුටීර් එකට ආවා."

"ටික වෙලාවකින් ස්වාමි ශිවානන්දත් එතනට ආවා. මා නැගිටලා කුඩා ආසනයක ඉඳ ගත්තා. ස්වාමි ශිවානන්ද මා දිහා බලලා කිව්වා, මට එයාගේ ආසනයේ ඉඳ ගන්න කියලා. වයසින් වැඩි බව හිතලයි එයා එයාගේම ආසනයේ මට ඉඳ ගන්න කියලා කිව්වේ. ඊට පස්සේ ආව ගිය තොරතුරු ටිකක් කතා කළා ආශ්‍රම ජීවිතයේ රස විඳින්න නම් අඩු ගානේ මාස තුනක්වත් එහේ ඉන්න කියලා මට කිව්වා. එච්චර කලක් ඉන්න අදහසින් නොවෙයි මා ගියේ. වැඩිම වුණොත් දවස් පහක් හෝ සතියක් ඉන්නයි මා ආවේ කියලා, කිව්වා. අලුතින්ම හදලා නිම කරලා තිබුණ ගොඩනැගිල්ලක මට නිවාස පහසුකම් එතුමා සැලැස්සුවා. මගේ අවශ්‍යතා පිරිමසන්ට ගෝල යෝගියකුත් යෙදුවා."

"එහේ හිටිය දවස්වල මා නාන්න යනවා ගංගා නදියට. අනිත් යෝගීන් සමග නාගේන ගොඩට ඇවිදිල්ලා අඳනය ඇඳගෙන නානකඩය මිරිකන්න හදනකොට යෝගියකු ඇවිදින් ඒක අරගෙන හෝදලා දෙනවා. මට වෙහෙසෙන්න දෙන්නේ නැහැ. ඉන් පසුව එයත් සමග ආපසු යනවා. එහි භෝජන ශාලාවේ සියලුම පුටු හදලා තිබුණේ සිමෙන්තියෙන්. වන්දනාවේ යන පිරිස (කෛලාශය වඳින්න) දෙතුන්සීයක් විතර නිතරම ඒ ආගන්තුක ශාලාවේ නතරවෙලා ඉන්නවා. දිල්ලි බාරාණසි ආදියේ ඉන්න දයකවරුන් දන කළමනා එහාට වාර බෙදගෙන ගේනෙනවා. හිමාලයේ ඉඳගෙනත් ශිවානන්ද ඩිවයින් ලයිෆ් නමැති සඟරාවක් මාස්පතා පළ කරනවා. දවසේ වැඩි හරියක් භාවනානුයෝගීව ඉඳලා හැමදම පැයක් දෙකක් එහි කාර්යාලයට එතුමා එනවා. ආ වහාම හින්දු ධර්මය ගැන අසා එවා ඇති ප්‍රශ්න මාලාවක් එතුමාගේ ගෝලයකු කියවනවා. ඒ සියල්ලටම එතුමා දෙන උත්තර ගෝලයකු ෂෝට්හෑන්ඩ් ක්‍රමයෙන් සටහන් කර ගන්නවා. සඟරාවට අවශ්‍ය ලියවිලිත් එතුමා කියනවා. ඒවත් ඔවුන් සටහන් කර ගන්නවා. ඒ සියල්ල ටයිප්රයිටරයකින් සකස්කොට දිල්හියේ ශාඛා කාර්යාලයට යවනවා. එහිදී මුද්‍රණය කොට ලෝකයේ නොයෙක් රටවලට යවනවා."

"මේ විදියෙන් පුදුම ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් ස්වාමි ශිවානන්දගේ පිරිස අතින් ඉටු වෙනවා. මේ අනුව ලෝකයේ නොයෙක් දෙනා හින්දු ධර්මය පිළිගෙන තිබෙනවා. හැම රටකම එතුමාගේ අනුගාමික සාමාජික පිරිසක් ඉන්නවා."

"සෑම හැන්දෑවකම පහමාරට පමණ එහි තිබෙන විශාල භජන් ශාලාවට (භක්තිගීත ගයන ශාලාවට) සියල්ලන්ම එකතු වෙනවා. මේ අවස්ථාවට වන්දනාකාරයනුත් සීයක් හමාරක් එතනට එනවා. සෑම හැන්දෑවකම මේ භජන් අහන්න මාවත් කැඳවාගෙන ගියා. මේ භක්තිගීත හින්දියෙන්, දෙමළෙන්, ඉංග්‍රීසියෙන් මුද්‍රිත කුඩා පොත් වශයෙන් තිබුණා. ඒ සියලුම යෝගීන් අතේ මේ භජන් පොත් තියෙනවා. ඒවාත් අරගෙන පිළිවෙළට ඉඳ ගන්නවා. මා ගියවිට මටත් එකක් දුන්නා බලාගන්න කියලා."

"මට මතක ඇති හැටියට එහි තිබුණා බ්‍රහ්ම, විෂ්ණු, ශිව, ගනේෂන්, ස්කන්ද කුමාර, බුදුරජාණන් වහන්සේ, යේසුතුමා යන

මේ හැමදෙනාටම නමස්කාර කරන ස්තෝත්‍ර. ශිවානන්ද ඇතුළුව මෙතනට රැස්වූ සැමදෙනාම මධුර ස්වරයෙන් මේවා ගායනා කරනවා. ඉන් පසුව ශිවානන්ද විසින් භාවනාව ගැන කතාවක් පවත්වනවා. ස්වාමි ශිවානන්ද එහි ඉන්න සියලුම යෝගීන්ට ඉංග්‍රීසි උගන්වනවා. ඒ හැමදෙනාටම හොඳට ඉංග්‍රීසි කතා කරන්න පුළුවන්. මේ යෝගීන් අතර නානා ජාතිකයන් ඉන්න බැවින් ඒ සැම හැන්දෑවකම එතුමා කරන අනුශාසනය ඉංග්‍රීසියෙන් කරන්නේ."

"මා එහි ගිය මුල් දවසේ භජන් ගායනා අවසානයෙහි මගෙන් ඉල්ලා සිටියා බෞද්ධ භාවනා ක්‍රම ගැන ඒ අයට දේශනයක් පවත්වන්න කියලා. මා සමථ විදර්ශනා භාවනා දෙක විස්තර කරමින් පැය දෙකක දීර්ඝ දේශනයක් කළා. දේශනාව අවසානයේදී ස්වාමි ශිවානන්ද කිව්වා 'තමා අසා තිබෙන්නේ බුද්ධාගමේ අනිත්‍ය දුක්ඛ අනාත්ම යන ත්‍රිලක්ෂණය ගැන පමණක් කියවෙන භාවනාවක් ඇති බවයි කියලා'. මේ කසිණාදි සමථ භාවනාවන් ගැන බුද්ධාගමේ තියෙනවා කියලා මා කලින් අසා තිබුණේ නැහැ' කියලත් ඔහු කිව්වා. එහෙම කිව්වේ සමථ භාවනාව ගැන විස්තර කිරීමේදී ආලෝක කසිණ භාවනාව විස්තර කොට මා කරුණු පැහැදිලි කළ නිසයි. 'මේ අගේ ඇති දේ විස්තර කරලා ලෝකයට කියා දෙන්නේ නැත්තේ ඇයි?' කියලත් ඔහු මගෙන් ඇහුවා. 'මේ හිමාලය කඳු ප්‍රදේශයේ ඉඳගෙන මා මාසික සඟරාවක් මගින් හින්දු ධර්මය ලෝකයේ පතුරවනවා. මේ තරම් දුෂ්කර ප්‍රදේශයක සිට එසේ කළ හැකි නම් ඔබ වහන්සේලාට නගර වල ඉඳගෙන ඒක කරන්න බැරි ඇයි?' කියලා එතුමා වැඩි දුරටත් මගෙන් ඇහුව්වා. ඒ නිසා ලංකාවට ගිය වහාම මේ ධර්මය පතුරුවන්න ඉංග්‍රීසි සඟරාවක් පටන් ගන්න කියලා මට අවවාද කළා."

"මා එහි ගත කළ දවස් කීපය තුළ එහි තිබුණු පරිසරය දැකීමෙන් සිතෙහි මහ වෙනසක් ඇති වුණා. මනා ප්‍රීතියක ශාන්ත බවක් ඇතිවුණා. කලබල ඝෝෂා සහිත ලෝකයෙන් තුරන්ව ශාන්ත සුබ පරිසරයක මේ ඉඳීම හරියටම බඹලොවක ඉන්නවා වගෙයි කියලයි මට දැනුණේ. ඒ ශාන්ත රසය ලැබෙන්නේ කලාතුරකින්. බොහෝ පැරණි, වැඩි ජනගහනයක් නැති බෞද්ධ සිද්ධාස්ථානයකට ගිය විටත් මේ ශාන්ත රසය හොඳට දැනෙනවා."

"දවස් කීපයකට පසු මා එහෙන් පිටත් වෙන්න සූදානම් වෙලා ස්වාමි ශිවානන්දට කියලා ගමනාරම්භ කළා. වැඩි කාලයක් මෙහෙ නතරවෙලා ඉන්න කියලා එතුමා මගෙන් ඉල්ලීමකුත් කළා. ඉතින් මා පිටත්වෙලා තනිවම කන්ද බැස්සා. උදෙන්ම කන්ද බැහැලා කාලිකමල දන ශාලාවට පැමිණ දවල් වළඳලා බසයකින් පිටත් වුණා. හැන්දෑවේ ස්වාමි නාරායනානන්දගේ ආශ්‍රමයට පැමිණියා."

"මේ ගත කරපු හැම දවසක්ම භාවනාවෙන් මා ගත කළේ. ඒ නිසාදෝ බසයේදීත් මහ පාරේදීත් මා දකින හැම කෙනෙක්ම මට විශාල ගෞරවයක් ලැදියාවක් දක්වුවා. මගේ අවශ්‍යතා සපුරාලන්නට කැමති බවක් පළ කළා. මා පිටරටක තනිවම යනවා නොවේද කියලා තනිකමක් මට දැනුණේ නැහැ."

"ඉතින් නාරායනානන්ද ස්වාමිගේ ආශ්‍රමයෙහි තවත් සති දෙකක් විතර භාවනා කරමින් ගත කරලා බරණැසට එන්න මා පිටත් වුණා. එතනදී ස්වාමි නාරායනානන්ද ලොකු පොත් කාණ්ඩ තුනක් ඔහුගේ කාමරයේ අල්මාරියකින් ගෙනත් මගේ අතේ තැබුවා. තබලා, 'කිව්වා මදුරාසියේ පොත් සාප්පුවලිනුත්, කල්කටාවේ පොත් සාප්පුවලිනුත්, බරණැස පොත් සාප්පුවලිනුත් සොයා ගන්න උත්සාහ කළ පොත් මේවා නේද?' කියලා. ඒ පොත් ගැන මා එතුමාට කලින් කිසිම සඳහනක් කරලා තිබුණේ නැහැ. මේ ඉන්දියාවේ සංස්කෘතික උරුමය (Cultural Heritage of India) කියන පොතේ කාණ්ඩ තුනයි. රාමක්‍රිෂ්ණ මිශන් සභාවෙන් ළඟදී පළ කරලා තිබුණු ඉතා වටිනා පොතක් ඒක. ඒ පොත මුද්‍රණය කළ හැටියේම ඉක්මනින් විකිණී ගියා."

"ලංකාවේ රාමක්‍රිෂ්ණ මිශන් එකෙන්වත් ඉන්දියාවේ කොයි තැනකින්වත් මට ඒ පොත ලබා ගන්න බැරි වුණා. ඒකට හේතුව ඉක්මනින් පොත විකිණී අවසන් වීමයි. ස්වාමි නාරායනානන්දතුමා ඒ පොතයි මට මේ දුන්නේ. එතුමා මට පොත දීලා කිව්වා, 'මා මේ පොත කියෙව්වා, දැන් මට මෙයින් වැඩක් නැහැ' කියලා. 'මා ඔබට මෙය දන් පරිත්‍යාග කරනවා' කියලත් කිව්වා. ඊළඟට මාත් සමග ස්වල්ප දුරක් ආවා. බස් එක එනතුරු ටික වෙලාවක් පේමන්ට් එකේ රැඳී සිටියා. ඒ ඉන්න අතර එතුමා කිව්වා,

'මේ අප්‍රියෙල් මාසය ලබාපු හැටියේමයි. මේ සැරේ අප්‍රියෙල් උෂ්ණය බොහොම බලවත් වෙයි. ඒ නිසා ඉක්මනින් ලංකාවට යන එක නුවණට හුරුයි' කියලා."

"මා කිව්වා 'බරණැසට ගිය හැටියේම ලංකාවට යනවා' කියලා. එතුමා කිව්වා 'ලංකාවට යන්නේ කොහොමද? ගමන් වියදම් නැතිව' කියලා. මා කිව්වා, 'මට ගමන් වියදම් තියෙනවා' කියලා. එතනදී එතුමා කිව්වා, 'ඔබ ළඟ තියෙන්නේ ටිකයි, මෙච්චරයි' කියලා. මා කිව්වා, 'බරණැසට ගියවිට දේවප්‍රිය මහතා මට ගමන් වියදම් එවයි' කියලා. එතුමා ටිකක් වෙලා නිහඬව කල්පනා කළා. 'නෑ! මුදල් හම්බවෙන්නේ නැහැ දන්න්ම. ඔබ වහන්සේට ලංකාවෙන් ගමන් වියදම් එවන්නේ ජුනි මාසයේ. ඒ නිසා මෙහේ මගේ දයකයන්ට කියලා ගමන් වියදම් සපයන්නම්, දුක් නොවිඳ ලංකාවට යන්න' කියලා මට කිව්වා. මට ඒ තරම් උදවු කරපු කෙනකුගෙන් ගමන් වියදම ගැනීම හොඳ නැහැ. ඒ නිසා මා එය පිළිගන්න කැමති වුණේ නැහැ. මා කිව්වා 'ගමන් වියදම ලැබෙන කල් මා බරණැස ඉන්නවා' කියලා. එතනදී එතුමා කිව්වා, 'මේ මාසයේ මැද හරියේදී තද උෂ්ණය එනවා. ඉවසාගන්න බැරි තරම් උෂ්ණය ඇති වුණාම මා දීපු යෝග උපදේශ අනුව තමන්ගේ ඇහවටා සීතල ඇති කරගන්න, එවිට උෂ්ණයෙන් පීඩාවක් වෙන්නේ නැහැ' කියලා."

"ඉතින් එතුමාට මා ආචාර කරලා බසයට නැගිලා පිටත් වුණා. දිල්ලියට ආවා. එතනින් බරණැසට ආවා. සාරානාත්වලට පැමිණ ඉන්නකොට උෂ්ණය අංශක එකසියවිසිඅටට නැග්ගා. එහි සිටින හාමුදුරුවරුන් දහයට විතර නාගෙන ගෙට ඇතුළ් වෙනවා. හීන් දූවිල්ලක් හැම තැනම පැතිරී යනවා. හුස්ම ගන්න කොට ඒ දූවිල්ල ඇතුළට යනවා. ඊළඟට හෙම්බිරිස්සාව හැදෙනවා. දඩිය තදින් පිට වෙනවා. එයින්ම නිව්මෝනියාව හැදෙන්නට සැලසෙනවා. සිවුරු තදින්ම පොරවා ගෙනම සිටිය යුතුයි."

"මේ කාලයේදී පෝසත් මිනිසුන් නේපාලය ආදි ප්‍රදේශවලට ගිහින් මේ උෂ්ණ ඍතුව ගත කරනවා. දුප්පත් මිනිසුන් ගංගා නදිය අද්දරට වෙලා දවසට හත් අට වරක් නා ගන්නවා. මේ කාලයේ උෂ්ණය බලවත්කමට ගැටඅඹ තැම්බිලා වැටෙනවා. මිනිසුන් ඒවා

කොටලා මිරිකලා බොනවා. ඒක තමයි බලවත් උෂ්ණයෙන් හැදෙන අසනීප වළක්වන බෙහෙත. බලවත් උෂ්ණය නිසා කැලේ ඉන්න සර්පයන් වතුර සොයාගෙන ගෙවල් අස්සට ඇදෙනවා. හැමතැනම ගුල්වල සර්පයන් ඉන්නවා. කවුරුනුත් ගෙවල් උඩ තට්ටුවෙයි ඉන්නේ. ඒ ගෙවල තට්ටු කීපයක් තියෙනවා. ඉසිපතනයේ භික්ෂූන් මහ ගොඩනැගිල්ලේ උඩ තට්ටුවේ තමයි ඉන්නේ. පැදුරක්වත් නැතිවයි ඉන්නේ."

"ඉතින් මෙබඳු අවස්ථාවකට මුණ දෙන්න මටත් සිදු වුණා. එහෙත් ස්වාමි නාරායනානන්දයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කිරීම නිසා මට මේ දැඩි උෂ්ණය ඒ තරම් බලපෑවේ නැහැ. මේ කොච්චර උෂ්ණය තිබුණත් මගේ භාවනාව කරගෙන ගියා. උෂ්ණය මැඩීමට භාවනාව උපකාරී වුණා."

# 8

# පැරණි බණ පොතේ මාර කථාව මා පිළිගන්නවා

"දේවප්‍රිය මහතා මට ගමන් වියදම් එව්වේ ජුනි මාසයේදීයි. ඊට පසුව මා ලංකාව බලා පිටත්වෙලා ආවා. මා කෙළින්ම බළන්ගොඩ පිරිවෙනට ගියා. පිරිවෙනේ ඉගැන්වීමේ කටයුතු උප ප්‍රධාන ගැටඅරළුවේ ධම්මරතන ස්ථවිරයන්ට සහ අනික් අයට පවරලා මුළු කාලයම භාවනාවේ යෙදීමට හිතා ගත්තා. පිරිවෙන් වත්තේ පහළ කොටසේ බිමට සිමෙන්ති දමා සකස් කළ හොඳ කුටියක් තියෙනවා. එය හොඳට අතුපතුගාලා ශුද්ධ කොට ඒ වටේත් හැම තැනම පිරිසිදු කරලා, ඒකේ ඇතුළේ ඉඳ ගැනීමට ආසනයකුත් හදගෙන, මා ඉදිරියේ පොඩි මේසයක් සහ කුප්පි ලාම්පුවකුත් තබලා කුටිය හොඳින් පිළියෙළ කර ගත්තා. එහි එළියේ කුඩා කාමරයක් තියෙනවා. මට අවශ්‍ය දෑ සපයා ගැනීමට සහායක හැටියට මගේ භාතෘවූත්, ප්‍රධාන ශිෂ්‍යවූත් වැලිගෙපොළ මෛත්‍රීමූර්ති නමට එළියේ කාමරයේ ඉන්න නියම කළා."

"රාත්‍රි අටට විතර මා හදගත් සුභ මොහොතින් යෝගාසනයේ ඉඳගෙන යෝග භාවනාව ආරම්භ කළා. එතකොටම මට පෙනුණා, මා ඉදිරියේ මේසය උඩ පොළොන් තෙලිස්සකු ඉන්නවා. ඌ ටික ටික මා දිහාවටයි එන්නේ. මේක මහා භයානක එකක්. ළඟ තිබුණා කොස්සක්. ඒක අරගෙන ඌ තල්ලු කරලා දැම්මා, බිමට. මට කුප්පි ලාම්පුවේ එළියෙන් පෙනුණා, සිමෙන්ති බිමේ ඌ එහාට මෙහාට කර කැවි කැවී ඉන්නවා. සිමෙන්ති පොළොවේ ඔප වැඩිකම නිසා ඌට එහාට මෙහාට යන්න අමාරුයි. මා හයියෙන් කතා කරලා මෛත්‍රීමූර්තිට කිව්වා, ඔය වහල තියෙන දොර අරින්න කියලා. ඒක යතුර දලා නොවෙයි නිකන් වහලා තිබුණේ. දොර ඇතුළට තල්ලු කරන්න කියලා මා කිව්වා. ඉතින් ඒ නම දොර තල්ලු කරලා ඇරියා. ඒ එක්කම මා කිව්වා, කාමරයට වෙලා දොර වහගන්න මෙතන සර්පයෙක් ඉන්නවා කියලා."

"එතන තිබුණා ප්ලෝඩ් බංකුවක්. ඒක උඩට මා නැගලා අර මුස්න අරගෙන වේගයෙන් උඩ විසි කරන්න මුස්න ගැසුවා. එතකොටම අර කුප්පි ලාම්පුව පෙරලුණා. බංකුවත් පෙරලුණා. මාත් කළුවරේම බිම වැටුණා. සර්පයා මගේ කකුලේ ඇඟිලි දෙකක් දෂ්ට කළා. මා අමාරුවෙන් නැගිටලා වැර උපදවාගෙන සර්පයාට උඩින් එළියට පැන්නා. පැනලා දොර වැහුවා. මේ සියල්ලම කළේ කළුවරේ. කැක්කුම ඉවසන්න බැරි තරමට වැඩි වුණා. මෛත්‍රීමූර්තිට කතා කරලා කිව්වා, සර්පයකු මා දෂ්ට කළා, උඩහට ගිහිල්ලා අනික් ඇත්තන්ටත් කියලා, ඉක්මනින් පුටුවක් අරන් එන්න කියලා. කළුවරේම ඒ නම ගිහිල්ලා, අනික් අයත් එක්ක පුටුවක් අරගෙන ඇවිත් මා උඩහට අරන් ගියා. මේ වෙලාව රාත්‍රි නවයට විතර ඇති."

"වහාම සර්ප වෙදකු ගෙන්වා ගන්න සෙව්වා. තුඹගොඩ මහ පන්සලේ හිටිය සුමනජෝති නායක හාමුදුරුවන්ට පනිවිඩයක් යැව්වා. උන්වහන්සේ දක්ෂ සර්ප වෛද්‍යවරයකු සමග වහාම ආවා. සර්ප වෙද ඇවිත් පරීක්ෂා කර බැලුවා. මේ පොළොන් තෙලිස්සකු කියලා කටින් විෂ උරලා ඊට පස්සේ බෙහෙත් බැන්ද. ඉතින් භාවනාව යකාට ගියා."

"තුන් මාසයක්ම ඇඳේ ඔත්පලවෙලා හිටියා. මේ රිදීම තුන් මාසයක්ම ටික ටික තිබුණා. තුවාලේ සනීප වෙන්නෙත් නැහැ. තුන් මාසෙකට පස්සෙයි වෙන සර්ප වෛද්‍යවරයකු වෙනත් බෙහෙතක් කකුලේ බැඳලා සම්පූර්ණ තුවාලය සනීප වුණේ. මෙතනදී මට හැඟීමක් ආවා, කෙනකු භාවනාවක් කරනකොට ඒක සාර්ථක වෙයි කියලා, වසවර්ති මාර දිව්‍යපුත්‍රයාට හෝ ඔහුගේ පක්ෂයේ භූතයකුට සැකයක් හිතුණොත් ඔහු ඒකට බාධා ඇති කරපු තැන් අපේ පොත්වල තියෙනවා. කලකට පෙරදී භාවනාව සමෘද්ධ වේගෙන් එන අවස්ථාවේදී පින්කම් පොළකට මට යන්න සලස්සලා මගේ භාවනාව කඩා කප්පල්වීමට සැලැස්සුවා. නැවත මේ අවස්ථාවේදි ඒකටම ජීවිතය කැප කරලා භාවනා කරන්න ලැස්ති වුණාම මේ සර්පයකු ගෙනත් දලා ඒකට බාධා කළා. ඒ මා භාවනා කරන්න ගිය කුටිය වෙනත් භික්ෂූන් වහන්සේලා පදිංචිවෙලා හිටිය හොඳ පිරිසිදු එකක්. ඒකට මේ සර්පයා කොහොම ආවද?"

"මේවා ඔක්කෝම මගේ භාවනාවට බාධා කිරීම්. ඉතින් මාරයාගේ, මාර පාක්ෂිකයන්ගේ, නැත්නම් මිසදිටු භූතයන්ගේ වැඩ කියලයි මට හිතුණේ. අපේ අලුත් පණ්ඩිතයන්, විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබූ ඇතැම් අය, යුරෝපීය උගතුන්ගේ කියුම්වලට වහල් වූ උගතුන්, මාර දිව්‍ය පුත්‍රයා කියල කෙනකු ඇතැයි යන්න ප්‍රතික්ෂේප කළත්, ක්ලේශයන්ම, රූපක වශයෙන් යෙදීමක් කියලා ඔවුන් තේරුවත්, පැරණි බණපොතේ කථාව සත්‍ය වශයෙන් මා පිළිගන්නවා. මා දේවපුත්‍ර මාරයා නැමැත්තකු ඉන්න බව එදත් පිළිගත්තා, අදත් පිළිගන්නවා. ඉන්දියාවේ බුද්ධාගම විනාශ කිරීමටත්, කලින් කල මේ හෙළදිවේ බුද්ධාගම විනාශ කිරීමටත් විරුද්ධ පක්ෂයට අනුබලය දුන්නේත් අදත් බෞද්ධ පක්ෂය දුර්වල කිරීමටත් අබෞද්ධයන් බලවත් කිරීමටත් සතුරු පක්ෂවලට පිටුපසින් මේ මාර දිව්‍ය පුත්‍රයා ඉන්න බවයි මා හිතන්නේ."

"සමහර කාලවල ශක්‍රාදි සම්‍යක් දෘෂ්ටික දෙවියන් මේ චණ්ඩි පාටියේ දඩබ්බර මාර දිව්‍ය පුත්‍රයාගේ දඩබ්බරකම්වලට බයෙන් මගාරිනවා. ඒ නිසා ඔහුට ඉඩ ලැබෙනවා, බුද්ධාගම විනාශ කිරීමට. අර සම්‍යක් දෘෂ්ටික හික්මිච්ච දේවතාවන් අයින් ගහනවා. එද මාර යුද්ධ අවස්ථාවේදීත් ඔවුන් බයේ පැනගිය බවට අපේ පොත්වල තියෙන කතාව ඇත්තක් වශයෙන් මා පිළිගන්නවා. ඉතින් සංයුත්සඟියේ මාර සංයුත්තය සහ භික්ඛුණී සංයුත්තයේ සඳහන් මාර දිව්‍ය පුත්‍රයාගේ දඟකාරකම් සමහරුන් කෙලෙසුන් හැටියට තෝරතත් පෙළ අටුවා දෙකට අනුව මා පිළිගන්නේ මාර දිව්‍යපුත්‍ර නැමති පුද්ගලයකුගේම ක්‍රියා හැටියටයි. ඔහු හෝ ඔහුගේ පක්ෂයෙහි කිසිවකු මගේ වැඩවලටත් නොයෙක් විට හරස් කපා ඇති බව මා පිළිගන්නවා."

"මේ කාරණය ම තවත් පැහැදිලි කරන්නම්. මාර ශබ්දය අපේ පොත්වල, මාරයන් පස් දෙනෙකුටම යොදලා තියෙනවානේ. ඔයින් මාර ශබ්ද හතරක්ම මර ධාතුවෙන් හද ගන්න පුළුවන් කියන එකයි මගේ අදහස. මර පාණවාගේ ධාතුවයි. ඉතින් ක්ලේශමාර ආදි ඔක්කෝම ශබ්ද අපේ අටුවාචාරීන් වහන්සේලා හදලා තියෙන්නේ ඔය කියන මර ධාතුවෙන්. අට්ඨකථාවල තියෙන්නේ මහාවිහාර හාමුදුරුවරුන්ගේ සම්ප්‍රදායයි. අභයගිරියේ හාමුදුරුවරුන්ගේ සමහර අදහස් හා මත ඒවාට එකඟවෙන්නේ නැහැ. මාර දිව්‍යපුත්‍රයා ගැන

කියන තැන්වල මාර ශබ්දය මර ධාතුවෙන් හදගෙන තිබුණත් ඊට වැඩිය හොඳ එකක් නිවැරදි එකක් මම කියන්නම්.''

"සංස්කෘතයේ ස්මාර කියන්නේ අනංගයාටයි. සිදත් සඟරාවේ තියෙනවා, සමර සමර කෙරෙයි, කියලා යෙදුමක්. සංස්කෘතයේ තියෙන ස්මාර කියන එක ප්‍රාකෘතයේ තියෙන්නේ 'මිහාර' කියලයි. ඒක ශුද්ධ මාගධියට 'මි' යන්නක් මුලට නොයෙදෙන නිසා මාර කියලා හිටිනවා. ඔය කියන දිව්‍ය පුත්‍රයාට මාර කියන එක ආවේ ස්මාර කියන එකෙන් බවයි මගේ අදහස. කවිසමයේ හැටියට අනංගයා පුද්ගලයෙක් නෙවෙයි. කාමාශාවට හෝ කාම අරමුණුවලට පුද්ගල ස්වරූපයක් දීමක්. නමුත් හින්දු පුරාණවලට අනුව කාමයට අධිපති දෙවියකු ඉන්නවා. ඒ තමයි අනංග. අප කියන හැටියට ඒ අනංග තමයි මේ මාර කියලා කියන්නේ. ඒ නිසා මාර දිව්‍යපුත්‍රයා කියන්නේ පුද්ගලයෙක්. දෙවියෙක්. එයාගේ පිරිස තමයි ඔය මාර පිරිස.''

"බුද්ධඝෝෂ හාමුදුරුවන් ලියපු පද්‍යචූඩාමණි කාව්‍යයේ මාර යුද්ධය වර්ණනා කරමින් කියූ ශ්ලෝකය මෙන්න මෙහෙමයි.''

**අත්‍රාන්තරේ නිවිඩමාස්ථිත බෝධිමූල**
**මාවේගවානභිෂිෂෙණයිෂුර් මුනීන්ද්‍රං**
**අධ්‍යාස්‍ය මත්ත කරිණං ගිරිමේඛලාඛ්‍ය**
**මාහූතසෛන්‍ය නිවහො නිරගාදනංගඃ.**

නිරාගාත් අනංගඃ = අනංගඃ නිරාගාත් = අනංගයා නික්මුණේය. ගිරිමෙඛලාඛ්‍යංමත්ත කරිණංඅධ්‍යාස්‍ය,ගිරිමේඛලා නම් මතැතු පිට නැගී හිඳ.

"පද්‍යචූඩාමණියේ කියන්නේ මාරයාට අනංගයා කියලා.''

"ඔය පුරාතන බුද්ධඝෝෂාචාර්‍ය්‍ය වැනි අය සලකලා තියෙන්නේ මාරයා පුද්ගලයෙකු හැටියටයි. ඉතින් බුදුහාමුදුරුවන් බුද්ධත්වයට පත්වන වෙලාවේදී ආ අර පරනිම්මිත වසවර්ති දිව්‍ය ලෝකයේ එක ප්‍රදේශයක හිතුවක්කාරකම් කරමින් ඉන්න දමරික දේව පුත්‍රයාටයි ඔය මාර කියලා කියන්නේ.''

"ඉතා ප්‍රබල මහා පින්වලින් ඉපදිච්ච, ලෝකයා අතර මහ ධනවත්කමින් යුක්ත පවුල් තියෙනවා. අන්න ඒ වගේම දිව්‍ය ලෝකයේත් අනික් දෙවියන්ට වඩා පින් කරලා තියෙන, අධික සැප සම්පත් නිසා ඒකටම මත්වුණ, ගුණධර්ම හෙළා දකින, තපස් රැකීම් ආදිය හෙළා දකින, කම් සැපයම වටිනාකම සේ සලකන එක්තරා දේව නිකායක් තියෙනවා. ඒකේ නායකයා තමයි ඔය වසවර්ති මාර දිව්‍ය පුත්‍රයා. වසවර්ති දිව්‍ය ලෝකයේ රජ්ජුරුවෝ වෙන කෙනෙක්. එයා හොඳ කෙනෙක්. මේ මාර දිව්‍ය පුත්‍රයා එහේ එක පැත්තක ඉන්න තක්කඩියෙක්. ගම්වල ඉන්නවානේ ඔය බේබදු නායකයෝ. ගමේ ධනවත් වැදගත් මිනිසුන් ඒ අය එක්ක කලබලවලට යන්නේ නැහැ. අයින්වෙලා ඉන්නවා. තක්කඩියන්ට කිසි ආත්ම ගෞරවයක් නැහැ. තක්කඩිකම් කරනවා කියලා ලැජ්ජාවක් නැහැ. ඒ විදියේම විශාල පිරිසක් පිරිවරාගෙන දමරිකකම් කරන කෙනෙක් තමයි මේ වසවර්ති මාර දිව්‍ය පුත්‍රයා. ඒ පිරිස තමයි මාර පිරිස. හින්දු කාරයන් ස්මාර කියනවා. අපේ පොත්වල මාර කියලා තියෙනවා. 'සදේවකේ ලෝකේ සමාරකේ සබ්‍රහ්මකේ' කී තැන ඔය අය ගැන තමයි බුදුහාමුදුරුවන් සමාරකේ කියලා වදළේ."

"සදේවකේ ලෝකේ සමාරකේ සබ්‍රහ්මකේ, කියලා බුදුහාමුදුරුවන් බොහෝ තැන්වලදී දේශනා කරලා තියෙනවා. දෙවියන් සහිත, මාරයන් සහිත, බ්‍රහ්මයන් සහිත කියන එකයි එහි තේරුම. සදේවකේ කිව්වාම දෙවියෝ. සබ්‍රහ්මකේ කිව්වාම බ්‍රහ්මයෝ. ඔය මැදට ඇයි සමාරකේ කියලා කෙලෙස් දන්නේ. පුද්ගලයන් දෙවර්ගයක් මැදට සමාරකේ කියලා කෙලෙස් දැමීමට හේතුවක් නැහැ. ත්‍රිපිටකයේ බුදුහාමුදුරුවන් ඒ විදියට වදළා නම් ඇයි සමාරකේ කියන එක කෙලෙස් වශයෙන් ගත්තේ? ඒ නිසාම ඒකෙන්ම ඔප්පුවෙනවා දෙවියන් මෙන්ම මාර නමින් එක්තරා පිරිසක් ඉන්න බව. ඊළඟට එයටත් වඩා උසස් බ්‍රහ්මයන් කියලා ජාතියක් ඉන්න බව. ඒ නිසා මාර නමින් පිරිසක් ඉන්නවා."

"සංයුත් සඟියේ මාර සංයුත්තයේ සඳහන් වෙනවා, මාරයා විටින් විට ඇවිත් බුදුහාමුදුරුවන්ටත් ශ්‍රාවකයන් වහන්සේලාටත් කළ ආරාවුල් කරදර ආදිය. ඉතින් බුදුහාමුදුරුවෝ කෙලෙස් සහිත කෙනෙක් නෙවෙයි. බුදුවෙලත් අවුරුද්දක් යන කල් මාරයා

උන්වහන්සේගේ පසු පස ඇවිද්ද කියලා තියෙනවානේ. එසේ ඇවිද්දේ බුදුහාමුදුරුවන්ගේ සිදුරක් සොයමින් කියලත් සඳහන් වෙනවා. ඉතින් මාරයා කියන්නේ කෙලෙස් නම් කෙලෙස් නැති කරපු බුදුහාමුදුරුවන් පසු පස තවත් කෙලෙස් ලුහු බඳිනවා කියන කථාවේ තේරුම මොකක්ද?''

''අනෙක් කාරණය නොයෙක් විට බුදුහාමුදුරුවන් මුළා කරන්න පුළුවන් කියලා හිතාගෙන මාරයා ආපු බව පේනවා. උන්වහන්සේගේ අසමසම ඥානය මොහුට විෂය වී නැහැ. මොහු කොච්චර බල සම්පන්නයෙක් වුවත් ලේසියෙන් රවටන්න පුළුවන්.''

''මොහු මෝඩයි. ඒ නිසා තමයි බුදුහාමුදුරුවන්ගේ සිදුරු සොය සොයා පස්සෙන් ඇවිද්දේ. අන්තිමට පසුබට වුණා. නමුත් මගේ පුද්ගලික අදහස නම් මාරයා බුදුහාමුදුරුවන්ගෙන් පළිගන්න පුදුම විදියට උත්සාහ කළා කියන එකයි. කෙළින්ම උන්වහන්සේගෙන් පළිගන්න බැරි වුණාම බුදුහාමුදුරුවන්ට අධික භක්තියෙන් උදව් උපකාර කළ අයගෙන් පළි ගත්තා.''

''ශාක්‍ය රජ පවුල විනාශ වන තැනට කරුණු සැලැස්සුවා. එසේ කළේ විඩූඪභ කුමාරයා ඇවිස්සීමෙන්. කොසොල් රජ්ජුරුවන්ගේ අවසාන මොහොත අනාථව මහමඟ නවාතැන් පොළක මැරෙන්නයි සිදු වුණේ. බුදුහාමුදුරුවන්ගේ මහ දයකයා තමයි අනේපිඬු සිටුතුමා. එතුමා එක් කලෙක අන්තිම දුප්පත් තත්වයට වැටුණා. බිම්බිසාර රජු ඔහුගේ පුතා ලවා අන්තිම දුක්ඛිත මරණයකට පත් කෙරෙව්වා. මේ විදියට බුදුහාමුදුරුවන්ට හුඟක් උදවු කළ අයගෙන් මාරයා පළි ගත්තා.''

''ඊළඟට බුද්ධ ශාසනයේ පැවැත්මට අකුල් හෙළුවා. බුදුහාමුදුරුවන්ගෙන් පස්සේ, සංඝයා බොහොම අමාරුවෙන් ශාසනය ආරක්ෂා කරගන්න උත්සාහ කළා. නමුත් නොයෙක් භේද ඇති වුණා. ඒත් ඒවාට මුහුණ දෙමින් බොහෝ දුරට ථෙරවාදී සංඝයා කටයුතු කළත් උතුරේ ථෙරවාදය නැතිවන තැනට කටයුතු යෙදුණා. මහායානය බලවත් වුණා. මේවාට මුල් වුණේ මාරයා කියන එකයි මගේ විශ්වාසය. අන්තිමට මුසල්මාන්වරුන් ලවා බුද්ධාගම සම්පූර්ණයෙන් විනාශ කෙරෙව්වා. ඉස්සර ගන්ධාරය

සම්පූර්ණ බෞද්ධ රටක්. අද ඒක අබෞද්ධ රටක්. ටාටරිය ඉස්සර චීනයට අයිති බෞද්ධ රටක්. ශිලාලේඛන හා හමුවන බෞද්ධ පොත් පත්වලින් ඒ කාරණය පැහැදිලි වෙනව. අද එක බෞද්ධයෙක්වත් ඒ රටේ නැහැ. ජාවාරට, මාලදිවයින ආදියත් ඉස්සර බෞද්ධ රටවල්. නමුත් ඒ සියල්ලේම බුද්ධාගම නැති වෙන්න කරුණු සැලසුණා. යන්තම් ඉතිරිවුණේ ලංකාවෙ, සියමෙ, බුරුමයේ පමණයි. කාම්බෝජයේ තිබුණා. ඒත් එක දවසින් ඒක විනාශ කළා.''

"ඉතින් මා හිතන්නේ මේ ඔක්කෝටම මුල මාරෝපක්‍රමය කියන එකයි. ඔහු හැම තිස්සේම බුද්ධාගම විනාශ කරන්ට හැකි හැම දෙයක්ම කරනවා. මේ උපක්‍රමය තවම නැති වුණේ නැහැ. දෙවිවරු මොහුට බයයි. එයාගේ පිරිස බලවත්. ඒ නිසා ඔහු එක්ක තරහයට යන්නේ නැහැ. ඒ නිසා එයා මර්දනය කරන්න මනුෂ්‍යයන්ම ඉදිරිපත් වෙන්න ඕනෑ. භික්ෂූන් වහන්සේලා ආගමානුකූලව, නියම ප්‍රතිපත්ති පුරමින් ස්ථිර අධිෂ්ඨානයෙන් වැඩ කරනවා නම් මාරයාට මොකවත් කරන්න බැහැ.''

"උන්වහන්සේලා ලෞකික සැප සම්පත් පැත්තට හැරුණාම මාරයාට වාසියි. ඉන්දියාවේ ඉස්සර වුණේත් ඕකයි. ඉන්දියාවේ භික්ෂූන් වහන්සේලා රජවරුන් සතුටු කිරීමට ඒ අයගේ ඇප උපස්ථානවලට වාල් වුණා. අනික් රටවලත් භික්ෂූන් වහන්සේලා හරියට ක්‍රියා කළේ නැහැ. නාලන්ද විහාරයේ භික්ෂූන්ගේ බලය තිබුණා. නමුත් ඒ එක්කම ඒ අයගේ ආඩම්බරකමක් තිබුණා, ඒ අය තමයි මුළු ඉන්දියාවේම ප්‍රධාන ආචාර්‍යවරුන් කියලා. ඒකම තමයි විනාශයට හේතු වුණේ. හැම තැනම හැම රටකම වුණේ ඔය විදියටයි.''

"සියලුම භික්ෂූන් වහන්සේලා ප්‍රතිපත්ති ගරුකව භාවනානුයෝගීව සිටියේ නම් මාරයාට මොකවත් කරන්න බැහැ. ඒ පැත්ත දුර්වල වෙන්කොට මාරයාට ඉඩ ලැබෙනවා. දෙවියන් විසින් කළ හැකි දෙයකුත් නැහැ. දෙවියන් වුණත් බලවත් වෙන්නේ අප පින්කරලා පින් අනුමෝදන් කළාම. අප නිකම් සිරිතක් වශයෙන් 'එත්තාවතාව අම්හෙහි' කියලා කියනවා. ඒත් දෙවියන්ට අනුමෝදන් වෙන්න දෙයක් නැහැ. මෙහේ කරන පින්කම් වැඩි හරිය

තම්බුව කීර්තිය බලාගෙන කරන ඒවා්නේ. ශ්‍රද්ධාව බොහොම ටිකයි තියෙන්නේ. සල්ලි එකතු කිරීම, ආධාර එකතු කිරීම වැනි වෙනත් අරමුණු වැඩි හරියක් පින්කම් අස්සේ තියෙන්නේ. ඉතින් ඔය විදියට කරලා එත්තාවතාව..... කිව්වාම පින් අනුමෝදන් වෙන දෙවියකු ඉන්නවායැ. ඉතින් පින් අනුමෝදන් වෙලා බලවත් වෙන්න දෙවිවරුන්ට අප කරන පින් මදි. ඒ නිසා අපේ සම්‍යක් දෘෂ්ටික දෙවිවරු බොහොම දුර්වලයි. මාරයාගේ පැත්තේ මිථ්‍යාදෘෂ්ටික දෙවිවරු බලවත්. ඒ නිසා බුද්ධ ශාසනය විනාශ කිරීමට නිතරම උත්සාහ ගන්නවා."

"බෝධිසත්වයන් බුදුබව ලබන වෙලාවේ උන්වහන්සේගේ හිත කලබල කිරීමට, සමාධියට බාධා කිරීමට මාරයා හොල්මන් කළත්, උන්වහන්සේ බය වුණේ නැහැ. එයා පැරදිලා යන්න ගියා. මා පිළිගන්නවා මාර යුද්ධය සත්‍ය සිද්ධියක් කියාත්, මාර සංකල්පය ප්‍රබන්ධයක් නොවේය කියාත්."

"මෙකී කරදරවලින් මිදිලා නැවත භාවනාව පටන් ගන්න හදනකොට ආරාධනාවක් අනුව වැල්ලවායේ බුදුරුවගල පිළිමය දකින්න ගිය වෙලාවේ අලුත් වැස්සෙන් පිරුණු ගල්වළක වතුර ටිකක් බිව්වා පිපාසෙට. පසුවද බළන්ගොඩට ආවා. මට මැලේරියාව හැදුණා. එය ඉතාම බලවත්ව නැගුණා. අවුරුද්දක්ම මා එයින් පීඩා වින්ද. කිසිම ඉංග්‍රීසි සිංහල ප්‍රතිකාරයකින් මට පූර්ණ සනීපයක් ලැබුණේ නැහැ. මේ කරදර නිසා මගේ චිත්ත බලයත් පිරිහුණා. අවුරුද්දක් ගතවීමෙන් පස්සේ මා හිතුවක්කාර ප්‍රතිකාරයක් කර ගත්තා. ඉතින් එහෙම වෙනකොට සංඝයාගේ කටයුතු දායකයන්ගේ කටයුතු නිසා භාවනාව දිගට ගෙනියන්න බැරි විදියට බාධා ඇතිවුණා. භාවනාව ක්‍රමානුකූලව ගෙනියන්න ඕනෑ, එතකොටයි ප්‍රතිඵල ලබන්න පුළුවන්. ඔය විදියට නොයෙක් කරදර ආවා. අන්තිමට මා සමථය අත් ඇරලා විපස්සනාව වඩන්න පටන් ගත්තා. හැකි හැම අවස්ථාවේම කළේ එය වැඩීමයි."

"ඔය අතරයි බුරුම ධර්ම සංගායනාවට යන්න සිද්ධ වුණේ. ඒ අතර හදිසියේ මෛත්‍රීමූර්ති අපවත් වුණා. බුරුමයෙන් මහාසී සියාඩෝ තෙරුන් විසින් කඳුබොඩ භාවනා මධ්‍යස්ථානයට එවූ සුජාත තෙරුන් වහන්සේ ගැන දැන ගන්න ලැබී මට හිතුණා

ඒ තෙරුන් වහන්සේ ළඟ විපස්සනා භාවනා ක්‍රමය පුරුදු කරන්න ඕනෑ කියලා. මෙය සිදු වූයේ ජර්මන් ධර්මදූත ආශ්‍රමය ආරම්භවූ අවස්ථාවේදීයි. ඉතින් මාත් මගේ ශිෂ්‍යයන් දෙනමකුත් කඳුබොඩට ගියා. ඒ දෙනම ධම්මපාල තෙරුන් යටතේ භාවනාව පුරුදු කළා. මේ දවස්වල බුරුමෙන් ලංකාවට පුරුදු කළ බඩේ පිම්බීමේ හැකිලීමේ භාවනා ක්‍රමයයි එහි තිබුණේ. ඒ ක්‍රමයට විරුද්ධව සමහර භික්ෂූන් පත්තරවල ලියුම් පවා පළ කළා. මේ අරගලය තියෙන විටයි මා එතනට ගියේ."

"සුජාත තෙර මහා ධර්මධරයෙක්. ඒ වගේම හොඳ පාලි පඬිවරයෙක්. මා උන්වහන්සේ සමග කථා කළේ පාලි භාෂාවෙන්. උන්වහන්සේ මගෙන් ඇහුවා උදරයේ උස් පහත්වීමේ භාවනාව කරන්න කැමතිද? වෙන එකක් කැමතිද? කියලා. සතිපට්ඨාන සූත්‍රාදියේ ආශ්වාස ප්‍රශ්වාස වායුව අරමුණු කොට සිහිය පිහිටුවා භාවනා කිරීම කෙළින්ම උගන්වලා තිබියදී බුදුරජාණන් වහන්සේ නොවදාළ බඩේ පිම්බීමටත් හැකිලීමටත් ප්‍රධාන තැන දෙමින් මේ උගන්වන ක්‍රමය මට නම් එච්චර හිතට ඇල්លුවේ නැහැ. සතිපට්ඨාන සූත්‍රයෙහි ශරීරයේ එක් තැනක් අල්ලාගෙන එබඳු භාවනාවක් කිරීමේ නිදහස තිබෙනවා. බඩේ හැකිලීමේ හා පිම්බීමේ ක්‍රමයක් අරමුණු කිරීමට මා කැමති නැති බව ඒ තෙරුන්ට කිව්වා. එතනදී උන්වහන්සේ වදාළා, 'ඔබ වහන්සේ මෙතෙක් පුරුදු කළ භාවනාවක් ඇතොත් එයම පුරුදු කරන්න' කියලා. මා පුරුදු කරලා තිබුණේ ධාතු කර්මස්ථානය. ශරීරයේ රූප කැඩී කැඩී, බිඳී බිඳී යාම අරමුණු අනුව චිත්ත වීථීන් වෙනස්ව යෑම කියන මේවා බොහොම අමාරුවෙන් අල්ලාගෙන ඒ භාවනාව පුරුදු කරලා තිබුණේ. සුජාත තෙරුන්ට මේ බව කිව්වාම උන්වහන්සේ වදාළා 'ඒක බොහොම හොඳයි ඒකම පුරුදු කරන්න' කියලා."

"උදේ හිට රෑ වනතුරුත්, රාත්‍රියෙහි දොළහ වෙනතුරුත්, සක්මනෙහි යෙදෙමින් ඒ භාවනාව මා පුරුදු කළා. ඉඳගන්නේ නැතිව මුළු දවසම සක්මන් කිරීමේ හැකියාව මට තිබුණා. මට වෙහෙස දැනුණේ නැහැ. ඒ භාවනා කිරීමේදී විශේෂ අමුත්තක් දැනුණාම මා ඒ බව සුජාත තෙරුන්ට කියනවා. උන්වහන්සේ අටුවාවෙන් ටීකාවෙන් හෝ පෙළෙන් විස්තර අරගෙන මට ලැබුණ, ඒ තත්වය පහදලා දෙනවා."

"මාස දෙක තුනකින් මගේ විපස්සනාව නැගිලා උදයව්‍යය ඥාණාදිය ලැබුණා. අන්තිමේදී මට හැම දෙයක් කෙරෙහිම උපේක්ෂාව ඇති වුණා. එය ඉතා බලවත්ව හිතේ ඇති වුණා. මා ලබා ඇති ඒ තත්වය 'සංඛාර උපෙක්ඛා ඥාණය' කියා සුජාත තෙරුන් මට පැහැදිලි කර දුන්නා. ඒ වගේම තව දුරටත් එය පුහුණු කරන්න කියා උන්වහන්සේ මට උපදෙස් දුන්නා. ඉතින් මා දිගටම එය පුරුදු කළා. එසේ උත්සාහ කළත් මට ඒ මට්ටමින් එහාට යන්ට බැරි වුණා."

"ඉතින් කරුණු ඔහොම සිද්ධ වුණත් වජිරාරාමයේ කස්සප තෙරුන් හෙම භාවනා ක්‍රම පිළිබඳව පළ කොට තිබූ පොත්වල මටත් දොස් කියා තිබුණා. බඩේ පිම්බීම හැකිලීම පිළිබඳ භාවනාවටත් දොස් කියා තිබුණා. මා ඒවා හරි ගස්සන්න ගියේ නැහැ. මගේ භාවනාව මා හොඳට දන්න නිසා මා ඒ ගැන වැඩිය හිතුවෙත් නැහැ. වාද අවශ්‍ය නැහැ. එතකොට ද්වේෂය ඇති වෙන්න ඉඩ තියෙනවා. සුජාත තෙරුන්ගේ දේශනාව ඉතාම රමණීයයි. වජිරාරාම ඇත්තන්ගේ කැගැහිල්ලෙන් මා කම්පිත වුණේ නැහැ. තරහ ගත්තෙත් නැහැ. මගේ මාර්ගයේ මා දිගටම ගියා. මේවා මා කළෙත් රහසේයි. මගේ භාවනාව පිළිබඳ රටට දන්වීමට මට ඕනෑ කළේ නැහැ. ඔය මගේ යට ගියාවේ සිද්ධියක්. මගේ ජීවිතයේ වැදගත් අවස්ථාවක් ඕක."

**"භාවනා ගුරුවරුන් උපචාර අර්පණා සමාධි දෙකේ වෙනස තෝරන්නේ විවිධ අන්දමින්. මේ ගැන මහානායක හාමුදුරුවන්ගේ අදහස පැහැදිලි කරන්න හැකිද?"**

"සමාධි භාවනා කරන්නාට ප්‍රතිභාග නිමිත්ත පහළ වුණාම කාමච්ඡන්දදි නීවරණ යටපත් වෙනවා. විතර්ක විචාරාදි අංගත් සිත්වල පහළ වුණත් ඒ බලවත්ව නොවෙයි. ධ්‍යාන අරමුණෙහි සිත එකඟ වුවත්, ඒ සමාධිය දුර්වලයි. ස්ථිර නැහැ. තවම භාවනා කරන සිත කාමාවචර අවස්ථාවේ. විතර්කාදි ධ්‍යානාංග පහ ස්ථිරව පහළවෙමින් සිත භාවනා අරමුණෙහි ස්ථිරවම පිහිටියාම පංච නීවරණ මුළුල්ලම යටපත් වෙනවා. රූපාවචර පළමු ධ්‍යාන සිත ඇති වෙනවා. මේ භාවනාවේ අර්පණා අවස්ථාව. ලීයක ඇණයක් තදින් වැදී එය ලීයෙහි බැඳුණාම ඒ ඇණය හෙල්ලෙන්නේ

නැතිව ලීයෙහි බැඳී පවතිනවා සේම හිත භාවනා අරමුණ හා තදින් බැඳී එහි තදින් වැදගෙන පිහිටි අවස්ථාව අර්පණායි. ඒ අර්පණා යන වචනයේ තේරුම තදින් පිහිටීම යනුයි. මේ අවස්ථාවෙහි වූ සිතේ ඇති දැඩි එකඟකම අර්පණා සමාධියයි. එයට මුලින් වූ එයට ළංවෙමින් පැවති සිතේ එකඟ බව උපචාර සමාධියයි. උපචා ර යන්නේ තේරුම ළංව හැසිරෙන යනුයි. උපචාර සමාධිය කාමාවචරයි. තවම රූපාවචර අවස්ථාවට පැමිණ නැත. අර්පණා සමාධි සිත රූපාවචරයි."

"භාවනාවේදී නැගී එන 'ථීනමිද්ධය' දුරු කිරීමට ආලෝක සංඥාව වැඩිය යුතුයි යනුවෙන් සූත්‍ර දේශනාවල සඳහන් වෙනවා. මේ ආලෝක සංඥාව කියන්නේ මොකක්ද? ඒක වඩන්නේ කොහොමද?"

**ආලෝක සඤ්ඤං මනසි කරොතීති දිවා වා රත්තිං වා සුරිය - දීප - චන්ද මණි - උක්කා - විජ්ජුල්ලතා - දීනං ආලෝකො දිවා රත්තිං ච උපලද්ධෝ**

**යථා ලද්ධ - වසෙනෙව**

**ආලොකං මනසි කරොති චිත්තේ ඨපෙති, තථා ච තං මනසි කරෝති**

**යථාස්ස සුභාවිතාලෝක - කසිණස්ස**

**විය කසිණා ලෝකෝ යපිච්ඡකංච සො ආලෝකෝ රත්තියං උපතිට්ඨති යෙන තත්ථ දිවා සඤ්ඤං ඨපෙති. දිවා විය විගත - ථීනමිද්ධෝ හෝති.**

"මෙහි කෙටි අදහස හිරු එළිය, සඳ එළිය, මැණික් එළිය, පන්දම් එළිය, විදුලි එළිය ආදි දැක පුරුදු මොනම එළියක් හෝ සිතේ ඇඳී තිබේ නම්, මතක් කරගතහැකි නම් ඒ එළිය මතක් කරගෙන කොපමණ වෙලාවක් හරි තමා කැමති හැටියට හිත එහි පිහිටුවා තැබීමයි. හරියටම කසිණ භාවනා කරන යෝගියා කසිණ එළිය ලබා ගත්තාට පස්සේ කැමති විටෙක කැමති වෙලාවක් හිත ඒ එළියේ පිහිටුවා ගෙන ඉන්නවා වගේම තමා දැක පුරුදු හිරු එළිය ආදි එළියක් මතක් කරගෙන එහි හිත පිහිටුවා ගත්තාම රාත්‍රි කාලයේ වුවද දවල් සේ ඔහුට හැඟෙයි. චිත්ත චෛතසිකයන්ගේ මැලිබව දුරු වෙයි. මේ අංගුත්තර ටීකාවේ විස්තර කර තිබෙන හැටියි. තවත් නොයෙක් තැන්වල මේක විස්තර කරලා තියෙනවා. ඒ හැම තැනම තෝරලා තියෙන්නේ මා දුන් කියපු හැටියටයි."

**"අරතියත් භාවනා කරන්නා විසින් මැඩගත යුතුයි, කියලා තියෙනවා. ඒ ගැන පිළිපැදිය යුත්තේ කොහොමද? මේ ගැන නායක හාමුදුරුවන්ගේ උපදේශය දැන ගන්න කැමතියි."**

"අරතිය යි කියන්නේ භාවනායෙහි නොඇලීමයි. පසුබාන ගතියයි. අංගෝත්තර සඟියේ දෙවන වර්ගයේ හත්වන සූත්‍රයේ අර්ථ වර්ණනාවේ මේක විස්තර වශයෙන් දක්වා ඇති. අරතිය දුරලීමට වීර්‍ය්‍ය වැඩිය යුතුයි."

**"මේ කාලයේ මාර්ග ඵල ලබන්න පුළුවන්ද? එයට බාධාවක් තියෙනවද?"**

"ත්‍රිහේතුක උත්පත්තිය ලැබූ කෙනකු උත්සාහ කළොත් බැරිවෙන්නේ නැහැ. උද්ඝටිතඤ්ඤු, විපචිතඤ්ඤු, නෙය්‍ය, පදපරම කියලා පුද්ගලයන් හතර දෙනකු ඉන්නවා. බුදුහාමුදුරුවන්ගේ මුල් අවුරුදු විස්සේදී වැඩි දෙනා උද්ඝටිතඤ්ඤ පුද්ගලයෝ. ඒ අය බුදුහාමුදුරුවන්ගෙන් බණ අහන ක්ෂණයකින් නිවන් ලබන්න පුළුවන් පිරිස."

"ඊළඟ අය ටිකක් විස්තර කරන කොට තමයි ඒ අවබෝධය ලබන්නේ. ඒ අයත් නිවන් අවබෝධ කළා. බොහෝ දෙනා නෙය්‍ය කොටසට ඇතුළත් අය. මාර්ගය ඔස්සේ ඉස්සරහට යැවිය යුතු අයයි. අර චක්ඛුපාල හාමුදුරුවන් වැනි අය. ඒ අයට උපදෙස් දිදී මග පෙන්නන්න ඕනෑ. නෙය්‍ය පුද්ගලයන්ගේ කාලය මේ පන්දහ අවසානය දක්වාම තියෙනවා. මගේ අදහස අනුව ඒ නිසා තමයි අට්ඨකථා කාරයන් සසුනේ කාලසීමාව පන්දහක් අවුරුදුයි කියලා තියෙන්නේ. පදපරම කියන අයට මේ ආත්මයේදී නිවන් දකින්න බැහැ. ඒ අයට ඒකට සෑහෙන තරම් පාරමිතා සම්පූර්ණ වෙලා, මෝරලා නැහැ. තව බොහෝ කාලයක් ඒ අය මහන්සි ගන්න ඕනෑ. ඒ අය කමත්ට ශක්ති පමණින් ගුණධර්ම පුරුදු කරනවා. ඒවා ප්‍රත්‍යය වෙනවා ඊළඟ ආත්මයට. ඉතින් ඒ අයට ඔය විදියට මතු ආත්ම ගණනාවකදීවත් බැරි වුණොත් මෛත්‍රෙය බුදුහාමුදුරුවන්ගේ කාලේ තමයි ඒකට අවස්ථාව ලැබෙන්නේ. මේ කාලේ තවම සෝවාන් වෙන්න බැරි කමක් නැහැ. සමහර තැනක රහත් වෙන්න පුළුවන් අයත් ඉන්න පුළුවන්."

"ඔය විදියට මාර්ග ඵල ලාභීන් ඉන්නවා. ලංකාවේ විතරක් නොවෙයි එංගලන්තය වැනි රටවලත් ඉන්න පුළුවන්. එංගලන්තයේ ග්‍රේට් ගැඩස්ඩන්හි අමරාවතී විහාරයේ ඉංග්‍රීසි ජාතික භික්ෂූන් වහන්සේලා කොපමණ ඇල්මකින් විපස්සනාව වැඩීමේ යෙදෙනවාද කීවොත් උදේ දනේ වළඳලා ඉඳ ගත්තාම දවල් පිණ්ඩපාතේ යන වෙලාව දක්වාම භාවනානුයෝගීවයි ඉන්නේ. ආපහු දවල් වළඳලා ටිකක් විවේකයෙන් ඉඳලා නැවත හවස පහමාර වෙනකල් භාවනානුයෝගීවයි ඉන්නේ. නැවත රාත්‍රියේ බුදුන් වැඳලා ඉඳ ගත්තාම රෑ දොළහ වෙනකල්, ඇතැම් දෙනා රෑ දෙක වෙනකල්, සමහරු එළිවෙනතුරුම ඉඳිමින් සක්මන් කරමින් භාවනා කරනවා. ඉතින් ඔය විදියට ඒ අය දැඩි උත්සාහයක් ගන්නවා. මේ අය අතර මාර්ග ඵල ලබාපු අය නෑ කියලා කියන්න බැහැ. තායිලන්තයේ (සියමේ) අ රණ්‍යවල, බුරුමේ විපස්සනා ස්ථානවල, පුදුම තරමේ උත්සාහවත් භාවනානුයෝගීන් ඉන්නවා. ඒ අය අතර මාර්ග ඵල ලාභීන් නැහැ කියලා කියන්න බැහැ. ඇති. ප්‍රසිද්ධ නැහැ. අර මහව පන්සලේ ඉඳලා අපවත් වුණ සුමේධ තෙරුන් වහන්සේ වගේ අය හරිම ගුණ සම්පන්නයි. ඉතින් ඒ වගේ අය තමන් මාර්ග ඵල ලැබුවත් කියන්නේ නැහේ. නමුත් එවැනි තත්වයක් ලබන්න ඇතැයි කියන එකයි මගේ විශ්වාසය. උන්වහන්සේ ගැන මා පොඩි කාලේ ඉඳන්ම දන්නවා. මා ළඟත් බළන්ගොඩ පිරිවෙනේ ටික කාලයක් හිටියා. ඒ හිටියේ විසුද්ධි මාර්ගයේ විස්තර ටිකක් දනගන්න. ඒ කාලයේත් දවසේ වැඩි කාලයක් භාවනානුයෝගීවයි හිටියේ."

**"සමථ භාවනාවෙන් ධ්‍යාන උපදවා නොගෙන විදර්ශනා වඩල මාර්ග ඵල ලබන්න පුළුවන්ද?"**

"සාර සංග්‍රහ පාලියේ, සමථ විපස්සනානං විභාවනා, කියලා පරිච්ඡේදයක් තියෙනවා. ඒකේ තියෙනවා විපස්සනාව වඩන්න පටන් ගත්තාම 'ඛණික සමාධිය' ඇති වෙනවා කියලා. සමථයක් නැති විපස්සනාවක් නැහැ. නමුත් විපස්සනාව පටන් ගන්නා මොහොතේ ඉඳලම සමථය තියෙනවා ක්ෂණිකව. යම් අරමුණක් ගත්තාම සිත එකඟවෙනවා ඒ වෙලාවට. ඒක තමයි ඛණික සමාධිය කියන්නේ. අපි හිතමු කිසිවකු විපස්සනාව වඩලා සෝවාන් වෙනවා කියලා. එතකොට ස්වභාවයෙන්ම ප්‍රථම


ධ්‍යානය එයාට ඇති වෙනවා. ඒ කියන්නේ සෝවාන් වීමේදී විචිකිච්ඡා සීලබ්බතපරාමාස දිට්ඨි ඔය කියන ඒවා මුලසුන් වෙනවානේ. එතකොට අතික් ක්ලේශයන්ට මොකද වෙන්නේ? සෝවාන් වෙන මොහොතේ අතික් කෙලෙස් (නීවරණ) විෂ්කම්භන (යටපත්) වෙනවා. මේ විදියට විපස්සනා වඩන හැම අයටම ප්‍රථමධ්‍යානය ස්වභාවයෙන්ම ඇති වෙනවා. අන්න ඒ නිසා තමයි සෝවාන් වුණාට පසුව සමහරුන් ද්විතීය ධ්‍යාන ආදි ඉතිරි ධ්‍යාන සඳහා ධ්‍යාන වැඩුවේ. ඒවා ලබන්න භාවනා කරන්න ඕනෑ.”

# 9 මගේ විදේශ ධර්මදූත සේවය

"සාරානාත්හි ඉසිපතනයේ විහාරාධිපතිකමේත් මාස නවයක් මා උන්නා. ඉසිපතනයේ ගත කළ කාලය ශාන්ත කාලයක්. බමුණන් පවා විටින් විට ඇවිත් මාත් සමග ධර්ම සාකච්ඡාවල යෙදුණා. ඔවුන්ගේ ගෙවල්වලට පවා මා කැදෙව්වා. ඒ කිට්ටුවම හින්දු කෝවිලක් තිබුණා. සමහර දවස්වල මා ඒකටත් ගියා. එක අවස්ථාවකදී එහි හින්දු පූජකතුමා කිව්වා, 'ඔබ වහන්සේ ඉන්නවා නම් ස්ථිරවම අපේ මේ කෝවිලත් ඉසිපතනයට පවරනවා කියලා. අනික් භික්ෂූන් වහන්සේලා අපට විරුද්ධයි. නමුත් ඔබ වහන්සේ අපට බොහොම කරුණාවන්තයි. ඒ නිසයි අප එහෙම කියන්නේ කියලා පූජකතුමා නැවත නැවත කිව්වා. මා තවත් කලක් එහි සිටියේ නම් හින්දු කෝවිලත් අපට ලැබෙනවා. මා හැමවිටම ක්‍රියා කළේ මෛත්‍රියෙන්. ඉතිරි ජීවිතය මා එහේ ගත කිරීමටයි හිතාගෙන හිටියේ. ඒකටත් බාධාවක් ඇති වුණා."

"ඔය අතර මට ලංකාවෙන් ලියුමක් ලැබුණා, අමරපුර නිකායේ සියලුම ශාඛා එකතුවී පිහිටුවා ගත් සංඝ සභාවේ සභාපතිකමට (මහානායක ධුරයට) මා පත්කර ගත්තා කියලා. එය භාර ගන්නා හැටියට විශේෂ ඉල්ලීමකුත් මගෙන් කර තිබුණා. ඒ පදවිය පිළිබඳ අක්ත පත්‍ර පිළිගැන්වීමේ උත්සවයට ඉක්මනින් වඩින්න කියලා ඒ සමගම තවත් ලිපියක් ලැබුණා. ඒ ලැබුණේ මුල්ලපිටියේ කේ. එච්. ද සිල්වා විජය ශ්‍රී මුහන්දිරම් රාළහාමිගෙන්. උන්නැහේ අමරපුර සංඝ සභාවේ මේ ඇති වුණ සාමග්‍රිය සඳහා වෙහෙස වී ක්‍රියා කළ අයෙක්. ඉතින් මා කල්පනා කළා එකතු කරන්න බැරි කොටස් එකතු වෙච්ච වෙලාවේ මාත් ඒකට සහයෝගය දෙන්න ඕනෑ කියලා. මුල්ලපිටියේ රාළහාමිගේ ලිපියේත් ඒක සඳහන් කරලා තිබුණා. ඉතින් මා හිතා ගත්තා ලංකාවට ගිහිල්ලා අක්තපත්‍රයත් අරගෙන සතියකින් දෙකකින් සභාපති ධුරය වෙනත් කාගෙ හරි ඇහේ ගහලා ඉසිපතනයට ආපහු එනවා කියලා. එහෙම හිතා ගෙනයි මා ලංකාවට ආවේ."

"ලංකාවට පැමිණිලා මා නිහඬව සියල්ල ඉවසලා මුල්ලපිටියේට කිව්වා, 'දැන් ඔක්කෝම හරි, මා සාරානාත්වලට ආපසු යනවා' කියලා, 'කාට හරි මේ සභාපති ධූරය භාරදීලා යනවා' කියලත් මා කිව්වා 'ඒ පාර ඒ මහත්මයා කෑ ගහන්න පටන් ගත්තා, මොකක්ද මේ පිස්සුව' කියලා. වෙන කාගේ නමක් ඉදිරිපත් කළත් කට්ටියක් විරුද්ධ වෙනවා. හැම කොටසගේම සමොානච්ඡන්දය ලැබුණේ ඔබ වහන්සේට පමණයි. මේ අලුත් පිටම මේක වෙනත්



ආනන්ද මෛත්‍රෙය මහනාහිමිපාණන්ට අමරපුර මහා සංඝ සභාවේ සභාපති පදවිය පිළිබඳ අක්ත පත්‍රය එවකට අගමැතිව සිටි ඩඩ්ලි සේනානායක මහතා පිළිගැන්වූ අවස්ථාව.

කාට හරි පැවරුවොත් ආයිත් කැඩිලා යයි කියලා මුල්ලපිටියේ රාළහාමි කිව්වා. 'එතකොට මොකවත් කරන්න බැරිවෙයි' කියලත් කිව්වා. 'ඒක නිසා මේ අවුරුදු පහ කොහොම හරි ඉවසන්න' කියලා මට තදින්ම කියා සිටියා. 'සංඝ සාමග්‍රිය ගැන කල්පනා කරලා, ඉවසලා ඉන්න' කියලා මට ආරාධනා කළා. මා ඒකට අනුකූලතාව දැක්වුවා. ඒ කාලය ගත වුණා."

"කාරක සංඝ සභාව ඉදිරි අවුරුදු පහටත් මා පත් කළා. නමුත් මා ඒකට කැමති වුණේ නැහැ. මා නිහඬ වුණා. වෙලාව ආවාම මා වැඩේ කරන්නම් කියලා හිතා ගත්තා. ටික දිනකින්



REFERENCE

මහා සංඝ සභාව රැස් වුණා. මුලසුනේ හිටියේ මායි. එහිදී මුලින්ම මා කිව්වා, 'මට වචනයක් මුලින්ම ප්‍රකාශ කරන්න තියෙනවා කියලා. දෙවැනි වරටත් සභාපතිකමට මාව පත් කරලා තියෙනවා. මා ඒක කොස්ගොඩ ධම්මවංශ හිමියන්ට පවරනවා, මේ යෝජනාව මගේ. ඒක කවුරුහරි ස්ථිර කරන්න' කියලා මා කිව්වා. ටික වෙලාවක් ගියා. කවුරුවත් ස්ථිර කරන්නේ නැහැ. නිහඬව බලාගෙන ඉන්නවා. කීප විටක්ම මේක කවුරු හරි ස්ථිර කරන්න කීවාම කොහේද ඇතින් සභාවට වැඩිය නමක් මේක ස්ථිර කළා. 'ඔක්කොම මේක පිළිගන්නවා නේද?' කියලත් මා ඇහුව්වා, ඇත්ත වශයෙන් මට නිදහසක් ලබන්න මා කළ ප්‍රයෝගයක් ඒක. සභාව අවසානයේදී මහ තෙරවරුන් කීප දෙනකුම මට දොස් කියන්න පටන් ගත්තා. මා ගණන් ගත්තේ නැහැ. ඔය පදවි තනතුරුවලට කෑදරවෙලා ඕවායේ ලැගලා ඉන්න මට බැහැ. මට එහෙම ආශාවක් නැහැ, කියලා මා හෙමින් මගැරලා ගියා."

**"යුරෝපීය රටවලත් ඔබ වහන්සේ ධර්ම ප්‍රචාරක කටයුතුවල පුළුල් වශයෙන් නිරත වුණා නේද? ඒ පිළිබඳවත් කරුණු ටිකක් දැන ගන්න මා කැමතියි."**

"ඇමරිකාව, කැනඩාව, එංගලන්තය, ස්කොට්ලන්තය, ප්‍රංශය, ඩෙන්මාර්කය වැනි රටවල ධර්මදූත සේවාවේ යෙදීමට මට අවකාශ ලැබුණා. ඒ රටවල අයගේ හරිම උනන්දුවක් තියෙනවා බුද්ධ ධර්මය පිළිබඳව කරුණු දැන ගැනීමට. 1973 දී පළමුවෙන්ම "උ'ම්‍යට් සෝ" නම් බුරුම බෞද්ධ මහතාගේ ආරාධනාවකින් මා එංගලන්තයට ගියා. ඔක්ස්ෆඩ් නුවර 'පාමුවර්' ප්‍රදේශයේ තියෙන 'ඕකන්හෝල්ට්' නම් බෞද්ධ මධ්‍යස්ථානයේ තමයි නැවතිලා හිටියේ. ඒ කාලය තුළ නොයෙක් තරා තිරම්වල උගතුන් හමුවේ බුද්ධ ධර්මය පිළිබඳ දේශන මාලාවක් පැවැත්වූවා."

"නැවත වරක් 1980 දී එංගලන්තයට යාමට අවස්ථාව ලැබුණා. ඒ මිල්ටන්ක්වින්ස්වල සාම චෛත්‍යය ආරම්භ කිරීමේ උත්සවයට සහභාගි වීමටයි. ලන්ඩන් නුවරට ටිකක් ඈතින් ඒක පිහිටලා තියෙන්නේ. එරටවාසී බෞද්ධයන්ගේ දහම් පිපාසය නිවීමට මට මේ ගමන් උපකාර වුණා. උගතුන්ගේ ගැටළුවලට පිළිතුරු සැපයීමට මට අවස්ථාව ලැබුණා."


"1981 දී එංගලන්තයේ උගත් සැදැහැවීත් බෞද්ධ පවුලක් වන 'ජැක්සන්' යුවල විශේෂ ධර්ම චාරිකාවක් පිළියෙළ කළා. කේම්බ්‍රිජ් ඔක්ස්ෆඩ්, ලැන්කැස්ටර් විශ්වවිද්‍යාලවල සම්භාවනීය උගතුන්ගේ සභා මධ්‍යයේ ඔවුන්ට දේශනා පැවැත්වීමට මට එවර අවස්ථාව ලැබුණා. ඔවුන්ට අනාවරණය නොවූ ගැඹුරු ධර්ම කරුණු මේවායේදි සාකච්ඡා වුණා. මේ සංචාරය හරිම කාර්ය බහුල ඒ වගේම ඉතාම වැදගත් එකක් වුණා. 'ඩොන්කැස්ටර්' නගරයේ ප්‍රසිද්ධ දේශන ශාලාවේදීත්, මැන්චෙස්ටර්හි ශමථ විහාරයේදීත්, චිචිහර්ස්ට් සංඝාරාමයේදීත්, බර්මින්හැම් නගරයේ විහාරයේත් බුද්ධ ධර්මය පිළිබඳ උනන්දු වූ බොහෝදෙනා සඳහා දේශන පැවැත්වුවා. මාස දහයක්ම එංගලන්තයේ නොයෙක් තැන්වල දිගටම දේශන පැවැත්වුවා."

"1983 දී කැනඩාවේත්, ඇමරිකාවේත් ධර්ම ප්‍රචාරක කටයුතුවල නියැළීමට මට අවස්ථාව ලැබුණා. ඔය වෙන කොට යුරෝපීය රටවල් හැමකකින්ම පාහේ මට ආරාධනා ගලා එන්ට පටන් ගත්තා. කැනඩාවට ගියේත් එහේ බෞද්ධයන්ගේ ආරාධනාවක් අනුවයි. ඒ ගමන අපූරු අත්දැකීමක්. කැනඩාවේ වැන්කුවර් කියන නගරයට එහායින් හාෆ් මූන් බේ (HALF MOON BAY) කියන ප්‍රදේශයට ගියා. එහේ තියෙන භාවනා මධ්‍යස්ථානයේ තමයි නැවතිලා හිටියේ. එහේ මාස එකහමාරක් විතර කාලයක් ධර්ම දේශනා කළා."

"ඉන් පස්සේ ගියේ ඇමරිකාවේ කැලිෆෝනියාවට. එහේ ලොස් ඇන්ජලීස් නුවර ධර්මවිජය බෞද්ධ මධ්‍යස්ථානයේ නැවතිලා හිටියා මාස හතක් පමණ කාලයක්. ඒ කාලය තුළදී ධර්ම සාකච්ඡා, ධර්ම දේශනා, සම්මන්ත්‍රණ හුඟාක් පැවැත්වුවා."

"1985 දීත් මා නැවත වරක් එංගලන්තය, ප්‍රංශය, ඇමරිකාව, කැනඩාව ස්කොට්ලන්තය යන රටවල ධර්මදූත චාරිකාවක යෙදුණා. මේ යුරෝපීය රටවල් ගත්තම එංගලන්තයේ උගතුන් අතර ඉතා ශීඝ්‍රයෙන් බුදු දහම පැතිරෙන බව කියන්න පුළුවන්. ඒ රටවල සමහර කතෝලික පූජකවරුන් පවා බුදු දහම හැදරීමට විශේෂ උනන්දුවක් ප්‍රියකමක් දක්වනවා. එහේ චිචිහර්ස්ට්

පෙදෙසේ අක්කර දෙසීයක භූමි භාගයක අංග සම්පූර්ණ විහාරස්ථානයක් තියෙනවා. එතන යුරෝපීය ඇමරිකන් ජාතික භික්ෂූන් වහන්සේලා දනට තිස් නමක් පමණ ඉන්නවා. ඒ අය හොඳින් ප්‍රතිපත්ති පුරණ අය. අපේ රටවල වගේ පිණ්ඩපාතේ පවා ඒ හාමුදුරුවරුන් වඩිනවා.''



එංගලන්තයේ අක්කර 200 භූමිභාගයක පිහිටුවා ඇති ''චිට්හර්ට්ස්'' බෞද්ධ මධ්‍යස්ථානයේ දී පැවැත්වූ ධර්මානුශාසනයකට, සුදු ජාතික භික්ෂූන් වහන්සේ හා උපාසක පිරිසක් සවන් දෙන අයුරු.

''ඉතින් ඔය විදියට යුරෝපීය රටවල සංචාරය තුළින් ඉතා ප්‍රයෝජනවත් ධර්ම ප්‍රචාරක ව්‍යාපාරයක යෙදීමට මට හැකි වුණා. ඒ හැම ගමනකදීම ඒ ඒ රටවල බෞද්ධ ජනයා මට ගමනට ටිකට් එවීම් ආදි අවශ්‍ය හැම පහසුකමක්ම සලසලා දුන්නා.''

**''බටහිර රටවල බෞද්ධ වැඩ පිළිවෙළ ගැන මහානායක හාමුදුරුවන් තවත් තොරතුරු ටිකක් ප්‍රකාශ කළොත් හොඳයි!''**

''ඒ රටවල බොහෝදෙනා ඉස්සරවෙලා භාවනාවට බහිනවා. බොහෝම භාවනා මධ්‍යස්ථාන තියෙනවා. ඒ හැම තැනම වගේ

උගන්වන්නේ සතිපට්ඨාන භාවනාව. ලංකාවෙන්, බුරුමෙන්, සියමෙන්, ගිය අය තමයි ඒ කටයුතුවල යෙදිලා ඉන්නේ. ඒ මගින් බොහෝදෙනා බෞද්ධයන් වෙනිවා. එංගලන්තෙ ගැන කියතොත් එහේ ප්‍රසිද්ධ උගත් බෞද්ධයන් ඉන්නවා. ඒ වගේම සීයකට වැඩිය බෞද්ධ මධ්‍යස්ථාන තියෙනවා. ස්කොට්ලන්තයේත් දැන් බෞද්ධ මධ්‍යස්ථාන තියෙනවා. මගේ දැනීමේ හැටියට බටහිර රටවලින් වැඩිපුර බුද්ධාගම දියුණු තත්වයක් දකින්ට ලැබෙන්නේ එංගලන්තේ. ඊළඟට ප්‍රංශයේ සහ ජර්මනියේ, බුදු දහම නැගීගෙන එනවා. ඇමරිකාවේ දැන් හැම තැනම වගේ පන්සල් හැදීගෙන එනවා. මේ වැඩ පිළිවෙළවල් නිසා සමහර උගත් ඇමරිකන් කාරයන් දැන් බෞද්ධයන් වී ගෙන යනවා."

"මැන්චෙස්ටර් නුවර තියෙනවා සමථ විහාරය කියලා තැනක්. එතන ඉන්න 'කසින්ස්' මහත්මා, මැන්චෙස්ටර් විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වරයෙක්. එතුමා පාලි සහ අභිධර්මය උගතෙක්. උන්නැහැ ඒ නගරයේ බෞද්ධයන්ට අභිධර්මය උගන්වනවා. දැන් බොහෝ දුරට උගන්වලා තියෙනවා. මා එහාට ගියාම ආරාධනා කරන්නේම අභිධර්ම මාතෘකාවක් උඩ දේශනාවක් කරන්ට කියලයි. හැන්දෑවට තුන් හාරසීයක් එනවා. ඒ අය බුදුන් වැඳලා භාවනා කරනවා. ඉතින් එක සැරයක් එහාට ගිය වතාවක මට කිව්වා, අභිධර්මාර්ථ සංග්‍රහය දැන් ඉවරයි, දැන් ධම්මසංගණිය යි ඉගෙන ගන්නේ, අපට එහි මාතෘකා යටතේ කතා පවත්වන්ට කියලා. සුමාන දෙකක් මා එහේ සිටියා. දවසක් ඇර දවසක් ධම්මසංගණී මාතෘකා යටතේ කතා පැවැත්වුවා. ඉතින් ඒ අතර ප්‍රශ්න අහනවා. ඒවා ඒ අයට විසඳලා දෙනවා. ඒ අය පැයක් විතර බුදු මැඳුරේ බිම පළක් බැඳ ඉඳගෙන භාවනා කරනවා."

"අවුරුද්දකට විතර පස්සේ දෙවන වතාවට මා ගියාම ඒ අය කිව්වා, දැන් අප ඉගෙන ගන්නේ අභිධර්මාවතාරයයි. අපට ඒකේ මාතෘකා විස්තර කරලා දෙන්න කියලා. ඉතින් එහේ හිටිය සුමාන දෙක තුළ අභිධර්මාවතාරයේ සමහර තැන් විස්තර කොට කතා කළා. මේ විදියට 'මැන්චෙස්ටර්' නගරයේ බෞද්ධ කටයුතු හරිම දියුණු තත්වයක තියෙන්නේ. විශ්වවිද්‍යාලයේ බොහොම බෞද්ධයන් ඉන්නවා. ඒ අතර උගත් ආචාර්යවරු සිටිනවා. ඒ අය සමථ විහාරය කියලා හදලා තියෙන එක ඉස්සර පල්ලියක්. පල්ලියට

මිනිසුන් එන්නේ නැති වුණාම ඒක ආණ්ඩුවට විකුණලා තියෙනවා. පස්සේ මේ බෞද්ධ මණ්ඩලය එකතුවෙලා ආණ්ඩුවෙන් ඒක බද්දට අරගෙන මේ සමථ විහාරය පවත්වා ගෙන යනවා.”

“ලංඩන්වල ඉඳලා හැතැක්ම දෙසීය පනහකට විතර එහා වේල්ස්වල කතරගම දේවාලයකුත් තියෙනවා. එතන ඉන්න කපුරාල තමයි පාතදූරේ සුභ්‍රා සිල්වා කියන මහත්මයා. එතන හුහාක් හාස්කම් තියෙනවා කියලා විශ්වාස කරනවා. මෙහේ කතරගමින් තමයි සියලුම කළමනා ගෙනියන්නේ. එහෙත් පෙරහැර බොහොම දියුණුවට කරනවා. එතන කන්ද උඩ දැන් චෛත්‍යයකුත් හදනවා. අක්කර සීයක් මුදලට අරන් තියෙනවා. දැන් එහි වැඩ ඉවර ඇති. එතන බෞද්ධ සිද්ධස්ථානයක් හදලා භික්ෂූන් වහන්සේ කෙනකු නවත්වා ගන්නත් එයාගේ බලාපොරොත්තුවක් තිබුණා. ඉතින් ඒ කටයුතු කෙරුණද කියන්න මා දන්නේ නැහැ. එහේ ඉන්න ඉංග්‍රීසි කාරයන් තමයි එයාගේ ගෝලයෝ. ශ්ලෝක ස්තෝත්‍ර ඒ අයට බොහොම හොඳට පාඩම්. කතරගම දෙවියෝ ජීවමාන කෙනෙක්. අවංකව ශාසන දියුණුවට උපකාර ඉල්ලුවොත් සහයෝගය දෙතැයි මගේ විශ්වාසයයි.”

# 10

# ධර්මපාලතුමා සමග වාද කරලා දිනන්න අමාරුයි

"ධර්මපාලතුමන් සමග මගේ සම්බන්ධය ඇති වුණේ මා කුඩා කාලයේදීමයි. එතකොට මට වයස දහඅටක් විතර ඇති. බළන්ගොඩ බුලත්ගම (උඩුමුල්ල) පන්සලේ මා ඉගෙන ගන්නා කාලේ එතුමාට මා මුලින්ම ලියුමක් ඇරියා. ඒකට හේතුව ඒ කාලේ නිතරම සිංහළ බෞද්ධයා පත්‍රය අපේ පන්සලට ලැබෙනවා. මා ඒක කියවනවා. ඉතින් ඒවා කියවීමෙන් පිටරට ධර්ම ප්‍රචාරක කටයුතුවලට මා පුරුදු පුහුණු විය යුතුයි කියලා මගේ හිත ඒ පැත්තට නැමුණා. කලිනුත් ඒ අදහස තිබුණත් එතුමාගේ ලියවිලි නිසා මගේ බලාපොරොත්තුව තවත් දැඩි වුණා."

"ඉතින් ඔය අතර තමයි මගේ අදහස ලියලා මා එතුමාට ලියුමක් යැව්වේ. ඒකට උන්නැහේ මට උත්තර එව්වා. 'පොඩි උන්නාන්සේගේ අදහස බොහොම හොඳයි, මා ඒකට ස්තුති කරනවා, ඕනෑම දවසක මෙහේ එන්න, කැමති නම් මට දැනුම් දෙන්න, මම මහාබෝධි සමාගම ගානේ මෙහාට ගෙන්වලා ඉංග්‍රීසි, හින්දි, බෙංගලි ආදී භාෂාවන් උගන්වන්නම්, ඊට පස්සේ මෙහේ ධර්ම ප්‍රචාරක වැඩවල යෙදෙන්ට පුළුවන්' කියලා. මගේ ලියුම් ගොඩේ තවම ඒ ලියුම ඇති."

"ධර්මපාලතුමාගෙන් මට ලැබුණ මේ ලිපිය මා අපේ ලොකුහාමුදුරුවන්ට පෙන්නුවා. 'පොඩි උන්නාන්සේ තවම පුංචි වැඩියිනේ, තව නෑනේ පාලි ටිකවත් අවසන් කළේ, තව අභිධර්ම පැත්ත හරියට ඉගෙන ගත්තෙත් නැහැනේ, ඒවා ඉවර කරලාම මේ ගමන යන එක හොඳයි, ඒක නිසා තව ටිකක් පහු කරන්න' කියලා ලොකුහාමුදුරුවන් වදළා. ඉතින් මේ කාරණය මා ධර්මපාලතුමාට ලියලා යැව්වාම එතුමා ඒකට කැමති වුණා."

"වර්ෂ එකදහස් නවසිය දහනවයේදී තමයි මා ආනන්ද කොලීජියට ගියේ. මා එහේ ඉන්න අතර උන්නැහේ ඉන්දියාවේ ඉඳලා ලංකාවට ආවා. ඔය අවුරුදු ගණනාවකට පස්සෙයි එතුමා ලංකාවට ආවේ. ඉතින් මා උන්නැහේ හමුවෙන්න ගියා. දැන් මහාබෝධිය තියෙන තැන පාර අද්දර පොඩි ගෙයක් තිබුණා. එතන තමයි උන්නැහේ හිටියේ. ඔය කාලේ උන්නැහේ නිතර නිතර හැම ඉරිදා සෙනසුරාදාවකම වගේ ආනන්ද කොලීජියටත් එනවා. ඇවිල්ලා මාත් එක්ක කතා කර කර ඉන්නවා. හැමදාම වගේ එන්නේ උදේ වරුවේ. මේ විදියට බොහොම මිත්‍ර කමක් අප දෙන්නා අතර ඇති වුණා."

"දවසක් එතුමා ඇවිදිල්ලා මාත් සමග කතා කර කර ඉන්න විට කිව්වා, 'පිටරටින් පූජක පිරිසක් ඇවිදිල්ලා මෙහේ ක්‍රිස්තියානි ධර්මය ප්‍රචාරය කිරීමේ වැඩ පිළිවෙළක් කරගෙන යනවා. ඒ ගොල්ලෝ ඒක පටන් අරන් තියෙන්නේ මහනුවරින්, ඒ පිරිසට දහ දෙනෙක් විතර ඉන්නවා, ඒ අය එලවා දන්න අපි යමුද?' කියලා මගෙන් ඇහුවා. මා කිව්වා, 'හොඳයි! මාත් ලෑස්ති වෙන්නම්' කියලා. 'හොඳයි එහෙමනම් තමුන්නාන්සේත් ලෑස්ති වෙන්නකෝ, අපි දෙන්න යමු' කියලා එතුමා කිව්වා. ඉතින් ඔය කාලේ වෙනකොට මාත් ක්‍රිස්තියානි කාරයින් එක්ක පත්තරෙන් වාද විවාද කර කර හිටියේ. ඒ නිසා මා උන්නැහේගේ අදහසට හරියට කැමති වුණා."

"මහ ලොකු ලොරියක් වගේ පිළියෙළ කරගත් වාහනයක් උන්නැහේට තිබුණා. ඒකට කිව්වේ "සෝබන මාළිගාව" කියලා. නිදාගන්ට, කෑම කන්ට, අවශ්‍ය විදියට ඔක්කෝම ඒකේ සකස් කරලා තියෙනවා. එහෙනම් මේකෙන් යමු කියලා මාත් සමග උන්නැහේ පිටත් වුණා. මහනුවරට ගිහිල්ලා එතුමා විසින්ම ආරම්භ කරන ලද සාමණෙර විද්‍යාලයේ නතර වුණා. මා කිව්වා 'මා මාළිගාදර්ශනාරාමයට නතර වෙන්න යනවා' කියලා."

"ඒ කාලයේ මල්වත්තේ මහානායක පදවිය දැරුවේ අඹන්වැල්ලේ මහානායක හාමුදුරුවෝ. උන් වහන්සේ මා එක්ක හරිම යාළුයි. ඉතින් මා එහාට ගියාම ඒ හාමුදුරුවෝ කිව්වා, 'මේ ටිකේ මෙහෙ නවතින්න' කියලා. මට මතක හැටියට එය අගෝස්තු මාසයක් වෙන්න ඕනෑ. ආනන්ද කොලීජියෙත් නිවාඩු කාලේ."

"ඉතින් පහුවද මා ධර්මපාලතුමත් ඉන්න තැනට ගියා. එහෙම නම් තමුන්නාන්සෙට වීථි දේශනාවට අවසර ගන්න එපායැ, කියලා පොලිසියට ගියා. වීථි දේශනාවට මට අවසර දුන්නා. උන්නැහේ අත්සන් කළා, වග කියන්නා හැටියට. ඒ කාලයේ හැටියට වීථිවල දේශනා කරනවා නම් ආණ්ඩුවෙන් අවසර ගන්න ඕනෑ. ඉතින් එද හැන්දෑවේ අර කණ්ඩායම මේ ක්‍රිස්තියානි ධර්මය දේශනා කරන්නේ කොහේද කියලා අප හොයලා බැලුවා. සෝබන මාලිගාවේ නැගලා අප දෙන්න පිටත් වුණා. ටික දුරක් යන කොට පිරිසක් රැස්වෙලා ඉන්නවා දැක්කා. එක්කෝ ඉංග්‍රීසි නැත්නම් වෙනත් යුරෝපීය ජාතිකයන් වෙන්න ඕනෑ ඒ පූජක පිරිස. ඒ අය ඉංග්‍රීසියෙන් කතා කරන අතර තව කෙනෙක් ඒක සිංහලෙන් ප්‍රකාශ කරනවා. ඉතින් මේ අය පේන තෙක් මානයේ අපේ වාහනය නැවැත්තුවා. ඒ වාහනයේ ඉස්සරහ කෑල්ලේ තිබුණා හිටගෙන ඉන්න තැනක් හදලා. ධර්මපාලතුමා ඒකේ හිට ගත්තාම ඈත දේශනාව අහන්න වටවෙලා ඉන්න පිරිස දැක්කා ධර්මපාලතුමා ඇවිත් ඉන්න බව. ඔක්කෝම දෙනා දුවගෙන අප ඉන්න තැනට ආවා. ඒ පාර උන්නැහැ කොටින් දේශනාවක් කරලා, මට කිව්වා, 'දැන් දේශනාව පටන් ගන්න' කියලා. මා ඊළඟට නැගිටලා දේශනාව පටන් ගත්තා. මා කළේ ක්‍රිස්තියානිය විවේචනය කිරීමක්."

"සෙනග කවුරුවත් නැති වුණ නිසා අර පූජක පිරිස වෙනින් දිහාවකට යන්න ගියා. අපත් කෙටියෙන් දේශනාව ඉවර කරලා අර අය ගියේ කොහේද කියල බලන්න ඒ පැත්තටම ගියා. යන කොට පළමු සේම පිරිසක් රැස්වෙලා ඒ ගොල්ලන්ගේ දේශනාව අහනවා. අපත් ඒ කිට්ටුවම අපේ වාහනේ නවත්වලා ඉස්සර වෙලා වගේම දේශනාව පටන් ගත්තා. එතන මිනිසුන් ටික අප වෙතට ආවා. ඔය විදියට එද උදේ ඉඳලා හැන්දෑවෙන කල්ම ක්‍රිස්තියානි දේශකයන් පස්සේ ඇවිද්ද. ඔහොම දවස් දෙකක් තුනක් කළා. එතනින්ම ඒක නවත්වලා ඒ ගොල්ලෝ වැඩේ අත්හැරලා යන්ට ගියා. එයින්ම ඒ අයගේ වැඩ පිළිවෙළ නැති වුණා."

"ඊට දවස් හත අටකට පස්සේ අප කොළඹට ආවා. දවසක් උන්නැහේ කතා කරලා කිව්වා, 'මා යනවා අපේ මෑණියන්ගේ කොල්ලුපිටියේ ගෙදරට, එහේ දවස් කීපයක් නවතිනවා, ඔබ

වහන්සේ හෙට එහාට දවල් දනෙට එන්න ඕනෑ!' කියලා. ඒ කාලේ දැන් විතර ටැක්සි නැහැ. එහෙ මෙහෙ යන්නේ රික්ෂෝ එකෙන්. ඉතින් ආනන්ද කොලීජියේ ඉඳලා කොල්ලුපිටියේ ඒ ගෙදරට මා ගියා. රික්ෂෝ කාරයා ගේ ළඟට ගෙනත් නැවැත්තුවා. ධර්මපාලතුමා එළියට ආවා. කීයද ගාණ කියලා එතුමා ඇහුවාම, සත හැත්තෑ පහයි කියලා රික්ෂෝ කාරයා කිව්වා. ඒ ගාණ උන්නැහේ ගෙවලා ඔහු යවලා ගෙට ආවා. ඊට පස්සේ උන්නැහේ මැණියන්ට කතා කරලා, 'අම්මේ! මෙන්න බොහොම හොඳ හාමුදුරුනමක් වැඩියා, අපි අද මේ හාමුදුරුවන්ට දනේ දෙමු' කියලා කිව්වා. ඔය උන්නාන්සේ මාළු එහෙම වළඳනවද කියලා ඒ අම්මා ඇහුවා. ධර්මපාලතුමා මට කිව්වා, 'ඔබ වහන්සේ වළඳනවානම් කියන්න, ඒවා ලෑස්ති කරන්න පුළුවන්' කියලා. මා කීවා, 'මා ඒවාට විරුද්ධයි' කියලා. ඒවා එපා කිව්වාම 'එහෙම නම් අම්මේ! එළවළු විතරක් හදන්න' කියලා එතුමා කිව්වා."

"ඉතින් අප දෙන්නා කතා කර කර හිටියා. එහෙම ඉන්න ගමන් එතුමා මගෙන් ඇහුවා, 'තමුන්නාන්සේ ළඟ සල්លි එහෙම නැද්ද?' කියලා. මා 'නෑ' කිව්වා. 'ඇයි ඔය උගන්වනවට පඩියක් නැද්ද? තමුන්නාන්සේ රිජිස්ටර් වෙලාද?' කියලා ඇහුවා."

"මා කිව්වා, 'ඔව්' කියලා. ඒ කාලේ පළපුරුදු ගුරුවරුන් අන්තිම වතාවට රිජිස්ටර් කළා. ඒ ලැයිස්තුවට මගේ නමත් කුලරත්න මහත්තයා ඇතුළත් කළා. 'ෆස්ට් ක්ලාස් ඉංගිලිස් සර්ටිපිකේට්' ගුරුවරයකු හැටියට යි ආනන්ද කොලිජියට මගේ නම රිජිස්ටර් කළේ. ඒ අනුව මට මතක ඇති හැටියට රුපියල් දෙසිය දහයක් වගේ මුදලක් දීමනාවක් හැටියට පටන් ගැනීමේදී නියමිතව තිබුණා. කුලරත්න උන්නැහේ ඒ මුදල මට බාර ගන්න කිව්වාම මා කැමති වුණේ නැහැ. 'ඔබ වහන්සේගේ වැඩවලට ඒව යොදා ගන්න' කියලා, ඒ මහතා මට කිව්වා. ගිහියන් යටතේ කුලියට වැඩ කරන්න මා කැමති වුණේ නැහැ. ඒ හැඟීම මා තුළ තිබුණා. ඉතින් තමුන්නාන්සේ මේක බාර ගත්ත කියලා අත්සන් නොසොළොත් ඒ ග්‍රාන්ට් එක ගෙවීම සම්පූර්ණයෙන්ම කපලා දනවා. ඒ නිසා ඒක බාර ගන්නය කියලා ඒ මහතා නැවත ඉල්ලා හිටියා. මා කිව්වා 'එහෙම නම් මම ඒක ගත්ත හැටියට අත්සන් කරන්නම්, ඒත් ඒ මුදල අසරණ දුප්පත් ළමයින්ට ශිෂ්‍යත්ව දීමට ආනන්ද

කොලීජියේ පිහිටුවල තිබුණ අරමුදලට 'මා වෙනුවෙන් දුන්න' කියලා. ඉතින් ඒක ඒ විදියට ක්‍රියාත්මක වුණා, කියලා මා කිව්වා."

"එතකොට තමුන්නාන්සේගේ ගමන් වියදම් කොහොමද කියලා ධර්මපාලතුමා මගෙන් ඇහුවා. ඒ කාලයේ කොලීජිය ආණ්ඩුවට අයිති එකක් නොවෙයි. ඒක අයිතිව තිබුණේ පරමවිඥානාර්ථ බෞද්ධ සමිතියට. ඉතින් කොලීජියේ පුණ්‍ය කටයුතු සඳහා මාස්පතා රුපියල් පන්සීයක් වෙන් කරනවා. මට කොහේවත් යන්න ඕනෑ වුණොත්, බළන්ගොඩට හරි ඉන්දියාවට හරි, ඒකෙන් මුදල් ඉල්ලා ගන්නවා. මා වියදමට මුදල් ලබා ගන්නේ එහෙමයි, කියලා එතුමාට කිව්වා."

"'තමුන්නාන්සේ අර විදියට මුදල් ගැනීම ප්‍රතික්ෂේප කළේ 'ජාතරූප රජත සික්ඛා පදය, කැඩෙයි කියලා බයවෙලා වත්ද?' කියලා උන්නැහේ හිනාවෙලා ඇහුව්වා. මා කිව්වා 'ඒකත් ඉතින් කඩවෙනවා නේද?' කියලා."

'ජාත රූප රජත කියන්නේ මොනවාද?' නැවත එතුමා ඇහුව්වා.

මා කිව්වා, 'රන් රිදී' කියලා.

'ඉතින් ඒ අය දෙන්නේ රන් රිදී ද?' කියලා එතුමා ප්‍රශ්න කළා.

මා කිව්වා, 'ඉතින් අප ඔය ජාතරූප රජත සික්ඛාපදය තෝරන කොට අටුවාවත් අනුව, සිංහල පොත්වල රන් රිදී මසු කහවණු කියලනේ තියෙන්නේ'.

"ඉතින් උන්නැහේ කිව්වා, 'අද හිටිය භික්ෂූන් වහන්සේලාට මිලමුදල් කිසිවක් ඕනෑ කළේ නෑ. බෞද්ධ රජවරුන්ගේ කාලයේ උන්වහන්සේලාට සියල්ලම නොමිලේ ලැබුණා. ඒ නිසා ඒ පැවතිච්ච ක්‍රමය අනුවයි සික්ඛාපද සමහර ඒවා තේරුම් කළේ. ඒ නිසා 'ජාතරූප රජත' කියන එකට රන් රිදී මසු කහවණු මිල මුදල් ආදිය ඔක්කොම ඇතුළත් කරලා තෝරලා තියෙනවා. නමුත් සික්ඛාපදයේ නියම අර්ථය ගන්න නම් බුදුහාමුදුරුවන් ඕක පැනෙව්වේ මොන හේතුවක් නිසාද කියලා නිදන කථාව බලන්න ඕනෑ. එතකොට රන් රිදී එපා කිව්වේ ඇයි කියලා, දැන ගන්න පුළුවන්' කියලා, එතුමා කිව්වා."

" 'එද දඹදිව මිනිස්සුන්ගේ පොහොසත්කම මනින්නේ මෙච්චර අමුරන් තියෙනවා. සුද්ද කරපු රත්තරන් මෙච්චර තියෙනවා, මෙච්චර රිදී තියෙනවා, කියලා සුද්ද කළ හෝ නොකළ රන් රිදී දෙකෙන් තමයි. පොහොසත් ගිහියන්ගේ පොහොසත්කම මනින දේ තමයි එද රන් රිදී දෙක. තඹ පිත්තල ආදිය නෙවෙයි. ඉතින් බුදුහාමුදුරුවන් භික්ෂූන්ට රන් රිදී එපා, ඒක ගැළපෙන්නේ නෑ, ඒක ගිහියන්ට අයිති එකක් කියලයි, සික්ඛාපදය වදළේ. කාසි වශයෙන් පාවිච්චි වුණත් තුනත් රත්තරන් රිදී ගැළපෙන්නේ නැහැ, ඕකයි නිදන කථාව, ඉතින් ඔබ වහන්සේ කියන්නේ මොනවාද?' කියලා එතුමා ඇහුව්වා. මා කථා කළේ නැහැ. පස්සේ මා කිව්වා, 'භික්ෂූන් වහන්සේලාට ගනුදෙනු හොඳ නෑනේ!' කියලා."

"ඉතින් ඒක ජාත රූප රජත සික්ඛාපදය නොවෙයි, 'කය වික්කය සික්ඛාපදයනේ' කියලා එතුමා කිව්වා. 'ඉතින් ඒකේ හැටියට තමුන්නාන්සේට සිද්ද වෙන වැරැද්ද මොකක්ද?' කියලත් එතුමා ඇහුව්වා. ඔය දන් සල්ලි කියලා කියන රුපියල් පහේ දහයේ කොළ කෑලි අහුවෙනවද ඒකට? ඉතින් මා කිව්වා, 'බුදුහාමුදුරුවන් කය වික්කය සික්ඛාපදය පැනෙව්වේ මොන එකකටවත් ගිහියන් එක්ක ගනුදෙනු කරන්න එපා' කියලා බව."

"තමුන්නාන්සේ මුද්දර පාවිච්චි කරනවාද?' මා 'ඔව්' කිව්වා. 'ඇයි මුද්දර පාවිච්චි කරන්නේ? ඒකෙත් තියෙනවානේ වටිනකමක්. රාජ්‍ය සම්මත දෙයක් ඒක.' ජාත රූප රජත කියන එකට ඔය තමුන්නාන්සේලා තෝරන හැටියට අහු නොවන දෙයක් මොකවත් නෑනේ!' කියලා එතුමා කිව්වා."

"බුදුහාමුදුරුවන් තුන් කාලය පෙනෙන කෙනෙක් කියලා ඔබ වහන්සේ විශ්වාස කරනවද? මා කිව්වා, 'ඔව්' කියලා. අනාගතයේ භික්ෂූන් වහන්සේලාට මිල මුදල් ප්‍රශ්නය බලපාන බව උන්වහන්සේ දැක්කේ නැද්ද? ඔව් දකින්න ඇති. 'එහෙම නම් ඒකට කරදරයක් නොවන විදියට උන්වහන්සේ මොකවත් පිළියමක් කරලා නැද්ද?' මා කිව්වා, 'මා දන්නේ නැහැ' අටුවාවලට අනුවයි මා කතා කරන්නේ කියලා."

"එතුමා කිව්වා 'භික්ෂූන් වහන්සේලා සික්ඛාපද තෝරන්නේ අකුරුවල හැටියටයි. වචනවල අදහස නොවෙයි බලන්නේ. ඒ නිසා

තමන්ට පිළිපදින්න බැරි විදියට සික්ඛා පදය තෝරා ගන්නවා. බුදුහාමුදුරුවන් සික්ඛාපද පැනෙව්වේ, භික්ෂූන් වහන්සේලාගේ පහසුවට නේද? නමුත් දැන් ඒවා අපහසුවට යෙදිලා නේද? දැන් තමුන්නාන්සේට බෙහෙත් හේත් ටිකක් ගන්න ඕනෑ වුණා කියමුකෝ. ඉතින් ඒ ගැන දායකයන්ට කිව්වාම ඒ බේත් හේත් ටිකක් ගණන් වැඩි නම් ඉතින් කොයි දායකයද ඒක අරන් දෙන්නේ?' "

"මා කිව්වා, 'එහෙම අය කලාතුරකින් හම්බ වෙන්නේ' කියලා. එතුමා ඇහුවා 'අසනීප වෙච්ච වෙලාවටම ඔය කලාතුරකින් හම්බ වෙන කෙනා ඉදිරිපත් වෙන්නේ කොහොමද?' කියලා. 'එහෙම හම්බ නුනොත් මොකද කරන්නේ!' කියලා ඇහුවා. 'බෙහෙත් පාවිච්චි නොකර ලෙඩේ වැඩි කරගෙන මැරෙන්නද? බුදුහාමුදුරුවන් එහෙම එකකට ඉඩ තියලද ඔය සික්ඛාපද පැනෙව්වේ ?' කියලා එතුමා ඇහුවා."

"ධර්මපාලතුමා සමග වාද කරලා මට දිනන්න බැහැ. මා නිහඬ වුණා. පස්සේ උන්නැහේ ඇහුවා 'බුදුහාමුදුරුවන් පිරිනිවන් මංචකයේ ඉඳීදී සංඝයා කැමතිනම් ඛුද්දානුඛුද්දක සික්ඛාපද අවලංගු කර ගත්තාට කමක් නැහැ කියල වදාළා නේද?' කියලා. මා 'ඔව්' කිව්වා. මොනවද ඒ ඛුද්දානුඛුද්දක සික්ඛාපද? මා කිව්වා, 'ඒක ඒ කාලේ පැහැදිලිව තෝරලා නැහැ' කියලා. 'ඇයි තේරුවේ නැත්තේ?' මා කිව්වා, 'ආනන්ද හාමුදුරුවන් ඒ ගැන බුදුහාමුදුරුවන්ගෙන් අහලා තෝරා ගත්තේ නැහැ' කියලා. භික්ෂූන් වහන්සේලා ආනන්ද හාමුදුරුවන්ට දෙස් කියා තිබෙන බව. 'ඉතින් ඇයි එහෙම ඇහුවේ නැත්තේ?' කියලා එතුමා ප්‍රශ්න කරලා, 'එහෙම ඇහුවේ නැත්තේ ඒක බොහොම සුළු දෙයක් නිසයි. අහන්න දෙයක් නොවෙයි' එතුමා ම පිළිතුරු දුන්නා. 'ඉතින් මේ ගැන ධර්මපාලතුමා හිතන්නේ කොහොමද?' කියලා මා ඇහුවා. 'ඔබ වහන්සේලාගේ විනය පොත් බලන්න. ප්‍රඥප්ති වද්‍ය, ලෝක වද්‍ය කියලා වැරදි දෙවගයක් එනවා. සමහර සික්ඛාපද ලෝක වද්‍ය, ප්‍රඥප්ති වද්‍ය දෙකටම ඇතුළත්. සමහරක් ප්‍රඥප්ති වද්‍ය පමණයි. ලෝක වද්‍ය කියන්නේ දස අකුසලයට, අහු වෙන ඒවා. බුදුහාමුදුරුවන් පැනෙව්වත් නැතත් අකුසල් අකුසල්මයි. සමහර සික්ඛාපද කඩ කළාම අකුසල් සිද්ද වෙනවා. බුදුරජුන් පනවාපු සංඝ සභාවේ පාලන නීතියක් කඩවෙනවා. හෙවත් ඇවැත් සිද්දවෙනවා.

ඇවතයි අකුසලයයි දෙකම සිද්ද වෙනවා එකට. ප්‍රාණඝාතයෙන් පාචිත්තිය ඇවැතට පත් වෙනවා. ඒ එක්කම අකුසලයකුත් සිද්ද වෙනවා. නමුත් විනය සික්ඛාපද රකින භික්ෂුවක් හැටියට ඇවැත් දෙසුවම එයින් පිරිසිදු වෙනවා. ඒත් අකුසලයෙන් නිදහස් වෙන්නේ නැහැ.''

''තමුන්නාන්සේ ඕක ගැන හිතලා තියෙනවාද?' කියලා එතුමා ඇහුවා. මා කිව්වා, 'ඔව්' කියලා. ඒවා ප්‍රඥප්ති වද්‍යත් ලෝක වද්‍යත් දෙකටම අයත් ඒවා. නමුත් ප්‍රඥප්ති වද්‍ය පමණක්ම සිදුවන සික්ඛාපද තියෙනවා. 'ඉඳගෙන ඉන්න කෙනෙකුට හිටගෙන බණ කියන්න එපා කියලා පනවා තිබෙනවා නේද?' මා 'ඔව්' කිව්වා. 'එය ඉන්දියාවේ චාරිත්‍රය අනුවයි. අද එංගලන්තයට ගියොත් පිරිස ඉඳගෙන ඉන්නවා. කපිකයා හිටගෙන. ඒක ඒ රටේ චාරිත්‍රය. එහෙම නැතිව චාරිත්‍රයට පටහැණි වුණොත් මිනිසුන් ඒකට කැමති වෙන්නේ නැහැ. ඉතින් ඒ චාරිත්‍රයට අනුව පවතින විට අර විනය සික්ඛාපදය කඩවෙනවද? ඒවා රටේ හැටියට වෙනස් කර ගන්නට කමක් නෑ නේද?''

''ඔය මිල මුදල් පිළිබඳ සික්ඛාපදයත් මා කල්පනා කරන්නේ ඔන්න ඔය ගණයට අයිති හැටියටයි. මිල මුදල් පරිහරණය අකුසලයක් නම් ගිහියන්ටත් අකුසලයක් වෙන්න ඕනෑ. භික්ෂුවට විතරක් මොකද ඒක අකුසලයක් වෙන්නේ. භික්ෂු සමාජයේ පහසුව සලකා ගෙන බුදුහාමුදුරුවන් ඔය කයවික්කයට බහින්න එපා කිව්වේ. නමුත් භික්ෂුවට භික්ෂුවක් එක්ක ගනුදෙනු කළාට කමක් නැහැ. ඒ ගනුදෙනු කරන්නේ මොනවායින්ද? අද ගනුදෙනු කරන්නේ ඔය රුපියල් පහේ දහයේ කඩදාසි වලින්. ඉතින් භික්ෂුවක් සමග කයවික්කය පුළුවනි. ගිහියන් එක්කයි බැරි. එතන කයවික්කය සික්ඛාපදය වෙනම එකක්. ජාත රූප රජත සික්ඛාපදය වෙනම එකක්. ඔය දෙකම ඔබ වහන්සේලා පටලවා ගෙන. ජාත රූප රජත සික්ඛාපදයට බුදුහාමුදුරුවන් වදාළ කය වික්කය සික්ඛාපදය පටලවා ගෙන. කයවික්කයට කියපුව අනිකට පටලවාගෙන. අන්තිමට අත්පා බැඳපු මිනිස්සුන්ට වගේ තමුන්නාන්සේලාට මොකවත් කර ගන්න බැහැ. ඉතින් ඔන්න ඔය විදියේ අවුලකට තමුන්නාන්සේලා පත්වෙලා තියෙන්නේ. ඒ නිසා ඔය අවුල බේරා ගන්න' කියලා එතුමා කිව්වා.''

"දැන් ඇමරිකාවේ පවත්වන ආගමික සභාවකට එන්න කියලා හදිසියේ තමුන්නාන්සේට ආරාධනාවක් ලැබෙනව, බුද්ධ ධර්මය ගැන දේශනයක් පවත්වන්න. ඉතින් තමුන්නාන්සේට ඒකට පුළුවන්කම තියෙනවා. කැමැත්ත තියෙනවා. නමුත් යන්නේ කොහොමද?"

"මා කිව්වා, 'කාටවත් කීවාම පුළුවන් වෙයි කියලා.' ඔව්! දෙයි තමුන්නාන්සේට, ඔය පොහොසත් මිනිස්සුන්ට ගිහින් කිව්වාම ඔවුන් කියයි 'ඕකට තමුන්නාන්සේ යන්න ඕනෑ නැහැ! ඕකට යන්න වෙනින් අය ඉන්නවා' කියලා. 'ඔහොම කියලා මගඅරිනවා අර සල්ලි දෙන්න වෙනවට. කොයි මිනිහත් ඔහොමයි. මේ මා පිටරට යන්නේ අනුන්ගේ ඔය සල්ලිවලින් නොවෙයි. මගේ පියාගේ බුදලයෙන් මට වෙන් කරලා තියෙනවා කොටසක්. මා ඒවා වියදම් කරලයි පිටරටවල ඇවිද්දේ. ඇවිදලා වැඩ කරන කොට තමයි මේ මිනිසුන් ආධාර දෙන්න පටන් ගත්තේ. එහෙම නැත්තම් දෙන්නේ නැහැ. කවුරුත් දෙන්න කැමති වෙන්නේ පුළුවන් කාරයටමයි. ඔය අපේ සිංහල මිනිහගේ හැටි. ඒක නිසා ඔය මිනිසුන් කෙරෙහි වැඩි විශ්වාසය තබන්න එපා. ඒ අයගෙන් පිහිටක් බලාපොරොත්තු වෙන්න එපා. තමන්ට කියලා හදිසියේ හෙම වැදගත් කටයුත්තකට අවශ්‍ය වුණොත් ගන්න සල්ලි ටිකක් බැංකුවේ ද ගන්න. එතකොට එක එක්කෙනාට අතපාන්න වෙන්නේ නැහැ' කියලා උන්නැහේ ඔය විදියට කරුණු කියාගෙන ගියා."

"දැන් සල්ලි පරිහරණය කළාම ඔය විනය පොතේ තෝරන හැටියට තමුන්නාන්සේ හිතනවා, ඒකෙන් පාචිත්තය ඇවතක් සිද්ධ වෙනවා' කියලා. නමුත් ඒ සල්ලි යොදවලා පිටරට ගිහින් ධර්ම ප්‍රචාරක කටයුතුවල යෙදිලා බොහෝ දෙනකුට බුද්ධාගම ගැන පැහැදෙන්න කරුණු කියලා තමුන්නාන්සේ එනවා කියලා හිතමු. මෙතනදී තමුන්නාන්සේට සිදු වෙච්ච පාචිත්තිය ඇවතද වඩා වැදගත්? නැත්තම් තමුන්නාන්සේගෙන් ඉටු වුණ වැදගත් ශාසනික මෙහෙයද? සිදුවෙන ඇවත ඇවැත් දෙසා ගැනීමෙන් අයින් කර ගන්න පුළුවන්. ඒත් සල්ලි ටික අහක දලා ඇවතට බයෙන් මෙහේ ඉඳීමෙන් අර වැදගත් ශාසනික මෙහෙය ඉටු වෙන්නේ නෑ නේද?"

"ධර්මපාලතුමා එක්ක කතා කරලා බේරෙන්න බැහැ. ඒත් මා කිව්වා, 'කොහොම වුණත් මිල මුදල් තියා ගන්න එක භික්ෂූන්

එහන්සේට හරි නෑ කියලා'. 'හා හොඳයි! මම ඒකත් තමුන්නාන්සේට කියන්නම්. අද ලෝකේ සල්ලි නැතුව මොකවත් කරන්න බැහැ. බෙහෙතක් ගන්නවත් බැහැ. භික්ෂුන් වහන්සේ කෙනකුට රේල්ලුවේ යන්නවත් බැහැ. තමුන් යන්න වෙනවා. ඉතින් කොහොමද යන්නේ?' මා ඒකට කතා කළේ නැහැ."

"හොඳයි තමුන්නාන්සේ දන් හිතන්න තමුන්නාන්සේට යන්න තියෙන පාරක කවුරුන් හරි මළ මූත්‍රා කරලා අපිරිසිදු කරලා තියෙනවා නම්, යන්න වෙනින් පාරක් නැත්නම්, ලොකු වැදගත් වැඩකට ඒ පාරෙන් එහා පැත්තට යන්න ඕනෑකම තියෙනව නම් නොගිහින් ඉන්නවද? නෑ නේද? ඒවා පාගගෙන ගිහිල්ලා කකුල් දෙක හෝදගෙන හෝ අර වැදගත් අරමුණ ඉටුකර ගන්නවා නේද? එහෙම නම් මේ සල්ලි නිසා ඇවැත් සිද්ධ වෙනවා කියලා තමුන්නාන්සේ හිතනවා. ඒත් එහෙම වෙනවා නම් වුණාවේ. තමුන්නාන්සේ ඊට වඩා ඉතා වැදගත් මෙහෙයක් කරලා ඇවිත් අර කකුල් හෝදලා පිරිසිදු වෙනවා වගේ ඇවැත් දෙසා ගත්තාම ඉවරයි නෙවෙද?' කියලා එතුමා කිව්වා. 'තමුන්නාන්සේගේ ඔය ලඝු කල්පනාව අත්හැරලා, කන්න බොන්න නොවෙයි, ශාසනික මෙහෙයට යොදන්න සල්ලි ටිකක් බැංකුවක දමා තියන්න', කියලා එතුමා මට අවවාද කළා. මා කිසිත් කතා කළේ නැහැ."

"මා ආනන්ද කොලීජියේ ඉන්න දවස්වල ඔය කොලීජියේ හිටපු සංගීත ආචාර්‍යවරයකු කොහේ හරි යන කොට එයාගේ සර්පිනාව මගේ කාමරයෙන් තියලා යනවා. එහෙම කරන්නේ වෙන තැනක තිබුණොත් කවුරුවත් ඒක ඇදලා නරක් කරයි කියලා හිතලා. ඉතින් ඔහොම තියල ගිය එක දවසක උදේ ධර්මපාලතුමා මගේ කාමරයට ආවා. ඒ එන කොට අර සර්පිනාව දකලා හොරැ හිත් බලා හිනාවෙලා මට කිව්වා, 'ඔබවහන්සේ මේක වාදනය කරනවා නම් දෙර වහගෙන වාදනය කරන්න. මේ ළමයින්ට හෙම මේකට එන්න දෙන්න එපා', කියලා. ඉතින් මා කිව්වා, 'ඒක මගේ නොවන බව, එය අයිති ගුරුවරයා ඒක මගේ කාමරයේ සබා ගිය බව. ඒක අල්ලන්නේවත් නැතිබව' මා කිව්වා. 'නෑ නෑ එහෙම කියන්න එපා! ඕක බොහොම හොඳ ශාස්ත්‍රයක්. ඉගෙන ගත්තට කමක් නැහැ. ඔබ වහන්සේ සංගීතය ගැන දන්නේ නැද්ද?' කියලා එතුමා ඇහුවා. 'මහණ වෙන්න ඉස්සෙල්ලා නම් මා වයලීන්

වාදනය ඉගෙන ගත්තා. මට හොඳට වයලීනය වාදනය කරන්න පුළුවන්. ගායනයත් හොඳට පුළුවන්. මහණ වුණාට පස්සේ මා ඒවා ඔක්කෝම අත්හැරලා දැම්මා'. කියලා මා කිව්වා. හා! හා! වයලීන් වාදනය පුළුවන් නම් තමුන්නාන්සේට මේක බොහොම ලේසි වෙයිනේ. මා කිව්වා, 'මා දන් පැවිදි කෙනෙක්, මට ඕවා ඕනැ නෑ' කියලා. 'නච්ච ගීත වාදිත' කියලා බුදුහාමුදුරුවන් ඒවා ගැන වදාරළ තියෙන බව මා කිව්වා. 'ඔබ වහන්සේ කියන ඔය ගීත කියන ඒවා ඉංග්‍රීසියෙන් නෝච් සිගින් (nauch singing) කියන එක. ඔය මනුෂ්‍යයන්ගේ ප්‍රමාදය ඇති කරන කාමුක ගායනා තියෙනවා. ඒවා ලෞකිකයි. ඒත් භක්ති ගීතයක් වාදනය කරන කොට කොච්චර තදින් හිතේ බුද්ධ භක්තිය ඇති වෙනවද?''

''තමුන්නාන්සේට මතක නැද්ද බුදුහාමුදුරුවන් ගීතිකා හදලා තියෙන බව? මා ඇහුවා 'කාටද එහෙම හදලා තියෙන්නේ?' කියලා. 'බුදුහාමුදුරුවන් බරණැස වැඩ ඉන්න කාලේ උත්තර මානවකයා කියල කෙනෙක් නාගමානවිකාවක් ළඟට ඇගේ ගීතයට උත්තර කියන්න, ගීතයක් ගොතාගෙන ගියා කියලා තියෙනවා මතකද?' කියලා එතුමා ඇහුවා. 'ඔව්' මට මතකයි. 'බුදුහාමුදුරුවන් නේද ඔහුට එක ගීතිකාවක් හදලා දුන්නේ?' 'ඔව් උන්වහන්සේ තමයි.' 'මතකද ඔබ වහන්සේට?' මතකයි කියලා මා කිව්වා.''

''ඔත්ත මානවකයාට බුදුහාමුදුරුවන් ගොතා දුන් එක මොකක්ද කියලා තමුන්නාන්සේට මතකද? යො වද තං පවරෝ..... මොකක්ද ඒකේ තාලේ? ඕක සින්දු තාලයක්නේ. ඕක උඩ පැන පැන නටමින් කිය කියා යන සින්දු තාලයක්. ඉතින් ඔය විදියට බුදුහාමුදුරුවන් එපා කිව්ව ගීතිකා උන් වහන්සේත් ගොතලා තියෙනවා නම් තමුන්නාන්සේලා නච්ච ගීත වාදිත කියන එකේ ගීත කියන එක තෝරන්නේ කොහොමද?' මා එතුමාට උත්තර දුන්නේ නැහැ.''

''කෙනෙකුගේ හිතේ ලෞකික පැත්තට බරවෙන, ඇදී යන දේවල් හොඳ නැහැ. නමුත් ශ්‍රද්ධාව භක්තිය වර්ධනය වෙන අර 'යො වදතං පවරෝ..... වැනි ඒවා වරදක් නැහැ. ධර්ම නිශ්‍රිත ගීතිකාවෙන් අයහපතක් වෙන්නේ නැහැ. බුදුහාමුදුරුවන් අර

උත්තර මානවකයාටත් ඒ විදියට ඒවා හදලා දුන්නේ ඒකයි. ඉතින් පස්සේ මොන විදියට ඕවා තේරුවත් බුදුහාමුදුරුවන් ගෙන ගිය ක්‍රියා මාර්ගයේ හැටියට මට පෙනෙන්නේ ධර්ම නිශ්‍රිත ගීතිකාව වරදක් නැති බවයි' කියලා ධර්මපාලතුමා කිව්වා."

"තමුන්නාන්සේලාට බුදුහාමුදුරුවන් අවසර දීලා තියෙනවා නේද අනුජානාමි භික්ඛවේ සර-භඤ්ඤං' කියලා. 'මොකක්ද මේ සර-භඤ්ඤං කියන්නේ?' මා කිව්වා 'හොඳ මිහිරි කට හඬ' කියලා. එතුමා කිව්වා, 'ඔය මිහිරි හඬින් කියූ තරමින් ඕක හරියන්නේ නෑ' කියලා. මේ ගීත විද්‍යාව දන්නේ නැති අයයි ඔය විදියට තෝරන්නේ. ස්වර හතක් තියෙන බව ඔබ වහන්සේ දන්නවද? මා කිව්වා 'ඔව් මා ඉගෙන ගෙන තියෙනවා' කියලා."

"ස රි ග ම ප ද නි, කියලා ස්වර හතකට බෙදලා ඒවා තවත් කොටස් තුනකට බෙදනවා. එතකොට විසි එකක් වෙනවා. ඉතින් ඒවාට අනුව ශබ්දය උස් පහත් කරන එක තමයි ස්වර නැංවීම, නැත්නම් ස්වර භන්‍යය කියන්නේ. ඒක හරියට දන්නේ නැත්නම් ගාථාවක් හරියට නියම විරිතකට කියන්න බැහැ. පිරිත් ටිකක් කියන්න බෑ. හීන් හඬින් කිවයුතු තැන්වල හීන් හඬින් කීම, ශබ්දය උස් කළ යුතු තැන් උස් හඬින් කීම ඕක තමයි බුදුහාමුදුරුවන් සර-භන්‍යය කියලා ඉගැන්නුවේ. ඉතින් ඒ සර-භන්‍යය සප්ත ස්වර ශාස්ත්‍රය උගන්වන එකක් තමයි මේ සර්පිනාව. මේක විද්‍යාවක් හැටියට ඉගෙන ගත්තට වරදක් නැහැ. හැබැයි සභාවලදී තමන් දන්න බව පෙන්වන්න වාදනය කරන්න නෙවෙයි. ඒ නිසා කාටවත් නොදැනෙන්න, නොපෙනෙන්න මේ ශාස්ත්‍රය ඉගෙන ගත්තට කමක් නැහැ. භික්ෂුවකට ඒ පිළිබඳ දැනුම හුඟාක් ප්‍රයෝජනවත්' කියලා එතුමා කිව්වා. මා ඉතින් නිශ්ශබ්දව අහගෙන උන්නා. සමහර කාරණා පිළිබඳව ධර්මපාලතුමාගේ අදහස් ඔන්න ඔය විදියයි."

# ක්‍රිෂ්ණමූර්ති සහ සායි බාබා සමග

**11**

"ක්‍රිෂ්ණමූර්තිතුමා හමුවී කතා කරන්න 1926 දෙසැම්බර් මාසයේ දවසක ඉඩ ලැබුණා. එහිදී ඇතිවූ අප දෙදෙනාගේ මිත්‍රත්වය එතුමාගේ අවසාන මොහොත දක්වාම දිගටම පැවතුණා. ආචාර්ය අදිකාරම් මහතා ක්‍රිෂ්ණමූර්තිතුමා දෙසට යොමු කළේ මායි. ක්‍රිෂ්ණමූර්තිතුමා ගැනත් මෙහිදී යමක් ප්‍රකාශ කරන්නම්. එතුමා ගැන මට ඇතිවූ හැඟීම නම් එතුමා නිශ්ශබ්දව කරුණු සලකා බලන, කවුරු පිළිගත්තත් නැතත් අවංකව තමන්ගේ අදහස් කෙළින් කියන, ජීවිතය පිළිබඳ ගැඹුරු දැනුමක් ඇති කෙනෙක්."

"එතුමා මුල් අවදියේදී යෝග භාවනා පුරුදු කළා. කුණ්ඩලිනි යෝග භාවනා පවා තරුණවියේදී දියුණු කොට සෘද්ධිබල ලබා සිටි කෙනෙක් එතුමා. යම්කිසි පිරිසකට එක භාෂාවකින් කතා කරන විට ඒ ඒ භාෂා කතා කරන අයට තම තමන්ගේ භාෂාවලින් කතා කරන්නාක් මෙන් ඇහෙන්න සලස්වා කරුණු අවබෝධ කිරීමේ ශක්තියත් ඇතිව සිටි කෙනෙක්. එතුමා එංගලන්තයේ කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ ඉගෙන ගන්න කාලයෙහි තමාගේ බාල සහෝදරයාවූ නිත්‍යානන්ද සමග නිවාඩුවක් ගත කිරීම සඳහා ඇමරිකාවේ ඔහායි ප්‍රදේශයේ එතුමාගේ සැප පහසුවට ඇනී බැසන්ට් මැතිනිය විසින් පිළියෙළ කර තිබුණු නිවසට ගියා."

"එහිදී තමන්ගේ සොහොයුරා හදිසියේ අසනීප වී කළුරිය කළා. එයින් එතුමාගේ සිතේ හටගත් දුක ශෝකය මැඩ පවත්වා ගැනීමට, තුනී කර ගැනීමට නොයෙක් ආකාරයෙන් කල්පනා කළා. අන්තිමේදී එතුමාට වැටහුණා මගේ සහෝදරයා කියා නේද මා මේ අඬන්නේ කියලා. එහේම නම් මගේ යන්නෙහි තේරුම

කුමක්දැයි එතුමා කල්පනා කළා. මගේ කියා සලකන්ට 'මම' කියා යමක් තිබිය යුතුයි. ඒ මම යනු කුමක්ද? ඊළඟට එතුමා මේ 'මම' යන්න සොයන්න පටන් ගත්තා. මේ පරීක්ෂණයේදී 'මම' කියා වෙන්කොට ගතහැකි කිසිවක් මේ ජීවිතය තුළ නැති බවත් ඇත්තේ නිතරම හැදි හැදී බිඳි බිඳී යන ශරීරයේ රූප ගොඩවල් පරම්පරාවක් බවත්, සිත් පරම්පරාවක් බවත් එතුමාට පෙනුණා. ඒ හැම එකක්ම අයත් සියලු අවයව ක්ෂණයක් පාසා වෙනස් වන බවත් එතුමාට පෙනුණා. එබැවින් මෙහි තමාය, මමය, ආත්මය කියා ගන්නට කිසි අරටුවක් නැති බවත්, ලොව බොහෝදෙනා මෙය තේරුම් නොගත් නිසා මම කියා දෙයක් ඇතැයි යන මිථ්‍යා දෘෂ්ටියට වහල් ව ක්‍රියා කරතැයි එතුමාට අවබෝධ වුණා. මේ අවබෝධයෙන් පසු එතුමා සම්පූර්ණයෙන්ම වෙනස් වුණා. එතෙක් තමාට උපකාර කළ ඇනී බැසන්ට්, ලෙඩ්බීටර් ආදි තියෝසොෆි වාදීන්ගේ ආත්ම දෘෂ්ටියෙහි දෙස් පෙන්වා දුන්නා. එතැන් පටන් එතුමා දේශනා කළේ මේ අනාත්මවාදී පදනමෙහි පිහිටා ගෙනයි."

"පසු කාලෙක එංගලන්තයේ එතුමා වෙනුවෙන් වෙන් කොට තිබුණු බ්‍රෝක් වුඩ් නම් නිවසට මා ගියා. එතුමා එහි ඉන්න බව මට දන්වා තිබුණා. ඒ නිසයි මා ලංඩන් විහාරයේ සිට එතැනට ගියේ. එද එතුමා සමග කතා කර කර ඉන්න ගමන් මා කිව්වා, 'මහත්මයාගේ දේශනවල අදහස් විමසා බැලුවිට මට හැඟෙන්නේ බුදුරජාණන් වහන්සේ වදාළ සතිපට්ඨාන සූත්‍රයේ අදහස් නවීන ව්‍යවහාරයෙන් ලෝකයට කියා දෙන බවක්' කියලා. එතනදී එතුමා කිව්වා, 'මා කුඩා කාලයේදී නම් ගොස්පල් ඔෆ් බුද්ධ (Gospel of Buddha) හා ධම්මපද ආදි පොත් කීපයක් කියවලා තියෙනවා. බොහෝ කලකින් දත් ආගමික පොතක් කියවලා නැහැ. මා ඉඳ හිටලා බයිබලයේ සාම්ස් (ගීතිකා) කොටස පමණක් කියවනවා. ඒක ධර්මයක් දත ගැනීමට නොවෙයි අදහස් ප්‍රකාශ කිරීමට එහි භාෂාව හොඳ නිසයි' කියලා. බයිබලයේ නම් ධර්ම වශයෙන් ගන්න කිසිම විශේෂ ගැඹුරු, දෙයක් නැති බවත් එතුමා එහිදී පැවසුවා. එවිට මා ඇසුවා බුදුරජාණන් වහන්සේ ගැන.' බුදුරජාණන් වහන්සේට සමාන කෙනෙක් තවම ලොව පහළ වුණේ නැහැ, මා ගරු කරන්නේ උන්වහන්සේට පමණයි කියා එතුමා පැවසුවා."

"තවත් ආගම් දේශනා කළ ශාස්තෲවරු ගැනත් මා විමසුවා. ක්‍රිස්තු තුමා ගැනත් මා විමසුවා. ක්‍රිස්තු තුමා බුදුරජාණන් වහන්සේට සැතපුම් ලක්ෂ ගණනකින්වත් ළංවිය නොහැකි කෙනෙකැ'යි කෙළින්ම එතුමා කිව්වා. එතනදී මා ඇහුවා, 'බෞද්ධ පොත් පත් නොකියවා බුදුරජාණන් වහන්සේ ගැන ඔය තරම් උසස් හැඟීමක් ඇතිවුණේ කොහොමද කියලා?' 'ඒක නම් මා දන්නේ නෑ'. කියලා එතුමා පිළිතුරු දුන්නා. කුඩා අවදියේදී ධම්මපද ආදියත් බයිබලයත් තවත් පොතුත් කියෙව්වා එද ඇතිවෙච්ච අදහස අදත් එසේම බව එතුමා කියා සිටියා. ඒ විතරක් නෙවෙයි, බුදුරජාණන් වහන්සේ අද සිටිත් නම් තමා උන්වහන්සේ පසු පසින් යෑම අතිවායයියෙන්ම කෙරෙන බවත්, කිසිසේත් එහි වෙනසක් නොවන බවත් පැවසුවා. ක්‍රිෂ්ණමූර්ති තුමා ඔය විදියේ ආශ්චර්ය පුද්ගලයෙක්ය යනු මගේත් අදහසයි. මෑතක සිටි ආගමික හා දර්ශනික මත ප්‍රකාශ කළ අයගෙන් හැමට වඩා මා ආදරයෙන් සලකන එකම උතුමා ක්‍රිෂ්ණමූර්ති බව අදත් මා කියනවා."

**"සායි බාබා ඇදහීම ගැනත් සායි බාබා ගැනත් මහානායක හාමුදුරුවන් මොනවද කියන්නේ?"**

"අසනීපයක් හැදුණාම අප දෙස්තර කෙනෙකු හම්බ වෙන්න යනවා නේද? ඒ යන ගමනේ අදහස අසනීපය සුව කර ගැනීමයි. සමහරවිට අපල කාලයක් කියලා හිතුණොත් නක්ෂත්‍ර කාරයකු ළඟටත් ගිහිල්ලා එයාගෙනුත් කේන්දරේ ගැන විස්තර අහ ගන්නවා. ඒ වගේ තමයි සායි බාබා හමුවෙන්න යෑමත්. පරලොව පින් තකා නෙවෙයි එයා හමුවෙන්න යන්නේ. නිවන් ලබා ගැනීමේ අදහසිනුත් නෙවෙයි එයා ළඟට යන්නේ. ඒ වගේම එතුමාට යෝග භාවනා බලයෙන් රෝග සුව කිරීමේ හැකියාවක් තියෙනවා කියන විශ්වාසය උඩයි යන්නේ. ගිහිල්ලා ලෙඩකට හෝ වෙන කරදරයකට ප්‍රතිකාර අහගන්නවා. එහෙම නැත්නම් තමන්ගේ ජීවිතය ගෙන යාමට උපදේශයක් ගන්නවා. ඒකටයි ඔය කවුරුනුත් යන්නේ. ඉතින් හරියට දෙස්තර කෙනකු හම්බ වෙන්න යනවා වගෙයි."

**"මහානායක හාමුදුරුවන්ට එතුමා මුණ ගැහිලා තියෙනවාද?"**

"ඔව් මට මුණ ගැහිලා තියෙනවා. සත්‍ය ශ්‍රී සායි බාබා මහා බලසම්පන්න යෝගියකු කියලා මා පිළිගන්නවා. ඒ පිළිගැනීමට

හේතු මේකයි. මගේ ඇස් දෙකේම කාවය හැදුණා. එක ඇහැක් සම්පූර්ණයෙන් නොපෙනී ගියා. අනික් ඇහැත් පෙනීම අඩුවේගෙන එන කාලෙදී මා නොයෙක් සිංහල වෙදුන්ගෙන් බෙහෙත් ගත්තා. අන්තිමට මා පාදුක්ක පැත්තේ උඩුමුල්ලේ ඇස් වෙද මහත්තයත් හම්බ වෙන්න ගියා. එයා හරි දක්ෂ වෙද මහත්මයෙක්. උන්නැහැ කිව්වා, 'හාමුදුරුවන්ගේ ඇහැ ඔපරේෂන් කරන්න ඕනැ. මාත් ඒකට උදව් කරන්නම්' කියලා. 'මේ අපේ සිංහල කෂාය බීලා ඕක හරියන්නේ නැහැ' කියලත් කිව්වා. 'ඕක හරියන්නේ ඔපරේෂන් එකෙන්, දැන් අප අතර ඔපරේෂන් ක්‍රම අතුරුදහන් වෙලා, බොහොම කල්' කියලත් කිව්වා."

"බළන්ගොඩ ඉන්නවා වෛද්‍යවරයකු පොකුණේ මැණික් අප්පුහාමි කියලා. එයා අලුත්නුවර පළාතේ කෙනෙක්. උන්නැහේත් හම්බ වෙන්න ගිහිල්ලා බෙහෙත් ගත්තා. එයත් ඉතින් හරියට බෙහෙත් දුන්නා. ටිකක් අඩු වුණා. එහෙත් ඔපරේෂන් එකමයි කළ යුතුව තිබුණේ. මේ ගැන නොයෙක් දෙනා හම්බ වෙන්න මා ගියා. පේන කියන අයත් හම්බ වෙන්න ගියා. ඒ අය නම් කිව්වා 'ඔපරේෂන් කළොත් ඇස් අන්ධ වෙයි, ඔපරේෂන් කරන්න එපා කියලා.' අන්තිමට ගියා නක්ෂත්‍ර කාරයකු හම්බ වෙන්න. එයා පේනත් කියනවා කේන්දරත් බලනවා. එයත් කිව්වා, 'මේක ඔපරේෂන් කරන්ට එපා ඇස් අන්ධ වෙයි' කියලා. දැන් ඉතින් ඔපරේෂන් නොකරත් බැහැ. කරලත් බැහැ. මොනවා කරන්දේ කියලා කල්පනා කර කර ඉන්න කොට රත්නපුරේ අපේ දායක මහතකු අවුත් එයාට සායි බාබා තුමා හම්බ වෙන්න යන්න ඕනැ කියලා මට කිව්වා. ඒ විතරක් නෙවෙයි, මටත් ඒ ගමනට කතා කළා. 'හාමුදුරුවන්ට මම වියදම් කරන්නම්', කියලත් කිව්වා. එයාට දඹදිව වන්දනාවේ යන්නත් ඕනැකම තිබුණා."

"ඒ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩු කාලය. පිටරට සල්ලි ගෙනයාම බොහොම සීමා සහිතයි. ඒක නිසා හරි අමාරු වුණා. කොහොම නමුත් බැංගලෝරයට ගිහිල්ලා ආපහු එන ප්‍රමාණයට දෙන්නටම සෑහෙන මුදල් ප්‍රමාණයක් ගෙන යන්න ඉඩ කඩ සලසා ගත්තා. එයාට ඉංග්‍රීසි බැරි නිසා මාත් අඩගහගෙන යාමටයි එයා බලාපොරොතත්තු වුණේ. මටත් පෙනීම අඩු නිසා එයා මගේ අතින් අල්ල ගෙනයි ගියේ. බැංගලෝරයට ගියා. වයිට් ෆීල්ඩ් එකේදී සත්‍ය සායි බාබා හමු වුණා."

"වයිට් ෆීල්ඩ් ස්කෝලේ මිදුලට එද සෑහෙන පිරිසක් පැමිණිලා හිටියා. පන්සීයක් විතර හිටියා. ඒ අය ඇවිත් සිටියේ ආශිර්වාද ලබා ගන්නටයි. වෙලාව සවස පහට විතර ඇති. ඔය අතර ලංකාවේ දෙමළ මනුෂ්‍යයකු මා දැකලා ලංකාවේද කියලා ඇහුවා. මා 'ඔව්' කිව්වා. 'එහෙම නම් ඔතන ඉන්න එපා, මෙන්න මෙතන ඉන්න, ඉස්සර වෙලාම සායි බාබා තුමා එන්නේ මෙතනටයි' කියලා කිව්වා. ඒ දෙමළ මනුෂ්‍යයා මට බොහෝම උපකාර කළා. මම ගිහින් එයා කියපු තැන හිටියා. ඇත්තටම පහට විතර සායි බාබා තුමා අර ගොඩනැගිල්ලෙන් පිටත් වුණා. හීන් සැරේ වට පිට බල බලා ඇවිදිල්ලා කෙළින්ම මා ළඟටයි ආවේ. ඇවිල්ලා මට ආශිර්වාද කළා. අත් දෙකින් ඔක්කෝටම ආශිර්වාද කරගෙන එහා කොනටම ගියා. ගිහිල්ලා මා ළඟට ආපහු ආවා. මා ළඟට ඇවිල්ලා මගේ උර හිසට අත තියලා ඉංග්‍රීසියෙන් කිව්වා, 'ඇස් ඔපරේෂන් කර ගන්න, සාර්ථක වෙයි' කියලා. මා අහලත් නෙවෙයි. මගේ හිත එතුමා දැන ගත්තා. කවුරුවත් කියලත් නෙවෙයි. ඉතින් මා කිව්වා, 'මා ආවෙත් ඕකට තමයි' කියලා. 'ඔව්' ඒක හරි යනවා. 'බය වෙන්න එපා, කර ගන්ට ඒක'',කියලා කිව්වා. අනික් ගිය එක්කෙනාටත් මොකක් හරි ආශීර්වාදයක් කළා, මොකක්ද අසනීපයකට. අප වැඩි වෙලා හිටියේනැහැ. ඉක්මනට ආවා. එතකොට හැන්දෑ වෙලාව. බස් එකත් පරක්කු වන නිසා අප ඉක්මනට පිටත් වුණා. අප නැවතිලා හිටියේ බැංගලෝර් පන්සලේ. පන්සලට ඇවිදිල්ලා පහුවද අප ලංකාවට ආවා."

"ටික දවසක් යන කොට මගේ ඇස් කොහෙත්ම නොපනී ගියා. මා අපේ ශිෂ්‍ය ආනන්දමූර්තිටත්, මට මොකවත් පේන්නේ නැහැයි කියලා, පිටත් ව ගියා ඇස් ස්පිරිතාලේ වීරරත්න දොස්තර මහත්තයා හමුවෙන්න. උන්නැහැ කිව්වා, 'ළඟදී නොපෙනී ගිය දකුණු ඇහැ සනීප කරන්නම්, අනික පරණ වැඩියි' කියලා. ඉතින් ස්පිරිතාලේ නැවතිලා ඇස් ඔපරේෂන් එක කරවා ගත්තා. බොහෝම හොඳට ඇස් පෙනීම හරි ගියා. ඊට මාස කීපයකට පස්සේ අනිත් ඇහැත් ඔපරේෂන් කර ගත්තා, සාත්තු නිවාසයකදී උපාලි මැන්ඩිස් මහතා ලවා. උන්නැහැ යන්ත්‍රයකින් ක්ෂණයකින් ඇහැ ඔපරේෂන් කරලා ඒ වෙලාවේම පන්සලට එන්නට අවසර

දුන්නා. මගේ ඇස් දෙකම පෙනෙන්ට වුණා. සායි බාබා තුමාගේ කියමන හරි ගියා. අර පේන කියන්නන්ගේ නක්ෂත්‍ර කාරයන්ගේ කියමන් බොරු වුණා. දැන්නම් මට කන්නාඩියක් නැතත් ඇවිදින්න පුළුවන්. කන්නාඩිය නැතිව ලොකු අකුරු කිය වන්නත් පුළුවන්. එච්චරටම මගේ ඇස්දෙක හරි ගියා."

"ඉතින් ඔය මගේ අත් දැකීමයි. මා පිළිගන්නවා සායි බාබා තුමා වංචාකාරයෙක් නොවෙයි කියලා. යෝග භාවනා පැත්තෙන් බොහොම ඉහළට දියුණු වෙච්ච චිත්ත ශක්තියක් එතුමාට තියෙනවා. එතුමා දන්න දේවල් චිත්ත ශක්තියෙන් හදන්න පුළුවන්. වැලි ටිකක් අරගෙන ඒක පොතකට පරිවර්තනය කරන්න එතුමාට පුළුවන්. ඒකෙන් එතුමා පොතක් හදනවා. ෆවුන්ටන් පෑනක් ඕනෑ කීවොත් ෆවුන්ටන් පෑනක් හදන්න එතුමාට පුළුවන්. එතුමා ඒක දන්නවා. හිතට අනුව එකක් වෙන දෙයකට පරිවර්තනය කරන්න හැකියාවක් එතුමා තුළ තියෙනවා. ඉතින් සායි බාබා තුමා හමුවෙන්න යනවා නම් වෛද්‍යවරයකු හමුවෙන්න යනවා වගෙයි කියලා මට කියන්න පුළුවන්. එතුමා හමුවෙන්න යන එක වැරදි නම් වෛද්‍යවරුන් හමුවෙන්න යන එකත් වැරදියි. තමුන්ගේ අපල කාලය කියලා නක්ෂත්‍රකාරයකු හමුවෙන්න යනවා වගේ වැඩක් සායි බාබා තුමා හමුවෙන්න යන එක. මේකේ වරදක් මට නම් පේන්න නැහැ. සායි බාබා තුමා බලන්න යන අය, එතුමාට ගරු කරන අය යන්නේත් ගරු කරන්නෙත් නිවන් ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් නොවෙයි. මෙලොව තමන්ගේ ශරීර සෞඛ්‍යය ලබා ගැනීමට, මෙලොව කරදර හිරිහැර විපත්වලට උපදේශයක් ලබා ගන්ට."

**"දැන් සමහර විහාරස්ථානවලත් සායි බාබා තුමා වෙනුවෙන් බජන් ගීත ගායනා කරනවා. ඒ සඳහා වෙන් වෙච්ච ස්ථානත් තියෙනවා. ඒ ගැන යමක්....."**

"ඔව්! තියෙනවා. එයාට ස්තුති කරනවා. ඒක හරියට විෂ්ණු දේවාලවල කතරගම දේවාලවල කන්නලව් කරනවා දේවස්තෝත්‍ර කියනවා වගේ වැඩක්. ඒක හරිනම් මේකත් හරි. සායි බාබා තුමාට එහෙම කරන එකේ දෝෂයක් නැහැ. ඉතින් අරවා පන්සල්වල තියෙන්න ඇරලා සායි බාබා තුමාට බජන් කියන එකට විතරක්

දෙස් කියන එක වැරදියි. එහෙම නම් අරවත් ඔක්කෝම නවත්වන්න ඕනෑ. ඔය එකම දේ තමයි දෙගොල්ලොම කරන්නේ. නමුත් කරන්නේ දෙවිදියකට. ඔය ඔක්කෝම කරන්නේ මෙලොව ලාභයක් පිණිස. ලෙඩක් සනීප කර ගන්නට. නැත්නම් අඩුපාඩුවක් සම්පූර්ණ කර ගන්නට. එහෙම නැතිව නිවන් ලබන්න නෙවෙයි. ඒ නිසා ඒ අයට සත්කාර කළා කියලා ගරු කළා කියලා කාගෙවත් තිසරණය බිඳෙන්නේ නැහැ."

# 12 ඉංග්‍රීසි ආණ්ඩු කාලෙවත් භික්ෂූන් වහන්සේලාට මෙහෙම කරදරයක් වුණේ නැහැ

**"මහානායක හාමුදුරුවන්ගේ ශාස්ත්‍රීය සේවය ගැනත් විස්තර ටිකක් දැන ගන්න මා කැමතියි."**

"ශාස්ත්‍රීය වශයෙන් මා එච්චර ලොකු සේවයක් කළාද කියලා මාවත් හරියට දන්නේ නැහැ. මා ඉගැන්නුවා. විද්‍යාලයත් පටන් ගත්තාම සහාය දුන්නා. මට ඒ ඒ අවස්ථාවල ඇති වෙච්ච අදහස් අනුව යම් යම් පොත් පත් ලිව්වා. පාලි ඉගෙනීම පහසු වෙන්න මා පොත් ලිව්වා. සංස්කෘත ඉගෙනීම පහසු වෙන්න කියලත් පොත් ලිව්වා. මුල් කාලයේදී බොහෝවිට සිංහල භාෂාව පිළිබඳව. මගේ අදහස් යම් යම් සඟරාවලට හා පත්තරවලට ලිව්වා. ඒවා ලිව්වේ මගේ ගුරුහාමුදුරුවන් ඉගැන්වූ කරුණු අනුව කල්පනා කරලා. මගේ ගුරු හාමුදුරුවන් මට සිංහල ඉගැන්වීමේදී සිදත් සඟරාව පවා විවේචනය කරමින් කරුණු කියා දුන්නා. ඒ වගේම ඒවා උගන්වන විට 'ඒවා රටට කියන්න යන්න එපා, එහෙම කරන්න ගියොත් බැණුම් අහන්න වෙනවා, ඔවා හොඳින් හිතේ තියා ගන්න' කියලා කිව්වා. අප පාවිච්චි කළේ රත්මලානේ ශ්‍රී ධර්මාරාම නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ සකස් කළ සිදත් සඟරා ව්‍යාඛ්‍යාවයි. අපේ ගුරු හාමුදුරුවන් බොහොම ගරු කළේ ඒකටයි."

"මා ලිපි ලේඛන ලිව්වේත් ඒ නීති රීති අනුවයි. පස්සේ කුමාරතුංග උන්නැහේගේ පොත් පත් පළ වුණාම මා සම්පූර්ණයෙන්ම ඒ නීති රීති පිළිගත්තා. මගේ ගුරු හාමුදුරුවන් ඉගැන්වූ ක්‍රමයට බොහෝ සෙයින් කිට්ටුයි, ඒ ක්‍රමය. ඒ ඇරත් මා යමක් දෙස බලන්නේ නිවහල් සිතින්. කුමාරතුංග උන්නැහැ දෙන නීති රීති හරි බව මට වැටහුණා. කුමාරතුංග මහතා ඉදිරිපත් කළ නීති රීති සම්පූර්ණයෙන්ම මා පිළිගන්නවා."

අද මේ දක්වාම මේ රටේ සිංහල බෞද්ධ ජනතාවට කියවන්න තියෙන හොඳම බුද්ධ චරිතය මහානායක හාමුදුරුවන් ලියූ බුද්ධ චරිතය නේද?"

"සමහරුන්ගේ මතයයි, ඒ. ගණේගම සරණංකර හිමියන් මෑතක ලියූ 'බුදුහාමුදුරුවෝ' නම් පොත මා ලියූ පොතට වඩා රසයි, ජනප්‍රියයි. මගේ පොත් ලිව්වේ හුඟාක් පොත් බලලා මහන්සියෙන්. ඒ සඳහා මා සියලුම අටුවා පොත් කියවලා කරුණු සපයා ගත්තා. බුද්ධ චරිතයෙහි යම් යම් දේ සිදුවෙච්ච වකවානු සොයා ගැනීමටයි ඒවා කියෙව්වේ. නමුත් මා එකතු කරපු ඔක්කෝම කරුණු ඇතුළත් කරලා පොත ලිව්වා නම් එයට වඩා පොත හතර පස් ගුණයක් විශාල වෙනවා. හුඟාක් දේවල් අතහැරලයි පොත ඔය තරමට කුඩාවට සකස් කළේ. සම්පූර්ණ බුද්ධ චරිතයක් මා ලියන්න හිතාගෙන ඉන්නවා. හුඟාක් වැදගත් කරුණු ඒකට අඩංගු වෙන්නත් තියෙනවා. දැන් වෙලා තියෙන්නේ ඒවාට කාලය නැති කමයි. වෙන වෙන දේවලට කාලය ගත වෙනවා. මේ රටේ ඉස්සර වෙලාම සම්පූර්ණ බුද්ධ චරිතයක් වශයෙන් පළ වූයේ මගේ පොත තමයි. ඊට පස්සේ සමහරුන් මගේ පොතේ කොටස්ම අරගෙන වෙන වෙන බුද්ධ චරිත ලියලා තියෙනවා. කොච්චර මගේ පොතේ කොටස් අරගෙන තියෙනවාද කියනවා නම්, මුල් මුද්‍රණවල මට වැරදිච්ච ඒවා ඒ විදියටම ඒ ගොල්ලන්ටත් වැරදිලා. මගේ පොතේ කොටස් කොපි කළා විතරක් නෙවෙයි මට වැරදිච්ච ඒවාත් ඒ විදියටම කොපි කරගෙන. පස්සේ ලියලා තියෙන බුද්ධ චරිතවල තත්වය ඒකයි. මා ඉතින් යටි හිතින් හිනහ වෙමින් ඒවට නිහඬව හිටියා. ග්‍රන්ථ චෞරයන් කිසිම ලැජ්ජා බයක් නැතිව මේ වැඩේ කරනවා. ඒ විතරක් නෙවෙයි, මා ලියූ ඉංග්‍රීසි ශික්ෂකයත්, ඒකේ ක්‍රමයත් අරගෙන පොඩ්ඩක් වෙනස් කරලා ඉංග්‍රීසි ඉගැන්වීමටත් පොත් ලියලා තියෙනවා. ඒක ඉතින් අපේ රටේ හැටියක්. යම් තැනකින් යමක් ගත්තා නම් ඒක එතනින් ගත්තා කියලා කියන්න කැමති නැහැ. මා ලියූ සංක්ෂිප්ත දික් සඟියේ උප ග්‍රන්ථයේ ඡේද අකුරකින් වෙනස් නොකර සිංහල බෞද්ධ විශ්ව කෝෂයේ ද ගෙන තියෙනවා. නමුත් ඒවා ගත්ත තැන සඳහන් කරලා නැහැ. ඔය සොරකම බොහොම පුරුදුයි අපේ ලංකාවේ නවීන ලේඛකයන්ට."

"දැන් කාලෙකින් ශාස්ත්‍රීය සේවාවකට බැස්සේ නැහැ. ඉස්සර පත්‍ර සඟරාවලට හරියට ලිපි ලේඛන ලිව්වා. මා වඩාත් ප්‍රිය කළේ, බුද්ධ ධර්මය ඉගැන්වීමටයි. බණ ඉගැන්වීම වඩා හොඳයි කියලා මට හිතුණා. මුලදී මා පටන් ගත්ත ශාස්ත්‍රීය සේවයෙන් වෙනත් පැත්තකට මා හැරුණා. ධර්මය ඉගැන්වීමේ පැත්ත අනික් ඔක්කෝටම වඩා වැදගත් කියලයි මට හිතෙන්නේ. දැන් ඒ සඳහායි වැඩිය කාලය යොදවන්නේ. එක් කාලයක මා කාව්‍ය රචනා පැත්තටත් ටිකක් හැරිලා හිටියා. මගේ නියම නමින් නොවෙයි වෙනත් ආරූඪ නම්වලින් මා කවි ලිව්වා. එහෙත් ඒ පැත්තට වැඩිය ගියේ නැහැ. ඒකෙන් වැඩි සේවයක් වෙනවා කියලා මට හිතුණෙත් නැහැ. භික්ෂුවක් වශයෙන් ශාසනයට කළයුතු සේවය සස්න රැක්මයි. මා උපන්නේ බුද්ධ ශාසනය රැක ගන්න. ඒ නිසා ඒ ගැන වැඩිපුර උත්සාහය යෙදෙව්වා. ශාස්ත්‍රීය පැත්තට වඩා මා බුද්ධ ධර්මය රැක ගැනීමට කාලය යෙදුවා. පිරිසිදු බුද්ධ ධර්මය රැක ගැනීම මට අයිති ප්‍රධාන කාර්‍යයක් වශයෙන් මා සලකනවා. ඉතින් ඒකට තව ටික කාලයයි මටත් තියෙන්නේ. ඒ ටික එය සඳහා යොදවමින් කටයුතු කරනවා."

**"මහානායක හාමුදුරුවන්ගේ ශාස්ත්‍රීය සේවාව ගැන කතා කළ ප්‍රශ්නයේදී, නායක හාමුදුරුවන් විසින් රචිත පාලි, සිංහල, සංස්කෘත, ඉංග්‍රීසි පොත්වල නම් සඳහන් වුණා නම් හොඳයි. සියල්ලම නැත්නම් විශේෂයෙන් සඳහන් කළ යුතු පොත් ටිකවත්....?"**

"මා පොත් ලියන්නට පටන් ගත්තේ මගේ වයස 25 දී පමණ. මුලින්ම කුඩා පොත් ලිව්වා. බුද්ධිවාණී, සංක්ෂිප්ත උදානය, ඉන්පසු ලිව්වා ශාක්‍යසිංහාවදාන බුද්ධ චරිතය, සංක්ෂිප්ත දික්සඟිය මුළු දීඝනිකායටම සම්පූර්ණ සිංහල ව්‍යාඛ්‍යානය, සංයුත්ත සගාථකවග්ග ව්‍යාඛ්‍යානය, ඛුද්දකපාඨ ධම්මපද ව්‍යාඛ්‍යාන, පාලි මිලින්ද පඤ්හ සංස්කරණය, සංස්කෘත භාෂාවතරණය, සංස්කෘත ශික්ෂකය, (කාණ්ඩ තුන) අශ්වඝොෂ බුද්ධ චරිත ව්‍යාඛ්‍යානය, ජාතකමාලා සංස්කරණය හා ව්‍යාඛ්‍යානය, (මෙහි ව්‍යාඛ්‍යානය මුද්‍රිත වුණේ නැත) බුද්ධ ධර්මය, සතර පරමාර්ථය, පාලි ශික්ෂකය, පාලි

ශික්ෂක ප්‍රවේශය, ඉංග්‍රීසි ශික්ෂකය, ඉංග්‍රීසි ව්‍යාකරණය (සිංහලෙන් ඉංග්‍රීසි කතා පුහුණුව) Four Divine States, Anapanasati, The Buddha and his way, Life of Buddha for Children. ශිශුබෝධ බුද්ධධම් (කාණ්ඩ 7ක්) සම්පූර්ණ බුද්ධ චරිතය (චිත්‍ර) සිංහල, එයම ඉංග්‍රීසියෙන් Pali made Easy, Lessons of Abhidhamma in English. මේ පළ කරවූ පොත්වලින් කිහිපයක්. ධර්මරශ්මි දහම් සඟරාව, ශ්‍රී බුද්ධ රශ්මි පත්‍රය, මගේ සංස්කරණයෙන් පළ වූ ඒවායි. මගේ ඉංග්‍රීසි දේශන රාශියක් එක් පොතක් වශයෙන් දැන් මුද්‍රණයේ පවතිනවා."

**"පක්ෂ දේශපාලනයට යාම නිසා භික්ෂූන් වහන්සේලාගේ පිරිහීමක් සිදු වුණා කියලා කියන්න පුළුවන්ද?"**

"භික්ෂුව කාටත් පොදු කෙනකු විය යුතුයි. පන්සල්වලට හැම පක්ෂවලම අය එනවා. භික්ෂුව ඒ ඔක්කෝටම පොදු පුද්ගලයෙක්. කතෝලික පූජක සභාව ගැන බලමු. ඒ අය කවදාවත් එළි පිට කිසිම දේශපාලන පක්ෂයකට වැඩ කරන්නේ නැහැ. ප්‍රසිද්ධ රැස්වීම් තබන්නෙත් නැහැ. ඒ ගොල්ලන්ගේ ගෞරවය රැක ගෙන ඒ අය ඉන්නවා. අපේ භික්ෂූන් වහන්සේලාට ඒක හොඳම පාඩමක්. ආදර්ශයක්. භික්ෂූන් වහන්සේලා දේශපාලන පැති ගැනීම සම්පූර්ණයෙන්ම වැරදියි. පක්ෂ දේශපාලනයට ගිහිල්ලා අපේ රටේ භික්ෂූන් වහන්සේ හුඟක්ම පිරිහිලා. අර පක්ෂෙට මේ පක්ෂෙට වැඩ කරන්න යෑම නිසා ආදානග්‍රාහී තත්වයට වැටිලා. එහෙම වුණාම අනික් පැත්තෙන් කරන හොඳ වැඩත් නරකයි. තමන්ගේ පැත්තෙන් කරන නරක වැඩත් හොඳයි. භික්ෂූන්ගේ ගෞරවය හොඳටම පිරිහුණේ දේශපාලන පක්ෂවලට වැඩ කරන්න යාම නිසයි. මා ඒකට කැමති නැහැ. භික්ෂූන් වහන්සේලා වෑයම් කරන්න ඕනෑ හැකි නම් පක්ෂ සමගි කිරීමටයි. ඉස්සරත් එහෙම දේවල් කරලා තියෙනවානේ. දුටුගැමුණු කුමාරයයි මල්ලියි අතර ඇතිවෙච්ච ගැටුම සමථයකට පත් කරලා සමගි කළානේ. ඒ නිසා අදත් භික්ෂූන් කරන්න ඕනෑ පුළුවන්නම් ඒ වගේ දේවල් තමයි. භික්ෂූන් එද්ද පක්ෂයක් ගත්තේ නැහැ. නැත්නම් බණ දහමටම සිත යොදවලා ඒ අතේ යන්න ඕනෑ. සාහිත්‍යයට භාෂාවට සේවාව කරන්න ඕනෑ."

**"මේ රටේ මුරදේවතාවුන් වශයෙන් ජාතික ආගමික සාමාජික හැම අංශයකදීම භික්ෂූන් වහන්සේට විශාල බලයක් තිබුණා නේද?, අද ඒ තත්වය හුඟක්ම අඩු වෙලා නේද?"**

"දේශපාලන පක්ෂවලට වැඩ කරන්න යාම නිසයි ඒ තත්වය හුඟාක් දුරටම අඩු වෙලා ගියේ. ඉස්සර හමුද කාරයකුවත්, පොලිස් කාරයකුවත් මේ රටේ භික්ෂුවකට හිරිහැර කරන්නේ නැහැ. නමුත් පසු ගිය කාලේ හරියට එහෙම කළා. ඉංග්‍රීසි ආණ්ඩු කාලයේවත් භික්ෂූන්ට කරදර හිරිහැර කළේ නැහැ. ඉංග්‍රීසින්ගේ මුල් කාලයේ එකම එක භික්ෂුවකට කරදර කරලා තියෙනවා. දඩුවම් දීලා තියෙනවා. පසුව ඉංග්‍රීසීන් තුළත් භික්ෂූන් වහන්සේලා කෙරෙහි ලොකු ගෞරවයක් ඇති වුණා. සීතාවක රාජසිංහ කාලය භික්ෂූන්ට හුඟාක් කරදර වෙච්ච කාලයක් තමයි. ඉන් පසුව භික්ෂූන්ට මහා විපත්ති කාලයක් වුණේ පසු ගිය කාලයයි. කොහොම හරි සැහෙන භික්ෂු පිරිසක් මැරුම් කෑ බව ආරංචියි. වැරදි කරපු අයත් නොකරපු අයත් ඒවාට ලක් වුණා. භික්ෂූන්ට කරදර හිරිහැර කිරීමට හමුදවේ අය අතරත් පොලීසියේ අය අතරත් තිබුණ, බිය සැක නැති වෙලා ගියා."

"පසු ගිය කාලයේ තිබුණා භික්ෂුවකට පාරේ බැහලා යන්න බැරි තත්වයක්. අපේම ශිෂ්‍යයකු දනෙකට යද්දී පොලීසියෙන් අල්ලා ගත්තා කිසි විචාරයක් නැතිව. ඒ උන්නාන්සේ කියලා තියෙනවා, 'මා දනෙකට යන්නේ, දනෙට ගිහිල්ලා එන්නම්' කියලා. අන්තිමට දනෙටත් නොගොහින් මා ළඟට දුවගෙන ආවා. ඒ ආවෙත් පිට පාරකින්. මා ඇහුව්වා දනේ වැරදුණා නේද කියලා. ඒ ඇත්තා මට විස්තරේ කිව්වා. පස්සේ මා ලියුම් කැල්ලක් දුන්නා මේ උන්නාන්සේ අහිංසකයෙක් කියලා. කිසිම දේශපාලනයකට සම්බන්ධ නැහැ කියලත් මා ඒකේ ලිව්වා. ඊට පස්සේ ඒ නම අරගෙන ගියේ නැහැ."

"ඔන්න ඔය විදියට පසුගිය කාලයේ භික්ෂූන්ට හරියට කරදර වුණා. ඉංග්‍රීසි ආණ්ඩු කාලෙවත් ඔහොම කරදරයක් නම් වුණේ නැහැ. ක්‍රිස්තියානි ආණ්ඩුවක් වෙලත් ඒ විදියේ කරදරයක් නොවූ එක පුදුමයි. නමුත් පසුගිය කාලයේ වරදක් නැති අහිංසක භික්ෂූන් රාශියක්ම හතුරන්ගේ කීම් අනුව බොරු චෝදනා අනුව අරගෙන

ගියා. ඒ ඇත්තන්ට මොනවා වුණාද කියලා මා දන්නේ නැහැ. ඒ නිසා භික්ෂු බලය හා බෞද්ධ බලය පිරිහීගෙන ගිය කාලයක් තමයි පසුගිය කාලය. මා ඇමරිකාවේ ඉන්න කාලයේ එහේ ක්‍රිස්තියානි ප්‍රචාරකයකු පත්තරයක පළ කරලා තිබුණා දැන් ලංකාවේ භික්ෂු බලය බෞද්ධ බලය පිරිහිලා, ඒ නිසා ලංකාවේ ක්‍රිස්තියානිය පතුරුවන්න ඒ අයට ආධාර අවශ්‍යයි කියලා. ඒ කාලයේ ක්‍රිස්තියානි ප්‍රචාරකයන්ට හොඳ අවස්ථාවක් ලැබුණා. දැන් භික්ෂූන් වහන්සේලා මොකකටවත් වැඩ කරන්න යන්න බයයි. කවුරුහරි කීවොත් ඒ භික්ෂුව ජේ.වී.පී. කාරයකු කියලා එතකොට ඒ භික්ෂුවට හිරිහැර ඇතිවෙනවා. තිරාණගම රතනසාර ස්ථවිර තුමා කිසිම දේශපාලන පක්ෂයකට වැඩ කළ කෙනෙක් නෙවෙයි. ඒ පැත්තේ කතෝලිකයන් මිනිසුන්ට ආමිසයෙන් උදව් කරමින් නොයෙකුත් ක්‍රමවලින් ආගම පතුරුවන්න උත්සාහ ගන්න විට ඒ ස්ථවිරයන් නොයෙක් ක්‍රමවලින් බෞද්ධයන් ටික ආරක්ෂාකර ගන්න කටයුතු කළා. ඔය අතර හදිසියේම උන්වහන්සේට වෙඩිපාරක් වැදිලා මැරුණා. බෞද්ධාගම බේරා ගන්න, බෞද්ධයන් බේරා ගන්න ක්‍රියා කරන කොට කොහෙන් වෙඩි පාරක් ඒවිද කියලා භික්ෂූන් වහන්සේලාට හැම පැත්තකින්ම ලොකු බයක් ඇති වුණා. ඒකෙන් ප්‍රයෝජන ගත්තා ක්‍රිස්තියානි ප්‍රචාරකයන්. කිසි බයක් නැතිව ගම්වලට ගිහිල්ලා දුප්පත් මිනිසුන්ට මිලමුදල් දීම ආදියෙන් රවටා ගෙන ක්‍රිස්තියානි ආගමට හරවා ගන්න පටන් ගත්තා. තවමත් ඒ වැඩ පිළිවෙළ කරගෙන යනවා. තවමත් භික්ෂූන් වහන්සේලා බයයි, ඒකට විරුද්ධව වැඩ කරන්න. මොකද හේතුව? කවුරු හරි රජයට ඔත්තු දෙනවා මෙන්න ජේ.වී.පී. කාරයෙක් කියලා. ඉතින් හමුදාවෙන් ඇවිදිල්ලා, පොලීසියෙන් ඇවිදිල්ලා අල්ලා ගෙන යයි කියන බයට බොහෝ භික්ෂූන් වහන්සේලා තවමත් වැඩවලට ඉදිරිපත් වෙන්නේ නැහැ, බෞද්ධ ජනතාව ආරක්ෂා කරගන්ට. මුදල් බලයෙන් ක්‍රිස්තියානි කිරීම වළක්වන්න භික්ෂූන් කටයුතු කරනකොට අර ක්‍රිස්තියානි ප්‍රචාරකයන් ඒ භික්ෂූන්ට තර්ජනය කරනවා කියලා එක භික්ෂුවක් මට කිව්වා. 'අපට මේවාට යන්න බැහැ, ක්‍රිස්තියානි ප්‍රචාරකයන් තරවටු කරනවා කියලා' ඒ අය දැන් ඒ තරමට බලවත් වෙලා. භික්ෂූන් වහන්සේලාට ඔන්න ඔහොම තත්වයක් උදවෙලා තියෙන්නේ. පසුගිය කාලයේ ගෙන ගිය අවිචාරක වැඩ පිළිවෙළ නිසයි

මේ තත්වය උද වුණේ. ඩබ්ලිව්. ඒ. සිල්වා මහතා ඉස්සර අවිචාර සමය කියලා පොතක් ලිව්වා. ඒක ඓතිහාසික නවකතාවක්. ඊටත් වඩා අවිචාර සමයක් මේ පසු ගිය කාලයේ ගත වුණා. ඒක දූත් හීත් සැරේ අඩු වී ගෙන යන බවකුත් පේනවා."

**"මහානායක හාමුදුරුවනේ, අද ශාසනික පිරිහීමක් තියෙනවාද? තියෙනව නම් ඒකට හේතු මොනවාද?"**

"මේ රටේ ශාසනික පිරිහීමට හේතු දෙකක් තියෙනවා. අපට නිදහස ලැබෙන්න කිට්ටුව අප පාලනය කළ ඉංග්‍රීසි ජාතිකයන් සිංහලයන්ගේ, බෞද්ධයන්ගේ තත්වය පිළිබඳව හොඳ අවබෝධයක් ඇතිව ඔවුන්ගේ කටයුතුවලට ආධාර දෙන්න පටන් ගත්තා. මට හොඳට මතකයි, අර මුලදී තිබුණු බුද්ධාගමට විරුද්ධත්වය, ක්‍රිස්තියානිය පතුරුවන්න ඕනෑ කියන ගතිය ඒ ගොල්ලන්ගේ නැති වුණා. මොකද එංගලන්තෙත් උගත් බෞද්ධයන් ඇති වුණා. රිස් ඩේවිඩ් මහතා වැනි අය. ඒ අය බුද්ධාගමට ගරු කරන අය. ඒ නිසා බුද්ධාගමට ගරු කිරීම ආණ්ඩුවේ උසස් ක්‍රිස්තියානි නිලධාරීන් තුළ පවා ඇති වුණා. සමහර වතු සුපරින්ටෙන්ඩන්ට් මහතුන් පවා පාලි ඉගෙන පාලි පොත් ඉංග්‍රීසියට නැඟුවා. ලංකාවේ ඉංග්‍රීසි නිලධාරීන් අතර පවා බුද්ධාගම ගැන ලොකු සැලකිල්ලක් ඇතිවේගෙන ආවා. සිංහලටත් ලොකු සැලකිල්ලක් දැක්වුවා. සිංහලයන් තුළත් ජාතික හැඟීම් බෞද්ධ හැඟීම් වඩ වඩාත් ඇති වෙන්ට පටන් ගත්තා."

"ඔය කාලයේ තමයි අපට නිදහස ලැබුණේ. අවාසනාවකට වාගේ ඒ නිදහස ලබා ගැනීමට ඉදිරිපත් වෙච්ච අය, ඒ සඳහා පාලක නීතිමාලාව හදපු අය විසින් අනිවාර්යයෙන් කළ යුතු දෙයක් නොතකා හැරියා. ලංකාව ඉංග්‍රීසින්ට බාර දුන්නේ සිංහල බෞද්ධයන් භික්ෂූන් වහන්සේලා සහිතව. නිදහස ලබා පාලන නීතිමාලාව හැදීමේදී ඒ ඇත්තන්ගේ යුතුකමව තිබුණේ අස්ගිරි මල්වතු දෙකේ සංඝයා විශේෂයෙන් මහානායක හිමිවරුන් කැඳවලා උන්වහන්සේලාගේ අදහස් විමසන්න. ඒ පැත්ත එහෙම පිටින්ම අමතක කරලා ක්‍රිස්තියානි පූජකයන්ගේ අදහස්, උපදෙස් අරගෙනයි මේ පාලන නීතිමාලාව හැදුවේ, ඒ ගොල්ලන්ට ඕන විදියට. අපේ පාලක පක්ෂයේ ඩී. ඇස්. සේනානායක

වැනි ඇත්තන් ක්‍රිස්තියානි පූජකයන්ගේ උපාය මාර්ග ගැන ගැඹුරින් තේරුම් ගෙන සිටියේ නැහැ. ඔය අවස්ථාවේ සිටිය යුතු කෙනෙක් එහි සිටියේ නැහැ. ඒක ලොකුම අඩුවක් වුණා. ඒ තමයි සර් ඩී. බී. ජයතිලක මහතා. ලංකාවට උචිතනා ක්‍රමය හොඳින් දැනගෙන සිටි ප්‍රධානම පුද්ගලයා ඔහු තමයි. උන්නැහැ හිටියා නම් ඕක ඔයිට වැඩිය වෙනස් වෙනවා."

"ඉතින් අපට හද ගත්ත, අපට ලැබිච්ච පාලන ක්‍රමය අනුව අපට මොකද වුණේ? අර අවසාන කාලයේ සිංහලයන් හා බෞද්ධයන් තුළ නැගී ආ ජාතික ආගමික හැඟීම් ටිකින් ටික පිරිහෙන විදියට කරුණු යෙදුණා. ඒ තත්වය දවසින් දවසම වැඩි වුණා. ඒ මුලින් තත්වයට වඩා මත්පැන් පවා වැඩිවෙන්න පටන් ගත්තා. එදට වඩා ගෝසාතක මඩු වැඩි වෙන්න පටන් ගත්තා. මා දන්නවා අප ඉගෙන ගන්න කාලයේ ඉංග්‍රීසි ආණ්ඩුවෙන් පවත්වපු පාඨශාලාවල පවා ඉගැන්නුවේ ලෝවැඩ සඟරාව, සුභාෂිතය, ලෝකෝපකාරය, ගුත්තිලය, උම්මග්ග ජාතකය, සැළලිහිණි සන්දේශය ආදි පොත පත. මෙයින් සමහර පොත් විභාගවලට පවා නියමිතව තිබුණා."

"අප නිදහස ලබා ගත්තට පස්සේ හීන්සැරේ අපේ අධ්‍යාපන ක්‍රමයෙන් ඕවා ටිකින් ටික අයින් වෙන්න පටන් අරන් අන්තිමට ඔක්කෝම අයින් වුණා. අපේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අයට මොනවා වුණාද කියලා මා දන්නේ නැහැ. අපේ සිංහල භාෂාවේ දියුණුව පිළිබඳව ලොකු උනන්දුවක් තිබුණා ඉංග්‍රීසි ආණ්ඩුව අවසාන කාලයේ. භාෂාව දියුණු කරන්න ඕනෑ කියලා මහත් උනන්දුවක් හටගෙන තිබුණා. නමුත් නිදහස ලැබුණායින් පස්සේ දවසින් දවස ඒක පිරිහුණා මිසක් දියුණුවක් ඇති වුණේ නැහැ. අද හුඟාක් ස්කෝල ගුරුවරුන්ට නවරත්නයේ ශ්ලෝකයක් කියන්න බැහැ. බුද්ධගජ්ජයේ ශ්ලෝකයක් කියන්න බැහැ. පාසැලක ඉහළම පන්තියේ ඉගෙන ගන්න ළමයෙකුට, මේ ඊයේ පෙරේදා මා බුද්ධගජ් ජයේ ශ්ලෝක කියවන්න සූදානම් වුණා. ඔහුට බැහැ ඒවා කියවන්න. ඉස්සර එහෙම නෙවෙයි. පාසැල් ගුරුවරු බොහෝ දක්ෂ අය. අප ස්කෝලෙ යන කාලේ ඉගෙන ගත් සයිමන්ද සිල්වා මුදලිතුමාගේ හවෙනි පොතේ අවසානයේ තියෙන ශ්ලෝක මාලාව මට අදත් මතකයි."

'මාතා ශත්‍රුඃ පිතා වෛරී යෙන බාලො න පාඨිතඃ'

"ඔන්න ඕවා තමයි ඉගෙන ගන්න තිබුණේ. ගුරුවරුත් අපට ඒවා කියෙව්වා. ඔය ඉංග්‍රීසි ආණ්ඩු කාලේ. අද අපේ සිංහල ආණ්ඩු කාලේ ඔය වැදගත් පොත පත කියවන්ට බොහෝ දෙනාට බැහැ. මහාප්‍රාණ ඝධ වෙනුවට සමහරු භාවිතා කරන්නේ 'ජ' යන්න නැත්නම් 'ක්' යන්න හා 'ධ' යන්නයි. මහාප්‍රාණ ඝධ අපේ පොත්වලින් අස්වෙන තැනට ගිහිල්ලා. මුද්‍රණ කරුවනුත් දන්නේ නැහැ මේක. 'ඝධ' ලිව්වොත් ඒ අය ගහන්නේ 'ක්' යන්නයි 'ධ' යන්නයි. මේ නිසා දේශයට ලක් වන්නේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව. හැමදම ළමයින්ට විෂය වැඩි කරනවා. විෂය වැඩි කරන්න ඉස්සරවෙලා භාෂා ඥානය දියුණු කරන්ට ඕනෑ."

"සිංහල භාෂාව සංස්කෘත වචනත් එක්ක මිශ්‍රයි. මොනම සංස්කෘත වචනයක් වුණත් හොඳට ශබ්ද කරලා කියන්ට ලියන්ට තරමට භාෂා ඥානයෙන් පරිපෝෂිත වෙන්නට ඕනෑ. පොත පත තේරුම් ගන්ට තරම් භාෂා ඥානය ඇති කළ යුතුයි. මේ ළමයින්ට විද්‍යා විෂය ආදි එක එක විෂය වැඩි කරන එක නෙවෙයි, පළමුවෙන් කරන්න ඕනෑ භාෂා ඥානය වැඩීමයි."

"අදනම් අපේ අධ්‍යාපනය පිරිහිලා එහෙම පිටින්ම. වැදගත් සිංහල පොතක් පතක් කියන්ට බැහැ. නවකතා භාෂාව විතරයි ශිෂ්‍යයන්ට පුළුවන්. අපේ පැරණි සාහිත්‍ය පොත් පත් **උම්මග්ග ජාතකය** වගේ ඒවා ඒ අයගේ අතට දුන්නොත් ඒවා තේරුම් ගැනීම පමණක් නොව කියවීම පවා ඔවුන්ට බැහැ. මොනවද කියන්නේ කියලා තේරුමක් නැහැ. නිදහස ලැබුදා හිටන්ම ශිෂ්‍යයන්ගේ භාෂා ඥානය ක්‍රමයෙන් පිරිහුණා. ඒ වගේම රටේ අපරාධ වැඩි වුණා. අල්ලස් ගැනීම් වැඩි වුණා. බෞද්ධ ප්‍රතිපත්තිවලට බෞද්ධයන්ගේ සැලකිල්ල ක්‍රමයෙන් අඩු වෙලා ගියා. ඒකට හේතුව රටේ ගෙන ගිය වැඩ පිළිවෙළයි."

"තව ලොකුම වැරැද්දක් අපට වුණා. අර ඉංග්‍රීසි ආණ්ඩු කාලයේ ආගම රැක ගන්න ඕනෑ, ජාතිය රැක ගන්න ඕනෑ කියලා මිනිසුන් තුළ ඇතිවෙච්ච උනන්දුව දෙකට තුනට හතරට පහට බෙදිලා ගියා. අපේ මේ දේශපාලන පක්ෂ තර කිරීමට ඒ මිනිසුන් යොදා ගත්තා. යූ.ඇන්.පී. කාරයන්ගේ බුද්ධාගම යූ.ඇන්.පියට පක්ෂ

නම්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂ කාරයන්ගේ බුද්ධාගම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට පක්ෂ නම්. කොමියුනිස්ට් පක්ෂයට කිසි ආගමක් නැහැ. ඒ අය මාක්ස්වාදීන්. ඉතින් ආගම් අදහන මිනිසුන්ගෙන් තමයි ආගම රැකෙන්නේ. ආගම අදහන බෞද්ධයන් කියන අය තමයි ඔය පක්ෂ හැම එකකටම බෙදෙන්නේ. නමුත් ක්‍රිස්තියානි අය පූජකයන්ගේ වචනෙට කීකරුයි. ඒ නිසා ඒවා රැකෙනවා. බෞද්ධයන් අපේ දේශපාලනඥයන් විසින් තම තමන්ගේ පක්ෂවලට ඇදගෙන බෙද වෙන් කරගෙන ආගම අතට යොමුවෙලා තිබුණ ඔවුන්ගේ උනන්දුව පක්ෂය නංවාලීමට යොදවා ගෙන තියෙනවා. ඒ නිසා ලංකාවේ බුද්ධාගමත් බෞද්ධයන්ගේ ප්‍රතිපත්තිත් පිරිහීගෙන යනවා. එක පන්සලක ශ්‍රී ලංකා පාක්ෂික පිරිස පූජාවක් පින්කමක් කරනවා නම් ඒකට යූ.ඇන්.පී. පාක්ෂිකයන් එන්නේ නැහැ. ඒ ගොල්ලන් විරුද්ධ පක්ෂයක් වශයෙන් සලකනවා. ඊළඟට යූ.ඇන්.පී. පාක්ෂිකයන් යම්කිසි පූජාවක් පින්කමක් කරනවා නම් ශ්‍රී ලංකා පාක්ෂිකයන් ඒකට යන්නේ නැහැ. ඒකට විරුද්ධයි. ඉතින් ඔන්න ඔහොමයි ලංකාවට වෙලා තියෙන දේ.''

''භික්ෂූන් වහන්සේලාත් මේ දේශපාලනඥයන් විසින් තම තමන්ගේ දේශපාලන පක්ෂවලට දේශපාලන වේදිකාවලට ඇද ගෙන යනවා. නොගියොත් ඒ භික්ෂුවගෙන් පලි ගන්නවා. ප්‍රකටව නොකළත් අප්‍රකටව හරි පලි ගන්නවා. ඒ නිසා භික්ෂූන් වහන්සේලා බයයි. භික්ෂූන් දේශපාලනයට යනවා කියා අද බොහෝදෙනා දෙස් කියනවා. පන්සලේ දයකයන් පක්ෂවලට බෙදිලා ඉන්න නිසා ඔවුන් කැදෙව්වාම නොගියොත් භික්ෂුව තනි වෙනවා. මා දන්නවා එක්තරා පන්සලක භික්ෂූන් වහන්සේ නමක් දේශපාලන යන්න කැමති වුණේ නැහැ පන්සලේ තියෙනවා කාර් එකක්. ටික දවසක් යනකොට කවුරුහරි පිරිසක් කාර් එක පුච්චලා දම්මා. ඇයි? දේශපාලන වේදිකාවට ඒ හාමුදුරුවන් ගියේ නැති නිසා. ඔන්න ඔය තැනට වැටිලා බෞද්ධ ගිහියා අද. ලංකාවේ භික්ෂූන් වහන්සේලාගේ ප්‍රතිපත්ති බොහෝ දුරට හීනවීමට එක හේතුවක් දේශපාලන පක්ෂවලට භික්ෂූන් ඇද ගැනීම. නොගියොත් උන් වහන්සේලාට හිරිහැර කරනවා. ඒ නිසා බයේ ඒවාට යනවා. ඔන්න ඔහොමයි තත්වය. ඉතින් ඕක එක හේතුවක්.''

"ඊළඟට රජයෙන්ම රටේ මත්පැන් නිපදවනවා. ඒවා වැඩි කරනවා. ඒවායේ වෙළඳම් වැඩි කරනවා. මා දන්නවා අපේ පළාතේ එක් ගමක ගම්මුන් එකතු වෙලා අපට හරක් මස් කන්ට එපා කියද්දි මන්ත්‍රීවරයෙක් බලෙන් මස්කඩ විවෘත කළා. පස්සේ මිනිසුන් ඒක වර්ජනය කළා. ඒ පාර ඒක අයින් කර ගත්තා. ජනතාව එපා කියද්දී අරක්කු තැබෑරුම් බලෙන් දැම්මා. ඒ රජයේ සමහර මන්ත්‍රීවරුන් කරන වැඩ."

"ඉතින් ඔය විදියට මේ රටේ බෞද්ධයන්ගේ බෞද්ධ ප්‍රතිපත්ති ක්‍රමයෙන් පිරිහෙන තැනට කරුණු සැලසීගෙන ගියා. මිනිසුන් තුළ පක්ෂ ප්‍රතිපත්ති වැඩි වෙන්න පටන් ගත්තා. හැබෑවෙන් හරි බොරුවෙන් හරි භික්ෂූන් වහන්සේලාත් ඒවාට බෙදන්න පටන් ගත්තා. පක්ෂග්‍රාහී වෙනකොට මිනිසෙකුගේ ප්‍රතිපත්ති නැති වෙනවා. ප්‍රතිපත්තිවලට පිටින් අගතියෙන් වැඩ කරන්න සිද්ද වෙනවා."

"ඔය එක අංශයක්. අනික භික්ෂූන් වහන්සේලාට පිරිවෙන්වලින් ත්‍රිපිටක ධර්මය ඉගැන්වීමට වඩා ඇස්.ඇස්.සී., එච්.ඇස්.සී. පැත්තට යොමු කරවීමෙන් ධර්මය හා පාලි ඉගෙනීම දුර්වල වුණා. එච්.ඇස්.සී පන්තියේ ඉගෙන ගන්න භික්ෂු නමකගෙන් මා ඇහුවා, දවසක් අංගුත්තරනිකාය එහෙම කියවලා තියෙනවද කියලා. ඒ ගැන ඒ නම මොකවත් දන්නේ නැහැ. මේ කාලයේ ඔය යන්තම් විභාගයට පාලි ටිකක් තියෙනවා. එච්චරයි ඒ ඇත්තන් දන්නේ. ඒ භික්ෂූන් ධර්මය දන්නේ නැහැ. පාලි දන්නෙත් නැහැ. නමුත් ස්කෝල ගුරුවරු, උපාධිධරයෝ. සමහර පිරිවෙන් නිසා භික්ෂූන්ගේ දැනුම පිරිහිලා ගියා. නමුත් පිරිවෙන් කිහිපයක් තවමත් හොඳින් වැඩ කරනවා. බොහොමයක් පිරිවෙන් ග්‍රාන්ට් එක වැඩියෙන් ගන්න ඕනෑ නිසා ගිහි ළමයින් වැඩි කරගෙන ඒ අයට දෙන අධ්‍යාපනය භික්ෂූන්ටත් දෙනවා. භික්ෂූන් වහන්සේලාට අවශ්‍ය අධ්‍යාපනය ගැන මහන්සි වෙන්නේ නැහැ. සුදුසු ගුරුවරුන් සොයා ගන්නත් බැරි නිසා වඩාත් ඒ ගැන හිතන්නේ නැහැ."

"ඉතින් ඔය නිසා භික්ෂූන් වහන්සේලාගේ ආගමික දැනුම පුදුම විදියට අඩුවී ගෙන යනවා. මේ අතර ඇතැම් පිරිවෙනක් වෑයම් කරනවා අර පැරණි ක්‍රමය ආරක්ෂා කර ගන්න. එබඳු පිරිවෙන් දෙක තුනක් නිසා තවමත් භික්ෂු අධ්‍යාපනය ටිකක්

රැකිලා තියෙනවා. ඒ සමඟම විශ්ව විද්‍යාල ගැනත් යමක් කියන්න ඕනෑ. දැන් කොහොමද මා දන්නේ නැහැ. ඒ දවස්වල කුලපතිවරුන් මා සමග කිව්වා, ඒවායේ භික්ෂූන් වහන්සේලාගේ හික්මීම අඩුයි කියලා. ඒ තරමටම පිරිහීමක් ඇතිවෙලා. එවැනි ආගමානුකූල හික්මීමක් නැති භික්ෂූන් පිරිවෙන්වල ගුරුවරුන් වුණාම ඒ පිරිවෙනුත් නරක් වෙනවා. එබඳු තත්වයක් එක අංශයකින් උදුවෙලා තියෙනවා."

"අපේ භික්ෂූන් වහන්සේලාගේ දැන් තියෙන අධ්‍යාපනය නම් එච්චර උසස් ප්‍රතිඵල ගෙන දෙන එකක් නොවෙයි. මගේ හැඟීම අනුව එකක් කියන්නම්. දැන් පිරිවෙන්වලට හදලා තියෙන පොත් ලැයිස්තුවේ පහළ පන්තියේ ඉඳලාම පාලියි, සංස්කෘතයි එකට තියෙනවා. මේක නුවණ ඇති කෙනෙකුට, ඉගැන්වීමේ පළපුරුද්ද ඇති කෙනෙකුට කවදාවත් අනුමත කරන්න බැරි දෙයක්. මේ ළාබාල හෙරණුන්ට පාලිභාෂාවතරණය වගේ පොතක් ඉගෙන ගන්න ගමන් සංස්කෘත ශික්ෂකය වගේ එකක් අති පැත්තෙන් උගන්වන්න ගියාම ඒ දෙක එකට පටලැවෙනවා නේ. ඒ දෙක සමාන භාෂා දෙකක්. ඒ නිසා සමහරුන් සමහර තැන පාලි වචන වෙනුවට සංස්කෘත වචන ලියනවා. සංස්කෘත වචන වෙනුවට පාලි වචන ලියනවා. මේ දෙක වෙන් කරලා හිතන්න මේ කුඩා දරුවන්ට පුළුවන්ද?"

"මාළිගාකන්දේ පිරිවෙනේ ඉස්සර බොහෝදුරට පාලි ඉගෙන ගෙන, රූපසිද්ධිය හෙම කියවලා, පාලි භාෂාව ගැන බැස ගත්ත දැනුමක් ඇති වුණායින් පස්සෙයි සංස්කෘත ඉගැන්නුවේ. මාළිගාකන්දේ ඉගෙන ගත් භික්ෂූන් වහන්සේලාට ඒ නියම ක්‍රමය මුල ඉඳලාම හික්කඩුවේ නායක හාමුදුරුවන් සකස් කර තිබුණා. වෙදකම් ඉගෙන ගන්න ගිහියන්ට නම් මුල ඉඳලා සංස්කෘත උගන්වනවා. ඒ අයට පාලිත් ඉගෙන ගන්න ඕනෑ නම් 'සංස්කෘත බොහෝ දුරට ඉගෙන ගත්තට පස්සෙයි පාලි උගන්වන්නේ. ඔය දෙක එකට මුල ඉඳලම කවදාවත් ඉගැන්නුවේ නැහැ. මේ දෙක එකට ඉගැන්වීම හරියට ලතින් ග්‍රීක් දෙක එකට උගන්වනවා වගෙයි. ඉස්සර නම් ස්කෝලවල ලතින් ග්‍රීක් දෙක එකට උගන්වන්නේ නැහැ. ලතින් උගන්වනවා නම් ඉංග්‍රීසිත් එක්ක ලතින් උගන්වනවා. ලතින් උගන්වා හොඳට දියුණු වුණායින් පස්සෙයි ග්‍රීක් උගන්වන්නේ."


"ඒ නිසා අපේ ළාබාල උන්නාන්සේලාට මේ දෙක එකට උගන්වන්න යාමෙන් මේ දෙකම එපා වෙනවා. සමහර දක්ෂ කුඩා සිසුවකු ඒ දෙකම එකට ඉගෙන ගත්තත් වැඩි දෙනාට ඒ වැඩේ බැහැ. ඔවුන් වැඩි දෙනා පාලි සංස්කෘත දෙකම හැර දමා වෙන විෂයයන් ඉගෙන ගන්නට පුරුදු වී තිබෙන්නේ මේ නිසයි."

"පාලි වෙළඳ භාෂාවක් නොවෙයි. ඉංග්‍රීසි වෙළඳ භාෂාවක්. ඒකේ කටපාඩම් කරන්න දෙයක් නැහැ. කතා කිරීමේ පුරුද්දෙන් ඒක හුරු කර ගන්න පුළුවන්. ඒ විදියට පාලි උගන්වන්න යන එක හරි නැහැ. පාලි, සංස්කෘත, ලතින්, ග්‍රීක් භාෂා අර පැරණි ක්‍රමයට උගන්වන්න ඕනෑ. හැබැයි ඒවා ලේසියෙන් උගන්වන්නත් පුළුවනි. **බාලාවතාරය** වගේ පොත් මුලින්ම කියවමින් වෙහෙස දෙන්න හොඳනැහැ. දැන් **පාලි භාෂාවතරණය** තියෙනවා. ඒක හොඳයි. මා ලියාපු **පාලි ශික්ෂකය** කියන එකත් හොඳයි. ඒවා ටිකක් කල් ඉගෙන ගත්තාම පාලි ව්‍යාකරණ නීති රීති ඔක්කෝම දැනගන්න පුළුවන්. ඊට පස්සේ **බාලාවතාරය** ආදි පොත් පැරණි ක්‍රමයට උගන්වන්න ඕනෑ. ඒවා අත් අරින්න හොඳ නැහැ. ඒවත් ඕනෑ. එහෙම උගන්වමින් බණ පොත් පැත්ත වැඩියෙන් උගන්වන්න ඕනෑ. අඩුගානේ **අංගුත්තරනිකාය** ඉවර වෙනකල්වත් අටුවා ටීකා සහිතව විස්තර කරමින් උගන්වන්න ඕනෑ. කැමති නම් **මජ්ඣිමනිකාය** කොටස්වලට බෙදලා අවසන් වෙනකල් අටුවා ටීකා සහිතව උගන්වන්න ඕනෑ."

**"මහානායක හාමුදුරුවනේ, ලෝකයට පිරිසිදු ථෙරවාදී බුදු දහම බෙදා හරින ප්‍රධාන රට ශ්‍රී ලංකාවයි. නමුත් ඒ සඳහා භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීමේ සුදුසු වැඩ පිළිවෙළක් අද මේ දක්වාත් සකස් වෙලා නැහැ නේද?"**

"ලංකාව පමණක් නොවේ. බුරුම සියම් (තායි) දෙරටත් ථෙරවාදය පතුරුවනවා. අපේ රටේ නම් තවම ඒ සඳහා සුදුසු වැඩ පිළිවෙළක් සකස්වෙලා නැහැ. ධර්මදූතයන් පුහුණු කිරීමේ ස්ථාන කියලා සමහරුන් එක එක තැන් ආරම්භ කළා මට තේරුණා ඒවා වැඩි හරියක් ආරම්භ කළේ මහජනයා රවටලා මොන මොනවා හරි හරිහම්බ කරගෙන තම තමන්ගේ පන්සල් තර කරගැනීමේ අරමුණින් බව. පන්සල පොහොසත් වුණායින් පස්සේ ධර්මදූත

පුහුණුව ඉවර වෙනවා. ඔන්න ඔහොම වැඩ පිළිවෙළක් නම් නොයෙක් තැන්වල ආරම්භ වුණා. ඒ නිසා ධර්මදූතයන් පුහුණු-කිරීමේ වැඩ පිළිවෙළ පවා මහා බොරුවක් බවට පත්වෙලා තියෙනවා. මොකද මේවා ආරම්භ කළ අයගේ අදහස් ධර්මදූතයන් පුහුණු කිරීම නොවෙයි. ඒ මුවාවෙන් තමන්ගේ තැන සකස් කර ගැනීමයි. ඉතින් මේ විදියේ වංචනික වැඩ නිසා මේ රටේ හරි වැඩක් කරන කෙනෙකුටවත් තැනක් නැහැ.''



ජයවර්ධන ගම චිත්ත විවේකාරාම පුස්තකාලයේ ......

''මා බොහොම කාලයක ඉඳන් ඔය ධර්මදූතයන් පුහුණු කරන ක්‍රමය ගැන හිත හිතා ඉන්න කෙනෙක්. ඒකට ගැළපෙන ආකාරයට තැනක් හද ගන්නටත් ඕනෑකම මට තිබුණා. මා ඒ කාලවල වගකිවයුත්තන්ට දැනුම් දුන්නත් මට ඒකට නියම සහයෝගයක් ලැබුණේ නැහැ. මොකද මට එක එක්කෙනා සතුටු කරලා, බොරුවට ස්තුති කරලා යම් යම් දේ ලබා ගැනීමට හුරු කමක් නැහැ. වන්දිභට්ටකම් කරන්නට කැමති නැහැ. ඒ නිසා කොච්චර අවංකව කටයුතු ආරම්භ කළත් මට ඒකට දෙර විවෘත වුණේ නැහැ. සහයෝගය ලැබුණෙත් නැහැ. ඉතින් මේ ස්ථානය

(රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා) එකල අගමැතිතුමා මට හදලා දුන්නා විවේක ස්ථානයක් වශයෙන්. එහෙත් ධර්මදූතයන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් වශයෙන් මෙතන හොඳ නැහැ. මෙතන උෂ්ණය අධිකයි. පිටරටින් මෙහාට එන අය මෙතන උෂ්ණය අධික නිසා ටික දවසක් ඉඳලා මෙතනින් ඉවත්ව යන්න යනවා. ඉතින් ධර්මදූතයන් පුහුණු කරන තැනක් ආරම්භ කරනවා නම් දේශගුණය හා කාලගුණය හොඳට තියෙන ශරීර සෞඛ්‍යය හොඳට රැක ගන්න පුළුවන් පිටිසර ප්‍රදේශයක් තමයි තෝරාගන්න ඕනෑ. භික්ෂූන් ඉන්න කිට්ටුවක පොහෝ සීමාවක් තිබිය යුතුයි. මේ ළඟදී ජපන් ජාතික බුරුමයේ මහණ වෙච්ච භික්ෂු නමක් මෙහාට ඇවිදින් ටික කලක් ඉගෙන ගත්තා. එයාට අර බුරුමයේ විදියට සති දෙකකට වරක් පෝය කරන්ඩ ඕනෑ. එයා මේ ගැන බැලුවා. මෙහේ සීමාවකුත් නැහැ. සීමාවක් සොයාගෙන යන්න ඕනෑ බොහෝම ඈතට. උෂ්ණයත් අධිකයි කියලා එයා කලකිරිලා එංගලන්තෙට ගියා. එංගලන්තෙ තියෙනවා සීමාවකුත් තියෙන බුරුම පන්සලක්. එහේ ඉඳගෙන පාලි භාෂාවයි අභිධර්මයයි ඉගෙන ගන්නවා කියලා මට කිව්වා. ඔය විදියේ අඩුපාඩුකම් මෙතන තියෙනවා. දේශගුණික වශයෙනුත් මෙතන හරි උෂ්ණයි. එංගලන්තෙ වගේ රටවල් සීතලයි. එහේ අය මෙහාට ආවාම වැඩි දවසක් ඉන්නේ නැහැ, ආපසු යනවා. මෙතන ධර්මදූතයන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් වශයෙන් යොදා ගන්නට කොහෙත්ම සුදුසු නැහැ. ඒ වගේ තැනක් සුදුසු තැනක ආරම්භ කරන්න ඕනෑ, භික්ෂූන්ගේ පාලනය යටතේ. හැබැයි ඒක සල්ලි උපයන මාර්ගයක් කර ගන්න ඕනෑ නැහැ. අවංකවම ශාසන සේවාවක් කරන්න ඕනෑ කියන හැඟීම උඩම ඒක පටන් ගන්න ඕනෑ. යම් කෙනෙක් එවැනි තැනක් ආරම්භ කරන්න හිතනවානම් ඒ සඳහා සුදුසු භික්ෂූන් වහන්සේලාත් තෝරා ගෙන රජයේත් සහයෝගය ලබාගෙන අද වුණත් ඒක කරන්න පුළුවන්."

"අනුරාධපුරයේ බුද්ධශ්‍රාවක ධර්මපීඨය ආරම්භ කරලා තිබුණත් එතන දෙන අධ්‍යාපනය මේ විදේශ ධර්මදූත සේවාවට ප්‍රමාණවත් වන්නේ නැහැ. බුද්ධශ්‍රාවක ධර්මපීඨය ආරම්භයේදීම ඒ සඳහා හැදූ පොත් පිළිවෙළ දුටුවාම මට හිතුණා මේක එච්චර සාර්ථක වැඩක් නොවෙයි කියලා. සාමාන්‍ය පිරිවෙන් ක්‍රමයමයි ඒකෙත් තියෙන්නේ. පොත් වැඩි කරනවා. හැම එකම යන්තම් අත

ගගා යනවා මිසක් වෙන වැඩක් නැහැ. ඒකේ නියම කරලා තියෙන හැටියට පාලි ඡන්දෝලංකාර පොත බලන්නත් ඕනෑ, සංස්කෘත ඡන්දෝලංකාර පොත බලන්නත් ඕනෑ. නමුත් දෙකේම උගන්වන්නේ එකමයි. ඉතින් ඔහොම මහා පොත් ගොඩක් වැඩි කරලා තියෙනවා. නමුත් ධර්මය හොඳට ඉගැන්වීමේ මාර්ගය බොහොම කෙටියෙන් තියෙනවා. සුළුකාලයකදී ධර්මය උගන්වන්න පුළුවන් ධර්මදූතයන් වශයෙන් වැඩ කරන්නට. ඒවා ගැන කිසි හුරුකමක් නැති පරණ හණමිටිය බඳගත් අයගේ වැඩ පිළිවෙළමයි අද කොයි පීඨයේත් තියෙන්නේ. ඒක නිසා ඒවායින් එච්චර ලොකු සේවාවක් කෙරෙන්නේ නැහැ."

**"භික්ෂූන් වහන්සේලා මේ යුගයේ ආමිෂය කෙරෙහි ගිජුවීමක් වැඩි වශයෙන් දකින්නට තියෙනවා නේද නායක හාමුදුරුවනේ?"**

"අද බොහෝ තරුණ භික්ෂූන් බලාපොරොත්තු වන්නේ උපාධියක් ලබාගෙන ඉන්පසුව ඒ අනුව වැටුපක් ලබා ගැනීමටයි. වැඩිපුර හිතන්නේ තමන්ගේ කටයුතු කරගෙන යාමටයි. ඊළඟට සමහරුන් බලන්නේ ගිහි වීමටයි. අද වැඩිපුරම දකින්නට තියෙන්නේ ඔය තත්වයයි. ඉතින් ඕක මෙලොව ලාභාපේක්ෂාව තමයි. මේ ඔක්කෝටම එක හේතුවක් තමයි අපේ භික්ෂු පාලනය විනයානුකූල නොවීම. නිකායවල මහනායකවරුන් ඇතුළුව කාරක සංඝ සභා මගින් විනයානුකූල පාලනයක් ගෙන යනවා නම් ඔය තත්වය උදා වන්නේ නැහැ. නමුත් ඒ ඇත්තන්ට විනයානුකූල පාලනයක් ගෙන යන්න නොයෙකුත් අවහිරකම් තියෙනවා."

"යම් භික්ෂුවක් වැරදි වැඩ කරනවා නම් ඒ භික්ෂුව මේ පැවිද්දෙන් අයින් කිරීමට තරම් බලයක් මහානායක හාමුදුරුවන්ටත් නැහැ. එහෙම අයින් කරන්ට නම් මහානායක හාමුදුරුවන් උසාවියට යන්න ඕනෑ. ඉතින් උසාවි වලට යන්න ඒ ඇත්තන් කැමති නැහැ. මහනායක හාමුදුරුවන් ප්‍රධාන සංඝ සභාවට භික්ෂුවක් අයින් කිරීමට රජයෙන් බලයක් දීලා නැහැ. නමුත් කතෝලික බිෂොප්තුමාට ඕනෑ පූජකයකු අයින් කරන්න බලය තියෙනවා. ඒ ඇත්තන්ට තියෙන බලය අපට නැහැ. ඒ නිසා අපේ සමහර භික්ෂූන් හිතුවක්කාර ලෙස ක්‍රියා කරනවා. මහානායක

හාමුදුරුවන්ටත් කීකරු නැහැ. පාලනය නියම විදියට සකස් කිරීමට රජයෙන් නියම සහයෝගය ලැබුණා නම් අපේ භික්ෂූන් ටික ආරක්ෂා කර ගන්ට තිබුණා. කලක්ම මොකක්දේ 'සංඝාධිකරණය' කියලා එකක් අනුමත කරනවා කියලා හැමදම භික්ෂූන් වහන්සේලාව රැවැට්ටුවා. කරන්නේ නැත්නම් කරන්නේ නෑ කියලා නිකම් ඉන්න ඕනෑ, ඇත්ත වශයෙන් මා නම් හරියට කලකිරිලා ඉන්නේ."

"භික්ෂූන් වහන්සේ මත්පැන් බොන්න එපා කියලා මහ ජනතාවට බණ කියනවා. රජය මත්පැන් රටේ පතුරුවනවා. එතකොට භික්ෂූන් වහන්සේ බණ කියන්නේ රජයට විරුද්ධවනේ. භික්ෂුව බණ කියනවා ළමයින්ට මාළු අල්ලන්න එපා කියලා. මාළු වැංකි හදන්න එපා කියලා. රජයෙන් ඒවා පාසැලේදී උගන්වනවා ඒවා කරන්නට කියලා. ඉතින් භික්ෂූන් වහන්සේ රජයට විරුද්ධවයි බණ කියන්නේ. ඔහොම තත්වයක් තමයි උදවෙලා තියෙන්නේ. ඒ විදියේ පාලන ක්‍රමයක් යටතේ රජය ගිහියන් ලවා බෞද්ධ ප්‍රතිපත්ති කඩවන විදියේ ක්‍රියාමාර්ගයන් අරගෙන තියෙනවානම් ඒ රටේ මහජනයා බුද්ධාගම රැක ගන්නේ කොහොමද? භික්ෂූන්ගේ කීමට වඩා රජයේ වැඩ පිළිවෙළට මිනිසුන් යටත් වෙනවා. ඉතින් ඕවා ඔහොම තිබුණත් මට නම් හිතට සතුටු වෙන්න තව එක දෙයක් තියෙනවා. සමහර භික්ෂූන් වහන්සේලා ඉන්නවා, උන් වහන්සේලාට ඕනෑකම තියෙනවා රට හදන්න, ආගම දියුණු කරන්න. ආගම රට රැක ගන්න හිතන ගිහි අයත් ඉන්නවා. මා නම් කිසිම දේශපාලන පක්ෂයකට නැහැ. මොන පක්ෂයෙන් හරි හොඳ වැඩක් කරනවා නම් ඒක හොඳයි. නරක වැඩක් කරනවා නම් ඒක නරකයි. ඒකයි මගේ පිළිගැනීම. යූ.ඇන්. පියෙන් වේවා නරක වැඩක් කළොත් ඒක නරකයි. ශ්‍රී ලංකාවෙන් වේවා නරක වැඩක් කළොත් ඒක නරකයි. හොඳනම් හොඳයි. නරකනම් නරකයි. ඒකයි මගේ පක්ෂය."

# කතරගම දෙවියන් මගේ ඇස් දෙකෙන්ම දැක්කා

13

**කුසල කර්ම ඵල විපාක ලබන්න ප්‍රාර්ථනාවක් කරන්නම අවශ්‍යද? මේ ගැන නායක හාමුදුරුවන්ගේ අදහස දැන ගන්න මා කැමතියි.**

"ලෝකයේ සැප සම්පත් ලැබීමට දානාදි කුසල කර්ම කරන අය ඒ සඳහා ප්‍රාර්ථනාවක් කරන්නම අවශ්‍ය නැහැ.

දානං බලු සභාවෙන - සග්ග මානුස භෝගදං
පරිණාම වසෙනෙව - හොති මොක්ඛූපනිස්සයං·

කියන ගාථාව ප්‍රසිද්ධයිනේ, දන්දීම විතරක් නොවෙයි, ශීලයත් එහෙමයි. මේ ලෞකික සැප ලබන්න නම්, සුගති සැප ලබන්න නම් ප්‍රාර්ථනා කරන්න ඕනෑ නෑ, ස්වභාවයෙන්ම කුසල කර්මයක ශක්තිය තියෙනවා, ඒවාට සැප විපාක දෙන්නට. බේතක් කන එක්කෙනා මේකෙන් මට සනීප වේවායි කියලා හිතන්න අවශ්‍ය නැහැ. බෙහෙතේම තියෙනවානේ සනීපය දෙන ශක්තිය. කුසල කර්ම කරලා ප්‍රාර්ථනා කළාට ඇති වැරද්දකුත් නැහැ. හැබැයි ඒ ලබන සැපත හොඳ අතකට යොමු කරවන්න නම් සැප ලැබුවාම මේවා මේවා කරන්න ඕනෑ කියලා ප්‍රාර්ථනා තබන එක නම් සුදුසුයි."

"පරිණාමය කියන්නේ මුහුකුරායාම, මේරීම, 'පරිණාම වසෙනෙව හොති මොක්ඛූපනිස්සයං' දානයක් දෙන අය කරන්නේ ලෝභය, ද්වේෂය, මෝහය, දුරු කිරීමට පුරුදු වීමක්. එතනදී තාවකාලිකව ඒවා දුරුවන්නේ. කවදහරි සම්පූර්ණයෙන්ම ලෝභ, ද්වේෂ, මෝහයන් දුරු කිරීමට මෙය ප්‍රත්‍යය වේවා, උපකාරී වේවා, කියලා පැතුවොත් අන්න පරිණාමය නිවන් අතට හුරු කරවීම. රහත්වීම කියන්නේ ලෝභය, ද්වේෂය, මෝහය සම්පූර්ණයෙන්ම නැතිකර දැමීමයි. අන්න ඒකට යොමු කරවන එකයි පින

මුහුකුරායාම කියන්නේ. ඉතින් ඒ සඳහා පෙර කී විදියට ප්‍රාර්ථනාව කරන්න ඕනෑ."

**"මළවුන්ට පින්දීම සඳහා දනාදි කුසල කර්ම කිරීමේදී දින වකවානු නියම කරගැනීමක් දකින්නට ලැබෙනවා. මේ ගැන මහානායක හාමුදුරුවන් පැහැදිලි කිරීමක් කළොත් හොඳයි."**

"එහෙම නියමිත දින වකවානුවක් අපේ පොත්වල නම් සඳහන් වෙලා නැහැ. බොහෝ විට තුන් දවසින්, හත් දවසින්, තුන්මාසයෙන්, අවුරුද්දෙන් පරලොව ගිය නෑයන් වෙනුවෙන් එවැනි පින්කම් කරනවා දකින්න ලැබෙනවා. හින්දූන්ගේ ගරුඩ පුරාණ ආදියේ සඳහන් අන්දමට මළ ගිය අයගේ පරලොව ගමන නිරුපද්‍රිතව සකස් කිරීමට තුන් දිනෙන්, හත් දවසින් යනාදි වශයෙන් කළ යුතු පූජා විධි අනුගමනය කරනවා. බෞද්ධයනුත් ඒ අනුව දින නියමයක් පුරුදු කරගෙන තියෙනවා වෙන්න ඇති. නමුත් බිම්බිසාර රජතුමා දුන් දනයේදී කල්ප ගණනකට පෙර ප්‍රේත ආත්මයේ සිටි නෑයන්ට බොහොම කලකට පස්සේ දුන්න ඒ දනයේ පින් අනුමෝදන් කර ගන්න පුළුවන් වුණා. එහෙම වුණේ ඒ අය එය බලාපොරොත්තුව සිටිය නිසයි. ඒ නිසා ඕකේ කාල නියමයක් නැහැ. කෙනෙකුට පහසු දිනක පින්කම් කරලා පින් අනුමෝදන් කළ හැකියි. ඒ බව මියගිය අයට දැනෙනවා නම් අනුමෝදන් වෙන්න පුළුවනි. අනුමෝදන් වෙනවා කියන්නේ එතනට ඇවිත් හෝ එය පෙණෙන තෙක් මානයේ ඉඳ ඒක දැකලා සතුටුවීම. හැබැයි දැනෙන තැනක ඒ අය ඉන්න ඕනෑ."

"පරදත්තූප - ජීවී, භූතනිකායේ උපන් ප්‍රේතයින්ට එවා දැනෙනවා. ප්‍රේතයින් කියන්නේ පරලොව ගිය අය. පරලොව යන හැමකෙනාම හඳුන්වන්නේ ප්‍රේත කියලා. දෙවියන්ටත් ප්‍රේත කියලා කියනවා. ප්‍ර+ඉත = ප්‍රේත. ඉතින් පරලොව යන අය බොහෝදෙනා මිය යන විටම තමන්ගේ කර්මයට අනුකූල ලෙස මනුෂ්‍ය ආශ්‍රමයක් ලැබෙන විදියට මවු කුසේ පිළියෙළ වෙලා නැත්නම් අතරමං වෙනවා. ඔය තත්වයට සර්වාස්තිවාදීන් කියන්නේ අන්තරාභවය කියලා. අප කියන්නේ මේ සාමාන්‍යයෙන් පරදත්තූපජීවී භූත නිකායක් කියලා. එය පොළොවට සම්බන්ධ භූත නිකායක්. කාම රූප අරූප කියන භව තුනෙන් වෙනස්වන භවයක් නොවෙයි. ඒ භව තුනට

අයිති නැති එකක් හැටියට කාරණා විවරණය වන නිසායි අන්තරාභවය ප්‍රතික්ෂේප කරලා තියෙන්නේ. ඉතින් මේ භූතනිකායේ අය මේ ශරීරයටම සමාන සියුම් ශරීර ඇති අයයි. ඒ ගොල්ලන්ට ඉංග්‍රීසියෙන් කියනවා 'අර්ත් බවුන්ඩ් ස්පිරිට්ස්' කියලා.''

''ඉතා වැඩි හරිය ඒ ගොල්ලෝ, ගෙවලට එනවා පළමු ස්වරූපයෙන්ම. මේ ගැන කතාවක් මා කියන්නම්. මට මතකයි මහනුවර සෙනෙවිරත්න කියන මහත්මයකුගේ මවගේ මව, ඒ මහත්මයා එංගලන්තයේ ඉඳලා ඇවිත් ආපහු යන වෙලාවේ කිව්වා, 'ඒ රටට යන්න ඕනැ රට බලන්න' කියලා, ඒත් මේ ආච්චි අම්මා බොහොම වයස හා අසනීප නිසා 'අනික් වර එක්ක යන්නම්' කියලා රවටලා ඒ මහත්මයා ආපසු එංගලන්තයට ගියා. ඊට මාස කීපයකට පස්සේ මේ ආච්චි මරණයට පත් වුණා. ඇය කවදාවත් එංගලන්තයට ගිහින් තිබුණේ නැහැ. මේ මරණය ගැන ඒ සෙනෙවිරත්න මහත්තයට දැනුම් දුන්නම උන්නැහැ ඒ වෙනුවෙන් ලංඩන් විහාරයට දානයක් දුන්නා. මාත් ඒ දවස්වල ලංඩන් විහාරයේ.''

''ඊට ටික දවසකට පස්සේ ඒ මහත්මයා නැවත ඇවිත් හම්මලව සද්ධාතිස්ස ස්ථවිරයන් හමුවෙලා කාරණයක් කිව්වා. 'අනේ මා දන්නේ නැහැ, ඕක ආනන්ද මෛත්‍රෙය හාමුදුරුවන්ගෙන් අහන්න' කියලා මා ඉන්න තැනට එව්වා. එයා පින්තූර දෙකක් අරගෙන විත් තිබුණා. දවසක් එයාගේ නෝනා තේ පිළියෙළ කරන්න කුස්සියට යන කොට අර මාස කීපයකට උඩදී ලංකාවේදී මැරුණු ආච්චි අම්මා එහේ ඉන්නවා දැකලා, විගහට ගිහින් මහත්තයාට කියලා තියෙනවා, 'අන්න ආච්චි ඇවිල්ලා ඉන්නවා' කියලා. මහත්තයාත් ඉක්මනට ඇවිත් බලන කොට මෙන්න ආච්චි ඉන්නවා. ඉතින් ඉක්මනට කැමරාව ගෙනත් පින්තූරයක් ගත්තා. ළඟට යන්න බයේ ඈතින් ඉඳගෙන බලා ගෙන ඉඳලා තියෙනවා.''

''ආයෙත් දවසක් දවල් දෙකට විතර ඒ මහත්තයාම තේ පිළියෙළ කරන්න ගියාම එදාත් දැකලා තියෙනවා. එදාත් පින්තූරයක් අරගෙන තියෙනවා. ඒ දර්ශනය ටික වෙලාවකින් නැති වුණාලු. ඉතින් ඔය ෆොටෝ දෙක අරගෙන තමයි අර මා ළඟට ආවේ. මෙවැන්නක් වෙන්නේ කොහොමද කියලා ඒ මහත්මයා මගෙන්

ඇහුවා. මා තෝරලා දුන්නා ඒ අයට කාරණය. බොහෝ දෙනකු මැරුණාම මෙකී භූතයන් අතර උපදිනවා. ඉතින් තමන් යම් කෙනෙකුට ආදරය කරනවා නම්, බලාපොරොත්තුව තියෙනවා නම් එයාගේ ස්වරූපය සිහි කරනවා. තැන දැනගන්න ඕනෑ නැහැ. එතකොටම එතැනට එයා එනවා. ඒ ශරීරය සූක්ෂම එකක්. ඉංග්‍රීසියෙන් කියන්නේ 'ඇස්ට්‍රල් බොඩි' කියලා. සමහරවිට කැමරාවටත් ඒ අය අහුවෙනවා."

"මීට අවුරුදු තිහකට විතර ඉස්සර එංගලන්තයේ 'සසෙක්ස්' ප්‍රදේශයේ ඉංග්‍රීසි මහත්මයකු රස්සාවක් නැතිව ආණ්ඩුවෙන් දෙන ආධාර මුදලින් ජීවත්වෙන දුප්පත් පිරිසක් ගෙන්වලා ඒ අයට කෑමක් දුන්නා. එහෙම කළේ අවුරුද්දකට ඉස්සර මිය ගිය තම පියා සිහි කරලයි. ඉතින් මේ අවස්ථාව සිහි වෙන්න කැමරාකාරයකු ගෙන්වලා පින්තූරයක් ගත්තා. කැමරාකාරයා පින්තූරය මුද්‍රණය කරලා ගෙනත් දුන්නා. ඒකෙ තිබුණා අර මැරුණ පියා බොහොම සතුටු මුහුණින් හිටගෙන ඉන්න රූපයක්. කැමරාවෙන් පින්තූර ගන්න වෙලාවෙ එයාගේ ඡායාරූපයක් එතන තිබුණේ නැහැ. ඉතින් අර මහත්මයාට හරි පුදුමයි මේ ගැන. පස්සේ මේ විස්තර ඇතුළත් කරලා ඒ පින්තූරයත් එක්කම ප්‍රීඩික්ෂන් කියන සඟරාවේ පළ කරලා තිබුණා."

"ඉතින් මේ තත්වය මොකක්ද? සර්වාස්තිවාදීන් කියන්නේ අන්තරාභවය කියලා. මහායානිකයන් කියන්නේත් අන්තරාභවය නැත්නම් ගන්ධර්ව , කියලා. අප කියන්නේ 'පරදත්තූපජීවී භූතාවස්ථාව' කියලා. ඒ ගොල්ලො තමයි ඔය පින් ගන්න බලාපොරොත්තු වෙන අය. අප පින් කරලා ඒ අය සිහි කරන කොටම ඒ අයට දැනෙනවා, අර මනෝමය පතිවිඩ ක්‍රමයට අනුව. ඒ අයගේ ශරීර බොහොම සියුම්. ඒ නිසා අපේ හැඟීම් බොහොම ඉක්මනට ඒ අයට දැනෙනවා. ඉතින් ඒ අය වහාම ඇවිත් අප කරන පුණ්‍යක්‍රියාව දැකලා සතුටු වෙනවා. පින් අනුමෝදන් වෙනවා කියන්නේ ඒකයි."

"ඒ භූතයන්ගේ හිත ධෛර්‍යවත් වුණාම ඒ අයගේ හිතේ තමන් කැමති දෑයක් නිර්මාණය කර ගැනීමේ ශක්තිය ලබනවා. කැමැත්තට අනුව ආහාර පානාදි අවශ්‍ය දේවල් ඒ අය උපදවා

ගන්නවා. අදත් සමහර බල සම්පන්න යෝගීන් වැලි ටිකක් අරගෙන වෙන දයක් බවට ඒවා පරිවර්තනය කරනවා. අන්න ඒ වගේ, ද්‍රව්‍ය වෙනත් දේකට පරිවර්තනය කිරීමේ ශක්තිය අර කී භූතයන් තුළ ඇති වෙනවා. දෙවියන් තුළත් පින් අනුමෝදන් වීමෙන් ඒ ශක්තිය ඇති වෙනවා. අමුතුවෙන් මැවීමක් නොවෙයි ඒ අය කරන්නේ. ලෝකයේ පැතිරිල පවතින පරමාණු තමන්ට අවශ්‍ය විදියට පෙරළන එක. හරියට ලී කෑලි අරගෙන කපල කොටලා අප පුටු මේස ආදිය සකස් කරනවා වාගේ. ඒ අය චිත්ත ශක්තියෙන් රූප ද්‍රව්‍ය තමන්ට ඕනෑ ක්‍රමයකට පරිවර්තනය කරනවා.''

**''සියැසින්ම කතරගම දෙවියන් දුටු බව නායක හාමුදුරුවන් කලින් ප්‍රකාශ කළා. ඒ ගැන විස්තරයක් දැන ගන්න මා කැමතියි?''**

''බළන්ගොඩ පිරිවෙන කරන කාලයේ, මට හරියට වර්ෂය මතක නැහැ. ඒ කාලයේ අපේ මෛත්‍රීමූර්තිට වයස අවුරුදු පහළොවක් විතර ඇති. ඇලපාත රටේ මහත්තයලාගේ වලව්ව අසල තියෙන අල්පිටියේ පන්සලේ වසකට මට ආරාධනා ලැබුණා. මාත් මගේ ගෝල දෙනමත් (මෛත්‍රීමූර්ති හා ශාන්තිදේව) එක්ක එහාට ගියා. ඒ දෙනම සාමණේරයි. ඉගෙනීමට පාඩු වන නිසා ඒ අයට එහේදීත් පොත් කියෙව්වා. මා ඔය වසට ගිය ළඟදීම ඇලපාත රටේ මහත්මයා ඇහුවා, 'හාමුදුරුවනේ දැන් කතරගම පෙරහැර කාලේ, ගිනි පාගන දවසත් කිට්ටුයි, හාමුදුරුවන් ගිනි පාගනවා බලන්න කැමතිද?' කියලා. මා කිව්වා, 'මා කවදවත් කතරගම ගිහිල්ලා නැහැ, කතරගම නම් බලන්න යන්න ආසයි' කියලා. 'එහෙනම් හාමුදුරුවන් ලෑස්ති වෙන්න' කියලා, කොළඹ වජිරාරාමයේ වැඩ ඉන්න නාරද තෙරුන් වහන්සේටත් ඇලපාත රටේ මහත්මයා ටැලිග්‍රෑම් පනිවුඩයක් යැව්වා. 'ආනන්ද මෛත්‍රෙය හාමුදුරුවන් මාත් එක්ක කතරගම යනවා, ඔබ වහන්සේත් වඩින්න කතරගම ගිනි පාගනවා බලන්න යන්න' කියලා. ඉතින් නාරද ස්ථවිරයනුත් වැඩියා.''

''ඇලපාත රටේ මහත්තයයි, වතු වවන එල්ලාවල මහත්තයගේ සහෝදරයකුයි එක කාර් එකක. අනික් කාර් එකේ නාරද ස්ථවිරයොයි, මායි අර සාමණේර දෙනමයි. අප පිටත්වෙලා ගිහිල්ලා තිස්සමහාරාමයේදි කාර් නැවැත්තුවා. ඒ කාලයේ එයින්

එහා කාර් යන්න පුළුවන් පාරක් තිබුණේ නැහැ. මේ සැතපුම් දහය පයින් යන්න අමාරුයි කියලා බර කරත්තයක් ලෑස්ති කරලා තිබුණා. අප ඒකේ නැගලා කතරගමට ගියා. මෙගොඩදී බැහැලා පයින් ගඟින් එගොඩ වුණා. අපට නතර වෙන්න එතන කූඩාරමක් හදලා තිබුණා. ඒකේ අප නතර වුණා. ඇලපාත රටේ මහත්තයාගේ මස්සිනා වන දිවිතොටවෙල රටේ මහත්තයා තමයි ඒ කාලේ කතරගම දේවාලයේ බස්නායක නිලමේ වෙලා හිටියේ. ඉතින් උන්නැහේ අපට අවශ්‍ය පහසුකම් සියල්ල සලසලා තිබුණා. කතරගම පන්සල් කොහේ තියෙනවද කියා අප එතකොට දන්නෙත් නැහැ."

"දවස් කීපයක් අප කතරගම හිටියා. පෙරහැර හෙමත් බැලුවා. ගිනි පෑගීම තිබුණේ පහුවද උදේට. සෙනග වැඩිවුණාම එතෙන්ට යන්ට අමාරුයි, කල් ඇතිව එතන්ට ගිහින් ඉන්න එක හොඳයි කියලා අප හතර නමට දේවාලේ ඉස්සරහ එක පැත්තක ටිකක් දුරින් පුටු හතරක් තියලා දුන්නා වාඩිවෙලා ඉන්න. ඒ කාලේ ගිනි පාගන්නේ දේවාලේ ඉස්සරහ. එළිවන ජාමයේ හතරහමාරට විතරයි අප එතනට අඩගහගෙන ගියේ. අප අර පුටුවල වාඩිවෙලා උන්නා. එතකොට අර ලොකු ගිනිවලේ ගිනි ඇවිලෙනවා. රස්නය වැඩි නිසා බඹ ගණනකටවත් කිට්ටු වෙන්න බැහැ. මහා දර ගොඩක් තදින් ඇවිලෙනවා."

"වෙලාව පහට විතර වෙන්න ඇති. අපට ඉතින් වෙන මොකවත් දකින්න බලන්න ඕනෑ කමක් තිබුණේ නැහැ. අප තිකන් ඔහේ හිටියා. තරමක පිරිසකුත් කල් ඇතිව ඇවිදිල්ලා වටවෙලා හිටියා. ඔහොම ඉන්න කොට ඔන්න අර ගිනිවල අද්දර ළඟම කවුදෝ කෙනෙක් හිටගෙන ඉන්නවා ගේට්ටුව දිහා බලාගෙන. වම් උරහිස වැහෙන සේ ගුරුපාට රෙද්දක් දාගෙන. පපුවෙන් පහළටත් ගුරුපාට රෙද්දක් ඇඳගෙනයි හිටියේ. හිස බාපු කෙනෙක් වගෙයි. මට පෙනුණේ රතුපාට හොඳ සුද්දෙක් වාගෙයි. මූණ හීන්දෑරියි. දිගටියි. වැඩිය මහතත් නැහැ. මධ්‍යම ප්‍රමාණයේ උස ශරීරය. බොහොම ලස්සණයි. කියන්න බැරි තරම් ලස්සණ රූපයක්. තාපස කෙනකු වගෙයි. බලාගෙන ඉන්නවා ගිනි මැලේ දිහා. මා ඉස්සරවෙලා හිතුවේ මේ කපුරාළ කෙනකු වෙන්න ඇති කියලා. ඒ එක්කම මා හිතුවා, අපට බඹ ගාණකට කිට්ටු

වෙන්න බැරි මේ මහා රස්නය තියෙන තැන කොහොමද මනුෂ්‍යයකු ඉන්නේ කියලා.”

“මා ළඟම හිටිය නාරද ස්ථවිරයන්ගේ ඇඟට තට්ටු කරලා නාරද ස්ථවිරයො, කියා හෙමින් කතා කළා. මොකවත් කතා කරන්න එපා බලා ගනිමු කියලා මා කිව්වා. ඉතින් අප බලා හිටියා. මෙන්න අර පුද්ගලයා හෙමින් හෙමින් ගිනිවලට බැස්සා. අර උඩට නගින ගිනි දලු මැදින් පියවර මනින්නා වගේ බොහොම හීන්සැරේ එහාට එහාට යනවා හොඳට පැහැදිලිව පේනවා. එතන හිටිය සියලු දෙනාම මේක දක්ක බව පසුව දැන ගන්ට ලැබුණා. එහාට එහාට බොහොම හීන්සැරේ ගමන් කළා. මිනිට්ටු දෙකක් හෝ තුනක් විතර යන්න ඇති. එච්චර හීන්සැරේ තමයි ගියේ. එගොඩට ගිහිල්ලා අනික් පැත්තෙන් ගොඩ වුණා. ගොඩවෙලා ගේට්ටුව දිහා බලාගෙන හිටියා ටික වෙලාවක්. එක පාරට නොපෙනී ගියා. ඉතින් අප තේරුම් ගත්තා මේ කවුද? කියලා.”

“ඊට පැයකටත් විතර පස්සෙ යි, ඒ වෙනකොට ගිනි අඟුරු බැහැලා. අන්න ඒ වෙලාවේ තමයි අර ගේට්ටුව පැත්තෙන් කපුරාළ මුලින්ම ඇවිත් ගිනිවල මැදින් ගියේ. ඊට පස්සේ අනික් අය ගිනිවල පාගගෙන දේවාලයට ගියා. අර ගින්දර තිවුණායින් පස්සේ ගිනි අඟුරු විතරයි. මේක උණේ උදේ හයට විතර. අප මේ දක්ක දර්ශනය ප්‍රධාන කපු මහත්තයා හමුවෙලා මා කිව්වා. මෙන්න මෙහෙම දර්ශනයක් අප දුටුවා කියලා. ඒ වෙලාවේ කපු මහත්තය කිව්වා, ‘හාමුදුරුවනේ, හැමදම දෙවියන් ඔය විදියට වඩිනවා මට විතරයි පේන්නේ. දෙවියන් ගිනි ගොඩ උඩින් වැඩියාම ගිනි සිසිල් වෙනවා. හැමදම ගිනි පාගන දවසට ඔය දර්ශනය එනකල් මා බලාගෙන ඉන්නවා. ඔය දර්ශනය නොපෙණුනොත් මා ගිනිවලට බහින්නේ නැහැ. ඉතින් අද කල් ඇතිව ඔබ වහන්සේලාට පෙනිලා තියෙනවා. සමහරවිට ඔබ වහන්සේලාගේ සැකයක් දුරු කරන්නත් වෙන්න ඇති. කොයි එකද මා දන්නේ නැහැ, වෙනද නම් උදේ ගිනි පාගන්න කිට්ටුවයි ඔය දර්ශනය පෙනෙන්නේ. අනික් අයට බොහෝ විට ඔය දර්ශනය දකින්න ලැබෙන්නේ නැහැ’ කියලා කපු මහත්තයා කිව්වා. නාරද ස්ථවිරයන් ඕක කොළඹට ආවට පස්සේ පත්තරේට දැම්මා. ඇත්ත පත්තරකාරයා ඒක දැකලා, ‘ඔන්න නාරද හාමුදුරුවන්ට දෙයියන් පෙනිලා’ කියලා, සමච්චල් කරලා තිබුණා.”

**"කර්මජ රෝග සුව කරන්ට ක්‍රමයක් තියෙනවාද? ඒ ගැන මහානායක හාමුදුරුවන්ගේ අදහස මොකක්ද?"**

"කර්මයකින් කර්මයක් කපන්න පුළුවන්නේ. අකුසල කර්මයකින් හටගන්නා රෝගයක් ඊට ප්‍රතිවිරුද්ධ කුසල කර්මයක් කළොත් ඒකේ බලය බිඳින්න පුළුවන්."

**"ඒ බව කොතනකවත් සඳහන් වෙලා තියෙනවද මහනායක හාමුදුරුවනේ?"**

"ඔව් මම කියන්නම්. එකක් සාමඤ්ඤ ඵල සූත්‍ර අටුවාවේ අන්තිමට ඇති. බුදුහාමුදුරුවන්ගේ දේශනාවට පැහැදිලා අජාසත් රජතුමා තෙරුවන් සරණ ගියා. රජතුමා බුදුරජාණන් වහන්සේ ළඟින් පිටත් වෙලා ගියාට පස්සේ උන්වහන්සේ වදළා 'ඔහු ධාර්මික පිය රජතුමා මැරුවේ නැති නම් අදම සෝවාන් ඵලයට පත්වන බවත්, ඒ ශක්තිය ඔහු කළ පාපය නිසා සිඳී ගිය බවත්' මේ කාරණය ගැන අටුවාවේ සඳහන් වෙනවා. රජතුමා බුදුහාමුදුරුවන් සරණ ගියාට පසුව බුදුහාමුදුරුවන් කෙරෙහි මහත් භක්තියෙන් කටයුතු කළ නිසා අවීචියේ උපදින්න තිබුණ කර්ම බලය අඩු වුණා. එහෙම අඩු වෙලා ලෝකුඹු නිරයේ උපන්නේ කියලා අටුවාවේ සඳහන් වෙනවා. මේ කාරණයෙන් පැහැදිලි වෙනවා ආනන්තරිය පාපකර්මය පවා බොහෝ දුරට කුසල කර්ම ශක්තියෙන් බිඳින්ට පුළුවන් බව. එහෙම නම් අනික් අකුසල කර්ම බිඳින එක ලෙහෙසියි."

**"සත්වයන්ට ග්‍රහයන්ගේ බලපෑමක් තියෙනවද? ඒ ගැන මහනායක හාමුදුරුවන්ගේ අදහස පැහැදිලි කරනවද?"**

"සම්පූර්ණයෙන්ම තියෙනවා. තියෙන්නේ මෙහෙමයි. පොළොව ඉර වටේ ගමන් කරනවා. ග්‍රහයන් ඉර වටේ ගමන් කරනවා. පොළොවේ තියෙන යම් යම් ලෝහ වර්ග, ඛනිජ වර්ගාදියේ ශක්තිය නිසා වටා ඇති දෑ ඇද ගන්නා ශක්තියක් පොළොවේ තියෙනවා. එක එක ග්‍රහයා එක එක ග්‍රහයාට ආකර්ෂණයක් තියෙනවා. පොළොවටත් එක්තරා ප්‍රමාණයකට එය තියෙනවා. ඉතින් ඉර වටා මේ ගොල්ලන්ගේ ගමන නිසා ඒ ආකර්ෂණ වේගය එක එක වෙලාවට වෙනස් වෙමින් පවතිනවා. අනික් ග්‍රහයන්ගේ පොළොවට ඇදුම් කෑමේ වේගය මිනිත්තුවෙන් මිනිත්තුවට වෙනස් වෙනවා. දැන් තියෙන එක නෙවෙයි ඊළඟ විනාඩියේදී තියෙන්නේ.

උපදින තරමක් සත්වයන් මේ ග්‍රහ ආකර්ෂණයට මැදිවෙලා. අහුවෙලා. මවුකුසින් බිහිවෙන්නේ යම් වෙලාවකද ඒ වෙලාවේ තමයි කෙනකුට ග්‍රහයන්ගේ මුල්ම බලපෑම තදින් එල්ලවන්නේ. මවුකුසේ ඉන්නතාක් මවගේ ආරක්ෂාව ලැබෙනවා. මවු කුසින් බිහිවෙන කොටම අර ග්‍රහයන්ගේ බලපෑම දරුවට තදින් ඇති වෙනවා. ඒ නිසා උප්පත්ති කේන්ද්‍රය වැදගත්. ඒ උපදින මොහොතේ ග්‍රහයන්ගේ බලපෑම කොච්චරද කියන එකයි මේ කේන්ද්‍රයෙන් කියන්නේ. ග්‍රහයන්ගේ බලපෑමට මැදි වුණ පරිසරයකටයි මවුකුසින් බිහිවෙන දරුවා වැටෙන්නේ. පූර්ව කර්ම ශක්තියෙන් තමයි එබඳු පරිසරයකට හසු වන්නේ. ඒ නිසා කර්මානුකූලව මේ ලෝකයේ ඒ ඒ පරිසරයට සත්වයන් වැටෙනවා.''

''ග්‍රහයන්ගේ ආකර්ෂණ ශක්තීන්, වෙනස්වීම්, මනුෂ්‍යයාගේ කර්ම ශක්ති ආදිය එකිනෙකට සම්බන්ධයි. ඒ නිසා නක්ෂත්‍රය දන්නවා නම් ජනක කර්මයෙහි ශක්තිය හුහක් දුරට තේරුම් ගන්න පුළුවන්. උත්පත්තිය ලබාදුන් කර්මයේ ශක්තිය ඊට සමීප කර්මයන්ගේ ශක්ති ප්‍රවෘත්ති කර්ම විපාකයේ ශක්ති හුහක් දුරට සොයා ගන්න පුළුවන්. ඒ නිසා ග්‍රහයන්ගේ බලපෑම කර්මානුකූලවයි කෙරෙන්නේ.''

''ඉතින් මේවා වෙනස් කරන්නටත් පුළුවන්. ඒ ග්‍රහයන්ගේ බලපෑම්වලට මග අරින්න පුළුවන්. දැන් ලංකාවේ උපන් කෙනකුට අධිපති ග්‍රහයා බොහෝ සෙයින් ශනි කියලයි කියන්නේ. ඉතින් ශනිගේ බලපෑම් ලංකාවේ අයට බොහොම වැඩියි. ශනිගේ ඒරාෂ්ටකය ආ කෙනකු එංගලන්තෙ වගේ රටකට යන එකයි තියෙන්නේ. එහේට තියෙන්නේ රවි බලපෑම කියන එකයි මා හිතන්නේ. ඒ විදියට ප්‍රදේශ වෙනස් වුණාම එක් එක් ග්‍රහයන්ගේ බලපෑම වෙනස් වෙනවා. 'පතිරූප දෙස වාසො ච' කියන බණ පදයටත් ඒක ගැළපෙනවා.''

**''මහානායක හාමුදුරුවනේ දැන් සියදිවි නසා ගැනීම් බහුලව දකින්න අහන්න ලැබෙනවා. මෙයින් සිදුවන අකුසලය පිළිබඳව යමක් හරියට කියන්න පුළුවන්ද?''**

''නොයෙක් හේතු නිසා නොයෙක් දෙනා සිය දිවි නසා ගන්නවා. සමහර කෙනකු ජීවිතය ගැන තද කලකිරීමෙන් එහෙම

කරනවා. සමහරුන් ලෙඩ දුක් රෝග පීඩාදිය උහුලාගන්න බැරිව එහෙම කර ගන්නවා. සමහරුන් ද්වේෂය, තරහව, ඊර්ෂ්‍යාව වැනි නොයෙක් හේතු නිසා සිය දිවි නසා ගන්නවා. ඉතින් ඊළඟ උත්පත්තිය ඇති වන්නේ අවසන් මොහොතේ ඇතිවුණ චිත්තවීථියේ හැටියටයි. එක එක්කෙනාට වෙනස් වන්න පුළුවන්. අපි හිතමු කෙනකු දිවි තොර කර ගන්න වැලක එල්ලුණා කියලා. ඒත් මැරෙණ මොහොතේ එයාට පෙර කළ හොඳ දෙයක් මතක් වුණා නම්, ඒ ගැන හිත දිව්වා නම් ඒ අනුවයි ඊළඟ ජන්මය ලැබෙන්නේ. ඒ නිසා අකුසලය වුණත් පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වෙනවා. සියදිවි නසාගන්නා දුගතියක උපදිනවාය යන්න භූයෝවෘත්තියෙන් කියා තිබෙන දෙයක්.''

**''මාර්ගස්ථ ඵලස්ථ පුද්ගලයන් දෙදෙනා අතර කාලයෙන් ඉඩක් නොපෙනෙන හෙයින් ඒ පුද්ගලයන්ට වෙන වෙනම දන් දෙන්නේ කොහොමද?''**

''මාර්ගක්ෂණය ළඟටමයි ඵලක්ෂණය ඇතිවෙන්නේ. මාර්ගක්ෂණ අවස්ථාව සලකා මාර්ගස්ථ පුද්ගලයාය කියාත්, ඵලස්ථ අවස්ථාව සලකා ඵලස්ථ පුද්ගලයා කියාත් ව්‍යවහාරයි. ඵලයට පත්වූ පුද්ගලයාට දන්දීමේදී මාර්ගස්ථ ඵලස්ථ දෙදෙනාටම දන් දුන්නා වෙයි. මාර්ගක්ෂණයෙහි දන් දෙන්නට අවකාශයක් ලැබෙන්නේ නැහැ. ඒ අවස්ථා පසු කළ තැනැත්තාට ඒ අවස්ථා අරමුණු කොට දන් දීමේදී මාර්ගස්ථ පුද්ගලයාටත්, ඵලස්ථ පුදගලයාටත් දන් දුන්නා නම් වෙයි.''

**''ජාතක අටුවාවේ තැනක උද්දේසිකං අවත්ථුකං මමායනමත්තමෙව, කියා තියෙනවා. ද්‍රව්‍ය රූසකින් තනා ගනු ලබන ප්‍රතිමාව උද්දේසික චෛත්‍යයකැයි ගත හැකිද? නායක හාමුදුරුවන් මෙය විසඳන්නේ කොහොමද?''**

''ජාතක අටුවාවේ 'උද්දේසිකං අවත්ථුකං මමායනමත්තමෙව', යන පාඨයේ 'මමායනමත්තමෙව' යන්න දිගින් දිගට පිටපත් කිරීමේදී වූ දෙසක් හරි ගස්සන්නට යාමේදී සිදුවී ඇති වරදක් කියායි මා සිතන්නේ. සමහර පැරණි පුස්කොළවල ලියා ඇති ජාතක අටුවාවල මෙය 'පතිමානමත්තං' කියාත් සමහර ඒවායේ 'මානමත්තං' කියාත් සමහර ඒවායේ 'මනමත්තං' කියාත් දක්නට

තියෙනවා. අන්තිමට 'මානමත්තං' යන්න කිසියම් පිටපතක 'මායනමත්තං' කියා තිබෙනවා දැක එය 'මමායනමත්තං' විය යුතුයැයි සිතූ ශෝධකයා මුද්‍රණයට දීමේදීත් 'මමායනමත්තං' යැයි ලියාදී තිබෙනවා. මුලදීම 'පටිමාමත්තං' යැයි තිබූ පාඨය පිටපත් කරන ලියනරාළ විසින් 'පතිමාමත්තං' යැයි ලියූ පාඨය දුටු ඊළඟ පිටපත්කාරයා එය 'පතිමානමත්තං' යැයි ලිවීමෙන් වූ වරද අන්තිමට නැවතුණේ 'මමායනමත්තං' යන වැරදිම පාඨයක් ඇතිවීමෙනි. මෙබඳු සැක උපදවන පාඨයක් දුටු තැන වෙන අටුවාවල එන විස්තර හා සසඳ බැලිය යුතුයි. ඛුද්දක පාඨයේ තිධිකණ්ඩසුත්ත අටුවාවේ උද්දිස්සකචෙතිය යන්න විස්තර කර තිබෙන සැටි කියවා සසඳ බලන්නට ඕනෑ. මෙන්න තිධිකණ්ඩ සුත්‍ර අටුවාවේ පාඨය:

**'තත්ථ චයි - තබ්බං පූජෙතබ්බං චිතත්තාව චෙතියං තං පනෙතං තිවිධං හොති. පරිභොග - චෙතියං උද්දිස්සක - චෙතියං සධාතුක චෙතියන්ති. තත්ථ බොධිරුක්ඛෝ පරිභෝග - චෙතියං, බුද්ධ - පටිමා උද්දිස්සක - චෙතියං, ධාතුගබ්භ - ථූපො සධාතුක - චෙතියං'**

මේ අටුවා පාඨයේ බුද්ධ - පටිමා උද්දිස්සක - චෙතියං යන්නෙන් බුදු පිළිමය උද්දිස්සක චෛතිය යැයි පැහැදිලිවම පෙනේ. අටුවාවල තවත් තැන්වල බුද්ධ ප්‍රතිමාව උද්දිස්සක - චෛතිය කියා සඳහන් තැන් තිබෙනවා. කාරණය පැහැදිලි වීමට මේ අටුවා පාඨයම ප්‍රමාණයි. ඊළඟට 'අවත්ථුකං' යැයි කීමේ තේරුම කිමෙක්දැයි ප්‍රශ්නය නැගේ. මෙහි 'අවත්ථුක' යන්න බහුබ්බීහි සමාස නයින් හැදුණු පදයකි. 'නත්ථි වත්ථු එතස්මින්ති අවත්ථුකං' යනු එහි විග්‍රහයයි. මෙය තුළ ශාරීරික ධාතු ආදි කිසි වස්තුවක් නැත්තුයි මෙය අවත්ථුක නම් යනු එහි තේරුමයි. ඇතුළත ධාතු හෝ ධර්ම පාඨ ලියූ තඹ පත්තිරු හෝ බුදුරදුන් පාවිච්චි කළ පාත්‍ර ආදි කිසිම පිරිකරක් හෝ නැති තනි බුද්ධ ප්‍රතිමාව පමණක් උද්දිස්සක චෛතිය නම් යනු එයින් දක්වෙයි."

**"ආත්මය යනු කුමක්ද? යන්නට නායක හාමුදුරුවන් දෙන උත්තරය කුමක්ද? කියා දැන ගන්නට මා කැමතියි?"**

"ආත්ම, යනු සම්මුතියේ ලෝක ව්‍යවහාරයේ එන වචනයක්. බුදුරජාණන් වහන්සේත් ලෝක ව්‍යවහාරය අනුව ආත්ම (තමා)

යන්න වදරලා තියෙනවා. ධම්මපදයේ අත්තවග්ග ආදියේ එය සඳහන් වෙනවා. 'අත්තාපි අත්තනො නත්ථි', තමාද තමාට නැත, යන දේශනාවල ආත්ම, සත්ව, පුද්ගල යන මේවා භාෂාවේ ව්‍යවහාර. පරමාර්ථ වශයෙන් ඒකාන්ත සත්‍ය වශයෙන් ආත්ම ආදි නම් ව්‍යවහාර වන්නේ කුමකටද කියලා සොයා බැලුවාමයි ඇත්ත හෙළිවන්නේ. සාමාන්‍ය ජනතාව 'ආත්ම' හෝ 'තමා, මම' යන වචන පාවිච්චි කරන්නේ හිතත්, හිත්වල යෙදුණු චෛතසිකත්, මේ ශරීරයටත් හෙවත් රූප කයටත්, යන තුනින් එකකටයි. චිත්ත චෛතසික යන දෙවගේම නාමයි, ශරීරය රූපයයි. නාම රූප දෙකටයි සාමාන්‍ය ජනයා ආත්ම යන නම ව්‍යවහාර කරන්නේ. බුදු දහම අනුව තව දුරටත් විභාග කිරීමේදී ස්කන්ධ පහට බව පැහැදිලියි."

"චිත්ත යනු එකක් නොව ක්ෂණයක් පාසා ඇති වෙවී නැති වෙවී දිගින් දිගට පවත්නා සිත් වැලයි. එය විඥාන ස්කන්ධ හෙවත් විඥාන රාශියකි. චෛතසික පනස් දෙක අතුරෙන් ඒ ඒ ක්ෂණයේ සිත් හා එකට ඇති වෙවී බිඳි බිඳී යන සතුට අසතුට මැදහත් බව යන විඳීම් රාශිය වේදනා ස්කන්ධයි. සිත්වලම ක්ෂණයක් පාසා ඇතිවෙවී නැතිවෙවී යන අරමුණු හැඳිනීම් හෙවත් සංඥා වැල සංඥා රාශිය සංඥා ස්කන්ධයයි. හිත්වල හිත් එක්කම ක්ෂණයක් පාසා හැදෙමින් බිඳෙමින් පවත්නා චේතනා ආදි ඉතිරි චෛතසික රාශිය සංස්කාර ස්කන්ධයි. ශරීරය යනු ක්ෂණයක් පාසා හැදෙමින් බිඳෙමින් ආයෙත් හැදෙමින් බිඳෙමින් දැයි මෙසේ හැදි හැදී බිඳි බිඳී දිගට පවත්නා රූප මිටි, රූප රාශි පරම්පරාව රූපස්කන්ධයි."

"මේ අන්දමට නාම රූප දෙකම විඥානස්කන්ධ, වේදනාස්කන්ධ, සංඥාස්කන්ධ සංස්කාරස්කන්ධ, රූපස්කන්ධ කියා පහකට බෙදලා තියෙනවා. සමහර අන්‍ය ලබ්ධිකයන් රූපය ආත්ම යැයි සලකනවා. සමහරුන් සංඥාව ආත්ම යැයි සලකනවා. සමහරුන් සංස්කාරස්කන්ධයම හෝ එයින් කිසිවක් ආත්ම යැයි සලකනවා. සමහරු සිත ආත්ම යැයි සලකනවා."

"අත-ති-සතතං පවත්තතීති අත්තා, යන විවරණය අනුව වෙනස්වී හැම කල්හිම එක්ම සැටියෙන් පවතින දයි. එහෙම වෙනස් නොවන, නොබිඳී පවත්නා කිසිවක් සත්ත්ව යන නම ලබන

පංචස්කන්ධය තුළ නැහැ. නාමරූප් පරම්පරාවෙහි, චිත්ත චෛතසික පරම්පරාවෙහි නිත්‍යවූ නොනැසෙන කිසිත් නැහැ. එබැවින් ආත්මය, තමායැ, මම යැ, කියලා වෙන් කරගත යුතු නොනැසෙන කිසිවක්ම නැහැ. මේකයි බුදු දහමේ ඉගැන්වෙන අනාත්මතාව. මනුෂ්‍යාත්මය. දේවාත්මය, තිරිසන් අත්බව, යන වචන ව්‍යවහාර කතාවට සම්මුති කතාවට අයත් ඒවා. ඒකාන්ත ඇත්ත අනුව කැරෙන යෙදුම් නොවේ. අප ඉර බහිනවා, ඉර නගිනවා, ඉර මුදුන් වෙනවා, යන ව්‍යවහාර කරනවා. එහෙත් ඉර නගින්නේත් නැහැ. මුදුන් වෙන්නේත් නැහැ. පොළොව තමා වටා කරකැවීමේදී යි ඉර නගින්නා වාගේ මුදුන් වෙන්නා වාගේ බසින්නා වාගේ පෙනෙන්නේ. එහෙත් ලෝක සම්මතය ඉර නගිනවා, මුදුන් වෙනවා, බහිනවා කියලයි. ඒ වගේ මනුෂ්‍යාත්මය, දේවාත්මය, ආදියත් ව්‍යවහාර. ඇති තත්වය ඒකාන්ත සත්‍යය නොවෙයි. ඇති තත්වය නම් හැදි හැදී, බිඳි බිඳී දිගින් දිගට යන ස්කන්ධ පරම්පරාවල් ඇත යන්නයි.”

# 14 මා ලොවුතුරා බුදුබව පිණිස පාරමිතා පුරන කෙනෙක්

**"මහානායක හාමුදුරුවන්ගේ ජීවිතයේ මතක තියෙන ඉතාම රසවත් සිද්ධියක් දෙකක් කියන්ඩ පුළුවන්ද?"**

"සියම් නිකායේ එක් නායක තෙරනමකට වෙන්න ගිය විපතකින් මා උන්වහන්සේ මුද ගත්තා. ඒක විශේෂ සිද්ධියක්. චිත්ත බලයත් උපාය ශක්තියත් යොදා මා එය කළේ. එය මා හෙළි කරන්ට කැමති නැහැ. බොහෝ දෙනකු මා කෙරෙහි අමනාප වන්ට හේතුවක් වන නිසා ඒක. තවත් විශේෂ වශයෙන් සලකන්නට පුළුවන් සිද්ධි කීපයක් ආනන්ද කොලීජියේ සිටි කාලයේදී ඇති වුණා. ආනන්ද කොලීජියේ ගත කළ අවුරුදු දෙළහක කාලය මට හොඳට විවේකය ලැබිච්ච කාලය වශයෙන් කියන්ට පුළුවන්. වර්තමානයේ බොහෝ පන්සල්වල ගත කරන ජීවිතයට වඩා එහි ගත කළ ජීවිතය හොඳයි, කියලා මට හිතෙනවා. මොකද හොඳට ඉගෙන ගත්ත ශීලාචාර යහපත් මහත්වරුන්ගේ ආශ්‍රය මට ලැබුණා. නිතර මුණ ගැහුණේ ඒ අය. ඒ අය හරිම හොඳයි. ඒ කාලයේ ආනන්ද කොලීජියේ ගුරුමණ්ඩලයත් ශිෂ්‍යයොත් ඉතාම විනීතයි. පන්සලකදී ඇතිවන කරදර මොකක්වත් එතනදී තිබුණේ නැහැ. පන්සල්වල ඉන්න කොට දායකයන් ඇවිදිල්ලා අරකට කතා කරනවා, මේකට කතා කරනවා. ඒවා මොකවත් එතන නැහැ. මගේ කැමැත්තේ හැටියට පොත පත බලා ගැනීමට භාවනා කිරීමට හොඳට ඉඩ කඩ එතනදී ලැබුණා. මා ම හදා ගත්ත කාල සටහනකට අනුව ශිෂ්‍යයන්ට පාලි සංස්කෘත උගන්වන්න කුලරත්න මහත්මයා මට ඉඩ කඩ සලසලා තිබුණා. මගේ කැමැත්තේ හැටියට මගේ වැඩ කරගෙන යන්න අවස්ථාව ලැබී තිබුණා."

"ආනන්ද කොලීජියේ ඔන්න ඔය කාලයේදී භාවනා කරන කොට එක රැයකදී මට එකපාරටම මගේ අතීත ජීවිත, පෙර ආත්ම භාව ප්‍රකට වෙන්න පටන් ගත්තා. ඒවා දැන ගන්නට මගේ ඕනෑ

කමක් තිබුණෙත් නැහැ. මට වර්තමානය අමතක වුණා. අතීතයේ මා ජීවත් වුණා. ඒ අතීතයේ ජීවත් වුණේ මා හයිද්‍රාබාද් නුවර 'මිහිර් කුල් මිහිර්චන්ද්‍ර' නම් බ්‍රාහ්මණයකු වෙලා. මේ ජීවිතය ගත කළ හැටි මට එකවරටම වැටහුණා. ඉතින් මඳ වෙලාවකින් ඒ ඔක්කෝම ඉවරවෙලා ආයෙත් ප්‍රකෘති තත්වයට ආවා. මට හැඟුණා මේ මගේ ඉස්සර ජීවිතය නේද කියලා. ඒ අතර ස්වල්ප කලක් මා දේවත්වයේ හිටියා; දේවාත්මභාවයක් ලබාගෙන. ඕකත් මට හොඳට ප්‍රත්‍යක්ෂව පෙනුණා. මේවා නිකන් මනඃකල්පිත ඒවා නොවෙයි."

"තව දවසක් මා භාවනා කරමින් හිටියා, කාමරේ දොර වහගෙන කළුවරේ. එක පාරටම එළියක් වැටුණා. මා හිටියේ ඇහැ පියාගෙන. මහා එළියක් වගේ කියලා හිතලා ඇහැ ඇරලා බැලුවා. හැම තැනම එළිය වැටිලා. මා බැලුවා බල්බ් එක දිහා. ඒකෙන් නෙවෙයි එළිය එන්නේ. මේ ඉස්සරහ බිත්තියෙන්. බිත්තිය මැදින් එළියක් විහිදෙනවා. මොකක්ද මේ එළිය කියලා ටිකක් වෙලා බලා හිටියා. ක්‍රමයෙන් හෙවනැල්ලක් වගේ රූපයක් මතු වුණා. මේක මතු වෙලා මතු වෙලා ඇවිදිල්ලා සාමාන්‍ය ජීවත්වන මිනිසකුගේ ස්වරූපයට ආවා. ඊට පිටුපස තවත් පිරිසක්. ඒ සියලු දෙනාම ස්වාභාවිකයි. මේක හීනයක් නොවෙයි. හොඳට ඇහැ ඇරගෙන මා බලා හිටියා. ඉතින් බය වෙන්න හෝ මවිතයට පත් වෙන්න දේකුත් නැහැ. මට පුදුම වෙන්න තිබුණේ මේ මොකක්ද ඇති වුණේ කියලා විතරයි."

"මේ මට පෙනුණ ඇත්තා මහා උත්තමයෙක්. උන්වහන්සේ තාපස ස්වරූපයකින් මට පෙනුණේ. හරිම ලස්සණයි. මට ටිකක් චිත්‍ර ඇඳීම පුළුවන්. මේ රූපයේ මුහුණේ තිබුණ ශාන්ත ලස්සණකම නිසා මට මේක ඇඳ ගන්න සිතුණා. මා ඒක ඇඳගන්න මුහුණේ ආකාරය හිතට ගන්නට වෑයම් කළා. එතකොට ඔක්කෝම නොපෙනී ගියා. අඳුරු වුණා. චාඃ මා කර ගත්ත මෝඩකම කියලා මා හිතුවා. භාවනාවම මා ආයෙත් කරගෙන ගියා. එතකොට අර ඇත්තා විතරක් ආයෙත් පෙනුණා. හොඳට පැහැදිලිව පෙනුණා. මා ඉතින් ඒ රූපය හිතට ගනිමින් ඉන්න වෙලාවේ 'මේ රූපය නොවෙයි ධර්මය දිහා බලන්න' කියලා අවවාද කළා. අවවාද කරලා නොපෙනී ගියා. මේ උත්තමයා ශ්‍රේෂ්ඨ දේවතා කෙනෙක්.

මට ඒ උත්තමයාගේ ආරක්ෂාව හැමදම තියෙනවා. ඉතින් මේවා පත්තරවලට යනවට මා කැමති නැහැ. භෞතිකවාදී ඇසින් බලන අය පරිහාස කරනු ඇති, මට තරමක මොළේ දේසයක් ඇත කියලා. ඒ නිසා මා ඒ උත්තමයාගේ නම කියන්න කැමති නැහැ. මගේ හැම කටයුත්තකදීම ඒ නම සිහි කරන්න කියලත් මට අවවාද කරලා තියෙනවා. ඒ නිසා වැදගත් හැම කටයුත්තක්ම මා පටන් ගන්නේ ඒ ඇත්තා සිහි කරලයි. මේ විදියට මට උදවු කරන තුන්දෙනකු ඉන්නවා."

"තව ඉතා වැදගත් සිද්ධියක් කියන්නම්. ඒක මා කිව්වද දන්නේ නැහැ. මා කතරගමදී කතරගම දෙවියන් මගේ ඇස් දෙකින්ම දැක්කා. මට සම්පූර්ණයෙන්ම විශ්වාසයි කතරගම දෙවියන් ඉන්නවා කියලා. නිකම් මනඃකල්පිත මාත්‍රයක් නොවෙයි. එතුමාගේද ආරක්ෂාව මට එහෙම පිටින්ම තියෙනවා. ඒ වගේම මා තව හොඳ සිද්ධියක් කියන්නම්."

"අපේ පන්සලේ මා සාමණේර කාලය ගත කරද්දී හැමදම විහාරේ වත පිළිවෙත කළේ මායි. හැමදම උදේ නැගිටලා විහාරෙට ගිහිල්ලා, අතුපතුගාලා, මල් වට්ටියක් කඩලා, පාත් පත්තු කරලා බුදුන් වැඳ පුදලා එනවා. ඊළඟට පල්ලැහැ පන්සලට ගිහිල්ලා හාමුදුරුවන්ට මූණ සෝදන්න වතුර උණු කරලා වතුර සෙම්බුවක් ගෙනිහින් තියනවා. හාමුදුරුවන් මූණ සෝදගෙන විහාරෙට ඇවිත් මල් පූජා කරලා බුදුරජුන් වඳිනවා. හැමදම ඔය ටික කරගෙන ගියා. ඊට පස්සේ පන්සලට ඇවිදිල්ලා ලුණු කැඳ ටිකක් බීලා පාඩම් කරන්න යනවා. හැන්දෑවේ බුදුන් වැඳලා වත පිරිත කියනවා. පිරිත් කියලා අවසන් වෙලා විහාරය ඉදිරියෙන් තිබුණ විෂ්ණු දේවාලයටයි සමන් දේවාලයටයි ගිහිල්ලා දෙවියන්ට පින් දෙනවා. ඉතින් මට මේ දෙවියන්ගේ ආරක්ෂාව හොඳට තියෙන බව වැටහුණා. මගේ ඉංග්‍රීසි දැනුම දියුණු කර ගන්න අපේ හාමුදුරුවන් මා කොළඹ එවන්න කීපවරක් උත්සාහ කළා. පන්සලේ හිටිය මට වැඩිමහලු අනික් හාමුදුරුවන් මට බොහොම ඊර්ෂ්‍යා කරපු කෙනෙක්. ඒ හාමුදුරුවන් එක එක දේවල් කියලා අපේ හාමුදුරුවන් බය ගන්වනවා. 'ඔය ළාබාල උන්නාන්සේ ඔහාට යැව්වාම නරක් වෙයි' කියලා ඒවා මේවා කියනවා. ඉතින් හාමුදුරුවන් ඒවා අහලා පසුබට වෙනවා. ඔය

කාලයේ ධර්මපාලතුමන් සමග මා ලියුම් ගනුදෙනු කරමින් හිටියා. එතකොට උන්නැහේ හිටියේ ඉන්දියාවේ. උන්නැහැ මට ලියලා එව්වා, 'පොඩිනම මෙහාට එන්න ධර්මදූත වැඩවලටත් එක්ක, ඉංග්‍රීසි ඉගෙන ගන්නත් වැඩ පිළිවෙළක් යොදන්නම්' කියලා. ඉතින් හාමුදුරුවන් ඒකට කැමති වුණා. නමුත් අර හාමුදුරුවන් ඒක වැළක්වුවා. 'ඔය ඇතට යැව්වාම ඔය උන්නාන්සේ නරක් වෙයි' කියලා. මගේ හැම වැඩකටම ඒ හාමුදුරුවන් බාධා කරනවා."

"දවසක් මා බුදුන් වැඳලා ඉන්පසු අර විෂ්ණු දේවාලයට ගියා. ගිහිල්ලා කිව්වා, 'මගේ දියුණුවට අහවල් පුද්ගලයා බාධා කරනවා, ඇයි තමුන්නාන්සේ බලන්නේ නැත්තේ?' කියලා. දවස් තුන හතරක්ම මා ගිහිල්ලා ඔය විදියට කිව්වා. අන්තිම දවසේ හීනෙනුත් මා ඒ විෂ්ණු දේවාලයට ගියා. ගිහිල්ලා මේ කන්නලව්ව කළා. ඒ පාර විෂ්ණු රූපේ නැගිට්ටා. ඒ මට හීනෙන් පෙනිච්ච හැටි. නැගිටලා ආවා අඩි දෙක තුනක්ම ඉස්සරහට. මා පස්සට පැන්නා. විෂ්ණු රූපය අත උස්සලා ඇඟිල්ල දික් කරලා කිව්වා, 'මේ මට කරච්චල් කරන්න එපා, තව ටික දවසකින් තමුන්නාන්සේ කොළඹට අරිනවා' කියලා. ඇත්තටම මට විරුද්ධකම් කරන අර හාමුදුරුවන් දින කීපයකින් උන්වහන්සේගේ ගමට ගියා. ආපසු එන්න සුමාන දෙකක් පරක්කු වුණා. මේ අතර පත්තරේ තිබුණා ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ආනන්ද විද්‍යාලයට භාර ගන්නවා කියලා."

"හාමුදුරුවන් මට කතා කළා. 'පුංචි උන්නාන්සේ යමු කොළඹ' කියලා ගමන් වියදම් එවන්න කියලා තාත්තාට දැනුම් දෙන්නත් කිව්වා. මා තාත්තට දැනුම් දුන්නා. තාත්තා ගමන් වියදම් එව්වා. අප පිටත් වුණා. අර හාමුදුරුවන්ට බාධා කරන්න අවස්ථාවක් ලැබුණේ නැහැ. ඉතින් දෙවියන්ගේ උපකාරය තියෙනවා කියන එක, දෙවියන් ඉන්නවා කියන එක සම්පූර්ණයෙන්ම මට ප්‍රත්‍යක්ෂ වුණා. මගේ ජීවිතය කවදත් සාමාන්‍යයි. විශේෂ සිද්ධියක් වශයෙන් මට කියන්න තියෙන්නේ අර මගේ චිත්ත බලය දියුණු කිරීමෙන් කරපු යම් යම් දේවල්."

"මගේ ජීවිතයේ කවදවත් අමතක නොවන තවත් වැදගත් සිද්ධි කීපයක් තියෙනවා. මට මතක ඇති හැටියට 1926 දී පමණ

මදුරාසියේ 'අඩියාර්හි' මූදු වෙරළේදී සවස මුලින්ම ක්‍රිෂ්ණමූර්තිතුමා හමුවී කතාබස් කොට ඇඳින ගැනීම, 1942 දී පමණ 'තිරුවනමලේ' අසපුවේදී ධ්‍යානලාභී 'රමණ මහර්ෂීන්' හමුවීම, ඉන් දෙමසකට පමණ පසු හිමාලය ජනපදයේදී ශ්‍රේෂ්ඨ යෝගාචාර්‍යවරයකුවූ ස්වාමි නාරායනානන්දයන් හමුවීම, එයින් මසකට පසු ඍෂිකේශයට යෑම, ආදිය අමතක නොවන සිද්ධි. කලකට පසුව එක් යෝග සාධනයකදී මට මේ ඝන ශරීරයෙන් වෙන්ව සියුම් සිරුරකින් ඇත ඇවිදීමේ හැකියාව ඇති වුණා. මෙය ටිකක් සිත එකඟ කර ගැන්මෙන් දැඩි අධිෂ්ඨානය ඇති කා විසිනුත් කළ හැකි දෙයක්. අමතක නොවන මෙබඳු වැදගත් සිද්ධි තියෙනවා.''

**''මහානායක හාමුදුරුවෝ පුදුම විදියේ නිරෝගී සම්පත්තියකුත් ඒ වගේම දීඝායු සම්පත්තියකුත් විඳිනවා. ඒකට විශේෂ හේතුවක් තියෙනවද?''**

''ඒකට හේතුව මට බය නැතිව කියන්න පුළුවන්. මා කවදාවත්ම දුම් බීලා නැහැ. මා පාසැල් යන කුඩා කාලයේ වැල්ලීරා, ඒ කියන්නේ වේලිච්ච මුවමස් හෙම නිතර කන්න ලැබුණා. ඒ කාලේ ඒවා හරියට හම්බ වෙනවා. පස්සෙ මට වයස දහසය දහහත තරම් කාලයේ මා මස් කෑම සම්පූර්ණයෙන්ම අත් හැරියා. පස්සෙ කාලේ කරවල ඉඳලා හිටලා කන සිරිතක් තිබුණා. අන්තිමට මා මස් මාලු කෑම සම්පූර්ණයෙන්ම අත් හැරියා. එළවලු වලින්ම ජීවත් වෙන්න පුරුදු වුණා. කලාතුරකින් කරවල කතත් ඒකටත් එතරම් රුචියක් නැහැ. මා හිතන හැටියට මගේ ශරීර සනීපයට එක හේතුවක් ඒක.''

''අනික මට කවුරු මොන කරදරයක් කළත් බැත්තත් පත්තරවලින් මොන තරම් මාව විවේචනය කළත් කවදාවත් මා තරහ ගන්නේ නැහැ. ඉස්සරත් පත්තරවලින් දෙස් කිව්වා. පියදාස සිරිසේන මහත්මයා වගේ අය. මාව මහණ කළ මගේ ආචාර්‍යවරයා මට දීපු උපදේශය තමයි කවුරුත් මොනවා කීවත් කළත් තරහ ගන්න එපා කියන එක. උන් වහන්සේත් මොනම දේකටවත් කවදාවත් තරහ ගත්තේ නැහැ. අපට උගන්වන වෙලාවකවත් කවදාවත් තරහ ගත්තේ නැහැ. සැර කළේවත් නැහැ. කරුණාවෙන් ඔක්කෝම කියා දුන්නා.''

"මාව මහණ කළ ආචාර්යවරයා මට දුන්න ප්‍රධාන උපදේශය තමයි තමාට යුම්කිසි කෙනකු කරදරයක් කළොත්, කෝප නොවී මෛත්‍රිය වඩන්න කියන එක. ඒක විශේෂයෙන් කියන්න හේතු වුණේ මා ඉගෙන ගන්න දක්ෂ නිසා වැඩිමහලු ශිෂ්‍ය හාමුදුරුවන් මට ඊර්ෂ්‍යා කළා. මගේ ගුරු හාමුදුරුවන් එය දැනගෙන තිබුණා. කෙනකු හිරිහැරයක් කරදරයක් කරන විට මේක මගේ අතීත අකුසල කර්මයක් කියලත්, එහි විපාකයක් වෙන්ට ඇති කියලත්, ඒ අකුසල කර්මයෙන් විපාකයෙන් මා දැන් බොහෝ දුරට නිදහස් කියලත්, ඒ අකුසල කර්මයේ ශක්තිය අඩු වුණා කියලත්, මට අතීත කර්මයක විපාක ලැබෙන්න තිබුණා කියලත්, නිතර නිතර හිතන්න කියලා, මට උපදෙස් දුන්නා. ඒ වගේම ඒ කර්මයට වෙනින් කෙනකු පටලැවිලා කියලා හිතන්න කියලත් උපදෙස් දුන්නා. මේ හේතු නිසා ඒ කරදර හිරිහැර කරන අයට අනුකම්පා කළ යුතුයි කියා ගුරු හාමුදුරුවන් මට අවවාද කළා. ඒ උපදෙස් මට හරියට ප්‍රයෝජනවත් වුණා. යමකු ගැන මා කලකිරුණොත් ආශ්‍රය අත් හරිනවා. එච්චරයි මා කළේ. මේ නිසා මා බොහෝ කාලයක සිට කිසිම දේකට තරහ ගන්නේ නැහැ. මට තරහවක් ආව කාලයක් මතක නැහැ."

"බළන්ගොඩ පිරුවනේ උගන්වන කාලයේ සිසුනට දඬුවම් නොදී හොඳින් කරුණු කියා හදන්නටයි මා සිතුවේ. එහෙත් සමහර දළදඩු සිසුන්ට දඬුවම් නොකර බැරි තැනට කරුණු සැලසුණා. නොයෙක් විට වේවැල පාවිච්චි කළා. ඒත් යටි හිතින් මහත් කනගාටුවෙන් එහෙම කළේ. කලක සිටම ගමනෙහි යෙදුණ වෙලාවට පවා මා හැමදෙනාටම මෛත්‍රී කරමින් තමයි යන්නේ. වාහනයක අහස් යානයක යන කොටත්; වෙනත් වැඩක් නැත්නම් මගේ හිත පුරවන්නේ මෛත්‍රී භාවනාවෙන්. ඒ නිසා මා හැම තිස්සේම හිතේ සන්තෝසෙන් ඉන්නවා. මගේ ශරීර සනීපයට ඒක හේතුවක්."

"මා කෙනකුගෙන් ගෞරවයක් බලාපොරොත්තු වන්නේ නැහැ. ඒක නිසා මට කවුරුවත් අගෞරව කළා කියලවත්, අමුතුවෙන් සැලකුවා කියලවත්, සැලකුවා මදි කියලවත් හැඟීමක් ඇතිවෙන්නේ නැහැ. ඉහළින් සැලකුවා කියලා මගේ හිතේ ආඩම්බරයක් ඇති වෙන්නෙත් නැහැ. උඩගු බවක් ඇති වෙන්නෙත්

නැහැ. මට ගෞරව කළත් එකයි. අගෞරව කළත් එකයි. ඒවා නිසා මගේ හිතේ අමුතු සතුටක් ඇතිවෙන්නේ නැහැ. අසතුටක් ඇති වෙන්නේත් නැහැ. මා නිතර සන්තෝසයෙන් ඉන්නවා. මට හොඳට සලකන අයත් ඉන්නවා. සමහරවිට මැති ඇමතිවරුන් පවා. එහෙම කිසිම සැලකිල්ලක් නොකරන අයත් ඉන්නවා. මට මේ අය බොහොම සලකනවා, මේ අය සලකන්නේ නැහැ, කියලා විශේෂ බැඳීමක් අමනාපයක් ඒ අය ගැන නැහැ. මේ ළඟම දායකයා කියලා, එහෙම හැඟීමක් එන්නේත් නැහැ. මට එබඳු තැනදී ඇත්තේ උපේක්ෂාව. ඕක මට බොහෝ කලක් පුරුදුවෙලා තියෙන එකක්. නිරෝගි සැප ලැබීමට, දීර්ඝායුෂ ලැබීමට මේක එක හේතුවක් කියලා මට හිතෙනවා. හැම තැනදීම ලද පමණින් සතුටු වෙනවා."

"මහානායක හාමුදුරුවෝ පරිත්‍යාගයට බොහොම කැමතියි නේද?"

"ඔව්, මා නොයෙක් විදියේ පරිත්‍යාග කරලා තියෙනවා. ඒක මට පොඩි කාලේ ඉඳලාම හුරුයි. මා නොයෙක් විදියේ පිත් දහම් කරලා තියෙනවා. තව තවත් කරනවා. එහෙත් ඒ අතර මට අමතක නොවන සිද්ධි දෙකක් තියෙනවා. මා ඉස්කෝලේ යන කාලේ අපේ වෙළඳ සැලේ දොරකඩට ආවා දෙමළ හිඟන ගැහැනියකුත් එයාගේ අවුරුදු දහයක් විතර වුණ කොලුවෙකුත්. ඒ කොලුවාගේ එක ඇහැක් පේන්නේ නැහැ. හරිම අපිරිසිදුවට තමයි හිටියේ. ඉතින් මට ඒ කොලුව දැක්කම හරියට කනගාටු හිතුණා. එතකොට මට වයස අවුරුදු නවයක් විතර ඇති. මා හිටියේ ඒ කඩේ භාරකාර ආතා ළඟ. මා ආතාට කිව්වා, 'ආතේ, අර ළමයාට හරියට පොරවන්න එකක්වත් නැහැ. මගේ බ්ලැන්කේට්ටුව මා එයාට දෙනවා' කියලා. මට තිබුණා හුඟාක් වටිනා ගණ රෙදිවලින් කරපු බ්ලැන්කේට්ටුවක්. මා අර විදියට කිව්වාම ආතා කිව්වා, 'ආ .. ඒක උඹේ කැමැත්තක්' කියලා. මා ඒක අකුලලා ගෙනත් අර ළමයාට දුන්නා. ඉතින් මට බොහෝම පිත් දීලා ඒ දෙමළ අම්මයි ළමයයි යන්න ගියා. එද මා ගත කළේ බොහොම ප්‍රීතියෙන්."

"තවත් සිද්ධියක් කියන්නම්. මා ආනන්ද කොලීජියේ උගන්වන කාලේ හලාවත මාදම්පේ පැත්තේ බණකට යන්න සිදු වුණා. මා බණට ගිහින් පහුවදා උදේ ස්ටේෂමට ආවා, රේල්ලුවට

නගින්න. අනේ ස්ටේෂමේ ඉන්නවා මහා කිළුටු සිවුරක් පෙරවා ගත්ත වයසක හාමුදුරු කෙනෙක්. ළඟට ගිහිල්ලා මා ඇහුවා මොකද හාමුදුරුවනේ මෙච්චර කිළුටු දිරාපත් සිවුරක් පෙරවා ගෙන ඉන්නේ කියලා. 'අනේ ආයුෂ්මතුනි, අපි දුප්පත් උන්නාන්සෙලා අපට ඉතින් කොහෙත් හම්බවෙනවාද?' මට තේරුණා මේ පිටිසර බොහොම දුප්පත් හාමුදුරු කෙනෙක් බව. මා කිව්වා, 'හාමුදුරුවනේ ඔය සිවුර මට දෙන්න, මගේ සිවුර හාමුදුරුවෝ පෙරවා ගන්න කියලා'. මා පෙරවා ගෙන ගියේ හොඳ අලුත් සිවුරක්. මා ඒක ඒ හාමුදුරුවන්ට දුන්නා. ඒ හාමුදුරුවන්ගේ පරණ සිවුර මා ඉල්ලා ගත්තා. ඒ විදියට අප දෙන්නා මාරු කරලා පෙරවා ගත්තා. ඉතින් ඒ හාමුදුරුවන් මට ඒ වෙලාවේ හුඟාක් පින් දුන්නා. ඒ පරණ සිවුර පෙරවාගෙන රේල්ලුවේ නැගිලා ආවා. ඒක පොරවාගෙන ආවත් ඒක හරිම අපිරිසිදුයි. කොලීජියේ කාමරේට ඇවිත් ඒක අයින් කරලා ඇඟ හෝදගෙන වෙන එකක් පෙරවා ගත්තා."

"ඉතින් මට ඔය විශේෂ සිද්ධි දෙක නිතර මතක් වෙනවා. අනික් දීම් කොච්චර කරලා තිබුණත් ඒවට වැඩිය මේ දීම් උසස්ය කියලා මට හිතෙනවා."

**"මහානායක හාමුදුරුවන් මේ දුප්පත් අසරණ අය ගැන, යමක් කමක් කර ගන්න බැරි අය ගැන හුඟාක් හිතනවා නේද?"**

"ඔව්, පොඩි කාලේ ඉඳන්ම මා අහලා තියෙනවා, දැකලා තියෙනවා, මේ ඉහළ මුලාදෑනීන් දුප්පත් අසරණ අයට හිරිහැර කරන හැටි. සමහරුන්ට අල්ලස් නොදෙන නිසා සිය යුතුකම් හරියට ඉටු නොකර අහිංසා අමාරුවේ දාන හැටි මා දැකලා තියෙනවා. අහලා තියෙනවා. මා කොළඹට ආවට පස්සේ, කොළඹ ඉන්න කාලයේ මේ කාරණය වඩාත් හොඳට තේරුම් ගත්තා. ඉතින් මේ විදියට දුප්පත් අසරණ අයට අයුතු අසාධාරණකම් කරන ඉහළ පැලැන්තියේ අය ගැන පොඩි කාලේ ඉඳන්ම මා තුළ පැහැදීමක් නැහැ. විශ්වාසයක් නැහැ. ඒ කලකිරීම මා තුළ ස්වභාවයෙන්ම ඇතිවුණ එකක්. ඉහළ නිලධාරීන් අතර හොඳ අය නැතුවා නොවෙයි. එක්කෙනෙක් දෙන්නෙක් එහෙම ඉන්නවා. නමුත් වැඩි දෙනා අර විදියේ අය. දැනුත් මට ආරංචි වෙන හැටියට ඔය ලොකු ලොක්කන් අහිංසක අසරණයන් අමාරුවේ දානවා."

"බළන්ගොඩ පළාතෙම කෙනෙකු අවුරුදු පහකට ඉස්සර ජනාධිපතිතුමා නියම කළ පැන්ෂන් එක ගන්න කායභීලයට යනවා. ඒත් මොනවා හරි කියලා කන්තෝරුවේ ප්‍රධානියා මේක පහු කරනවා. දැන් අවුරුදු පහක් විතර වෙනවා. ඒක දෙන්නේ නැහැ. දවසක් ඇවිත් මට ඒ ගැන පැමිණිලි කළා. මා කිව්වා, 'අනේ මට ඕවාට අත ගහන්න බැහැ, ඔය ගැන ජනාධිපතිතුමාට කියන්න' කියලා. ඉතින් ඔන්න ඔය විදියේ ඒවා කොච්චරවත් මට අහන්න දකින්න ලැබෙනවා. මේ විදියට අහිංසක මිනිසුන්ට කළ යුතු සේවය නොකරන නිලධාරීන් ගැන මගේ ලොකු අප්‍රසාදයක් තියෙනවා. එක්කෙනෙකු දෙන්නකු හොඳ අය සිටියත් වැඩිදෙනා නරක පැත්තේ නිසා ඉහළ නිලධාරීන් ගැන මගේ පැහැදීමක් විශ්වාසයක් නැහැ. මටත් සලකන නිලධාරීන් සිටියා. ඔය බාත්ස් රත්වත්තේ රටේ මහත්මයා හෙම මට බොහොම සලකනවා. එහෙත් මා බලන්නේ ඒ ඉහළ නිලධාරීන් සාමාන්‍ය ජනතාවට සලකන විදියයි."

"කලකට පෙර රත්නපුර පෙදෙසේ සිටි එක් උසස් නිලධාරියකු අපේ පිරිවෙනටත් අපටත් බොහොම උපකාර කළා. එයා නිතරම කතා කරන්නේ රට හදන්න, ආගමට සේවයක් කරන්න. නමුත් එයත් එක්ක ළඟින් ආශ්‍රය කිරීමේදී මට පෙනුණා එයා එයාගේ සේවකයන්ට බොහොම පහත් ලෙස සලකන බව. එතැන නෑ සමානාත්මතාවක්. මහජනයා මැදට ගියාම විතරයි සමානාත්මතාව. මට මෙයින් පෙනුණා මේ අය කතාවට විතරයි සමානාත්මතාව, ක්‍රියාවට නෑ කියලා.මේ නිසා මට හිතුණ දෙයක් තමයි 'මේ අය රට රවටන පිරිසක්' කියන එක. ඔන්න ඔය වැනි හැඟීම් නිසා ලොකු ලොක්කන් වැඩිදෙනා ගැන මගේ පැහැදීමක් නැහැ. විශ්වාසයක් නැහැ. මිත්‍රත්වයක් නැහැ. එදත් අදත් කවදවත්ම නැහැ. කොච්චර ලොකු වැඩ කළත් එවැනි අය දුර්වලයකුට පීඩා කරනවා නම් ඒ මිනිහා එහෙම පිටින්ම මට එපා වෙනවා. ඔන්න ඕක තමයි මගේ ස්වභාවය. ඒක මගේ දුර්වලකමක් වෙන්නැති. මේ නිසා කෙනකු මට කොපමණ උදව් කළත්, ඒ උදව් මාත්‍රයෙන් මා එයාට නැමෙන්නේ නැහැ. එයා වෙන කෙනෙකුට හිරිහැර කරනවා නම්, හෙළා දකිනවා නම් මා ඔහු ගැන කලකිරෙනවා. අර මට කරන උදව් ගැන උපේක්ෂක වෙනවා. ඒ නිසා ලොකු ලොක්කන් කෙරෙහි මගේ විශේෂ බැඳීමක් ඇල්මක් නැහැ. විශ්වාසයක් පැහැදීමක් නැහැ."

"මට හුරුවෙලා තියෙන්නේ ඔවුන් කෙරෙහි උපේක්ෂක වීමටයි. මට උදව් නොකරන එක්කෙනාත් උදවු කරන එක්කෙනාත් දෙන්නම මට එක වගෙයි. පුද්ගලයා හොඳම නම් සත්පුරුෂයෙක් නම්, යහපත් කෙනෙක් නම් අවංක නම් එයා කෙරෙහි මගේ පැහැදීමක්, පෞද්ගලික පැහැදීමක් තියෙනවා. ගිහි පැවිදි කා කෙරෙහිත් එහෙමයි. එහෙත් මා කාටවත් වහල් නැහැ. තද බැඳීමක් නැහැ."

**"නායක හාමුදුරුවනේ ඔබ වහන්සේ ගැන ඔබ වහන්සේට වෙන මොනවද කියන්න තියෙන්නේ?"**


"මා නිතර හිතන දෙයක් තමයි මා තනියි කියන එක. කවර තැනක හිටියත් මට ඒ ස්ථානය ගැන ඕනෑ කමක් නැහැ. කොතනදී උණත් මා ඉන්නේ හැමවිටම යන්න ලෑස්ති වෙලා. ඉන්න ලෑස්තියක් නැහැ. මට රටේ කොතනත් ඉන්න පුළුවන්. කන්න දෙයක් නැත්නම් කොළ ජාති කාලා හරි ඉන්න පුළුවන්. මගේ ජීවිතය හුරුවෙලා තියෙන්නේ ඒ විදියටයි. ඒ නිසා මට අහවලා තරහ වෙයි කියලා බයක්වත්, අහවලා පහදවා ගන්න ඕනෑ කියන ඕනෑ කමක්වත් නෑ. මේ නිසා මට බොහොම පාඩු සිදුවෙලා තියෙනවා. සිදුවෙන්නත් පුළුවන්. ඒත් මා ඒවා සන්තෝසෙන් ඉවසනවා. එහෙම නැතුව ලොකු ලොක්කන් සතුටු කර ගත්තා නම් මා ඉන්න මේ උඩුමුල්ලේ පන්සල මාලිගාවක් කර ගන්න මට ඉඩ තිබුණා. මා පන්සල හදල දෙන්න කිසි කෙනකුට කිව්වේ නැහැ. බළන්ගොඩ බොහොම පොහොසත්, සිංහල මුස්ලිම් මැණික් කාරයන් ඉන්නවා. සමහරුන් කියනවා 'අපට කියනවා නම් අප උදව් කරනවා, මේ හාමුදුරුවන් අපට මොකවත් කියන්නේ නැහැ' කියලා. මා කිව්වොත් දහස් ගාණක් වියදම් කරලා මේවා හදලා දෙයි. එහෙත් එහෙම බැඳීම්වලට මා කැමති නැහැ. මේක මගේ දුර්වල කමක්ද මා දන්නේ නැහැ. අනුන් කෙරෙහි විශ්වාසය බොහොම අඩුයි. ඒ නිසා කාටවත්ම මගේ බැඳීමක් නැහැ. කෙනකු කොච්චර මට පැහැදීම දක්වුවත් මා ඒ ගැන උපෙක්ෂක වෙනවා."

"මට නිතර මතක් වෙන දෙයක් තමයි සංයුත් සඟියේ අර ලාභ සත්කාර කීර්ති ගැන ආශා කිරීමේ වැරැද්ද බුදුහාමුදුරුවන් වදාරල තියෙන හැටි. ඒවට වහල් වීමේ දෝෂ කියලා උපේක්ෂක වීමේ ශ්‍රේෂ්ඨත්වය පෙන්නල දීල තියෙනවා."

"ඒ විතරක් නෙවෙයි මගේ හිත මොනම දේකින්වත් පෙරළන්න කලඹන්න ලේසියෙන් බැහැ. මොන කරදරයක් වුණත්, මොන බාධාවක් වුණත්, මේවා මේ ලෝකේ හැටි, කියලා මා ඒවා සුළුකොට හිතනවා. නම්බු කීර්ති ප්‍රශංසා ගැන මුලසිටම මගේ අපේක්ෂාවක් නැහැ. අග්ගමහා පණ්ඩිත වැනි උපාධි රාශියක් මට නොයෙක් තැන්වලින් ලැබී තියෙනවා. නමුත් ඒවා ගැන මගේ තැකීමක් නැහැ. ඒවා නිරායාසයෙන්ම මට ලැබුණ නිසා රටේ අනික් අයටත් එවැනි දේ දෙන නිසා, නොපිළිගත්තොත් දෙන අයගේ සිත රිදෙන නිසා ලෝ සිරිත අනුව මාත් ඒවා බාර ගත්තා. එහෙත් මා ඒවා පාවිච්චි කරන්නේ නැහැ."

"මට නිතර තිබුණ හැඟීමක් තමයි මා තවම දැනීම අතින් මදි, කියන එක. බුද්ධ ධර්මය බොහෝ ගැඹුරු දෙයක්. ඒක තව කොච්චර බැලුවත්, එක සූත්‍රය දහස් සැරයක් බැලුවත් අලුත් අලුත් දැනුම් ඇති වෙනවා. කලින් නොආ අදහස් එනවා. මා ත්‍රිපිටකය කීපවරක් කියවලා තියෙනවා. මට තේරෙනවා ලෝකය පිළිබඳව දත යුතු තව බොහෝ දේ තියෙනවා කියලා. ඒ වගේම ජීවිතය ගැනත් තව දත යුතු බොහෝ දේ තියෙනවා කියලා. මා දන්නේ මොනවාද? මට මේ අදහස නිතර ඇතිවෙනවා. දැනීම පිළිබඳ මා තෘප්තියට පත්වෙලා නැහැ. මා තවම ලෝක තත්වය හරියට නොදන්න කෙනෙක්. ඒ නිසා කිසිම උපාධියක් ලැබීමට සුදුස්සෙක් කියලා මා හිතන්නේ නැහැ. නමුත් ඒවා මට ලැබුණා. මා තවම ඉගෙන ගන්නා අවස්ථාවේ ඉන්න කෙනෙක්. කවදහරි අනාගතයේ ලොවුතුරා බුදුබව ලැබුණොත් එදටයි මගේ ඉගෙනීම නතර වන්නේ. කොටින්ම සෝවාන් පුද්ගලයකුට ලෝක තත්වය පිළිබඳව තියෙන දැනුමෙන් දහෙන් පංගුවක්වත් මොනම ලෞකික පණ්ඩිතයකු තුළවත් නැහැ. ඉතින් මා මොනවාද දන්නේ? පොත්වල තියෙන්නේ අනුන්ගේ අදහස්. ඒවා කටපාඩම් කර ගත්තාම, හිතට ගත්තාම ඒවා අනුන්ගෙන් ණයට ගැනීමක්. විභාග පාස් කරලා ලබන්නේ අනුන් ලියාපු ඒවා හිතේ තැන්පත් කරගෙන ඒවා ලියලා උපාධියක් ලබා ගැනීමයි. ඒ උපාධිය ඒ සඳහා ලබාපු එකක් මිස තමන්ගේ අවබෝධය නිසා ලබාගත් එකක් නොවෙයි. මේ විදියට බලපුවාම මේ උගතුන්ගේ පණ්ඩිතයන්ගේ උගත්කම හිස් කියලා මට හිතෙනවා."

"ඉතින් මා පුළුවන් තරම් මගේ පැවිදි බව උපසම්පදාව හොඳින් ආරක්ෂා කර ගන්නවා. ඒ වගේම මා බොහොම උත්සාහ කරනවා හිත පිරිසිදුව තබා ගන්න. ලේසියෙන් ප්‍රිය සම්මත දෑයක් දෙසට මා නැමෙන්නේ නැහැ. හරිම ලස්සණයි කියන මොනම රූපයක් හරි මට දකින්න ලැබුණාම මට පේන්නේ ඒකේ දෙස් පැත්ත. එය තුළින් ඇට සැකිල්ලක්. මේ ඇටසැකිල්ල වටේට ලේ මස් ගොඩක් එකතුවෙලා ඒක හමකින් වැහිලා තියෙනවා නොවේද යන්න තදින් මගේ හිතට කාවැදුණ අදහසක්. ඒ විදියටයි මට පේන්නෙත්. ඒක නිසා මගේ හිත බොහොම ආරක්ෂා වෙනවා.



විවේක සුවයෙන් චිත්ත විවේකාශ්‍රමයේ ගත කල මොහොතක්.....

ඒ වගේම කෙනකු නිග්‍රහ කළත්, හෙළා දක්කත් ඇටසැකිල්ලක් කෙරෙහි මා තරහ ගන්නේ මොකටද කියලත් මට හිතෙනවා. ඒ නිසා කෙනකු ගැන මට තරහව නැගිච්ච වෙලාවක් මතක නැහැ. හැබැයි ඉතින් මගේ එක දුර්වල කමක් තියෙනවා, කිසිම කෙනකුගේ බසට නොනැමෙන ගතිය. බොහෝ දෙනා නොයෙක් දේ මට කියනවා. මා විරුද්ධව වාදයට යන්නේ නැහැ. කතාව කොට කිරීමට ඒවා පිළිගත්තා වගේ අහවනවා. ඒ වුණාට මා ඒවා සිතින් බාර ගන්නේ නැහැ. ඉස්සර ඉඳන්ම හැමදමත් එහෙමයි. බොහෝදෙනා

හිතාගෙන ඉන්නවා මා බොහොම ලේසියෙන් රවටා ගන්න පුළුවන් කියලා. ඒක ඔවුන්ගේ මුළාවක්. මට හිතුණු එකයි මා කරන්නේ.”

**“මහානායක හාමුදුරුවන් මුල සිට කරගෙන ආ භාවනා අංශයට මුළු කාලයම යොදනවා නම් වඩාත් හොඳයි නේද?”**

“ඔව්! ඒක ඇත්ත, එහෙම දේකට මට විවේකයක් නැති කමයි ලොකුම බාධාව. උදේ හිට හැන්ද වෙනතුරු සමහරුන් ඇවිත් වැදගැම්මකට නැති දේවල් ගැන කතා කර කර කාලය කා දමනවා. සමහරුන් ඇවිත් ලියුම් ඉල්ලනවා, ජනාධිපතිතුමා ළඟට පිළිකන්නෙන් ගිහිල්ල ඒ අයගේ කටයුතු කරවා ගන්න, මා එහෙම වැඩවලට කැමති නැහැ. කොච්චර මුරකාරයන් හිටියත් කොහොම හරි ඒ අය වළකලා මා මුණ ගැහෙන්න ඉඩ ගන්නවා. කාරණය මොකක්ද? අර වගේ හේතුවලට ලියුම් ගන්න. මා ඔබඳු වැඩවලට කැමතිම නැහැ. ජනාධිපතිතුමා ඒ ඒ මැති ඇමතිවරුන්ට වැඩ කොටස් පවරලා තියෙනවා. ඒ අයට ඒවා නීත්‍යානුකූලව කරන්න අප ඉඩ දිය යුතුයි. ඒවාට ඇඟිලි ගහන එක වැරදියි.”

“රටේ පාලන ක්‍රමයට ඇඟිලි ගහන්න මා කැමති නැහැ. තනතුරු පත් කරනවා ඇත්තේ යම්කිසි ක්‍රමයකට වෙන්න ඇති. යාළු මිත්‍රකම්වලට හෝ, එහෙම නැත්නම් පිළිකන්නෙන් ගිහිල්ලා හෝ, එක එක්කෙනා පොළඹවලා හෝ, නුසුදුස්සන් තනතුරුවලට පත් කරන්න උත්සාහ ගන්නවානම් ඒක බරපතළ වරදක්. රජයේ ඇමතිවරුන් යම් යම් පරීක්ෂණ කරලයි ඒ ඒ අය තනතුරුවලට පත් කරන්නේ. ඒක වෙනස් කරන්න මා කරුණු කියන්න යෑම හරි නෑ. නමුත් මිනිසුන්ට මේ කාරණය කොච්චර කිව්වත් පිළිගන්නේ නැහැ. නැවත නැවත කන්නලව් කරනවා. ගමේ මිනිස්සු වැඩිය කරදර කරන්න එන්නේ නැහැ. දුර බැහැර පළාත්වලින් පිට අය තමයි ඕවට එන්නේ. මෙහේ හිටියොත් පොත් පත්වල වැඩ කරන්නවත් භාවනා පැත්ත දියුණු කර ගන්නවත් ඉඩක් ලැබෙන්නේම නැහැ.”

“මට දන් තවත් කරදරයක් තියෙනවා. අපේ සමහර තෙරවරුන් නායක උත්සවවලට එසේ නැත්නම් වෙනත් සභා රැස්වීම්වලට මා ගෙන්වා ගන්ට කරව්වලේ. ඒ උත්සව, කාලය නාස්ති කරන හිස් වැඩ. ඒ අයගේ හිත් රිදවන්න නොකමැති

නිසා මා ඒවාට යනවා. මෙහි ඉන්න කොට මේ තත්වය හොඳටම වැඩියි. ඒ වගේම මෙහේ උෂ්ණයත් එක කරදරයක්. අධික උෂ්ණය තියෙන විට හිත එකඟ කර ගන්න අමාරුයි. ඒ නිසා බළන්ගොඩ යන්න හිතාගෙන ඉන්නවා. එහේ මා මහණ වෙච්ච පන්සල හරිම සනීපයි. කාලයේ වැඩි කොටස එහේ ඉන්නයි අදහස."

"මා දවස බෙදු ගෙනයි තියෙන්නේ. නියමිත වෙලාවට භාවනා කරනවා. ඉස්සර නම් දවසට හතර සැරයක් භාවනා කරනවා. පහේ සිට හය දක්වා, දවල් දහයේ සිට එකොළහ දක්වා, සවස පහේ සිට හය දක්වා, රාත්‍රී දහයේ සිට එකළොහ දක්වා. ඔය වෙලාවල් හතර කඩ කරන්නේම නැහැ. ඒත් දැන් ඒවා කරන්න ඉඩක් ලැබෙන්නේම නැහැ. පිළිවෙළකට කරන්න දෙන්නේම නැහැ."

"පිටරට ඉන්න විට යුරෝපීයයන්, ඇමෙරිකන් ජාතිකයන් බොහෝ විට එන්නේ නොතේරෙන කරුණු අහලා දැන ගන්න. දේශනාවලට වඩා ඒක හරිම ප්‍රයෝජනයි. විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයන්, කොලීජ්වල ශිෂ්‍යයන්, සමහර බෞද්ධයන් සමහරවිට අබෞද්ධයන් මේ සඳහා නිතර පැමිණෙනවා. නමුත් ලංකාවේදී යමක් අහලා දැන ඉගෙන ගන්න එන අය කොහෙත්ම නැතැයි කිය යුතුයි. තනතුරු ලබා ගන්න කරච්චල් කිරීමට ඊමයි මෙහේ තියෙන්නේ. එහෙම නැත්නම් විනෝදය සඳහා නානාවිධ සංලාපවල යෙදෙන්නට තමයි එන්නේ. මේ නිසා මට හිතෙනවා කිසි කෙනෙකුට නොදැනෙන්න අප්‍රකට කැලෑ ප්‍රදේශයක හැංගිලා ඉඳගෙන මගේ භාවනා පැත්ත දියුණු කරගන්න. මා පොරොන්දුවෙලා තියෙනවා පාලි ත්‍රිපිටකයේ යම් යම් කොටස් ඉංග්‍රීසියට නගලා 'කොම්පියුටර්රයිස්' කරලා දෙන්න."

"ඒක දැන් මගේ වැඩවලින් එකක්. අනෙක තමයි භාවනාව. කැලයකට ගිහින් පොත් පත්වල වැඩ කරන්න බැහැ ලයිට් නැති නිසා. ඒ නිසා ඔය අරමුණු දෙකට බළන්ගොඩ පන්සලට යන්නයි මා හිතාගෙන ඉන්නේ."

"භාවනාවට මුළු කාලයම යෙදවීම වඩා හොඳයි නේද? කියලා අහපු ප්‍රශ්නයට පිළිතුර 'ඔව්' කියන එකයි. භාවනාව සඳහා මුළුකාලයම යෙදුවා නම් අද මේ වනවිට ඉතාම උසස් ධ්‍යානලාභියකු වෙන්න තිබුණා, කියලා මට හිතෙනවා. නමුත්

ඉදිරිපත් වෙන වෙනත් කරුණු මගහැර දන්නත් බැහැ. ඒවාට මුහුණ දෙන්නත් ඕනෑ. කොහොම වුණත් මට ලැබීගෙන ආ ආධ්‍යාත්මික දියුණුව මේවා නිසා බොහෝ සෙයින්ම ඇන හිටියා."

**"මහානායක හාමුදුරුවනේ, අවසාන වශයෙන් ඔබ වහන්සේගෙන් මා තව එක ප්‍රශ්නයක් අහන්න කැමතියි, මේ රටේ බොහෝ දෙනකුගේ හැඟීමක් තියෙනවා, නායක හාමුදුරුවන් මාර්ග ඵලයකට හෝ අඩු තරමින් ඒ කිට්ටුවටවත් පත්ව වැඩ ඉන්නවා කියන එක. ඒ ගැන මොකද කියන්න තියෙන්නේ?"**

"අනේ නැහැ. ඒක වැරදි අදහසක්. මා එවැනි තත්වයකට පත්වෙලා නැහැ. හැබැයි ඒ ආසන්නයට නම් ආවා. කඳුබොඩදී සුජාත තෙරුන් යටතේ මා භාවනාව පුරුදු පුහුණු කළ බව කලින් කීවානේ. එහිදී භාවනාව තුළින් මා උසස් තත්වයක් ඇති කර ගත්තා. එහිදී මා සංඛාර උපෙක්ඛා ඥානය තෙක් වැඩුණු බව කලින් සඳහන් කළා. සුජාත තෙරුන් මට කිව්වේ තව දුරටත් ඒ තත්වය දියුණු කර ගන්නා ලෙසයි.මා ඒ සඳහා උත්සාහ කළත් එතනින් එහාට යන්න මට බැරි වුණා. එතනින් එහාට යන්න පුළුවන් වුණා නම් ඊළඟට වැටෙන්න තිබුණේ සෝවාන් තත්වයටයි."

"ඉතින් 'ඒ කිට්ටුවට ඇවිත් එතනින් එහාට යන්ඩ බැරි තත්වයක් ඇති වුණේ මන්ද?' කියා මා සුජාත තෙරුන්ගෙන් විමසුවා. එතනදී උන් වහන්සේ 'ඔබ වහන්සේගේ විශේෂ ප්‍රාර්ථනාවක් තියෙනවද' කියලා මගෙන් ඇහුවා. මගේ හිතේ තිබුණු රහසක් එවිට මා හෙළි කළා. එනම් 'මා ලොවුතුරා බුදුබව පිණිස පාරමිතා පුරන කෙනකු' බව උන්වහන්සේට හෙළි කළා."

" 'එහෙමනම් ඔතනින් එහාට යන්න බෑ. සුමේධ තවුසත් ඔතනට ඇවිත් තමයි අතට පත් නිවන් සුවය අත් හළේ, ඉතින් කොච්චර විපස්සනා කළත් ඔතනමයි නතර වෙන්නේ. ඒ නිසා සමථ භාවනාවක් අවස්ථානුකූලව වඩන්න කියලා උන්වහන්සේ එදා මට උපදෙස් දුන්නා. ඉතින් අදත් මා වෑයම් කරනවා. මේ වයසක තත්වයෙන් ඉඳ ගෙනත් භාවනා පැත්ත දියුණු කර ගන්න."

## "බුදුබව පතන බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහනාහිමි" ග්‍රන්ථය ප්‍රථම මුද්‍රණයෙන් දොරට වැඩූ 1993.04.08 දින අතිපූජ්‍ය ආනන්ද මෛත්‍රෙය මහනාහිමියන් විසින් පැවත්වූ දේශනය.

මා මේ ස්ථානයට එනතුරුම හිතුවේ නෑ, මේ වගේ උත්සව සභාවක් ඇතැයි කියා. මේ පොත සකස් කළ ඉත්තෑපාන ධම්මාලංකාර ස්ථවිරයන් වහන්සේ දැන් දවස් දෙක තුනකට ඉස්සර මා මුණගැහිල මේ පොත පිළිගැන්වීමට මේ ජයවර්ධන සංස්කෘතික මධ්‍යස්ථානයට එන්නැයි කියල ආරාධනාවක් කළා. ඉතින් ආවායින් පස්සේ මට පෙනුණා, විශාල උත්සවයක් මෙතන පැවැත්වෙන බව. මා ජීවිතයේ කවදාවත් මේ විදියේ ගෞරව සත්කාර බලාපොරොත්තු නැහැ. අනෙක මගේ චරිතය ලෝකයාට දෙන්න උවමනාවක් තිබුණේ නැහැ. නමුත් කලකට පෙර මේ ධම්මාලංකාර ස්ථවිරයන් ඇවිත් මගේ පෞද්ගලික ජීවිතයේ තොරතුරු දැනගන්න කැමති බව කිව්වා. ඊට පස්සේ ඒවා ගැන මගෙන් එක එක ප්‍රශ්නත් ඇහුවා. ඉතින් අහන අහන ඒවට මමත් උත්තර දුන්නා. ඔහොම දවස් ගණනක්ම ඇවිත් ලියාගෙන ගියා.

ටික දවසක් යන කොට "**වයසට ගියත් මහළු නොවන හාමුදුරුවෝ**" කියල මා ගැන විස්තරයක් පත්තරයක යන්න පටන් ගත්තා. ප්‍රසිද්ධියට මගේ කැමැත්තක් නැහැනේ. ඒ වුනත් ඉතින් මා ගැන අනුන් ලිව්වට මට කරන්න දෙයකුත් නැහැ. ඔය විස්තර බොහෝ කාලයක් පත්තරවල පළ වුණා. පස්සේ කාලෙක ඒ විස්තරත් ඇතුළත් කරල මගේ චරිතය පොතක් හැටියට ලියා පළ කරන බව ඒ ස්ථවිරයන් වහන්සේ මට කිව්වා. ඉතින් ඒ අනුව යි මේ පොත සකස් කරල තියෙන්නේ. මගේ චරිතය බොහෝ දෙනා උසස් කරලා සැලකුවාට ඒක එතරම් උසස් ලෙස මා සලකන්නේ නැහැ. මේ පොතේ මා ගැන නොයෙක් තොරතුරු ලියවී තියෙනවා. ඒ හැර මා හෙළි කරන්න කැමති නැති තවත් වැදගත් කරුණු තියෙනවා. ඒවා හෙළි කළොත් බොහෝ දෙනාගේ පරිහාසයට මා ලක්වෙන්න පුළුවන්. ඒ භාවනා කිරීම් ආදියෙන් මා ලැබූ අත්දැකීම්

තොරතුරුයි. නමුත් අද බොහෝ දෙනා ඕවා පිළි ගන්නේ නැහැ. ඒවා කීවොත් බොරු ආත්ම වර්ණනා කරනවා කියා හෝ මිත්‍යා මත ප්‍රකාශ කරනවා කියා හෝ නිග්‍රහ කළ හැකියි. ඒ මොකද ධර්මය පවා භෞතිකවාදී පැත්තට නැඹුරුවයි අද බොහෝ දෙනා තෝරන්නේ.

දැන් මගේ වයස අනූහත ඉවර වේගෙන යනවා. අගෝස්තු මාසය වෙන විට අනූඅටට ලබනවා. මගේ ශරීර සෞඛ්‍යටත්, ආයුෂ දික්වීමටත් හේතුව පුදුමයක් නොවෙයි. අල්පායුෂව ඉපදී නැත්නම් හැම අයකුටම තම ආයුෂ දික්කර ගන්න පුළුවන්. ඒ පිළිබඳව මනා පැවතීමෙන්. වයසට ගියත් මහළු නොවෙන හාමුදුරුවෝ කියල මා ගැන කිව්වේ මට තාමත් ශරීර ශක්තිය හොඳට තියෙන නිසා වෙන්නැති කියල මා හිතනවා. මා වරක් දොස්තර කෙනෙක් ළඟට බෙහෙත් ගන්න ගියා. මගෙන් ඇහුවා වයස කීයද කියා? අනූතුනයි කිව්වම පුදුම උනා. ඒ අය කිව්වේ වයස අවුරුදු විසිපහක අයකුට සමාන හෘදය වස්තුවක් තියෙන්නේ කියල. ඒ අය ඇහුවා එච්චරටම නිරෝගිකම ආරක්ෂා කරගත්තේ කොහොමද? කියල.

මම කවදාවත් දුම්බීම කරලා නැහැ. දුම්කොල කාලා නැහැ. බොහොම ඉස්සර කුඩා කාලේ ඔය මස් වර්ග කාලා තියෙනවා. පස්සේ මට වැටහුණාම ඒවත් අත් හැරල දැම්ම. ඉඳ හිට කරවල වගේ දෙයක් වළඳල තියෙනවා. ඒත් එච්චර ඕනෑකමකින් නෙමෙයි. මම කවදාවත් දවල්ට නිදා ගත්තේ නැහැ. මේ රැස්වෙලා ඉන්න පිරිසට මා කියන්නේ මගේ ශරීර සෞඛ්‍යට හේතු ඕවයි. මම බොහොම පයින් තමයි ගමන් බිමන් කළේ. නිකම් මා කාලය ගත කළේ නැහැ. පොත් ලියන්න, පොත් කියවන්න තමයි කාලය වැය කළේ. මගේ ශරීර සෞඛ්‍යය ආරක්ෂා වෙන තවත් හේතුවක් තියෙනවා. ඒක තමයි කොයිම දේකටවත් හිතට තරහ නොගැනීම. මට විරුද්ධව අන් අය මොන මොන දේවල් කිව්වත්, කළත්, ඒ අය ගැන මගේ හිතේ තරහ, වෛරය ඇති කරගන්නේ නැහැ. ඒක මට මගේ ගුරුහාමුදුරුවන් නිතර කියා දුන් අවවාදයක්. උන්වහන්සේත් එහෙමයි. ගුරුවරයාගේ ආදර්ශය මා ගත්තා. හැමකෙනා තුළම දුර්වලකම් තියෙනවා. මා තුළත් තියෙනවා. නමුත් වරදක් දුටු තැන ඒ පිළිබඳව මා කේන්ති ගන්නේ නැහැ.

එතැනදී මා හිතන්නේ ඒ වැරදි කරන කෙනාගේ දුර්වලකම ගැනයි. එහෙම නැත්නම් එයාගේ නොතේරුම්කම කියලයි. ඔය විදියට අන්‍යයන් ගැන මා සිතන නිසා මගේ හිතට තරහ එන්නේ නැහැ. තරහ ගන්නේ නැහැ.

අනිත් කාරණය තමයි මා නිකම් ගත කරන වේලාවටත්, පාරේ යන එනකොට පවා පුරුදු කරන්නේ මෛත්‍රී භාවනාව. ඉතින් ඒ නිසා කොයිම වෙලාවකවත් මගේ හිතේ තරහ වෛරය වගේ දේවල් නැහැ. හිත නිතරම සතුටින් තියෙන්නේ. ඒ වාගේම හිතේ මෛත්‍රිය වඩනවා. ඉතින් මගේ ශරීර සෞඛ්‍යට ප්‍රධාන හේතු ඕවා කියල මා විශ්වාස කරනවා.

ධම්මාලංකාර ස්ථවිරයන් මා ගැන ලියල තියෙන මේ පොතේ ඔය විස්තර මා කියා තියෙනවා. මගේ චරිතය මේ විදියට ප්‍රකාශ කරන්න මට ඕනෑකමක් තිබුණේ නැහැ. ඒ ස්ථවිරයන්ගේ ඕනෑකමට තමයි මගේ ජීවන තොරතුරු කිව්වේ. හැබැයි එතනදීත් හුඟක් දේවල් තියාගෙන මා පිළිබඳව ටිකක් තමයි ප්‍රකාශ කළේ. කවුරුවත් කිව්වට විශ්වාස නොකරන ඇතැම් දේවල් මා කිව්වේ නැහැ. ඔය "ගුප්ත විද්‍යාවට" සම්බන්ධ දේවල් "වශීකරණ" සම්බන්ධ දේවල් පිළිබඳව නොයෙක් අත්දැකීම් මා ලබා තිබෙනවා. ඒවා අන්‍යයන්ට කිව්වත් විශ්වාස නොකරන්න ඉඩ තියෙනව. එසේම නවීන විද්‍යාව අනුව බොහෝ දේවල් ඇතැම් අය විශ්වාස නොකළත් අපේ බණ පොත්වල සඳහන් වන දිව්‍යලෝක, ප්‍රේත ලෝක, නිරය, ආදිය ඇති බවට මා විශ්වාස කරනවා. මගේ අත්දැකීම් අනුව මට පුළුවන් ඒවා ඇති බව ඔප්පු කරන්න.

කුඩා කල සිටම මට ඇති වූ හැඟීම තමයි මේ බුද්ධ ධර්මය ලෝකයට කියාදෙන්න ඕනෑ කියන එක. ඒ හැර වෙනත් කීර්ති ප්‍රශංසා මා බලාපොරොත්තු නැහැ. යම්තම් ඉංග්‍රීසි පුළුවන් වූ තැන් පටන් මා බොහෝ දේවල් කියෙව්වා, නොයෙක් විෂයයන් පිළිබඳව. මේ හැම දෙයක්ම මා කියෙව්වේ මොන අදහසකින්ද? අපේ බණ පොත්වල තියෙන බොහෝ කරුණු ඔප්පු කිරීමට මොනවා හෝ සාධකයක් මේවායින් ලබා ගත හැකිද කියා හිතාගෙනයි. ඒවා කියවීමෙන් මගේ දැනුම පුළුල් වුණා. ඒවා පිළිබඳව නොයෙක්

දෙනා අසන ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න මේ නිසා මට පුළුවන් වුනා.

අද දින මේ තරම් විශාල සම්භාවනීය පිරිසක් මේ විදියට මට ගෞරව දැක්වීමට එකතුවීම සතුටට කරුණක්. ඒ වුනත් මේ විදියේ ගෞරව ප්‍රශංසා ලබන්න මා තවම උගත්කමින්වත්, ආධ්‍යාත්මික දියුණුවෙන්වත් සුදුසුකම් ලබාගෙන ඉන්නවා කියා මා හිතන්නේ නැහැ. සමහරු හිතනවා මා ධ්‍යානයක් ලබාගෙන ඇතැයි කියා. අනේ නෑ. පොත්පත් ලියමින්, පත්තරවලට ලිපි ලේඛන ලියමින්, බණ කියමින්, මිනිසුන්ගේ වැඩ මේ විදියට කරමින් අවිවේකීව ඉඳගෙන කොහොමද ධ්‍යාන වඩන්නේ? ඒ නිසා මහණකමට උවමනා විදියට බණ භාවනා කරගෙන ඉන්නවා. ධ්‍යාන මාර්ගවල ඒවා නැහැ. එතැනට කිට්ටුවෙන්න තවම අපට බැහැ. නමුත් භාවනා කරන කොට ඉන් මෙහා පැත්තේ යම් යම් ශක්තීන් සිතේ ඇති වෙනවා. මා එවැනි අත්දැකීම් ලබා තිබෙනවා. නමුත් ඊට එහා යන ආශ්වර්යවත් දෙයක් මා තුළ නැහැ. ඒ නිසා මේ විදියේ වරිත කතා ලියා ගෞරව සත්කාර කරන්න තරම් ලොකු කෙනෙක් නොවෙයි මා. මා තවමත් දැනුම සොයන කෙනෙක්. කොච්චර ඉගෙන ගත්තත් මගේ හිතට මදි. මා හිතන්නේ මා තවම ශිෂ්‍ය අවස්ථාවෙ ඉන්නෙ කියායි.

ඔය අග්ගමහා පණ්ඩිත ආදී බොහෝ උපාධි මට ලැබුණා. නමුත් අග්ගමහා පණ්ඩිත නොවෙයි නිකම් පණ්ඩිත කියන්නවත් මා කැමති නැහැ. ඒවා පාවිච්චි කරන්න මා කැමති නැහැ. "සාහිත්‍ය ශූරී" "සාහිත්‍ය චක්‍රවර්ති" වැනි උපාධි මට දුන්නා. දුන්න නිසා ඒවා මා භාර ගත්තා, ඒ අයට ගෞරව වශයෙන්. ඒත් ඒවා නමට අගින් එකතු කරගෙන මා පාවිච්චි කරන්නේ නැහැ. ඒවා නිකම්ම ඔහේ තියෙන්න ඇරලා තියෙනවා. අනිත් අය ඉතින් ඔය උපාධිවලින් මාව හැඳින්වූවාට මට කරන්න දෙයක් නැහැ. ඒ ඒ අයගේ කැමැත්ත. ඒත් මා දන්න දේවල් වලට වඩා නොදන්න දේවල් අප්‍රමාණ බව මා දන්නවානේ. ඒ නිසයි මා කිව්වේ එවැනි දේවල්වලට මා නොකැමති බව.


ස්තුති ප්‍රශංසාවලට මා අකමැතියි. ඒත් මා ගැන මා එහෙම හිතුවත් මේ වගේ චරිත කතා ලියල තිව්වම ඒවා කියවල අනිත් අයට යම් යම් ආදර්ශ ගන්න පුළුවන්නේ. වයස් ගතවෙන කොට මාත් තව දුර්වල වෙන්න පුළුවන්. එතකොට ඉතින් බොහෝ දේවල් අමතක වෙනවනේ. ඒ නිසා මා කියා ඇති මේ දේවල් දැන්ම කියන්න ලැබීමත් හොඳයි. දැන් මේ පොතෙන් මා රහසක් වශයෙන් තියාගත් දෙයක් හෙළිවෙලා තියෙනවා. මා බුදුබව පතනවා කියන එක දැන් ප්‍රසිද්ධ වෙලා. නමුත් පෘතග්ජනයෝ හැටියට අපි තාම බෝධිසත්ව මාර්ගයට ගියේ නැහැ. ඒක මගේ ප්‍රාර්ථනාවක්. ඒ නිසා ඒක ප්‍රසිද්ධ වෙනවට මා කැමති නැහැ. නමුත් කරන්න දෙයක් නැහැ. ප්‍රසිද්ධ වෙලා ඉවරයි. මා හුහක් දේවල් හංගාගෙන හිටියට කතා කොරන කොට එක එක්කෙනා යම් යම් දේවල් අල්ලා ගන්නවා. ඒවා පත්තරවලත් පොත් පත්වලත් ලියනවා. එහෙම වුනාම මට තමයි බේරුමක් නැතිවෙන්නේ. භාවනා ගැන, ගුප්ත විද්‍යා ගැන, චිත්ත ධර්මය ගැන, වශීකරණය ගැන ඔය විදියට නොයෙක් දේවල් ගැන කරුණු අහන්න මාව හොයාගෙන එනවා. එහෙම වුනාම ඉතින් මට මගේ වැඩවලට තියෙන කාලෙ නැති වෙනවා. දැන් ඉතින් මේ පොත පිට වුණාම කරච්චලේ තවත් වැඩිවෙයි.

මාතෘකාවෙන් පිට වුනත් විනෝදෙටත් එක්ක තවත් හොඳ කතාවක් මේ වෙලාවේ මම කියන්නම්, පසුගිය කාලෙක වෙච්ච. කලකට පෙර මගේ හොඳ මිත්‍රයෙක් හිටියා. එයාගෙ නම අක්බාර්. දවසක් මම උන්නැහේ හමුවෙන්න ගියාම ඒ ගෙදර මුරකරන්න හිටිය මිනිහ පෙන්නල මට කිව්වා ඔය ඉන්නේ මිනිහෙක් නොවෙයි යක්ෂයෙක් කියල. "මේක දන්නේ මම විතරයි, වෙන කවුරුවත් මේ මිනිහා යක්ෂයෙක් බව දන්නේ නැහැ. අපේ පරම්පරාවේ මන්ත්‍රයකින් තමයි මේ යක්ෂයා ගෙන්වා ගන්නේ, කැමති නම් ඒ මන්ත්‍රය මම ඔබ වහන්සේට දෙන්නම්" කියලා උන්නැහැ මට කිව්වා. "ඒ මන්ත්‍රය කටින් දෙන්නෙ අපේම පරම්පරාවේ කෙනෙකුටයි, ඔබවහන්සේට මම පොත දෙන්නම් පොතින් ලියාගන්න." කියලත් කිව්ව. ඊට පස්සෙත් හමු වුන වෙලාවල ඒක දෙන්න මට එන්න කිව්වා. නමුත් අවාසනාවකට ඒක මට ලබා ගන්න කලින් උන්නැහේ මළා. ඉතින් ඔය ප්‍රවෘත්තිය පත්‍රයක පළ වුණා.

ඊට පස්සේ මොකද වුණේ ? මට බේරුමක් නැහැ. බොහෝ දෙනා මට ලියුම් එවනවා අර යකා ගෙන්නා ගන්න මන්ත්‍රය එවන්න කියලා. ඒක මම දන්නේ නැහැ කියලා කිව්වට කවුරුවත් පිළිගත්තේ නැහැ. හිතන්නේ මම ඒක තියාගෙන දෙන්නේ නැහැ කියලයි. පස්සේ ඔය මීරිගම පැත්තේ වෙද මහත්තයෙක් මාව හොයාගෙන ආව මහරගම පන්සලට. ඇවිත් අද නම් හාමුදුරුවෝ මන්තරය දෙනකල් යන්නේ නැහැ කියල කිව්ව. මොනව කරන්නද? ඉතින් මම කිව්ව ඇත්ත වශයෙන්ම එහෙම මන්තරයක් මා ළඟ නැහැ කියලා. "නැහැ නැහැ ඔය කියන්නෙ ඒක දෙන්න වෙනවටයි අද නම් මන්තරය දෙනකල් මම යන්නෙම නැහැ" කියල මේ මනුස්සයා එකහෙළාම කියා හිටියා. මොනව කරන්නද ඉතින්. මේ දැන් මට ලොකු කරදරයක්. මම හැදුව මන්තරයක්. මිනිහ ඒක ලියාගෙන යන්න ගියා.

දවසක් මේ මිනිහ අර මන්තරය ජප කරලා තියෙනවා. ජප කළාම අර යක්ෂයා ඇත්තටම ආවා. මන්තර ඕනෙ නැහැ සමහර යක්ෂයන්ට, අමනුෂ්‍යයන්ට නිකම් කථා කළාම එනවා. රාත්‍රියේ ටිකක් කළුවරට වී කීප වතාවක් කතා කළාම ඔය අවතාර වගේ ඒවා එනවා. ඔය මන්තර වලින් කියන්නේ ඒ ඒ භාෂාවලින් ඒ අයට එන්න කියල කියන එකයි. ඕක ජප කළාම මේ යක්ෂයා ආවා. ඇවිත් ඇහුව මේ මිනිහගෙන් ඇයි මට එන්න කිව්වේ? කියල. දැන්, දැන් මට හරක් මස් රාත්තල් දෙකක් තම්බල දුන්නේ නැතිනම් බෙල්ල කරකවල යනව කියල මේ යක්ෂයා කියා හිටියා. මිනිහා හොඳටම බය වුණා. දැන්මම ගෙනත් දෙන්නම් කියලා ගියා මස් හොයන්න. ඉරිදා හින්දා එදා මස් කඩෙත් වහලා. ඉතින් කඩේ අයිතිකාරයගේ ගෙදරටම ගිහින් වැඩි ගානක් දීල මිනිහ එක්ක ඇවිත් කඩේ අරවගෙන මස් ගෙනත් යකාට කන්න හරිගස්සල දුන්නා. ඒක කාලා අර යකා මේ මිනිහගෙන් ආයෙත් ඇහුව ඇයි මට එන්න කිව්වෙ කියලා. මිනිහට හොඳටම දැන් බයයි. මොකුවත් කියන්න දෙයක් නැහැ. ඒ පාර යක්ෂයා මං යනවා කියල යන්න ගියා.

ඉතින් අර මුනුස්සයා මොකද කළේ ? ආනන්ද මෛත්‍රෙය හාමුදුරුවෝ මට කළ විපත්තියක් කියල ඔය කතාව පත්තරයක දැම්මා. ඔන්න ඔය වගේ දේවල් මට සිද්ධ වෙලා තියෙනවා. දැන් මේ පොත ප්‍රසිද්ධ වුනාමත් මිතිස්සු නොයෙක් ප්‍රශ්ණ හදාගෙන මා හොයාගෙන එයි. කොයි හැටි වෙතත්, කීර්ති ප්‍රශංසා මා බලාපොරොත්තු නොවුනත්, එවැනි දේවලට මා තවමත් සුදුසු නැහැ කියලා මා කල්පනා කළත්, මට ඇති බලවත් හිතවත්කම නිසා මේ වගේ පොතක් පළ කිරීමට ඉත්තෑපාන ධම්මාලංකාර ස්ථවිරයන් වහන්සේ උනන්දු වුණා. මේකෙන් බොහෝ දෙනාට ප්‍රයෝජන ඇති වෙයි, ඇතිවේවා කියල මා ප්‍රාර්ථනා කරනවා. අද දින මට ගෞරව කිරීමට මෙහි රැස් වූ ගිහි පැවිදි මේ සියලු දෙනාටම මගේ කෘතඥතා පූර්වක ස්තුතිය පිරිනමනවා.



පූජ්‍යපාද පණ්ඩිත **ඉත්තෑපාන** ධම්මාලංකාර හිමිපාණන් විචිත්‍ර ධර්මකථිකයාණන් වහන්සේ නමක් වශයෙන් මුළු මහත් තුන් සිංහලයේම පතළය. ඒ නිසාම ධර්මප්‍රචාරක කටයුතු සඳහා උන්වහන්සේගේ සේවය ඇමරිකාවටද අවශ්‍ය විය. එරටින් ලැබුණු ආරාධනාවක් පරිදි එහි වැඩම කළ උන්වහන්සේ දැනට කැලිෆෝනියාවේ ලොස් ඇන්ජලීස් නුවර **මෛත්‍රී විහාරයේ** අධිපති ධුරය දරමින් එහි වාසය කරන සිංහල හා අනෙකුත් බෞද්ධයන්ගේ සේවයට කැපවී සිටිති. ඊට අමතරව ගරුතර ධම්මාලංකාර හිමිපාණෝ රුක්මලේ ධර්මවිජයාලෝක විහාරයේ අධිපති ධුරය ද, කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ නියෝජ්‍ය ලේඛකාධිකාරී ධුරය හා කර්මවාගාචාර්ය ධුරයක් ද හොබවති. කැලණිය විශ්ව විද්‍යාලයේ බී.ඒ. ගෞරව උපාධිධරයකු වන උන්වහන්සේ මෑතදී ඉදිරිපත් කළ **ආදි බුදුදහමෙහි පැනෙන දර්ශනික ප්‍රස්තුත** නම් වූ නිබන්ධය පිළිගත් කැලණිය විශ්ව විද්‍යාලය දර්ශනපති උපාධිය උන්වහන්සේ වෙත පිරිනමා තිබේ.

විනයධර ධර්මධර සුපේශල ශික්ෂාකාමී ධම්මාලංකාර හිමිපාණෝ ධර්මදේශනාවෙහි පමණක් නොව ලේඛන කලාවෙහි ද දක්ෂයෙකි. මෙරට මුල් පෙළෙහි වැඩ සිටින මහතෙරුන් වහන්සේලා දෙලොස් නමකගේ චරිත ඇතුළත් කොට උන්වහන්සේ ලියූ **පැව්දි පඩි මිණි පහන්** 1990 දී පළ විය. අමරපුර මහා සංඝ සභාවේ ප්‍රථම සභාපති ධුරය හෙබවූවා වූද, අග්‍රගණ්‍ය පඬිරුවනක් වශයෙන් ජාත්‍යන්තර කීර්තියක් ඇත්තා වූද, අතිගරු අග්ගමහාපණ්ඩිත බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහානායක ස්වාමීන් වහන්සේගේ උදාර චරිතය විස්තර කරමින් **බුදු බව පතන බළන්ගොඩ ආනන්ද මෛත්‍රෙය මහ නාහිමි** ලියා ඇත. ගරුතර ධම්මාලංකාර හිමිපාණන්ගේ විචක්ෂණ ශෛලියත්, ලේඛන කුශලතාවත්, මෙම පොතින්ද මනාව ප්‍රකට වෙයි.

ආචාර්ය සෝමපාල ජයවර්ධන
පාලි පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
රුහුණ විශ්ව විද්‍යාලය, මාතර

කවරය සැකැස්ම : වීකී හෙට්ටිගොඩ

ISBN 955-95328-1-2

මහේෂු සේනානායක වන මා විසින්
දෙහිවල පැපිලියාන පාරේ අංක 27 දරණ තැන
ශ්‍රීදේවී ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි මුද්‍රණය කරවන ලදී.

**National Digitization Project**

***National Science Foundation***

Institute : Sabaragamuwa University of Sri Lanka

1. Place of Scanning : Sabaragamuwa University of Sri Lanka, Belihuloya
2. Date Scanned : ...2017.-.10...21...........................................................
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : ....S.A.C....Sadaruwan............................................

Signature : ..........................................................................

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : LIBRARIAN..........................................................................

Name : T.N. NEIGHSOOREI..........................................................................

Signature : ..........................................................................

Date : ...2017.-.10.-..21.........

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*